319 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 319 - இல. 4
Volume 319 - No. 4

2025 මැයි 08 වන බ්‍රහස්පතින්දා
2025 மே 08, வியாழக்கிழமை
Thursday, 08th May, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රතිඥාව:**

ගරු රත්නායක මුදියන්සේලාගේ සමන්ත රණසිංහ මහතා [තීරුව 559]

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**

මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 559]

**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 560]
අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 560]
වරප්‍රසාද: 2025.03.06 දින කෝප් කමිටුවේදී කරන ලද ප්‍රකාශය [තීරුව 561]
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 561]
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 561]
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [තීරුව 562]
ආංශික අධීක්ෂණ කාරක සභා: සාමාජිකයන් නම් කිරීම [තීරුව 562]
අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයන් නම් කිරීම [තීරුව 563]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 572]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 576]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 579-627]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

පිරිවැය ප්‍රතිසාධන විදුලි බිල, SVAT අහෝසි කිරීම සහ ඩිජිටල් අපනයන සඳහා බද්ද [තීරුව 627]
උතුරු සහ නැඟෙනහිර දමිළ ජනතාවගේ පාරම්පරික ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැසට් නිවේදනය [තීරුව 648]

**සහල් නිෂ්පාදනය, පරිභෝජනය සහ ආනයනය:**

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 650]

**විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 656]

**පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 656]

**ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී [තීරුව 657]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) - [ගරු රවී කරුණානායක මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 657]

**රේගු ආඥා පනත:**

යෝජනා සම්මතය [තීරුව 658-768]

---

# பிரதான உள்ளடக்கம்

**உறுதிப்பிரமாணம்:**

மாண்புமிகு ரத்னாயக்க முதியன்சேலாகே சமந்த ரனசிங்ஹ [ப: 559]

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**

பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 559]

**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 560]
குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 560]
சிறப்புரிமை: 'கோப்' குழுவில் 06.03.2025 அன்று தெரிவிக்கப்பட்ட கருத்து [ப: 561]
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம் [ப: 561]
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு: உறுப்பினர் நியமனம் [ப: 561]
அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம் [ப: 562]
துறைசார் மேற்பார்வைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம் [ப: 562]
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம் [ப: 563]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 572]
**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 576]
**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 579-627]
**தனி அறிவித்தல் மூல வினா:**
செலவு மீளாக்க மின் கட்டணம், SVAT நீக்கம் மற்றும் டிஜிட்டல் ஏற்றுமதிகளின் வரி [ப: 627]
வடக்கு, கிழக்கிலுள்ள தமிழர்களின் பூர்வீக நிலங்களைச் சுவீகரிப்பது சம்பந்தமான வர்த்தமானி அறிவித்தல் [ப: 648]
**அரிசி உற்பத்தி, நுகர்வு மற்றும் இறக்குமதி:**
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 650]
**வெளிநாட்டுக் கடன்கள் (நீக்குதல்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 656]
**தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 656]
**தேசிய போக்குவரத்து ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 657]
**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
நிகழ்நிலைக் காப்புச் சட்டம் (இரத்துச் செய்தல்) சட்டமூலம் - [மாண்புமிகு ரவி கருணாநாயக்க] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 657]
**சுங்கக் கட்டளைச் சட்டம்:**
தீர்மானம் [ப: 658-768]

---

# PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Rathnayaka Mudiyanselage Samantha Ranasingha [Col. 559]

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 559]

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 560]
Code of Criminal Procedure (Amendment) Bill: Petition to the Supreme Court [Col. 560]
Privilege: Remark Made at the COPE on 06.03.2025 [Col. 561]
Committee on Parliamentary Business: Nomination of Members [Col. 561]
Committee on Public Accounts: Nomination of Member [Col. 561]
Committee on Public Enterprises: Nomination of Members [Col. 562]
Sectoral Oversight Committees: Nomination of Members [Col. 562]
Ministerial Consultative Committees: Nomination of Members [Col. 563]

AUDITOR GENERAL'S REPORT [Col. 572]
PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 576]
ORAL ANSWERS TO QUESTIONS [Cols. 579-627]
QUESTION BY PRIVATE NOTICE:
Cost-reflective Electricity Tariff, Abolition of SVAT and Tax on Digital Exports [Col. 627]
Gazette Notification on Acquisition of Traditional Lands of Tamil People in North and East [Col. 648]

PRODUCTION, CONSUMPTION AND IMPORT OF RICE
Statement by Minister of Trade, Commerce, Food Security and Co-operative Development [Col. 650]

FOREIGN LOANS (REPEAL) BILL:
Read the First Time [Col. 656]

PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL:
Read the First Time [Col. 656]

NATIONAL TRANSPORT COMMISSION (AMENDMENT) BILL:
Read the First Time [Col. 657]

PRIVATE MEMBERS' BILLS:
The Online Safety (Repeal) – [The Hon. Ravi Karunanayake] - Read the First time [Col. 657]

CUSTOMS ORDINANCE:
Resolution [Cols. 658–768]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 මැයි 08 වන බ්‍රහස්පතින්දා***
*2025 மே 08, வியாழக்கிழமை*
*Thursday, 08th May, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ප්‍රතිඥාව: ගරු රත්නායක මුදියන්සේලාගේ සමන්ත රණසිංහ මහතා
## உறுதிப்பிரமாணம்: மாண்புமிகு ரத்னாயக்க முதியன்சேலாகே சமந்த ரனசிங்ஹ
## AFFIRMATION: HON. RATHNAYAKA MUDIYANSELAGE SAMANTHA RANASINGHA

***ගරු රත්නායක මුදියන්සේලාගේ සමන්ත රණසිංහ මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.***

*மாண்புமிகு மாண்புமிகு ரத்னாயக்க முதியன்சேலாகே சமந்த ரனசிங்ஹ சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப் பிரமாணம் செய்து சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.*

*The Hon. Rathnayaka Mudiyanselage Samantha Ranasingha made and subscribed the Affirmation required by Law; and signed the Book at the Table.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 අප්‍රේල් මස 22 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් 2025 අප්‍රේල් 11 දින "එකතු කළ අගය මත බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි හා 2025 අප්‍රේල් 30 දින "අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

**II**

### අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## III

## වරප්‍රසාද: 2025.03.06 දින කෝප් කමිටුවේදී කරන ලද ප්‍රකාශය

சிறப்புரிமை: 'கோப்' குழுவில் 06.03.2025 அன்று தெரிவிக்கப்பட்ட கருத்து

PRIVILEGE: REMARK MADE AT THE COPE ON 06.03.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් 2025 මාර්තු 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## IV

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்

COMMITTEE ON PARLIAMENTARY BUSINESS: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115හි විධිවිධාන පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු වසන්ත සමරසිංහ මහතා

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා

ගරු අබූබකර් අතම්බාවා මහතා

## V

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම

அரசாங்கக் கணக்குகள் பற்றிய குழு: உறுப்பினர் நியமனம்

COMMITTEE ON PUBLIC ACCOUNTS: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධාන පරිදි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු සුනිල් රත්නසිරි මහතා

## VI

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்

COMMITTEE ON PUBLIC ENTERPRISES: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120හි විධිවිධාන පරිදි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු අබූබකර් අතම්බාවා මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

## VII

## ආංශික අධීක්ෂණ කාරක සභා: සාමාජිකයන් නම් කිරීම

துறைசார் மேற்பார்வைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

SECTORAL OVERSIGHT COMMITTEES: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111හි විධිවිධාන පරිදි සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පහත සඳහන් එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවල සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

**1. ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

**2. යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

3. **අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
   ගරු අබුබකර් අතම්බාවා මහතා
   ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය
   ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
   ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
   ගරු සුජීව දිසානායක මහතා
   ගරු සංජීව රණසිංහ මහතා
   ගරු සුනිල් රාජපක්ෂ මහතා

4. **සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
   ගරු මුනීර් මුලාෆර් මහතා
   ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
   ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
   ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
   ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
   ගරු ජගත් මනුවර්ණ මහතා
   ගරු රුවන් මාපලගම මහතා

5. **පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
   ගරු රොෂාන් අක්මීමන මහතා
   ගරු උපුල් කිත්සිරි මහතා
   ගරු එම්.ජේ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
   ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
   ගරු සුදත් බලගල්ල මහතා
   ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
   ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

6. **විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
   ගරු චතුරංග අබේසිංහ මහතා
   ගරු අර්කම් ඉල්යාස් මහතා
   ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
   ගරු තනුර දිසානායක මහතා
   ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
   ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
   ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

## VIII

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා: සාමාජිකයින් නම් කිරීම

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

MINISTERIAL CONSULTATIVE COMMITTEES: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධාන පරිදි සහ පාර්ලිමේන්තුව විසින් 2025මාර්තු 19දින සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ ද නාම ලේඛන භාෂාත්‍රයෙන්ම මම **සභාගත*** කරමි.

***සභාමේසය මත තබන ලද නාමලේඛනය:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப்பட்டியல்:*
*List of names tabled:*

1 **මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු සුනිල් කුමාර ගමගේ මහතා
   ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
   ගරු කන්දසාමි ප්‍රභු මහතා
   ගරු රුවන් විජේවීර මහතා

2. **අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු මහින්ද ජයසිංහ මහතා
   ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
   ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

3. **විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
   ගරු කන්දසාමි ප්‍රභු මහතා
   ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

4. **කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු වසන්ත පියතිස්ස මහතා
   ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
   ගරු අජිත් ගිහාන් මහතා
   ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

5. **ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
   ගරු කේ. ඉලංකුමාරන් මහතා
   ගරු සුනිල් රත්නසිරි මහතා
   ගරු මුහම්මද් ෆයිසාල් මහතා

6. **කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු වසන්ත පියතිස්ස මහතා
   ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
   ගරු නන්දන පත්මකුමාර මහතා
   ගරු කන්දසාමි ප්‍රභු මහතා
   ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

7. **ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
   ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
   ගරු පී. රුවන් සෙනරත් මහතා
   ගරු අරුන් හේමචන්ද්‍ර මහතා

8. **කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
   ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
   ගරු ලාල් ප්‍රේමනාත් මහතා
   ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
   ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

**9. වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු අරවින්ද සෙනරත් මහතා

**10. නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා

ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා

**11. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඕෂානි උමංගා මහත්මිය

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

**12. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

**13. කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

**14. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

**15. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා

ගරු මුනීර් මුලාෆර් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

**16. විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා

ගරු එරංග වීරරත්න මහතා

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා

**17. බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ඇන්ටන් ජයකොඩි මහතා

ගරු සුගත් තිලකරත්න මහතා

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු අශෝක ගුණසේන මහතා

**18. ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

**19. ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු චතුරංග අබේසිංහ මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු රුවන් විජේවීර මහතා

**20. පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

**21. තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු රොෂාන් අක්මීමන මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ භාග්‍යා ශ්‍රී හේරත් මහතා

**22. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු නීතිඥ සුනිල් වටගල මහතා

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛචෙල්වි මෙනෙවිය

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

**23. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු රත්න ගමගේ මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා

ගරු ගමගෙදර දිසානායක මහතා

ගරු ටී.බී. සරත් මහතා

**24. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

ගරු නාමල් කරුණාරත්න මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛචෙල්වි මෙනෙවිය

ගරු කන්දසාමි ප්‍රභු මහතා

**1. நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சுனில் குமார கமகே

மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ

மாண்புமிகு கந்தசாமி பிரபு

மாண்புமிகு ருவன் விஜேவீர

**2. கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ

மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி

மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ

**3. வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி

மாண்புமிகு கந்தசாமி பிரபு

மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே

4. **கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு வசந்த பியதிஸ்ஸ
மாண்புமிகு அஜந்த கம்மெத்தெகே
மாண்புமிகு அஜித் கிஹான்
மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ

5. **போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி
மாண்புமிகு கே. இளங்குமரன்
மாண்புமிகு சுனில் ரத்னசிரி
மாண்புமிகு முஹம்மட் பைசல்

6. **கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு வசந்த பியதிஸ்ஸ
மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி
மாண்புமிகு நந்தன பத்மகுமார
மாண்புமிகு கந்தசாமி பிரபு
மாண்புமிகு ரவீந்திர பண்டார

7. **கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு
மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ
மாண்புமிகு பி. ருவன் செனரத்
மாண்புமிகு அருண் ஹேமச்சந்திரா

8. **தொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்
மாண்புமிகு லால் பிரேமநாத்
மாண்புமிகு கிட்ணன் செல்வராஜ்
மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்

9. **பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே
மாண்புமிகு ஜகத் மனுவர்ண
மாண்புமிகு அரவிந்த செனரத்

10. **நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன
மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல
மாண்புமிகு சந்தன தென்னக்கோன்
மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க

11. **சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா
மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி
மாண்புமிகு ருவன் விஜேவீர
மாண்புமிகு தர்மப்பிரிய விஜேசிங்ஹ

12. **பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க
மாண்புமிகு அஜித் கிஹான்
மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க
மாண்புமிகு தேவானந்த சுரவீர

13. **மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ
மாண்புமிகு சுகத் வசந்த த சில்வா
மாண்புமிகு அதுல வெலந்தகொட

14. **கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சமிந்த லலித் குமார
மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்
மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க

15. **புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன
மாண்புமிகு முனீர் முலாபர்
மாண்புமிகு ருவன் மாபலகம
மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல

16. **விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன
மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி
மாண்புமிகு எரங்க வீரரத்ன
மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன

17. **வலுசக்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு அன்டன் ஜயகொடி
மாண்புமிகு சுகத் திலகரத்ன
மாண்புமிகு ரொஷான் அக்மீமன
மாண்புமிகு அசோக குணசேன

18. **பாதுகாப்பு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சட்டத்தரணி சரத் குமார
மாண்புமிகு நிஷாந்த பெரேரா
மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி

19. **டிஜிட்டல் பொருளாதார அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ
மாண்புமிகு வசந்த புஷ்ப குமார
மாண்புமிகு கந்தசாமி பிரபு
மாண்புமிகு ருவன் விஜேவீர

20. **சுற்றாடல் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு லசித் பாஷண கமகே
மாண்புமிகு சுஜீவ திசாநாயக்க
மாண்புமிகு அருண பனாகொட
மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்

**21. இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ரொஷான் அக்மீமன

மாண்புமிகு கே. இளங்குமரன்

மாண்புமிகு தனுர திசாநாயக்க

மாண்புமிகு தினேஷ் ஹேமந்த

மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்

**22. நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு சட்டத்தரணி சுனில் வடகல

மாண்புமிகு அருண் ஹேமச்சந்திரா

மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி

மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே

**23. பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு ரத்ன கமகே

மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற)அருண ஜயசேகர

மாண்புமிகு கமகெதர திசாநாயக்க

மாண்புமிகு ரீ.பி. சரத்

**24. வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு**

மாண்புமிகு நாமல் கருணாரத்ன

மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி

மாண்புமிகு கந்தசாமி பிரபு

1. Ministerial Consultative Committee on Finance, Planning and Economic Development

The Hon. Sunil Kumara Gamage

The Hon. (Prof.) Ruwan Ranasinghe

The Hon. Kanthasamy Prabu

The Hon. Ruwan Wijeweera

2. Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education

The Hon. Mahinda Jayasinghe

The Hon. Rajeevan Jeyachandramoorthy

The Hon. Darmapriya Wijesinghe

3. Ministerial Consultative Committee on Foreign Affairs, Foreign Employment and Tourism

The Hon. Lakshman Nipuna Arachchi

The Hon. Kanthasamy Prabu

The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law

4. Ministerial Consultative Committee on Agriculture, Livestock, Land and Irrigation

The Hon. Wasantha Piyathissa

The Hon. Ajantha Gammeddage

The Hon. Ajith Gihan

The Hon. Darmapriya Wijesinghe

5. Ministerial Consultative Committee on Transport, Highways, Ports and Civil Aviation

The Hon. Manjula Suraweera Arachchi

The Hon. K. Ilankumaran

The Hon. Sunil Rathnasiri

The Hon. Muhammad Faizal

6. Ministerial Consultative Committee on Industry and Entrepreneurship Development

The Hon. Wasantha Piyathissa

The Hon. Rajeevan Jeyachandramoorthy

The Hon. Nandana Pathmakumara

The Hon. Kanthasamy Prabu

The Hon. Ravindra Bandara

7. Ministerial Consultative Committee on Fisheries, Aquatic and Ocean Resources

The Hon. Janitha Ruwan Kodithuwakku

The Hon. (Dr.) Susil Ranasinghe

The Hon. P. Ruwan Senarath

The Hon. Arun Hemachandra

8. Ministerial Consultative Committee on Labour

The Hon. Mayilvaganam Jegatheeswaran

The Hon. Lal Premanath

The Hon. Kitnan Selvaraj

The Hon. Bhagya Sri Herath, Attorney-at-Law

9. Ministerial Consultative Committee on Plantation and Community Infrastructure

The Hon. (Mrs.) Nilusha Lakmali Gamage

The Hon. Jagath Manuwarna

The Hon. Aravinda Senarath

10. Ministerial Consultative Committee on Urban Development, Construction and Housing

The Hon. R.M. Jayawardhana

The Hon. Sunil Watagala, Attorney-at-Law

The Hon. Chandana Thennakoon

The Hon. Dinindu Saman Hennayake

11. Ministerial Consultative Committee on Health and Mass Media

The Hon. (Mrs.) Oshani Umanga

The Hon. Ruwanthilaka Jayakody

The Hon. Ruwan Wijeweera

The Hon. Darmapriya Wijesinghe

12. Ministerial Consultative Committee on Public Administration, Provincial Councils and Local Government

The Hon. R.M. Gamini Rathnayake

The Hon. Ajith Gihan

The Hon. E.M. Basnayaka

The Hon. Dewananda Suraweera

13. Ministerial Consultative Committee on Women and Child Affairs

The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law

The Hon. Sugath Wasantha de Silva

The Hon. Athula Welandagoda

14. Ministerial Consultative Committee on Rural Development, Social Security and Community Empowerment

The Hon. Chaminda Lalith Kumara

The Hon. Mayilvaganam Jegatheeswaran

The Hon. E.M. Basnayaka

15. Ministerial Consultative Committee on Buddhasasana, Religious and Cultural Affairs

The Hon. (Dr.) Chrishantha Abeysena

The Hon. Muneer Mulaffer

The Hon. Ruwan Mapalagama

The Hon. (Dr.) Nandana Millagala

16. Ministerial Consultative Committee on Science and Technology
    The Hon. R.M. Jayawardhana
    The Hon. (Dr.) Hansaka Wijemuni
    The Hon. Eranga Weeraratne
    The Hon. (Dr.) Namal Sudarshana

17. Ministerial Consultative Committee on Energy
    The Hon. Anton Jayakody
    The Hon. Sugath Thilakaratne
    The Hon. Roshan Akmeemana
    The Hon. Ashoka Gunasena

18. Ministerial Consultative Committee on Defence
    The Hon. Sarath Kumara, Attorney-at-Law
    The Hon. Nishantha Perera
    The Hon. Chandima Hettiaratchi

19. Ministerial Consultative Committee on Digital Economy
    The Hon. Chathuranga Abeysinghe
    The Hon. Wasantha Pushpa Kumara
    The Hon. Kanthasamy Prabu
    The Hon. Ruwan Wijeweera

20. Ministerial Consultative Committee on Environment
    The Hon. Lasith Bhashana Gamage
    The Hon. Sujeewa Dissanayake
    The Hon. Aruna Panagoda
    The Hon. (Ms.) Ambika Samivel

21. Ministerial Consultative Committee on Youth Affairs and Sports
    The Hon. Roshan Akmeemana
    The Hon. K. Ilankumaran
    The Hon. Thanura Dissanayake
    The Hon. Dinesh Hemantha
    The Hon. Bhagya Sri Herath, Attorney-at-Law

22. Ministerial Consultative Committee on Justice and National Integration
    The Hon. Sunil Watagala, Attorney-at-Law
    The Hon. Arun Hemachandra
    The Hon. (Ms.) Krishnan Kalaichelvi
    The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law

23. Ministerial Consultative Committee on Public Security and Parliamentary Affairs
    The Hon. Rathna Gamage
    The Hon. Major General (Rtd.) Aruna Jayasekera
    The Hon. Gamagedara Dissanayake
    The Hon. T. B. Sarath

24. Ministerial Consultative Committee on Trade, Commerce, Food Security and Co-operative Development
    The Hon. Namal Karunaratne
    The Hon. (Ms.) Krishnan Kalaichelvi
    The Hon. Kanthasamy Prabu

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIX කොටස;
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XLIII කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XL කොටස, තෙවැනි කාණ්ඩයේ XVII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXIII කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) 2023 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් රෙගුලාසි, නියෝගය, නිවේදනය සහ නියමය ඉදිරිපත් කරමි.

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 19 දිනැති අංක 2428/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය; සහ

(iv) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

මෙම රෙගුලාසි, නියෝගය, නිවේදනය සහ නියමය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ පෝෂණය හා ආහාරවේදය අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් සාදන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
- 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ 19(අ) වගන්තිය යටතේ රේගු ආනයන තීරු බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 පෙබරවාරි 25 දිනැති අංක 2425/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
- 2025 අංක 3 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය ප්‍රකාරව 2025.03.01 සිට 2025.03.27 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 වර්ෂය සඳහා මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද රේගු ආඥාපනතේ (235 අධිකාරය වූ) "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය (2025 ජනවාරි 27 දිනැති අංක 2421/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2025 අප්‍රේල් 09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද) සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද ලලිත් කුමාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) අතුරුගිරිය, ඔරුවල, ලේක් ටෙරස්, 5 වැනි පටුමග, අංක 723/80 දරන ස්ථානයෙහි පදිංචි බී.එච්.ජී. නයනි රේණුකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) කඩවත, පහළ බියන්විල, පුෂ්පාරාම මාවත, අංක 145 දරන ස්ථානයෙහි පදිංචි එල්.පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) තඹුත්තේගම, රාජාංගනය පාර, අංක 238 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඩී.එස්. විජේතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාතර, වෙරදූව, නාවිමන පාර, අංක 31 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත වික්‍රමසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) වත්තල, එඬේරමුල්ල, ශාන්ත ජූඩ් පාර, අංක 45/1 දරන ස්ථානයෙහි පදිංචි රොහාන් අල්විස් කොතලාවල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පේරාදෙණිය, උඩ ඊරියගම, අංක 129 දරන ස්ථානයෙහි පදිංචි ශ්‍රියානි හෙට්ටිවත්තගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) ත්‍රිකුණාමලය, ධ්‍යානගම, ඉදිරිපිට නිවස, බී-4 දරන ස්ථානයෙහි පදිංචි ටී. අප්සරා ජීවාංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මහනුවර, වේවැල්ල පාර, අංක 58/5 බී දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්. ප්‍රියා දමයන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) පානදුර, වලාන, පොදුජන මාවත, අංක 67 බී දරන ස්ථානයෙහි පදිංචි ඩී.එච්. ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) රාගම, කපු වැව පාර, අංක 648 බී දරන ස්ථානයෙහි පදිංචි පී.ජී.සී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පිළියන්දල, කුම්බෝවිල, වෙද මාවත, 3 වැනි පටුමග, අංක 202/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජී. සුනීතා පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පන්නිපිටිය, දෙපානම, අරලිය උයන, අංක 75/49 එෆ් දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩී. නීලිකා අතුකෝරළ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව රටටත්, ජනතාවටත්, මේ ගරු සභාවේ අපටත් වැදගත් වන කාරණයක් ගැන රජයේ අවධානය යොමු කරවන්න මම මිනිත්තුවක කාලයක් ඉල්ලා සිටිනවා.

පසුගියදා ඇමෙරිකානු රජය විසින් ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ රටවල් රැසකට තීරුබදු පැනවීමක් සිදු කළ අවස්ථාවේ, එමඟින් අපේ රටේ ආර්ථිකයට සිදු විය හැකි බලපෑම සැලකිල්ලට ගෙන සර්වපාක්ෂික සමුළුවක් කැඳවන ලෙස අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව අප්‍රේල් 10වැනිදා ජනාධිපතිතුමා විසින් කැඳවපු සාකච්ඡාවට ගරු විපක්ෂ නායකතුමාත්, විපක්ෂයේ සෙසු පක්ෂවල නායකයින් සහ නියෝජිතයින් සහභාගි වෙලා ඉතා වැදගත් කරුණු ගණනාවක් සාකච්ඡා කළා. එතැනදී ජනාධිපතිතුමා කිව්වා, රජයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් ඇතුළු පිරිසක් ඇමෙරිකාවට ගිහිල්ලා මේ ගැන සාකච්ඡා කරන බව. ඒ අනුව, එම සාකච්ඡාවල ප්‍රතිඵල මේ සතියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම පසුගිය දවසක යුරෝපා සංගමයේ නියෝජිතයින් පිරිසක් පැමිණ GSP Plus ගැන ජනාධිපතිතුමා සහ රජය සමඟ සාකච්ඡා කරනවා අපි දැක්කා. අපි රජයෙන් ඉල්ලනවා, එම වැදගත් සාකච්ඡාවල ප්‍රතිඵල සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන්න කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අද දින පවත්වන විවාදය අතරතුර අදාළ විෂය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් එම කරුණු මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා ඇති.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්න හදන්නේත් ඒ කාරණය ගැනම ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් තමයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද හවස ඒ සම්බන්ධයෙන් කථා කරමු.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක Order of Businessහි නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද දින විෂයය වන්නේ රේගු ආඥා පනත යටතේ වූ යෝජනා සම්මතය ගැන සාකච්ඡා කිරීම. එතකොට ඒකත් එක්ක කොහොමද මේක සම්බන්ධ කරන්නේ? මේක වෙනම ප්‍රශ්නයක් විධියට අහලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඇමෙරිකාවේ මුදල් ඇමති ප්‍රකාශයක් කළා, රටවල් 17ක් මේ සුමානයේ ගිවිසුම් ටික හෙළිදරව් කරනවා කියලා. මම බලාපොරොත්තු වෙනවා, ඒගොල්ලන් අද එය හෙළිදරව් කරයි කියලා. හැබැයි, අද මේ ගරු සභාවේ තිබෙන්නේ රේගු ආඥා පනත යටතේ වූ යෝජනා සම්මතය පිළිබඳව විවාද කිරීම. එතකොට ඒක මේකට සම්බන්ධ කරන්නේ කොහොමද කියලා තමයි දැන ගන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, රේගුව කියන එක ආර්ථිකයට සම්බන්ධයි. Order of Businessහි අපි දැන් ඉන්න තැන ගත්තොත්, ඒ කාරණාව මෙතැනට කිසිම සම්බන්ධයක් නැහැ. නමුත්, ඔබතුමන්ලා වැදගත් දෙයක් සභාවට මතු කළේ. ඒ නිසා ඒ ගැන විවාදයක් ඇති කරගන්න අවශ්‍යතාවක් නැහැ. අද ආර්ථිකය සම්බන්ධව සම්පූර්ණ විවාදයක් තිබෙනවා. ඒ විවාදයේදී අදාළ ඇමතිවරු සියලුදෙනා ඒ පිළිබඳව පැහැදිලි කරයි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### සිවිල් නඩු අවසන් කිරීමේදී ප්‍රමාදය වැළැක්වීම: ක්‍රියාමාර්ග
### குடியியல் வழக்கு விசாரணைகளை நிறைவுசெய்வதில் ஏற்படும் தாமதத்தைத் தவிர்த்தல் : நடவடிக்கை
### PREVENTION OF DELAY IN ENDING CIVIL COURT CASES: MEASURES TO BE TAKEN

133/2024

1. **ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ විභාග කරමින් පවතින අවුරුදු පහ ඉක්ම වූ සහ අවුරුදු දහය ඉක්මවූ සිවිල් නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නඩු විභාග කර අවසන් කිරීමේදී පවතින ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் நீதிமன்றக் கட்டமைப்பில் விசாரணையிலுள்ள ஐந்து வருடங்களுக்கு மேற்பட்ட மற்றும் பத்து வருடங்களுக்கு மேற்பட்ட குடியியல் வழக்குகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) வழக்கு விசாரணைகளை நிறைவுசெய்வதில் ஏற்படுகின்ற தாமதத்தைத் தவிர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the-

(i) number of civil cases which are pending before courts within the judicial system of Sri Lanka for over five years and for over ten years, separately; and

(ii) measures that will be taken to prevent the delay in ending cases?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අවුරුදු පහ ඉක්මවූ (එනම් අවුරුදු 5 - 10 අතර) සිවිල් නඩු ගණන -29,132

අවුරුදු දහය ඉක්ම වූ සිවිල් නඩු ගණන - 17,271

(ii) ගරු මන්ත්‍රීතුමනි, මා කෙටි උත්තරයක් දෙන්නම්. මොකද, මේ සඳහා දීර්ඝ උත්තරයක් තිබෙන්නේ. All the details are in this Answer. එය මම සභාගත කරන්නම්.

අධිකරණ සංඛ්‍යාව සුදුසු පරිදි වැඩි කිරීම.

a) කළමනාකරණය කර ගත හැකි නඩු සංඛ්‍යාවක් එක් අධිකරණයකට ලබා දීම.

b) අධික නඩු සංඛ්‍යාවක් පවතින අධිකරණ සඳහා අතිරේක අධිකරණ පිහිටුවීම.

උදාහරණ වශයෙන් මෑතකදී කරපු ඒවා මෙහි ඉදිරිපත් කර තිබෙනවා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

c) සංචාරක අධිකරණ කලාප ස්ථිර අධිකරණ කලාප ලෙස පිහිටුවා තිබෙනවා.

ඒ සඳහා උදාහරණ ඉදිරිපත් කර තිබෙනවා.

d) ඒකාබද්ධ අධිකරණ පිහිටුවීමත් තව එකක් හැටියට සලකනවා. තෝරාගත් සිවිල් සහ මහෙස්ත්‍රාත් අධිකරණ.

e) ඒ වාගේම අධික නඩු සංඛ්‍යාව හා අනෙකුත් අවස්ථානුගත කරුණු පිළිබඳව සැලකිල්ලට ගෙන අධිකරණ සේවා කොමිෂන් සභාව හා එක්ව අවශ්‍ය අවස්ථාවල නව අධිකරණ බලප්‍රදේශ පිහිටුවීම.

ඔබතුමන්ලා දන්නවා, කොවිඩ් ව්‍යාප්තියට පෙර Court Expansion Programme එකක් පටන් ගත් බව. නමුත්, ඒක නැවතුණා. Court Expansion Programme එකේ මූලික බලාපොරොත්තුවක් වුණේ, එක නඩුකාරතුමෙකුට handle කරගත හැකි නඩු ප්‍රමාණයක් අධිකරණයට ලබා දෙන එක. For this, we mainly used and based ourselves on the Final Report of the Committee Appointed to Review the Demarcation of Jurisdiction and to Increase the Number of Courts Houses Including the High Courts headed by Justice Mahinda Samayawardhena.

Then, Small Claims Court and Pre-Trial Courts. Although all the procedure are in place, තවම තිබෙන්නේ සුළු හිමිකම් අධිකරණ දෙකයි, ගරු මන්ත්‍රීතුමනි.

ඒ, මහනුවර සහ මාතර අධිකරණ පමණයි. ඒ නිසා අපි පූර්ව නඩු විභාග සහ Small Claims Courts හඳන්න ගාල්ල, කන්තලේ, මාතලේ, නිකවැරටිය, පුත්තලම, වාලච්චේන සහ මහව අධිකරණ බල ප්‍රදේශවල නව ගොඩනැඟිලි ඉදි කරමින් පවතිනවා. Then, you can convert those to Small Claims Courts.

වාණිජ මහාධිකරණ සංඛ්‍යාව 4 දක්වා වැඩි කර තිබෙනවා. 5වන මහාධිකරණය සූදානම් වෙලා තිබුණාට යටිතල පහසුකම් ගැටලුවක් නිසා එය තවම ආරම්භ කරලා නැහැ.

සංචාරක අධිකරණ 7ක් මහෙස්ත්‍රාත් අධිකරණ දක්වා උසස් කර තිබෙනවා. ඒවා තමයි, මැදවච්චිය, කහටගස්දිගිලිය, නොච්චියාගම, කලවන්චිකුඩි, කලවාන, පස්සර සහ නාරම්මල.

ඒ වාගේම, නඩු සංඛ්‍යාව පදනම් කරගෙන අතිරේක මහාධිකරණ 3ක්, අතිරේක දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ 12ක්, අතිරේක දිසා අධිකරණ 2ක්, අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණ 1ක් ස්ථාපිත කර තිබෙනවා. අතිරේක මහාධිකරණ 3 තමයි, කොළඹ, මහනුවර සහ අනුරාධපුර.

ඉතාම පැරණි නඩු පවතින අධිකරණ හඳුනාගෙන එම පැරණි නඩු කඩිනමින් විසඳා අවසන් කිරීම සඳහා පමණක්, යටිතල පහසුකම් හා කාර්ය මණ්ඩලය පවතින්නේ නම් වෙනම විනිශ්චයකාරවරුන් පත් කිරීමටත් අපි උත්සාහ කරමින් සිටිනවා.

Then, Model Courts. I think it is a programme that was started earlier. It has now expanded up to 21 court houses and we are continuing with it.

නඩු කටයුතු අවසන් කිරීම සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස ප්‍රමාදයන් පවතින බවට ලැබෙන පැමිණිලි පිළිබඳව හැකි සෑම අවස්ථාවකදීම අධිකරණ සේවා කොමිෂන් සභාව මඟින් සොයා බැලීම අපි සිදු කරනවා.

ඒකාබද්ධ අධිකරණවල පවතින අපරාධ හා සිවිල් නඩු සංඛ්‍යාවේ ඉහළ යෑමත් සමඟ තවදුරටත් එම අධිකරණ ඒකාබද්ධ තත්ත්වයෙන් පවත්වාගෙන යෑම ඵලදායී නොවන තත්ත්වයකට පත් වන විට, ඒකාබද්ධ අධිකරණ වෙනම දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණ වශයෙන් වෙන් කොට ස්ථාපිත කිරීම සිදු කරනු ලබනවා. කැස්බෑව, මොරටුව, වලස්මුල්ල, තංගල්ල යනාදී ප්‍රදේශවල පවතින අධිකරණ එයට උදාහරණයි.

අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමේදී අප මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. අධිකරණවල බරපතළ ලෙස කාර්ය මණ්ඩල හිඟයක් තිබෙනවා, පසුගිය වසර දෙක තුළ කිසිම recruitment එකක් වෙලා නැති නිසා. අත්‍යවශ්‍ය පුරප්පාඩු 753ක් හඳුනාගෙන දැන් ඒ සඳහා බඳවා ගන්න කටයුතු කරමින් ඉන්නවා. ඊට අමතරව, උපලේඛනගත නොවන නිලධාරින් ලෙස සිතාසි බෙදන්නන් 151ක්, අධිකරණ සෝෂක හා ප්‍රවේශකයන් 29ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනවා.

ඒ වාගේම, ඔබතුමන්ලා දන්නවා that there is a delay in Government Analyst's reports because there is a severe staff shortage in the Government Analyst's Department. So, to start with, we are in the process of recruiting at least 16 more because, as you know, the remands are overflowing becaue of that delay. එය අපේ අවධානයට යොමු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා දන්නවා, සාමාන්‍යයෙන් වෙනත් රටවල් හා සසඳන කොට ඕනෑම දියුණු රටක ජනගහනයෙන් මිලියනයකට අඩුම ගණනේ නඩුකාරවරු 30ක, 40ක ප්‍රමාණයක් ඉන්නවා කියලා. නමුත්, අපේ රටේ ඉන්නේ ඇත්තටම 19යි. ඒ නිසා මේ වන කොට අපි නිලධාරින් 50දෙනෙකු Judicial Officersලා වශයෙන් බඳවා ගෙන තිබෙනවා. ඒ, 46දෙනෙක් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් සහ තවත් 4දෙනෙක් LT Presidentsලා වශයෙන්.

සමථ මණ්ඩල විශේෂ ආරාවුල් විසඳීමේ පනත යටතේ ඉඩම් ආරාවුල් සමථ මණ්ඩල දිස්ත්‍රික්ක 16ක තිබෙනවා. අපි ඉදිරියේදී ඉතිරි දිස්ත්‍රික්ක 9 තුළත් ඒවා පිහිටුවීමට කටයුතු කරනවා, as an alternative way of reducing the courts' workload.

ඒ වාගේම 2024 අංක 2 දරන සමථ මණ්ඩල **(සංශෝධන)** පනත මඟින් සිවිල් ආරාවුලක් අධිකරණය වෙත යොමු කිරීමට පෙර සමථ මණ්ඩලයට යොමු කළ යුතු මූල්‍ය සීමාව ලක්ෂ 10 දක්වා වැඩි කර තිබෙනවා. මේ වන විට සමථ මණ්ඩලයට ආරාවුල් 126,253ක් ලැබිලා තිබෙනවා.

ඒ වාගේම මහනුවර, කොළඹ සහ මාතර වෙනම සුළු හිමිකම් අධිකරණ පිහිටුවා තිබෙනවා.

අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය සඳහා අධ්‍යයනයක් සිදු කර ඇති අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දැනට ප්‍රමාද වී ඇති අතර, එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවා.

On the Court Automation Programme, we have appointed a committee headed by Justice Arjuna Obeysekere and have identified two court complexes, one, in Negombo and the other in Kandy, to implement the Court Automation Programme, which is another attempt to expedite the process.

ඒ වාගේම, යුක්තිය පසිඳලීමේ ස්වාධීන සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම මඟින් එම ක්‍රියාවලිය පිළිබඳ ජනතා විශ්වාසය ගොඩ නඟා නීතියේ ආධිපත්‍යය සුරැකීමට

අප රජය කටයුතු කරනු ලබනවා. එසේම මිල අධික අධිකරණ ක්‍රියාවලිය ජනතාවට දැරිය හැකි මුදලකට පරිවර්තනය කොට නීතියේ සම ප්‍රවේශය සෑම පුරවැසියෙකුටම සහතික කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අප රජය විසින් ගනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ වැය ශීර්ෂයේදීත් කරුණු ඉදිරිපත් කළා. මේ ප්‍රශ්නය ප්‍රමාද වෙලා අද තමයි අහන්න ලැබුණේ. Court Automation Programme එක සහ digitalization සම්බන්ධව ඔබතුමන්ලාගේ පොරොන්දුවකුත් තිබෙනවා. ඒක ප්‍රමාද වුණා කියලා දැන් ඔබතුමා සඳහන් කළා. ඒ programme එක ප්‍රමාද වෙලා තිබෙනවා කියලා දැන් ඔබතුමා සඳහන් කළා. *[බාධා කිරීමක්]* මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහලා අවසාන කරලා ඉන්නම්.

ගරු ඇමතිතුමනි, අධිකරණ ශාලාවක් ඇතුළත දුරකථනයක් නාද වීම නිසා රක්ෂිත බන්ධනාගාරගත කළ පුද්ගලයෙකු යම් ප්‍රශ්නයක් නිසා මිය ගිය සිද්ධියක් අපි ඊයේ පෙරේදා දැක්කා. මට තේරුම් ගන්න පුළුවන්, අධිකරණ ශාලාවක් ඇතුළත දුරකථනයක් නාද වන එක සුදුසු නැහැ කියලා. ඒක කොහොමටත් සුදුසු දෙයක් නොවෙයි. හැබැයි, අධිකරණ ශාලා ඇතුළේ නීතිඥවරුන්ට දුරකථනයක් විතරක් නොවෙයි, ටැබ් එකක්, ලැප්ටොප් එකක් පාවිච්චි කිරීමේදීත් ප්‍රශ්න ඇති වුණු අවස්ථා මම දැකලා තිබෙනවා. තාක්ෂණය දිහා බලන විධියේ යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවා කියලා මට හිතෙනවා. ඒ සම්බන්ධයෙන් සහ මේ ප්‍රමාදය සම්බන්ධයෙන් මොකක්ද කරන්නේ කියලා පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඇත්තටම Court Automation Programme එක UNDP project එකක් හැටියටයි පටන් අරගෙන තිබුණේ. නමුත්, ඒක අතරමග නැවතිලා තිබුණා. ඒකට හරියටම හේතුවක් සොයා ගන්න අපහසුයි. දැන් නැවත UNDP එකේ සහය යටතේ අපි ඒ Court Automation Programme එක පටන් අරගෙන තිබෙනවා. අපේ ආණ්ඩුව ආවාට පසුව තමයි කමිටුවක් පත් කළේ, Justice Obeysekereගේ ප්‍රධානත්වයෙන්. ඒ අනුව දැන් ඒ project එක නැවත ආරම්භ වෙලා තිබෙනවා. පමාවක් තිබුණා. ඒක අපේ ආණ්ඩුව එන්න කලින් පටන් අරගෙන මඟදී නැවතිච්ච project එකක්. ඉතුරු ටික දැන් කෙරීගෙන යනවා.

ඔබතුමා අහපු දෙවැනි අතුරු ප්‍රශ්නයටත් මම පිළිතුරක් දෙන්නම්.

You are absolutely correct there. I am so glad that you asked that question and I am very happy to answer that. As an Attorney-at-Law, you know the limitations of a Minister of Justice; I am unable to give commands or orders to the Judiciary since it is an independent institution. හැබැයි, මේ ගැටලුව, I have brought to the notice of the Judicial Service Commission. I have prepared a letter to send them and have also spoken to the Judicial Service Commission. They are now looking into the matter. There is a general sentiment among the profession. I should not criticize or say anything wrong against a judge because that is a disciplinary thing. If they have to, the JSC will look into the matter.

Also, I have asked the prison authorities to carry out an investigation as to what happened to that person. So far, that final report has not come, but provisionally, I feel there had been an altercation between him and some other inmates. Anyway, I am not going to give a final answer on that because they are supposed to investigate. But, I am fully with you on that matter. I cannot tell you everything I told the JSC, but I did bring the matter to the attention of the JSC, and I believe the JSC would take appropriate action in that regard.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -153/2024- (2), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
නැහැ, මම එක අතුරු ප්‍රශ්නයයි ඇහුවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමා එක අතුරු ප්‍රශ්නයයි ඇහුවේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. එහෙම නම් ගරු මන්ත්‍රීතුමා අහන්න.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Minister, since it a national issue, with the Hon. Member's permission, may I ask a question based on that?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
If the Hon. Speaker permits. Otherwise, I -

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Sir, since it is a national issue, can I ask a question based on that?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Minister, this issue with regard to - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය - *[බාධා කිරීමක්]*

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Sir, that person was remanded because his phone rang inside the court. That is a very serious issue. An issue like this, I would beg you to discuss with the JSC. If the Contempt of a Court, Tribunal or Institution Act is abused in this manner, citizens' rights are at stake. That person's phone rang inside the court, then, he was remanded and he died in remand. But, the question is - his phone rang inside the court, he was remanded and he died in remand and it could inadvertently happen to anybody; it happens to lawyers day in and day out whether it warrants such action. So, Hon. Speaker, it is a serious issue. Therefore, I beg you to discuss it with the JSC and see that the Contempt of a Court, Tribunal or Institution Act is not abused in this manner.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Speaker, may I quickly answer the point made by the Hon. Musthapha.

Hon. Member, I take your point very seriously since it is a very valid point, giving it the same weight. In fact, the Bar Association and a few others are already in discussion with me with regard to the Contempt of a Court, Tribunal or Institution Act. So, I would suggest very strongly to all the professionals who are interested - even you are most welcome, Hon. Musthapha - to contribute. We will appoint a committee to look into this matter and with the help of the Bar Association, we will come up with a suitable law. Also, I take what happened to that person, him being imprisoned for his phone ringing inside court, as a very serious matter, and that is a matter that the JSC is looking into at the moment. So, I am unable to make a comment on a judge's conduct, as you are aware. But, the JSC is looking into the matter.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Minister, in India, for contempt of court, maximum punishments is -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will move on to the next Question.

## ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර: විස්තර

## இலங்கையிலுள்ள காற்றாலை மின்னுற்பத்தி நிலையங்கள்: விபரம்

## WIND POWER STATIONS ESTABLISHED IN SRI LANKA: DETAILS

153/2024

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සුළං විදුලි බලාගාරයේ ධාරිතාව (installed capacity) වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2022 සිට 2024 දක්වා එම එක් එක් සුළං විදුලි බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාව තුළ සුළං මඟින් විදුලි බලය උත්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அமைக்கப்பட்டுள்ள காற்றாலை மின்னுற்பத்தி நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காற்றாலை மின்னுற்பத்தி நிலையம் ஒவ்வொன்றினதும் நிர்மாணப் பணிகள் தொடங்கப்பட்ட ஆண்டு வெவ்வேறாக யாதென்பதையும்;

(iii) மேற்படி காற்றாலை மின்னுற்பத்தி நிலையம் ஒவ்வொன்றினதும் கொள்ளளவு (installed capacity) வெவ்வேறாக யாதென்பதையும்;

(iv) 2022ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை மேற்படி ஒவ்வொரு காற்றாலை மின்னுற்பத்தி நிலையத்தின் மூலமாக தேசிய மின்சாரக் கட்டமைப்புடன் சேர்க்கப்பட்டுள்ள வலுசக்தியின் அளவு ஒவ்வோர் ஆண்டுவாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(v) இலங்கையில் காற்றாலை மூலமான மின்னுற்பத்தியை அதிகரிக்க எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) number of wind power stations that have been established in Sri Lanka;

(ii) year of commencement of the construction of each of the aforesaid wind power stations, separately;

(iii) installed capacity of each of the said wind power stations, separately;

(iv) capacity of energy added to the National Grid by each of the said wind power stations in each year from 2022 to 2024, separately; and

(v) measures taken to promote wind power generation in Sri Lanka?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ වී දැනට විදුලිය සපයනු ලබන පෞද්ගලික සුළං විදුලි බලාගාර 19ක් සහ ලංකා විදුලිබල මණ්ඩලය සතු එකක් පවතී. ඒ අනුව මුළු සංඛ්‍යාව 20කි.

(ii) එම බලාගාර ඉදිකිරීම් ආරම්භ කරන ලද වර්ෂ ලංකා විදුලිබල මණ්ඩලය සතුව නොමැති අතර, ඒවා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ වූ දිනය - commissioned date - පහත පරිදි වේ.

| | සංවර්ධකයාගේ නම | බලාගාරයේ නම | සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළ දිනය | වානිජ මෙහෙයුම් ආරම්භ කළ දිනය |
|---|---|---|---|---|
| 1 | Senok Wind Power (Pvt.) Ltd. | මාම්පුරි සුළං බලාගාරය | 16/12/2008 | 06/05/2010 |
| 2 | Seguwantivu Wind Power (Pvt.) Ltd. | සේගුවන්තිවු සුළං බලාගාරය | 09/09/2009 | 28/05/2010 |
| 3 | Vidatamunai Wind Power (Pvt.) Ltd. | විඩටමුනායි සුළං බලාගාරය | 09/09/2009 | 20/07/2010 |
| 4 | Nirmalapura Wind Power (Pvt.) Ltd. | නිර්මලපුර සුළං බලාගාරය | 22/12/2009 | 06/10/2010 |
| 5 | Willwind Wind (Pvt.) Ltd. | විල්පිට සුළං බලාගාරය | 16/05/2023 | 21/07/2023 |
| 6 | Ace Wind Power (Pvt.) Ltd. | අඹේවෙල සුළං බලාගාරය | 16/05/2023 | 09/06/2023 |
| 7 | Daily Life Renewable Energy (Pvt.) Ltd. | මදුරන්කුලිය සුළං බලාගාරය | 29/12/2008 | 13/10/2011 |
| 8 | Powergen Lanka (Pvt.) Ltd. | උප්පුදළුව සුළං බලාගාරය | 09/12/2010 | 24/07/2012 |
| 9 | Nala Danavi (Pvt.) Ltd. | එරුම්බුක්කුදල් සුළං බලාගාරය | 27/08/2018 | 28/05/2020 |
| 10 | Senok Wind Energy (Pvt.) Ltd. | මාම්පුරි II සුළං බලාගාරය | 09/12/2010 | 28/07/2012 |
| 11 | Senok Wind Resource (Pvt.) Ltd. | මාම්පුරි III සුළං බලාගාරය | 22/12/2009 | 28/07/2012 |
| 12 | Joule Power (Pvt.) Ltd. | පොලුප්පලෙයි සුළං බලාගාරය | 22/12/2009 | 09/08/2012 |
| 13 | Beta Power (Pvt.) Ltd. | වල්ලිමුනායි සුළං බලාගාරය | 09/12/2010 | 25/06/2013 |
| 14 | Musalpetti Wind Power (Pvt.) Ltd. | මුසල්පෙට්ටි සුළං බලාගාරය | 22/11/2010 | 03/02/2014 |
| 15 | Vayusakthi Vitpaner (Pvt.) Ltd. | චුන්නාකම් 1 සුළං බලාගාරය | 26/07/2011 | 19/05/2014 |
| 16 | Yaal Vayupahavan (Pvt.) Ltd. | චුන්නාකම් 2 සුළං බලාගාරය | 24/12/2013 | 01/12/2014 |
| 17 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 1 සුළං බලාගාරය | 24/12/2013 | 22/12/2014 |
| 18 | Pawan Danavi (Pvt.) Ltd. | කල්පිටිය සුළං බලාගාරය | 07/03/2014 | 07/01/2015 |
| 19 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 2 (2019/002/C-60) සුළං බලාගාරය | 27/08/2018 | 28/05/2020 |

ලංකා විදුලිබල මණ්ඩලය සතුව එක් සුළං විදුලි බලාගාරයක් මන්නාරම ප්‍රදේශයේ පිහිටුවා ඇති අතර, එහි ධාරිතාව මෙගාවොට් 103.5ක් වේ. 2019 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද එම බලාගාරය 2021 අප්‍රේල් මාසයේදී සම්පූර්ණයෙන් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ - commission - කරන ලදී.

(iii)

| | සංවර්ධකයාගේ නම | බලාගාරයේ නම | ව්‍යාපෘතියේ ධාරිතාව (මෙ.වො.) |
|---|---|---|---|
| 1 | Senok Wind Power (Pvt.) Ltd. | මාම්පුරි සුළං බලාගාරය | 10 |
| 2 | Seguwantivu Wind Power (Pvt.) Ltd. | සේගුවන්තිවු සුළං බලාගාරය | 10 |
| 3 | Vidatamunai Wind Power (Pvt.) Ltd. | විඩටමුනායි සුළං බලාගාරය | 10 |
| 4 | Nirmalapura Wind Power (Pvt.) Ltd. | නිර්මලපුර සුළං බලාගාරය | 10 |

[ගරු කුමාර ජයකොඩි මහතා]

| | සංවර්ධකයාගේ නම | බලාගාරයේ නම | ව්‍යාපෘතියේ ධාරිතාව (මෙ.වො.) |
|---|---|---|---|
| 5 | Willwind Wind (Pvt.) Ltd. | විල්පිට සුළං බලාගාරය | 0.85 |
| 6 | Ace Wind Power (Pvt.) Ltd. | අඹේවෙල සුළං බලාගාරය | 3 |
| 7 | Daily Life Renewable Energy (Pvt.) Ltd. | මදුරන්කුලිය සුළං බලාගාරය | 10 |
| 8 | Powergen Lanka (Pvt.) Ltd. | උප්පුදළුව සුළං බලාගාරය | 10 |
| 9 | Nala Danavi (Pvt.) Ltd. | එරුම්බුක්කුදල් සුළං බලාගාරය | 4.8 |
| 10 | Senok Wind Energy (Pvt.) Ltd. | මාම්පුරි II සුළං බලාගාරය | 10 |
| 11 | Senok Wind Resource (Pvt.) Ltd. | මාම්පුරි III සුළං බලාගාරය | 10 |
| 12 | Joule Power (Pvt.) Ltd. | පොලුප්පලෙයි සුළං බලාගාරය | 10 |
| 13 | Beta Power (Pvt.) Ltd. | වල්ලිමුනායි සුළං බලාගාරය | 10 |
| 14 | Musalpetti Wind Power (Pvt.) Ltd. | මුසල්පෙට්ටි සුළං බලාගාරය | 10 |
| 15 | Vayusakthi Vitpaner (Pvt.) Ltd. | චුන්නාකම් 1 සුළං බලාගාරය | 10 |
| 16 | Yaal Vayupahavan (Pvt.) Ltd. | චුන්නාකම් 2 සුළං බලාගාරය | 10 |
| 17 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 1 සුළං බලාගාරය | 10 |
| 18 | Pawan Danavi (Pvt.) Ltd. | කල්පිටිය සුළං බලාගාරය | 9.8 |
| 19 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 2 (2019/002/C-60) සුළං බලාගාරය | 5 |

ලංකා විදුලිබල මණ්ඩලය සතු සුළං විදුලි බලාගාරයෙහි ධාරිතාව මෙ.වො.103.5ක් වේ.

(iv)

| | **සංවර්ධකයාගේ නම** | **බලාගාරයේ නම** | **උත්පාදනය කළ විදුලිය (කි.වො. පැය)** | | |
|---|---|---|---|---|---|
| | | | **2022** | **2023** | **2024** |
| 1 | Senok Wind Power (Pvt.) Ltd. | මාම්පුරි සුළං බලාගාරය | 17,947,443 | 22,760,864 | 44,137,492 |
| 2 | Seguwantivu Wind Power (Pvt.) Ltd. | සේගුවන්තිවු සුළං බලාගාරය | 23,865,026 | 19,827,782 | 17,961,465 |
| 3 | Vidatamunai Wind Power (Pvt.) Ltd. | විඩටමුනායි සුළං බලාගාරය | 25,461,257 | 19,683,822 | 17,833,507 |
| 4 | Nirmalapura Wind Power (Pvt.) Ltd. | නිර්මලපුර සුළං බලාගාරය | 30,955,797 | 30,220,895 | 27,538,214 |
| 5 | Willwind (Pvt.) Ltd. | විල්පිට සුළං බලාගාරය | 278,420 | 214,394 | 181,188 |
| 6 | Ace Wind Power (Pvt.) Ltd. | අඹේවෙල සුළං බලාගාරය | 3,321,376 | 2,329,167 | 3,116,145 |
| 7 | Daily Life Renewable Energy (Pvt.) Ltd. | මදුරන්කුලිය සුළං බලාගාරය | 34,127,450 | 35,690,960 | 28,349,840 |
| 8 | Powergen Lanka (Pvt.) Ltd. | උප්පුදළුව සුළං බලාගාරය | 13,621,720 | 9,642,840 | 11,231,650 |
| 9 | Nala Danavi (Pvt.) Ltd. | එරුම්බුක්කුදල් සුළං බලාගාරය | 13,411,272 | 12,331,296 | 11,500,988 |
| 10 | Senok Wind Energy (Pvt.) Ltd. | මාම්පුරි ii සුළං බලාගාරය | 16,157,632 | 20,384,889 | 15,854,339 |
| 11 | Senok Wind Resource (Pvt.) Ltd. | මාම්පුරි iii සුළං බලාගාරය | 22,475,327 | 25,393,947 | 22,500,247 |
| 12 | Joule Power (Pvt.) Ltd. | පොලුප්පලෙයි සුළං බලාගාරය | 30,425,466 | 32,146,012 | 30,225,464 |
| 13 | Beta Power (Pvt.) Ltd. | වල්ලිමුනායි සුළං බලාගාරය | 31,359,563 | 34,835,418 | 43,075,659 |
| 14 | Musalpetti Wind Power (Pvt.) Ltd. | මුසල්පෙට්ටි සුළං බලාගාරය | 21,356,139 | 23,839,716 | 21,684,466.06 |
| 15 | Vayusakthi Vitpaner (Pvt.) Ltd. | චුන්නාකම් 1 සුළං බලාගාරය | 35,334,624 | 38,841,504 | 36,807,744 |
| 16 | Yaal Vayupahavan (Pvt.) Ltd. | චුන්නාකම් 2 සුළං බලාගාරය | 34,478,256 | 38,552,717 | 36,239,664 |
| 17 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 1 සුළං බලාගාරය | | 56,359,128 | 40,374,360 |
| 18 | Pawan Danavi (Pvt.) Ltd. | කල්පිටිය සුළං බලාගාරය | 21,543,920 | 22,166,210 | 20,192,640 |
| 19 | Hiruras Power (Pvt.) Ltd. | මන්නාරම 2 (2019/002/c-60) සුළං බලාගාරය | | 9,751,224 | 41,263,458 |

ලංකා විදුලිබල මණ්ඩලය සතු මෙ.වො. 103.5 ධාරිතාවක් ඇති සුළං විදුලි බලාගාරය මඟින් ජාතික විදුලිබල පද්ධතියට එක් කරන ලද බලශක්ති ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | එක්කරන ලද බලශක්ති ප්‍රමාණය (ගි.වො. පැය) |
|---|---|
| 2022 | 347.2 |
| 2023 | 391.4 |
| 2024 | 383.0 |

(v)

1. ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සෑම වසර දෙකකට වරක් ප්‍රකාශයට පත් කරන 20 අවුරුදු දිගු කාලීන ජනන සැලැස්ම තුළ වාර්ෂිකව සැලකිය යුතු සුළං විදුලි බලාගාර ධාරිතාවක් ක්‍රමානුකූලව ජාතික පද්ධතියට අවශෝෂණය කරගත හැකි පරිදි සැලසුම් කර ඇත. දැනට මහජන උපයෝගිතා කොමිසමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති 2025-2044 ජනන සැලසුම අනුව 2030 වනවිට 860 MW ධාරිතාවක් සහිත සුළං බලාගාර පද්ධතියට අලුතින් එක්වීමට නියමිතය. මෙම බලාගාර තරඟකාරී ටෙන්ඩර් ක්‍රම මඟින් ප්‍රසම්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

2. කුඩා පරිමාණ පුනර්ජනනීය බලාගාර ඉදිකිරීම සඳහා වන අනුමැතීන් ලබා දීමේදී ඇති වන ප්‍රමාදවීම් වළක්වා ගැනීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය - SEA - සහ ලංකා විදුලිබල මණ්ඩලය - CEB - ඒකාබද්ධව ක්‍රියා පටිපාටි සකස් කර ගැනීම.

3. වැඩි වශයෙන් පුනර්ජනනීය බලශක්තිය පද්ධතියට අවශෝෂණය කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සැලසුම් දිගු කාලීන සම්ප්‍රේෂණ සැලසුම් යටතේ ප්‍රකාශයට පත් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

4. ජාතික විදුලබල පද්ධතියට සුළං විදුලි බලාගාර හරහා බලශක්තිය එක්කර ගැනීම පිණිස පවතින නීත්‍යානුකූල රාමුව තුළ විවිධ ප්‍රමාණයේ බලාගාර සඳහා විවිධ මිලදී ගැනීම් ක්‍රම භාවිත කරනු ලබයි. එනම්, සුළං විදුලි බලාගාර සඳහා ද විවෘත පුනර්ජනනීය බලශක්තිය හරහා විදුලිය උත්පාදනය විවිධ ක්‍රම මඟින් ප්‍රසම්පාදනය කෙරේ. එනම්, ස්ථාවර පෝෂක ගාස්තු - feed-in-tariff - සහ තරගකාරී ලංසු තැබීම් යන ප්‍රසම්පාදන ක්‍රමවේද

- උපරිමය මෙ.වො.10ට යටත්ව ඕනෑම ස්ථානයක ස්ථාපිත කළ හැකි වන පරිදි සුළං විදුලි බලාගාර සඳහා සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් -SPPA- යටතේ ඒකකයකට රුපියල් 29.86ක මිලක් ප්‍රකාශයට පත් කර ඇත.
- ඊට අමතරව, සුළං බලාගාරවලින් ජනනය වන විදුලිය තරගකාරී ලංසු තැබීම් මඟින් කාණ්ඩ දෙකක් යටතේ මිලදී ගනු ලැබේ. එනම්, මෙගාවොට් 10 හෝ ඊට අඩු කුඩා පරිමාණ බලාගාර සහ මෙගාවොට් 10ට වැඩි මහා පරිමාණ බලාගාර.
- එලෙස ජාතික විදුලිබල පද්ධතියට නුදුරේදී එක්වීමට නියමිත සුළං විදුලි බලාගාර පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| බලාගාරයේ නම | ධාරිතාව (මෙගා වොට්) | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළ දිනය | විදුලි බලාගාරය ජාතික පද්ධතියට එක් කිරීමට අපේක්ෂිත වර්ෂය | සටහන |
|---|---|---|---|---|
| **01. සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (SPPA) හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති** | | | | |
| ආලංකුඩා සුළං බල ව්‍යාපෘතිය | 10 | 12/6/2023 | 2026 | |
| මුල්ලිපුරම සුළං බල ව්‍යාපෘතිය | 10 | 6/2/2024 | 2026 | |
| **02. මෙගාවොට් 10 සහ ඊට අඩු ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය (BOO) පදනම යටතේ ප්‍රසම්පාදනය කළ ව්‍යාපෘති** | | | | |
| මන්නාරම මෙගාවොට් 5 සුළං බලාගාරය 1 | 5 | 18- සැප්- 24 | 2025 | |
| මන්නාරම මෙගාවොට් 5 සුළං බලාගාරය 2 | 5 | | | |
| මන්නාරම මෙගාවොට් 5 සුළං බලාගාරය 3 | 5 | | | |
| මන්නාරම මෙගාවොට් 5 සුළං බලාගාරය 4 | 5 | | | |
| මාදම්පේ මෙගාවොට් 5 සුළං බලාගාරය 1 | 5 | අත්සන් කිරීමට නියමිතයි | 2026 | |
| මාදම්පේ මෙගාවොට් 5 සුළං බලාගාරය 2 | 5 | | | |
| **03. ඉදිකිරීම්, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය (BOO) පදනම යටතේ ප්‍රසම්පාදනය කළ මහා පරිමාණ ව්‍යාපෘති** | | | | |
| මෙගාවොට් 50 මන්නාරම සුළං බලාගාරය (මන්නාරම අදියර I - දිගුව | 50 | | 2026 | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු ප්‍රදානය කිරීමට නියමිතව ඇත. |
| මුල්ලිකුලම්හි මෙගාවොට් 100 (2 x 50) සුළං බලාගාරය | 100 | | 2027 | ටෙන්ඩර් කැඳවීම සඳහා මූලික කටයුතු කරමින් ඇත. |

(ආ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු ඇමතිතුමනි, විස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

වර්තමාන රජය බලයට පත්වීමෙන් පසුව අලුතින් සුළං බලාගාර සඳහා ටෙන්ඩර් කැඳවීම් හෝ බලපත්‍ර ලබා දීම සිදු වුණේ නැහැ. අදානි සමාගමට අදාළ ඒ මූලික එකඟතා සහිත ව්‍යාපෘතියෙන් ඉවත්වීමෙන් පසුව මන්නාරමේ, පූනරීන්වල වාගේම ලංකාවේ තවත් ප්‍රදේශ ගණනාවකම ගොඩබිමේත්, මහ මුහුදේත් සුළං විදුලිබලය පිළිබඳ විශාල විභවයක් තිබෙන බව අපි දන්නවා. ඒ සඳහා අවශ්‍ය කරන දත්ත අප සතුව තිබෙනවා. දැන් මේ සියලු තත්ත්වයන් තුළ කඩිනමින් වැඩි පුනර්ජනනීය බලශක්තියක් අපේ පද්ධතියට එකතු කර ගැනීම විදුලි බිල අඩු කිරීමට හේතුවක් වෙනවා. ඒ වාගේම එය අපේ බලශක්ති ආරක්ෂාව සම්බන්ධයෙනුත් වැදගත් වෙනවා. මේ තත්ත්වය තුළ තරගකාරී ටෙන්ඩර් කැඳවීම් සඳහා සූදානම් කරලා තිබෙන බලාගාර මොනවාද, ඒ ස්ථාන මොනවාද සහ ප්‍රමාණයන් මොනවාද කියා අපි දැනගන්න කැමැතියි. මොකද, තරගකාරී ක්‍රමවේද තුළින් තමයි ජාත්‍යන්තර සහ දේශීය ආයෝජකයන්ගේ සහයෝගය ලබාගෙන අඩුම මිලක් අපිට ලබා ගන්න පුළුවන් වන්නේ. ඒ වාගේම, මේ අලුත් බලාගාර මොනවාද, ඒවා සඳහා ටෙන්ඩර් කරන්නේ කවදාද, ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන බලාගාරවල ධාරිතාව කොපමණද කියලාත් අපි දැනගන්න කැමතියි, ගරු ඇමතිතුමනි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, දැනට ටෙන්ඩර් එකක් float කර තිබෙනවා. ඒක ක්‍රියාත්මකව පවතිනවා. මුල්ලිකුලම්හි මෙගාවොට් 50ක සුළං බලාගාර දෙකක් -මෙගාවොට් 100ක්- සඳහා දැනට ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ සඳහා මිල ගණන් ලබා ගනිමින් පවතිනවා. ඊට අමතරව මන්නාරම සුළං බලාගාරයේ මෙගාවොට් 234ක් නිපදවීම සඳහා අවශ්‍ය මූලික අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු පටන් ගන්න ලැහැස්ති කරලා තිබෙනවා. ඒ වාගේම පූනරීන් සුළං බලාගාරයේ මෙගාවොට් 250ක් නිපදවීම සඳහා අදාළ මූලික feasibility study එක අපි සිදු කර අවසන් කරලා තිබෙනවා. ඒ transmission line එකට අවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ කටයුතුවල අපි නිරතවෙලා සිටිනවා.

ඇත්තටම ඒකත් ටෙන්ඩර්වලට ඉදිරිපත් කරන්න තිබෙනවා. ඊට අමතරව ශක්‍යතා අධ්‍යයන වාර්තා කැඳවා තිබෙනවා, වෙරළිල් සුළං විදුලිබල ව්‍යාපෘතිය වාගේම තවත් කිහිපයක. ඒවායේ වැඩකටයුතු තවම ඉවර නැති හින්දා අපිට ඒ ගැන ප්‍රකාශ කරන්න බැහැ. කොහොම වුණත්, මේ අවුරුද්ද ඇතුළත මෙගාවොට් 400කට ආසන්නව ටෙන්ඩර් කැඳවන්න අපි කටයුතු කරගෙන යනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විදුලි ඒකකයක මිල පිළිබඳ කාරණය අද සමාජයේ විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. විදුලි ඒකකයක මිල අධික වීම නිසා කර්මාන්ත අධෛර්යවත්වෙලා තිබෙනවා. ඒ වාගේම පාරිභෝගිකයන්ගේ ජීවිතවලට විශාල ගැටලුවක් ඇතිවෙලා, ජීවන වියදම වැඩිවෙලා තිබෙනවා. එමෙන්ම රටේ අනාගත සංවර්ධනයටත් විශාල බාධාවක් ඇතිවෙලා තිබෙනවා. අපිට දැනගන්න ලැබුණා, IMF එක සමඟ ඇති කරගෙන තිබෙන ගිවිසුමේ අපි මෙතෙක් නොදැන සිටි කොන්දේසි අනුව නැවත වරක් විදුලි බිල වැඩි කිරීමට රජය කටයුතු කරනවා කියලා. ගරු ඇමතිතුමනි, දැන් අපේ රට පාලනය කරන්නේ IMF එකද, එහෙම නැත්නම් මේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ ක්‍රියාත්මක වන මේ ආණ්ඩුවද? ඔබතුමාගේ රජය ජාත්‍යන්තර බලපෑමට යටත්ව මේ විදුලි බිල සම්බන්ධයෙන් පාරිභෝගිකයා පීඩාවට පත් කරන්න කටයුතු කරනවා නම් අපිට, අපේ ස්වාධිපත්‍යය අහිමි වෙලාද තිබෙන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන්ද, විදුලි බිල සම්බන්ධයෙන් තිබෙන පාලනයක් නැතිකමේ ප්‍රශ්නය ගැන? කොහොමද, අපි විදුලි බිල සම්බන්ධයෙන් පාලනයක් ඇති කරගන්නේ?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපිටත් ඕනෑ, ගෙවල්වලට වාගේම කර්මාන්ත සඳහා අවම මිලට - least cost එකට - විදුලිය ලබා දෙන්නයි. ඒක තමයි අපේ ප්‍රමුඛ අරමුණ. ඒ වෙනුවෙන් තමයි අපි ගොඩක් වැඩ කරගෙන යන්නේ. සමහර වෙලාවට ඔබතුමන්ලාම අනෙක් පැත්තට කෑ ගහනවා, ඇයි අරවා අඩු කරන්නේ, මේවා අඩු කරන්නේ කියලා. අපිට විදුලි ඒකකයක් ගන්න මිල අඩු කරලා තමයි පාරිභෝගිකයාට දෙන මිලත් අඩු කරන්න පුළුවන් වෙන්නේ. අර වී කිලෝවක් රුපියල් 150ට අරගෙන හාල් කිලෝවක් රුපියල් 130ට ඉල්ලුවා වාගේ අපිට මේ වැඩකටයුත්ත කරන්න බැහැ. එක පැත්තකින් ඔබතුමන්ලාම කියනවා, සමහර දේවල් අඩු කරනවා කියලා. ඒ වාගේම, අපි විදුලිය ඒකකයක් ගන්න මිල අඩු කරලා තමයි පාරිභෝගිකයාට දෙන මිලත් අඩු කරන්න ඕනෑ. ඒක හින්දා අනිවාර්යයෙන් විදුලි බිල අඩු කිරීමේ හෝ වැඩි නොකර සිටීමේ අරමුණින් තමයි අපි වැඩ කරගෙන යන්නේ. මොකද, මේ තිබෙන තත්ත්වයන් එක්කයි අපි කටයුතු කරන්නේ. අපි මේ මොහොතේ solar power ඒකකයක් රුපියල් 37ට, රුපියල් 27ට අරගෙන තමයි කර්මාන්තවලට රුපියල් 6 ඉඳන් රුපියල් 13 දක්වා වූ මිලකට unit එකක් දෙන්නේ. IMF එක කියනවා කියලා අපි විදුලි බිල කොතැනකදීවත් වැඩි කරලා නැහැ. අපි එහෙම තීරණයක් අරගෙනත් නැහැ. මොකද, ලංකා විදුලිබල මණ්ඩලය තමන්ගේ ගණනයන් තවම භාර දීලාත් නැහැ; ඒ කටයුත්ත අවසන් කරලාත් නැහැ. ලබන මාසයේ මුල විතර වෙනකොට තමයි මහජන උපයෝගිතා කොමිසමේ තීරණය අනුව ඒ තීන්දුව ගන්නේ. අපේ ආණ්ඩුවවත්, ලංකා විදුලිබල මණ්ඩලයවත් තවම ඒ ගැන තීරණය කරලා නැහැ. මොකද, අපි මේ මාස 5, 6 ඇතුළත අපිට ගන්න පුළුවන් උපරිම ලාභදායී පැත්ත අරගෙන ඊට පස්සේ තමයි ඒ ගැන බලන්නේ. අපි ඉදිරි මාස 6කට forecast එක බලනකොට සුබවාදීව ඒ ගැන බලන්න පුළුවන්. සාමාන්‍යයෙන් බැලුවොත්, ඒ කාලය තුළ wet season එකක් තමයි ලංකාවේ තිබෙන්නේ.

අපි ඒ forecast එකත් අරගෙන සුබවාදීව හිතනවා, මිල වැඩි කිරීමකට නොයා ඉන්න හැකිවේ යැයි කියලා. ඒ ස්ථාවරයේ තමයි අපි ඉන්නේ. හැබැයි, තවත් ප්‍රශ්න තිබෙනවා. ණය තිබෙනවා. දැන් ණය නොගෙවා කොටසක් ඉතුරුවෙලා තිබෙනවා. ගෙවිය යුතු ණය පංගුවක් එකතු වෙන්න තිබෙනවා, විදුලි බිලට. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. මිල වැඩි කරනවාද, නැද්ද කියන කාරණය ගැන අපට ලබන මාසයේ මුල වනකොට හරියටම කියන්න පුළුවන්. ඇත්තෙන්ම කිව්වොත්, ආණ්ඩුව විදියට අපි ඒ වාගේ negative තැනක නැහැ. අපටත් ඕනෑ විදුලි බිල තවත් අඩු කරලා, මිල ස්ථාවරව පවත්වාගෙන යන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -156/2024- (1), ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -192/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2022-2024 දක්වා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ නිල විදේශ සංචාර: විස්තර

## 2022 முதல் 2024 வரையான முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹவினது உத்தியோகபூர்வ வெளிநாட்டு விஜயங்கள்: விபரம்

## FOREIGN OFFICIAL VISITS BY FORMER PRESIDENT RANIL WICKREMESINGHE FROM 2022-2024: DETAILS

259/2024

**5. ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා කාලය තුළදී හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ නිල විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදේශ සංචාරය කරන ලද රට, අරමුණ, ශ්‍රී ලංකාවට හිමි වූ ප්‍රතිලාභ, හිටපු ජනාධිපතිවරයාට අමතරව රජයේ වියදමින් සම්බන්ධ වූ පුද්ගලයන් සහ ඔවුන් සම්බන්ධ කර ගැනීමේ අරමුණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කරන ලද සම්පූර්ණ වියදම කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சர் மற்றும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ பங்கேற்றுள்ள உத்தியோகபூர்வ வெளிநாட்டு விஜயங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு வெளிநாட்டு விஜயமும் மேற்கொள்ளப்பட்டுள்ள நாடு, நோக்கம், இலங்கைக்கு கிடைத்த நன்மைகள், முன்னாள் சனாதிபதிக்கு மேலதிகமாக அரசாங்க செலவில் பங்கேற்றுள்ள நபர்கள் மற்றும் அவர்களை இணைத்துக்கொண்டதன் நோக்கம் ஆகியன வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி வெளிநாட்டு விஜயங்களுக்காக மேற் கொள்ளப்பட்டுள்ள மொத்தச் செலவு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of foreign official visits made by Former President Ranil Wickremesinghe during the period from 2022 to 2024;

(ii) country of visit, objective, benefits accrued to Sri Lanka, those persons who were part of the visit on Government expense other than the former President, and the purpose of making each of them part of it, separately in respect of each visit overseas; and

(iii) total expenditure borne for these visits overseas?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා 2022 වර්ෂයේ නිල විදේශ සංචාර 4ක්, 2023 වර්ෂයේ නිල විදේශ සංචාර 14ක්, 2024 වර්ෂයේ නිල විදේශ සංචාර 5ක් වශයෙන් නිල විදේශ සංචාර 23ක් සඳහා සහභාගි වී ඇත.

ඒ අනුව, එම නිල විදේශ සංචාර පිළිබඳ තොරතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

| **2022 වර්ෂය - නිල විදේශ සංචාර 04** | | |
|---|---|---|
| අංකය | රට | අරමුණ |
| 01 | එක්සත් රාජධානිය | දෙවන එලිසබෙත් මහ රැජිනගේ රාජකීය අවමංගල්‍ය උත්සවයට සහභාගි වීම. |
| 02 | ජපානය | ජපාන හිටපු අග්‍රාමාත්‍යතුමාගේ රාජ්‍ය අවමංගල්‍ය උත්සවයට සහභාගි වීම. |
| 03 | පිලිපීනය/මැනිලා | ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) 55 වන පාලක මණ්ඩල වාර්ෂික සමුළුව සඳහා සහභාගි වීම. |
| 04 | ඊජිප්තුව, කයිරෝ | COP 27, UNFCCC ලෝක නායක සමුළුවට සහභාගි වීම. |
| **2023 වර්ෂය - නිල විදේශ සංචාර 14** | | |
| 05 | එක්සත් රාජධානිය | තුන්වෙනි චාල්ස් මහරජුගේ රාජාභිෂේකය සඳහා සහභාගි වීම. |
| 06 | සිංගප්පූරුව | සංචාරයේ අරමුණ පැහැදිලි නැත. |
| 07 | ජපානය | Nikkei Future of Asia සමුළුවට සහභාගි වීම. |
| 08 | එක්සත් රාජධානිය, ලන්ඩනය | 2023 IDU සමුළුවට සහභාගි වීම. |
| 09 | ප්‍රංශය | 2023 නව ගෝලීය මූල්‍ය ගිවිසුමක් සඳහා වන සමුළුවට සහභාගි වීම. |
| 10 | ඉන්දියාව | ශ්‍රී ලංකා ජනාධිපති ධුරය භාර ගැනීමෙන් අනතුරුව සිදුකරන ලද ද්විපාර්ශ්වික සංචාරයට සහභාගි වීම. |
| 11 | සිංගප්පූරුව | රාජකාරි සංචාරය |
| 12 | කියුබාව/හවානා | "වර්තමාන සංවර්ධන අභියෝග" පිළිබඳ "G 77 හා චීනය" රාජ්‍ය නායකයන්ගේ සමුළුවට සහභාගි වීම. |
| 13 | නිව්යෝර්ක් | එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 78 වන ඉහළ පෙළ සැසිවාරයට සහභාගි වීම. |
| 14 | එක්සත් රාජධානිය | 2023.09.22වන දින වොල්වහැම්ටන් විශ්වවිද්‍යාලයේ පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවයකට මෛත්‍රී වික්‍රමසිංහ මහත්මිය සමඟ සහභාගි වී ඇති බව පෙනී යයි. |
| 15 | ජර්මනිය/බර්ලින් | බර්ලින් ගෝලීය සමුළුවට සහභාගි වීම. |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| 2022 වර්ෂය - නිල විදේශ සංචාර 04 | | |
|---|---|---|
| අංකය | රට | අරමුණ |
| 16 | චීනය | ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ තෙවන "එක් තීරයක් එක් මාවතක්" සමුළුවට සහභාගි වීම. |
| 17 | මාලදිවයින | අතිගරු ආචාර්ය මොහොමඩ් මයිස්ෂු මැතිතුමාගේ පදවි ප්‍රාප්ති උත්සවයට සහභාගි වීම. |
| 18 | ඩුබායි/එක්සත් අරාබි එමීර් රාජ්‍යය | UNFCCC (COP 28) සමුළුවෙහි පක්ෂ සම්මේලනය සඳහා සහභාගි වීම. |
| 2024 වර්ෂය - නිල විදේශ සංචාර 05 | | |
| 19 | ස්විට්සර්ලන්තය | ලෝක ආර්ථික සමුළුවේ සභාපතිතුමන්ගේ ආරාධනය පරිදි ලෝක ආර්ථික සමුළු වාර්ෂික හමුවට සහභාගි වීම. |
| 20 | උගන්ඩාව | නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ 19වන රාජ්‍ය නායක සමුළුවට සහභාගි වීම. |
| 21 | ඕස්ට්‍රේලියාව | 7 වන ඉන්දීය සාගර සමුළුව සඳහා සහභාගි වීම. |
| 22 | ඉන්දුනීසියාව | 10 වන ලෝක ජල සමුළුවේ ඉහළ පෙළ හමුව සඳහා සහභාගි වීම. |
| 23 | ඉන්දියාව | ඉන්දීය රජයේ ආරාධනය පරිදි ගරු ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ දිවුරුම් දීමේ උත්සවයට සහභාගි වීම. |

(ii) මෙම විදේශ සංචාර සඳහා ජනාධිපතිවරයාට අමතරව රජයේ වියදමින් සම්බන්ධ වූ පුද්ගලයන් ගණන පහත පරිදි වේ.

- 2022 වර්ෂයේදී සංචාර 04 සඳහා පුද්ගලයන් 63ක් ද,
- 2023 වර්ෂයේදී සංචාර 14 සඳහා පුද්ගලයන් 252ක් ද,
- 2024 වර්ෂයේදී සංචාර 05 සඳහා පුද්ගලයන් 111ක් ද සහභාගි වී ඇත.

විදේශ සංචාරය කරන ලද රට, අරමුණ, ශ්‍රී ලංකාවට හිමි වූ ප්‍රතිලාභ ඔවුන් සම්බන්ධ කර ගැනීමේ අරමුණ ඇමුණුම 01හි පැහැදිලිව දක්වා ඇත.

(iii)

| වර්ෂය | විදේශ සංචාර ගණන | වියදම (රුපියල්) |
|---|---|---|
| 2022 | 04 | 129,316,753.66 |
| 2023 | 14 | 577,964,372.83 |
| 2024 | 05 | 300,065,855.17 |

- ඒ අනුව, ඉහත සඳහන් කළ විදේශ සංචාර සඳහා වැය වී ඇති මුළු මුදල රුපියල් 1,007,346,981.66කි.
- ඉහත සංචාරවලට අමතරව, 2022 සිට 2024 දක්වා කාලපරිච්ඡේදය තුළ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පෞද්ගලිකව සහභාගි නොවූ නමුත්, එතුමා නියෝජනය කරමින් නියෝජිතයෙකු/නියෝජිතයින් සහභාගි වූ විදේශ සංචාර ගණන 19ක් ලෙස හා එම සංචාර සඳහා වැය වී ඇති මුළු මුදල රුපියල් 19,821,797.09ක් ලෙස වාර්තා වී ඇත. විස්තර ඇමුණුම 03හි දක්වා ඇත.
- ඒ අනුව, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා නිල වශයෙන් සහභාගි වූ සංචාර මෙන්ම එතුමා නියෝජනය කරමින් නියෝජිතයින් සහභාගි වූ විදේශ සංචාර වෙනුවෙන් දරන ලද සමස්ත වියදම රුපියල් 1,027,168,778.75ක් ලෙස වාර්තා වී ඇත. විස්තර ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

## දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සහ භාණ්ඩ හා සේවා අපනයනය: විස්තර

මொத்த உள்நாட்டு உற்பத்தி வளர்ச்சி மற்றும் பண்டங்கள், சேவைகளின் ஏற்றுமதி: விபரம்

GDP GROWTH AND EXPORT OF COMMODITIES AND SERVICES: DETAILS

306/2024

**6. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වසර 20 තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් - SLR - හා ඇමෙරිකානු ඩොලර්වලින් - USD - සහ එම කාලය තුළ වර්ධන වේගය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි වසර 5 සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත වර්ධනය සහ වර්ධන අනුපාතයේ ප්‍රක්ෂේපණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 20 තුළ අපනයනවල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල් හා ඇමෙරිකානු ඩොලර්වලින් සහ එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඉහළම අපනයන වෙළෙඳ භාණ්ඩ 20 කවරේද;

(v) පසුගිය වසර 10 තුළ සේවාවලින් ලැබුණු මුළු ආදායම ඇමෙරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවට වැඩිම ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණයක් උපයා දෙන ලද සේවා අංශ 10 කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උපයන ලද ඇමෙරිකානු ඩොලර්වලින් කොපමණ ප්‍රමාණයක් විදේශයන්හි රඳවා තිබේද;

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(ii) ඇමෙරිකානු ඩොලර් විදේශයන්හි රඳවා තැබිය හැකි නිල කාලය කොපමණද;

(iii) විනිමය පාලන නියම උල්ලංඝනය කරමින් විදේශයන්හි මුදල් රඳවා තබා ගන්නා පුද්ගලයින්ට හෝ ආයතනවලට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 20 வருடங்களில் இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்தியின் மொத்தப் பெறுமதி இலங்கை ரூபாய் (SLR) மற்றும் ஐக்கிய அமெரிக்க டொலர்களில் (USD) மற்றும் அக்காலப்பகுதியில் வளர்ச்சி வீதம் யாதென்பதை வெவ்வேறாகவும்;

(ii) எதிர்வரும் 5 வருடங்களுக்கு எதிர்பார்க்கப்படும் மொத்த உள்நாட்டு உற்பத்தி வளர்ச்சி மற்றும் கணிப்பிடப்பட்ட வளர்ச்சி வீதம் யாதென்பதை வெவ்வேறாகவும்;

(iii) கடந்த 20 வருடங்களுக்கான ஏற்றுமதிகளின் மொத்தப் பெறுமதியை இலங்கை ரூபாய் மற்றும் ஐக்கிய அமெரிக்க டொலர்களிலும் மற்றும் மொத்தத் தேசிய உற்பத்தியில் அதன் சதவீதம் யாதென்பதை வெவ்வேறாகவும்;

(iv) இலங்கையில் முதல் 20 இடங்களில் காணப்படும் ஏற்றுமதிப் பண்டங்கள் யாதென்பதையும்;

(v) கடந்த 10 ஆண்டுகளாக சேவைகளிலிருந்து கிடைக்கப்பெற்ற மொத்த வருமானத் தொகை ஐக்கிய அமெரிக்க டொலர்களில் யாதென்பதை வெவ்வேறாகவும்;

(vi) இலங்கைக்கு ஐக்கிய அமெரிக்க டொலர்களை ஈட்டித்தந்த முதல் பத்து சேவைத் துறைகள் யாதென்பதை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வெளிநாடுகளில் வைக்கப்பட்டுள்ள சம்பாதிக்கப் பட்ட ஐக்கிய அமெரிக்க டொலர்களின் தொகை யாதென்பதையும்;

(ii) வெளிநாடுகளில் ஐக்கிய அமெரிக்க டொலரை உத்தியோகபூர்வமாகத் தக்கவைத்துக் கொள்வதற்காக சட்டரீதியாக அனுமதிக்கப்பட்ட காலஎல்லை யாதென்பதையும்;

(iii) செலாவணிக் கட்டுப்பாட்டு ஒழுங்குவிதிகளை மீறி வெளிநாடுகளில் பணத்தை தக்க வைத்திருக்கும் தனியாட்கள் அல்லது நிறுவனங் களுக்கு எதிராக ஆரம்பிக்கப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) total value of the GDP of Sri Lanka in Sri Lankan Rupees (SLR) and United States Dollars (USD) along with the growth rate for the past 20 years, separately;

(ii) expected GDP growth and the growth rate projection for the next five years, separately;

(iii) total value of exports in SL Rupees and US Dollars along with its percentage of GDP for the past 20 years, separately;

(iv) top twenty export commodities of Sri Lanka;

(v) total earnings from services in US Dollars for the past 10 years, separately; and

(vi) top ten service sectors which generated US Dollars for Sri Lanka?

(b) Will he also inform this House -

(i) out of the US Dollars earned, the amount kept overseas;

(ii) the official period for which US Dollars could be retained overseas; and

(iii) the action initiated against individuals or entities retaining money overseas, violating exchange control regulations?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ගරු මන්ත්‍රීතුමනි, මා හිතනවා, ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කර ඇති කියලා. මෙම ගණනය කිරීමේදී පදනම් වර්ෂ එක එක විධියට සූදානම් කරගෙන තිබෙනවා. පසුගිය වසර 20 තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් - SL Rupeesවලින් - හා ඇමෙරිකානු ඩොලර්වලින් - US Dollarsවලින් - සහ එම කාලය තුළ වර්ධන වේගය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01හි සඳහන් වේ.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

ඇමුණුම 01

1 සංඛ්‍යා සටහන: දළ දේශීය නිෂ්පාදිතය (අ)

| වර්ෂය | පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. මිලියන) | පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (එ.ජ.ඩො. මිලියන) (ආ) | මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතය (%) |
|---|---|---|---|
| 2004 | 2,090,841 | 20,663 | 5.4 |
| 2005 | 2,452,782 | 24,406 | 6.2 |
| 2006 | 2,938,680 | 28,267 | 7.7 |
| 2007 | 3,578,688 | 32,350 | 6.8 |
| 2008 | 4,410,682 | 40,714 | 6.0 |
| 2009 | 4,835,293 | 42,066 | 3.5 |
| 2010 | 6,413,668 | 56,726 | 8.0 |
| 2011 | 7,219,106 | 65,293 | 8.4 |
| 2012 | 8,732,463 | 68,434 | 9.1 |
| 2013 | 9,592,125 | 74,294 | 3.4 |
| 2014 | 10,361,151 | 79,359 | 5.0 |
| 2015 | 11,566,987 | 85,110 | 4.2 |
| 2016 | 12,812,975 | 87,992 | 5.1 |
| 2017 | 14,387,319 | 94,356 | 6.5 |
| 2018 | 15,351,933 | 94,749 | 2.3 |
| 2019 | 15,910,976 | 88,989 | -0.2 |
| 2020 | 15,646,254 | 84,420 | -4.6 |
| 2021 (ඇ) | 17,612,370 | 88,611 | 4.2 |
| 2022 (ඇ) | 24,063,762 | 76,845 | -7.3 |
| 2023 (ඇ) | 27,629,665 | 84,403 | -2.3 |

(අ) ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂ 2002, 2010 සහ 2015 වර්ෂවල දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කර ඇත.

දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු පහත සඳහන් වර්ෂ මත පදනම් වේ.

2004-2009: පදනම් වර්ෂය 2002

2010-2014: පදනම් වර්ෂය 2010

2015-2023: පදනම් වර්ෂය 2015

(ආ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදාගෙන ද.දේ.නි., එ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.

(ii) ඉදිරි වසර 5 සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත වර්ධනය සහ වර්ධන අනුපාතයේ ප්‍රක්ෂේපණය අංශ තුනක් ඔස්සේ බලන්නට පුළුවන්. That is from the angles of real GDP growth, GDP deflator growth and nominal GDP growth. Hon.Member, in addition, the nominal GDP in billions of rupees is given in Annex 02.

Annex 02

Expected GDP Growth and Growth Rate Projection for next five years.

| Indicator | 2025 | 2026 | 2027 | 2028 | 2029 | 2030 |
|---|---|---|---|---|---|---|
| Real GDP Growth (%) | 3.5 | 3.1 | 3.1 | 3.1 | 3.1 | 3.1 |
| GDP Deflator Growth (%) | 3.6 | 5.3 | 5.1 | 5.0 | 5.0 | 5.0 |
| Nominal GDP Growth (%) | 7.1 | 8.5 | 8.4 | 8.3 | 8.3 | 8.3 |
| Nominal GDP (In Billions of Rs.) | 32,036 | 34,754 | 37,664 | 40,779 | 44,163 | 47,826 |

(iii) පසුගිය වසර 20 තුළ අපනයනවල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල් සහ ඇමෙරිකානු ඩොලර්වලින් සහ එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් ඇමුණුම 03හි දක්වා ඇත.

ඇමුණුම 03

2 සංඛ්‍යා සටහන: අපනයනවල මුළු වටිනාකම

| වර්ෂය | අපනයන (රුපියල් මිලියන) | අපනයන (එක්සත් ජනපද ඩොලර් මිලියන) | දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2005 | 638,276 | 6,347 | 26.0 |
| 2006 | 716,579 | 6,883 | 24.4 |
| 2007 | 845,683 | 7,640 | 23.6 |
| 2008 | 878,499 | 8,111 | 19.9 |
| 2009 | 813,911 | 7,085 | 16.8 |
| 2010 | 937,737 | 8,626 | 14.6 |
| 2011 | 1,167,588 | 10,559 | 16.2 |
| 2012 | 1,245,531 | 9,774 | 14.3 |
| 2013 | 1,344,054 | 10,394 | 14.0 |
| 2014 | 1,453,176 | 11,130 | 14.0 |
| 2015 | 1,431,431 | 10,546 | 12.4 |
| 2016 | 1,500,766 | 10,310 | 11.7 |
| 2017 | 1,732,440 | 11,360 | 12.0 |
| 2018 | 1,933,533 | 11,890 | 12.6 |
| 2019 | 2,134,796 | 11,940 | 13.4 |
| 2020 | 1,858,927 | 10,047 | 11.9 |
| 2021 | 2,486,943 | 12,499 | 14.1 |
| 2022 | 4,234,913 | 13,106 | 17.6 |
| 2023 | 3,899,427 | 11,911 | 14.1 |
| 2024 (තාවකාලික) | 3,857,195 | 12,772 | නැත |

(iv) කෘෂිකාර්මික අපනයන, කාර්මික අපනයන, ඛනිජමය කොට්ඨාසයට අයත් අපනයන සහ වර්ග නොකළ අපනයන වියියට අයිතම වශයෙන් ඒ ඉල්ලා තිබෙන විස්තර ඇමුණුම 04හි දැක්වෙනවා.

ඇමුණුම 04

**3 සංඛ්‍යා සටහන: ඉහළම අපනයන වෙළඳ භාණ්ඩ එ.ජ.ඩො. මිලියනවලින් (2021-2024)**

| අයිතමය | 2021 | 2022 | 2023 | 2024 (අ) |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | **2,730** | **2,568** | **2,567** | **2,775** |
| තේ | 1,324 | 1,259 | 1,310 | 1,436 |
| කුළුබඩු | 455 | 369 | 393 | 455 |
| මුහුදු ආහාර | 274 | 269 | 263 | 233 |
| පොල් මද හැර අනෙකුත් පොල් නිෂ්පාදිත | 224 | 220 | 188 | 221 |
| පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත | 201 | 180 | 148 | 195 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 149 | 179 | 181 | 154 |
| එළවළු | 29 | 27 | 28 | 29 |
| ස්වභාවික රබර් | 42 | 41 | 28 | 26 |
| සකස් නොකළ දුම්කොළ | 32 | 24 | 28 | 26 |
| **කාර්මික අපනයන** | **9,702** | **10,465** | **9,278** | **9,947** |
| ඇඟලුම් | 4,952 | 5,483 | 4,441 | 4,660 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 506 | 568 | 540 | 1,064 |
| රබර් නිෂ්පාදිත | 1,050 | 977 | 902 | 976 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 587 | 520 | 539 | 652 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 501 | 581 | 598 | 486 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 277 | 451 | 500 | 382 |
| වෙනත් කාර්මික අපනයන | 314 | 342 | 323 | 347 |
| රෙදිපිළි | 355 | 354 | 338 | 295 |
| රසායනික නිෂ්පාදිත | 223 | 223 | 194 | 234 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 156 | 177 | 178 | 187 |
| සත්ත්ව ආහාර | 150 | 171 | 145 | 133 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 130 | 137 | 114 | 124 |
| ප්‍රවාහන උපකරණ | 148 | 129 | 149 | 107 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 128 | 115 | 100 | 106 |
| සම් භාණ්ඩ සංචාරක භාණ්ඩ හා පාවහන් | 59 | 86 | 71 | 62 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 79 | 61 | 56 | 53 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 50 | 53 | 55 | 48 |
| පිගන්මැටි නිෂ්පාදිත | 37 | 38 | 34 | 32 |
| **ඛනිජමය අපනයන** | **45** | **50** | **39** | **25** |
| පාෂාණ හා ගල් | 20 | 18 | 19 | 18 |
| ලෝපස්, ලෝබොර හා අළු | 23 | 31 | 19 | 6 |
| **වර්ග නොකළ අපනයන** | **23** | **23** | **28** | **26** |
| සජීවී සතුන් | 22 | 23 | 27 | 25 |
| **මුළු අපනයන** | **12,499** | **13,106** | **11,911** | **12,772** |

(අ) තාවකාලික

(v) ඒ පිළිබඳව සමස්ත විස්තරය ඇමුණුම 05හි දැක්වෙනවා.

ඇමුණුම 05

4 සංඛ්‍යා සටහන: සේවාවලින් ලැබුණු ආදායම

| වර්ෂය | සේවාවලින් ලැබුණු ආදායම (එක්සත් ජනපද ඩොලර් මිලියන) |
|---|---|
| 2014 | 5,605 |
| 2015 | 6,397 |
| 2016 | 7,138 |
| 2017 | 7,724 |
| 2018 | 8,374 |
| 2019 | 7,474 |
| 2020 | 3,035 |
| 2021 | 2,475 |
| 2022 | 3,062 |
| 2023 | 5,416 |
| 2024 (තාවකාලික) | 6,910 |

(vi) සේවා අංශයට දායක වූ ප්‍රධාන අංශ පහත දැක්වේ.

- සංචාරක
- මුහුදු ප්‍රවාහන
- පරිගණක සේවා
- ගුවන් ප්‍රවාහන
- තාක්ෂණික, වෙළෙඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා
- වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා
- ඉදිකිරීම්
- විදුලි සන්දේශ සේවා

(ආ) (i) ඒ සම්බන්ධයෙන් තිබෙන නීතිමය රාමුව මම පැහැදිලි කරන්නම්.

- 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද 1993.03.26 දිනැති අංක 759/15 දරන ගැසට් නිවේදනය මගින් අපනයනකරුවන් විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරන ලදී.
- එසේ වුවත්, විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද 2016.04.01 දිනැති අංක 1986/43 දරන ගැසට් නිවේදනය මගින් ඉහත නිදහස් කිරීම අවලංගු කරන ලදී.
- ඒ අනුව, 1993 වසරේ සිට 2016 වසර දක්වා තිබූ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවක් නීතිමය වශයෙන් නොතිබුණි.
- 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීම සහ විනිමය පාලන පනත අවලංගුවීමත් සමඟ විදේශ විනිමය පනතෙහි නියමයන් ප්‍රකාරව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව අඛණ්ඩව පැවතුණි.
- 2020 වසරේ සිට බලපෑ විදේශ විනිමය සංචිතවල අඩුවීමත් සමඟ එයට පිළියමක් ලෙස එවකට තිබූ රජය 2021දී අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම පිළිබඳ රීති මුදල් පනත යටතේ නිකුත් කිරීම නැවත ආරම්භ කරන ලදී.
- 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ - CBA - විධිවිධානයන් යටතේ නිකුත් කරන ලද 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති ප්‍රකාරව සියලුම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් විසින් අදාළ භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ/සේවාවන් සැපයූ දිනයේ සිට දින එකසිය අසූවක් ඇතුළත තම අපනයන ඉපැයීම් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.
- මේ රීතීන්ට අනුකූලව සියලුම බලපත්‍රලාභී බැංකු, අපනයනකරුවන්, වක්‍ර අපනයනකරුවන් විසින් වාර්තා/ ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

- බැංකු විසින් යොමු කරන ලද වාර්තාවලට අනුව 2022 සිට 2024 වසර දක්වා අපනයන ප්‍රේෂණ ඉපැයීම් පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 17,756ක්, ඇමෙරිකානු ඩොලර් මිලියන 14,997ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 16,008ක් ලෙස දැක්වේ. මෙය ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙළින් 110ක්, 87ක් සහ 81ක් වේ.
- මේ අතර, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සමීපව නිරීක්ෂණය කිරීමේ අරමුණින්, 2022 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට සංවර්ධන අදියරක පවතින "අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය" නමින් පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය හරහා මෙරටට ලැබෙන අපනයන ආදායම සැසඳීමට අදාළව වාර්තා ලබා ගත හැක.

(ii) ඉහත සඳහන් රීතිවලට අනුකූලව අපනයනකරුවෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීමේ දින සිට ශ්‍රී ලංකාවට අපනයන ආදායම නැවත ගෙන්වා ගැනීමට පෙර, උපරිම වශයෙන් දින 180ක් ශ්‍රී ලංකාවෙන් පිටත අපනයන ආදායම රඳවා ගැනීමට හැකියාව ඇත.

(iii) මෙම රීතියෙහි 11වන රීති ප්‍රකාරව, භාණ්ඩ සහ/ හෝ සේවා අපනයනයේදී ඕනෑම අපනයනකරුවෙක්, ඍජු අපනයනකරුවෙක්, වක්‍ර අපනයනකරුවෙක් හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතින් සමඟ අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාමාර්ග ඇරඹීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂහට අයිතිය ඇත.

ඒ අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ඉහත ආ (i) ඡේදයෙහි සඳහන් කර ඇති රීතින්ට අනුකූලවීමට අපොහොසත් වූ අපනයනකරුවන්ට එකී රීතින්ට අනුකූල වන ලෙස නියම කරමින් අවශ්‍ය ලෙස නිතිපතා දැනුවත් කිරීම් කරනු ලැබේ.

තවද, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 107(1) වගන්තිය අනුව, පනතේ ඕනෑම විධිවිධානයක් හෝ ඒ යටතේ නිකුත් කරන ලද ඕනෑම රීතියක්, විධිවිධානයක් හෝ තීරණයක් උල්ලංඝනය කරන ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හට පරිපාලනමය පියවර ගැනීමේ හැකියාව පවතී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ වනවිට මහ බැංකු පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද රීති උල්ලංඝනය කළ අවස්ථාවකදී ගත යුතු පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කෙටුම්පත් කරමින් පවතී. මෙම රීතින් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ මෙම රීතින් උල්ලංඝනය කිරීම/ අනුකූල නොවීම සඳහා අවශ්‍ය පරිපාලන ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලංකාවේ අපනයන සම්බන්ධයෙන් ඇමෙරිකාව විශේෂ තැනක් අරගෙන තිබෙන බව අපට පෙනෙනවා. මේ වනකොට ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් වෙළෙඳ භාණ්ඩ සඳහා තීරු බදු පැනවීම නිසා අපට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් වූ සාකච්ඡාවේදී ඔබතුමා අපේ රට නියෝජනය කළාය කියලා අප දැනුවත්වෙලා තිබෙනවා. ඊයේ හැන්දෑවේ CNN එක හරහා US Secretary of the Treasury, Scott Bessent මේ සම්බන්ධයෙන් දැනුවත් කරනවා මා දැක්කා, කැනඩාව, වියට්නාමය, the European Union, ඉතාලිය, ජපානය, කොරියාව, ඉන්දියාව ඇතුළුව රටවල් 17ක් ඇමෙරිකාව සමඟ මේ සුමානයේ ගිවිසුම්ගත වෙන්න සූදානමින් සිටිනවා කියලා. ඔබතුමන්ලාගේ සාකච්ඡා තුළ ලංකාව කවුරුන් එක්කද කථා කළේ කියලා මම දැනගන්න කැමතියි. මොකද, මෙතුමා කෙළින්ම ඩොනල්ඩ් ට්‍රම්ප් වැනි නායකයෝත් සමඟ සාකච්ඡා කර තිබෙන බවක් තමයි අපට හෙළිදරව් වෙලා තිබෙන්නේ. මෙය අපේ රටේ ප්‍රශ්නයක් නිසාත්, මෙයින් අපේ අපනයනවලට බලපෑමක් ඇති වී තිබෙන නිසාත්, කොයි ආකාරයෙන්ද මේකට උත්තරයක් ලබා ගන්න පුළුවන් වන්නේ කියන එක මා ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් අහනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, කලිනුත් ගරු සභානායකතුමා මේ ගැන දැන්වූවා. විවාදය වෙලාවේදී මේ පිළිබඳ විස්තරයක් සියලු තොරතුරු සමඟ ඉදිරිපත් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

පැහැදිලි කිරීමක් කරනවා කිව්වේ ඒ වෙලාවේ අහපු ප්‍රශ්නයට. නමුත්, මේක අතුරු ප්‍රශ්නයක් නිසා මේකට ඍජු උත්තරයක් අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අසා තිබෙන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයට වැඩිමනත් කරුණක් දැනගැනීම සඳහා තමයි අතුරු ප්‍රශ්න ඇසිය යුත්තේ. නමුත්, ඔබතුමා මේ අහන්නේ වෙනත් taxation එකක් පිළිබඳව නේ. ඔබතුමා ඇසූ මුල් ප්‍රශ්නය තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා අසන ප්‍රශ්නයක් නොවෙයි නේ ඔය අහන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට තේරෙන්නේ නැහැ ඔබතුමා කියන කාරණය. මොකද, මම අහලා තිබෙන්නේ පසුගිය වසර 20 තුළ මේ රටේ අපනයනවල මුළු වටිනාකම ශ්‍රී ලංකා රුපියල් හා ඇමෙරිකානු ඩොලර්වලින් සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද කියායි. දැන් ඒකට බාධාවක් ඇතිවෙලා තිබෙනවා. මම ඉල්ලා සිටිනවා ඒ කරුණ සම්බන්ධයෙන් මට සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙන්න කියලා. මොකද, මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඔබතුමා පිට රට ගිහිල්ලා තිබෙනවා. අපේ අපනයන තවදුරටත් ඉදිරියට ගෙනියන්න පුළුවන් සාකච්ඡා කොච්චර දුරට ගිහිල්ලා තිබෙනවාද කියා කරුණාකරලා කියන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා විවාදය වෙලාවේදී ඒ පිළිබඳව පිළිතුරු ලබා දෙනවා කියලා. මම හිතන විධියට ඒක ප්‍රමාණවත්. දැන් ගරු මන්ත්‍රීතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ කියන්නේ, අද අසන අතුරු ප්‍රශ්න ඔක්කොටම විවාද තුළින් ද උත්තර ලබා ගන්න වන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට ඒ ගැන පැහැදිලි කරලා කිව්වා. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් මේ තුළින් අලුත් සංස්කෘතියක් බිහි වන ආකාරයක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ. මෙහෙම ප්‍රශ්න අහනකොට මීන් පසුව කියන්න පුළුවන්, පිළිතුරු කථාව තුළින් සියලුදේටම උත්තර ලබා ගන්න පුළුවන් කියලා.

එහෙනම් සේවා අංශය සම්බන්ධයෙන් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. මේ රටේ සංචාරක කර්මාන්තයට ඉමහත් සේවයක් මූල්‍ය ආයතන - බැංකු, insurance companies - තුළින් සිදු වන බව අප දන්නවා. දැන් මාලදිවයිනේ පිහිටුවා තිබෙනවා, Maldives International Financial Centre කියලා එකක්. මේක දැන් ඉදිරිපත්වෙලා තිබෙනවා, Dubai, Singapore වැනි රටවල් එක්ක තරග කරන්න. ලංකාවේ Port City එක තුළිනුත් මෙවැනි ප්‍රයත්නයක් දැරුවා. මාලදිවයින නොදැනුවත්ව එකවරම අද ලෝකයේ වැදගත් තැනකට මේක අරගෙන යන අවස්ථාවේදී ලංකාවට මේ සම්බන්ධයෙන් කරන්න පුළුවන් වෙන්නේ මොනවාද කියලා අපව දැනුවත් කරන්න පුළුවන්ද? මාලදිවයින ගත්තොත්, ඒගොල්ලන් සම්පූර්ණයෙන්ම tax free දීලා තිබෙනවා, ඒ රටට ගෙනෙන ඕනෑම දෙයක් පිළිබඳව ප්‍රශ්න අහන්නේ නැතුව, exchange control එකක් නැතුව ඒ රටේ ආයෝජනය කරන්න. ව්‍යවස්ථාවෙන්ම ඒ සඳහා රක්ෂණයක් දෙනවා. ලංකාවේ Port City එක මේකම කරලා තිබෙනවා. ඒකේ අද තිබෙන තත්ත්වය මොකක්ද? මොකද, බැරි වෙලාවත් Maldives International Financial Centre එක ඉදිරියට ගියොත් ඒකෙන් ලංකාවට ලොකු බලපෑමක් ඇති වෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සුරක්ෂිත වෙන්නේ කොහොමද කියන එක මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ඔබතුමා මුල් ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ භාණ්ඩ හා සේවා අපනයනය සම්බන්ධයෙන්. නමුත්, මේ අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කළේ ආයෝජන සම්බන්ධයෙන්. ගරු කථානායකතුමනි, එතුමාගේ අතුරු ප්‍රශ්නයට අදාළව කෙටි පැහැදිලි කිරීමක් මම කරන්නම්. ඊයේ දවසේ ජාත්‍යන්තර මාධ්‍ය තුළ පළ වුණා, මාලදිවයිනට මෙවැනි ආයෝජනයක් ලැබීමට නියමිත බව. මේ පිළිබඳව අපි විමසා බැලීමේදී හෙළි වුණා, මේක අලුත් එකක් නොවෙයි කියලා. වසර ගණනාවක් තිස්සේ ඒ පිළිබඳව කථා බහ කෙරීගෙන ගිහිල්ලා දැන් තමයි ඒ මට්ටමට ගිවිසුම්ගත වෙන්නට අවස්ථාව ලැබිලා තිබෙන්නේ කියලා අපි දැනුවත්වෙලා තිබෙනවා. දැන් ශ්‍රී ලංකාවේත් මේ ආර්ථිකය පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් තිබෙන වැදගත්කම සලකා බලා අපේ Port City එක සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

ඒ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන්නට අවශ්‍ය නීති පද්ධතිය තවත් ශක්තිමත් කර, ඒ සම්බන්ධයෙන් තිබෙන ගැටලු නිරාකරණය කර දී ඉදිරියට ගමන් කිරීමටත්, ඒ තුළින් primary developersලා සහ secondary industriesවලට යනාදී වශයෙන් ආයෝජකයින් ලංකාවට කැඳවා ගැනීමටත් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සූදානම් කර තිබෙනවා. ඒ පිළිබඳව අණ පනත් සම්මත වීමෙන් පසුව, finalize වීමෙන් පසුව වැඩිදුර තොරතුරු ලබා දෙන්නට පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -335/2024- (1), ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -560/2025- (1), ගරු චාමර සම්පත් දසනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 -617/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2015 සිට 2024 සැප්තැම්බර් දක්වා මුද්‍රණය කරන ලද මුදල්: විස්තර

2015 தொடக்கம் 2024, செப்ரெம்பர் வரை அச்சிடப்பட்ட பணம்: விபரம்

CURRENCY PRINTED FROM 2015 TO SEPTEMBER, 2024: DETAILS

873/2025

**10. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණය පැවති දින දක්වා මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(ii) ඉහත කාල සීමාව තුළ එක් එක් මුදල් අමාත්‍යවරයා යටතේ මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත කාල සීමාව තුළ එක් එක් ජනාධිපතිවරයා යටතේ මුද්‍රණය කරන ලද මුදල්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් රුපියල්වලින් කොපමණද;

(iv) ඉහත කාල සීමාව තුළට අයත් වන යම් කාල වකවානුවක පාලනයකින් තොරව මුදල් මුද්‍රණය කර තිබේද;

(v) පාලනයකින් තොරව මුදල් මුද්‍රණය කිරීමේ අහිතකර බලපෑම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டில் இலங்கையில் சனாதிபதித் தேர்தல் நடத்தப்பட்ட திகதி வரை அச்சிடப்பட்ட பணத்தின் பெறுமதி ஆண்டுவாரியாகத் தனித்தனியே ரூபாயில் எவ்வளவு என்பதையும்;

( ii) மேற்படி காலப்பகுதியில் ஒவ்வொரு நிதி யமைச்சரின் கீழும் அச்சிடப்பட்ட பணத்தின் பெறுமதி தனித்தனியே ரூபாயில் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காலப்பகுதியில் ஒவ்வொரு சனாதிபதி யின் கீழும் அச்சிடப்பட்ட பணத்தின் பெறுமதி தனித்தனியே ரூபாயில் எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி காலப்பகுதிக்குரிய ஏதேனுமொரு காலத்தில் கட்டுப்பாடின்றி பணம் அச்சிடப் பட்டுள்ளதா என்பதையும்;

(v) கட்டுப்பாடின்றி பணத்தை அச்சிடுவதால் ஏற்படும் பாதகமான விளைவுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the value of the currency that were printed/ minted since the year 2015 up to the date of the Presidential Election of Sri Lanka held in the year 2024, separately in respect of each year in rupees;

(ii) the value of the currency that were printed/ minted corresponding to the tenure of each Minister of Finance during the period referred to above, separately in rupees;

(iii) the value of the currency that were printed/ minted corresponding to the term of each President during the same period, separately in rupees;

(iv) whether currency were printed/minted without control during any span of time within the period concerned; and

(v) the potential adverse effects of printing money without control?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2015 සිට 2024 ජනාධිපතිවරණය පැවැති දිනය දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුද්‍රණය කරන ලද සහ ටංකනය කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි පිළිබඳ තොරතුරු:

2015 වර්ෂයේදී රුපියල් බිලියන 280ක්, 2016 වර්ෂයේදී රුපියල් බිලියන 170ක්, 2017 වර්ෂයේදී රුපියල් බිලියන 201ක්, 2018 වර්ෂයේදී නෝට්ටු විධියට රුපියල් බිලියන 161ක්, 2019 වර්ෂයේදී සමස්ත නෝට්ටු හා කාසි වශයෙන් බලනකොට රුපියල් බිලියන 217ක්, 2020 වර්ෂයේදී රුපියල් බිලියන 322ක්.

සමස්ත එකතුව, 2021 වර්ෂයේදී රුපියල් බිලියන 210ක්, 2023 වර්ෂයේදී රුපියල් බිලියන 213ක් සහ 2024 ජනවාරි සිට 2024 ජනාධිපතිවරණය පැවැති දිනය දක්වා රුපියල් බිලියන 60.62ක ප්‍රමාණයක මුදලක් මුද්‍රණය සහ ටංකනය කරන ලද බව වාර්තා කර තිබෙනවා.

(ii) ඉහත කාල සීමාවේ එක් එක් මුදල් අමාත්‍යවරයාගේ ධුර කාලය තුළ මුද්‍රණය කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ ටංකනය කරන ලද කාසිවල වටිනාකම ගත්තොත්, ගරු රවී කරුණානායක මුදල් ඇමතිතුමාගේ කාලයේදී සමස්ත එකතුව රුපියල් බිලියන 646.17ක්. එය, සමස්ත කාල සීමාවේ වැඩිම ප්‍රමාණය ලෙස සඳහන් වෙනවා. ඊළඟට, ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමාගේ කාලයේදී රුපියල් බිලියන 472.75ක ප්‍රමාණයක්, ගරු මහින්ද රාජපක්ෂ මහතා මුදල් ඇමතිවරයා ලෙස රුපියල් බිලියන 487.35ක ප්‍රමාණයක්, ගරු බැසිල් රාජපක්ෂ මහතා මුදල් ඇමතිවරයා ලෙස රුපියල් බිලියන 201.5ක ප්‍රමාණයක් සහ ගරු රනිල් වික්‍රමසිංහ මහතා මුදල් ඇමතිවරයා ලෙස රුපියල් බිලියන 442.35ක ප්‍රමාණයක් ආදී වශයෙන් සඳහන් වනවා.

(iii) අදාළ කාල සීමාවේ එක් එක් ජනාධිපතිවරයාගේ ධුර කාලය තුළ මුද්‍රණය කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු සහ ටංකනය කරන ලද කාසිවල වටිනාකම ගත්තොත්, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ලෙස කටයුතු කළ කාලසීමාවේ රුපියල් බිලියන 1,118.92ක ප්‍රමාණයක්, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලය තුළ රුපියල් බිලියන 688.85කුත්, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලසීමාව තුළ රුපියල් බිලියන 442.35කුත් ලෙස සඳහන් වෙනවා.

(iv) අදාළ නොවේ.

(v) මුදල් අච්චු ගැසීම යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ නෝට්ටු සහ කාසි ආකාරයෙන් භෞතික වශයෙන් මුදල් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියයි. අනෙක් අතට, මුදල් මුද්‍රණය යනුවෙන් පුළුල් ලෙස අදහස් වනුයේ මහ බැංකුවක් ආර්ථිකයට නව මුදල් නිකුත් කරන ක්‍රියාවලිය වන අතර, එය මුදල් පදනමේ ප්‍රසාරණය මඟින් පිළිබිඹු වේ.

ආර්ථිකයක් වර්ධනය වන විට, ආර්ථිකයට අවශ්‍ය මුදල් ප්‍රමාණයද වර්ධනය වේ. එබැවින්, පාලනයක් සහිතව මුදල් මුද්‍රණය සිදු කිරීම

ආර්ථිකයට හානිකර නොවේ. කෙසේ වෙතත්, නව මුදල් නිකුත් කිරීම ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හැකියාවට අනුරූප විය යුතුය. ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනයට අනුකූලව මුදල් ප්‍රමාණය වැඩි වනවිට, එය ආර්ථික උද්ධමන පීඩනයක් ඇති නොකරන අතර, තිරසර ආර්ථික වර්ධනයකට සහාය වේ.

(ආ) පැන නොනඟී.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මම එක් අතුරු ප්‍රශ්නයක් පමණයි යොමු කරන්නේ. අපි දන්නවා, මෙවර අය වැය බොහොම ජනතා හිතවාදී අය වැයක් වුණා කියලා. ඒ වාගේම පසුගිය කාලයේ දැනගන්න ලැබුණා, නව රජය යටතේ මුදල් කිසිවක් මුද්‍රණය නොකළ බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා අසන අතුරු ප්‍රශ්නය මෙයයි. රුපියල් බිලියන 1,300කට වැඩි ප්‍රමාණයක ආයෝජන තිබෙන බව මෙවර අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබුණා. රුපියල් බිලියන 1,300කට වැඩි ප්‍රමාණයක ආයෝජන තිබෙනකොට ඒකට අරමුදල් සපයා ගන්න රජයේ වැඩ පිළිවෙළ මොකක්ද කියන එක තමයි මම අහන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, මේ කාල සීමාව තුළ අලුතින් මුදල් මුද්‍රණය නොකළාට අය වැය තුළින් ඉදිරිපත් කරන ලද ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ආයෝජන කිරීම සඳහා ක්‍රියා පටිපාටි ගණනාවක් තුළින් ඒ අවශ්‍ය අරමුදල් සපයා ගන්නට වැඩකටයුතු සූදානම් කරලා තිබෙනවා. උදාහරණයක් ලෙස, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට විශාල වැඩකටයුතු ප්‍රමාණයක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. එහිදී තීරු බදු, ආදායම් බදු සහ වෙනත් බදු යනාදී වශයෙන්, ආදායම එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවා මේකට අවශ්‍ය ආදායම සහ අරමුදල් සපයා ගැනීමටත්, යම්කිසි අඩුපාඩුවක් තිබෙනවා නම් රාජ්‍ය මුදල් පරිපාලන ක්‍රමවේදවලට අනුගතව අවශ්‍ය කරන ණය ගැනීම් තුළින් -දේශීය සහ විදේශීය වශයෙන්- ඒ අවශ්‍ය කරන ප්‍රමාණ සම්පාදනය කරගෙන අය වැය තුළින් යෝජනා කරන ලද සියලුම කාර්යයන් සඳහා අරමුදල් සපයා දීමට අවශ්‍ය කටයුතු අපි සූදානම් කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්. ගරු මන්ත්‍රීතුමා එක අතුරු ප්‍රශ්නයක් ඇහුවා. මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාට එහෙම අවසරයක් නැහැ. ප්‍රශ්නය අහන්න ඔබතුමාට ඒ මන්ත්‍රීතුමාගේ අවසරය තිබෙන්න ඕනෑ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ අදාළ මන්ත්‍රීතුමාගේ කැමැත්ත මත. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට එතුමාට ඉඩ සලසනවාද?

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නයක් යොමු කරන්නේ නැහැ. මම එක් අතුරු ප්‍රශ්නයක් පමණයි යොමු කළේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට. වෙනත් අතුරු ප්‍රශ්න යොමු කරන්න වෙන කාටවත් බලය පවරලාත් නැහැ. මම තවත් අතුරු ප්‍රශ්නයක් අහන්නෙත් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අසුන් ගන්න. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක මැතිතුමාගේ පෞද්ගලික නිවස තිබෙන්නේ මේ ආසන්නයේ. අවශ්‍ය නම් අපට ඒ නිවසේදී මෙවැනි practice එකක් කරන්න පුළුවන්. නැත්නම් අදාළ මන්ත්‍රීතුමාගේ අවසරයකින් තොරව අතුරු ප්‍රශ්න අහන්න බැහැ, මන්ත්‍රීතුමනි. ඔබතුමාට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයකට උත්තරයකුත්,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

එතුමා අහන්නේ නැත්නම් එතුමාගේ අවසරය මත තමයි ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ. එතුමාගේ අවසරය මත පමණයි එහෙම කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග කියවන්න. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා පාර්ලිමේන්තුවේ වටිනා කාලය නාස්ති කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## 2024 නොවැම්බර් මාසයේ උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල පැවති මහ විරු සැමරුම්: විස්තර
### 2024 நவம்பரில் வட-கிழக்குப் பகுதிகளில் நடைபெற்ற மாவீரர் நினைவேந்தல்கள்: விபரம்
### MARTYRS' DAY CELEBRATIONS IN NORTH AND EAST IN NOVEMBER, 2024: DETAILS

156/2024

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Dayasiri Jayasekara, Attorney at Law)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) 2024 නොවැම්බර් මාසයේදී එල්ටීටීඊ සංවිධානය, වෙනත් සංවිධානයක්, පුද්ගලයෙක් හෝ පුද්ගලයන් විසින් උතුරු-නැඟෙනහිර යුද්ධයේදී මියගිය එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් සිහි කරමින් මහ විරු සැමරුම් පවත්වා තිබේද;

(ii) එසේ නම්, ඒවා පවත්වන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදී තිබේද;

(iv) එම සැමරුම් පැවැත්වීමට පෙර ඒ සම්බන්ධයෙන් රජය දැනුවත්වී තිබේද;

(v) ශ්‍රී ලංකාවේ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද තහනම් කර ඇති සංවිධානයකට ශ්‍රී ලංකාව තුළ එවැනි සැමරුම් පැවැත්වීමේ හැකියාවක් තිබේද;

(vi) එම සැමරුම් පැවැත්වීම නැවැත්වීම සඳහා ගන්නා ලද පියවර කවරේද;

(vii) තහනම් සංවිධානයක සැමරුම් පැවැත්වීම සම්බන්ධයෙන් රජය වගකීම් භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024 நவம்பர் மாதத்தில் எல்.ரீ.ரீ.ஈ. அமைப்பு, வேறேதேனும் அமைப்பு, எவரேனும் நபர் அல்லது நபர்கள் வடக்கு-கிழக்கு யுத்தத்தில் உயிரிழந்த எல்.ரீ.ரீ.ஈ. அமைப்பின் உறுப்பினர்களை நினைவுகூரும் வகையில் மாவீரர் நினைவேந்தல்களை நடாத்தியுள்ளார்களா;

(ii) ஆமெனில், அவற்றை நடாத்திய தரப்பினர்கள் யாவர்;

(iii) அதற்கு அரச அனுசரணை வழங்கப்பட்டுள்ளதா;

(iv) மேற்படி நினைவேந்தல்கள் நடாத்தப்படுவதற்கு முன்னர் அது தொடர்பில் அரசாங்கம் அறிந்திருந்ததா;

(v) இலங்கையில் மாத்திரமன்றி சர்வதேச ரீதியாகவும் தடை செய்யப்பட்டுள்ள அமைப் பொன்றுக்கு இலங்கையில் அவ்வாறான நினைவேந்தல்களை நடாத்தும் இயலுமை உள்ளதா;

(vi) மேற்படி நினைவேந்தல்கள் நடாத்தப்படுவதை நிறுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கை யாது;

(vii) தடை செய்யப்பட்ட ஓர் அமைப்பு நினைவேந்தல் நடாத்தியமை தொடர்பில் அரசு பொறுப்பை ஏற்றுக்கொள்கின்றதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether the LTTE, some other organization, an individual or individuals held a Martyrs Day (Mahaviru) celebration in memory of the LTTE cadres who died during the war in the North and East in November, 2024;

(ii) if so, the parties that held such celebrations;

(iii) whether State patronage had been accorded for it;

(iv) whether the Government had been made aware of such celebrations before they were conducted;

(v) whether an organization which has been banned not only in Sri Lanka but also internationally has the ability to hold such celebrations in Sri Lanka;

(vi) the steps that had been taken to prevent the holding of such celebrations; and

(vii) whether the Government takes responsibility over the holding of celebrations of a banned organization?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උතුරු පළාත තුළ යුද්ධයේ දී මියගිය ඥාතීන් සිහිකිරීමේ සැමරුම් උත්සව 212ක් සහ නැඟෙනහිර පළාත තුළ එවැනි සැමරුම් 07ක් පවත්වා ඇත.

(ii) ඇමුණුම 01 හි දක්වා ඇත.

ඇමුණුම 01

උතුරු පළාත

| අනු අංකය | පාර්ශවකරුගේ | | | කොට්ඨාස මට්ටමින් සැමරුම් උත්සව පවත්වා ඇති ගණන | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නම | තනතුර | සංවිධානය | කන්කසන්තුරය | යාපනය | කිලිනොච්චිය | මුලතිව් | වවුනියාව | මන්නාරම | එකතුව |
| 1 | සෙල්වරාසා ගජේන්ද්‍රන් | හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 0 | 7 | 0 | 0 | 0 | 0 | 7 |
| 2 | ආර්. සයෙන්ද්‍රන් | සිවිල් ක්‍රියාකාරිකයෙක් | ත්‍රිරෝද රථ රියදුරු සහ වෙළඳ ව්‍යාපාරික | 0 | 4 | 0 | 0 | 0 | 0 | 4 |
| 3 | විශ්වලිංගම් මනිවන්න් | යාපනය හිටපු නගරාධිපති | දෙමළ ජාතික ජනතා සංධානය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 4 | එම්.කේ. සිවාජලිංගම් | උතුරු පළාත් හිටපු මන්ත්‍රී | දෙමළ ජාතික පක්ෂය | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 5 | ඉමානුවෙල් ආර්නෝල්ඩ් | යාපනය හිටපු මහ නගරාධිපති | ලංකා තමිල් අරුසුකච්චි පක්ෂය | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 6 | වරදරාසා පාකීපන් | යාපනය හිටපු මහ නගර සභා මන්ත්‍රී | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 0 | 10 | 0 | 0 | 0 | 0 | 10 |
| 7 | වාසුහී සුදාකරන් | නල්ලූර් හිටපු ප්‍රදේශීය සභා මන්ත්‍රිනී | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 0 | 2 | 0 | 0 | 0 | 0 | 2 |
| 8 | අන්බලගන් කනගයියා සහ මඩුත්තින් බෙනඩික් | කයිට්ස් ප්‍රාදේශිය සභා මන්ත්‍රි | දෙමළ ජාතික ජනතා සංධානය | 0 | 10 | 1 | 0 | 0 | 0 | 11 |
| 9 | කේ. තුවාකරන් | ශිෂ්‍ය සංගම් නායක | යාපනය විශ්ව විද්‍යාලය | 0 | 10 | 1 | 0 | 0 | 0 | 11 |
| 10 | පොන්රාසා පොන්ගුණරත්නම් | හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 0 | 6 | 0 | 0 | 0 | 0 | 6 |
| 11 | කේ. කුණාලන් | ක්‍රියාකාරික | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 6 | 0 | 0 | 0 | 0 | 0 | 6 |
| 12 | සහායරාසා ජේම්ස්,නඩ රාසා ශ්‍රිදරන්, කලෙයිවෙල්වන් | යාපනය සහ කන්කසන්තුරය ධීවර සමිතිය | ධීවර සමිති සංගම් නිලධාරින් | 38 | 2 | 0 | 0 | 0 | 0 | 40 |
| 13 | ලෝක ප්‍රකාශන් රමණන් | වලිකාමම් හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 1 | 1 | 0 | 0 | 0 | 0 | 2 |
| 14 | ඩිලාන් පද්මනාදන් | ක්‍රියාකාරික | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 1 | 0 | 1 | 0 | 0 | 0 | 2 |
| 15 | සම්මුගරාසා ජීවරාසා | ධර්මපුරම් පොලිස් වසමේ කේරාවිල් සුසාන භූමිය අසළ පදිංචිකරුවෙක් | | 0 | 0 | 5 | 0 | 0 | 0 | 5 |
| 16 | ශිවතුමාර් ශ්‍රී රන්ජන් | කමිටු සභාපති | කිලිනොච්චිය, මහවිරු සමිතිය | 0 | 0 | 8 | 0 | 0 | 0 | 8 |
| 17 | ෂන්මුගරාසා තවේන්ද්‍රරාසා නොහොත් අමලන් | වවුනියාව උතුර සංවිධායක | ඉලංගෙයි තමිල් අරුසු කච්චි පක්ෂය | 0 | 0 | 0 | 3 | 0 | 0 | 3 |
| 18 | එස්. තවබාලන් | දිස්ත්‍රික් සංවිධායක | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 0 | 1 | 0 | 0 | 1 | 0 | 2 |
| 19 | අරුනාවලම් වේලමානිදන් | කරච්චි ප්‍රාදේශිය සභාවේ හිටපු සභාපති | ඉලංගෙයි තමිල් අරුසු කච්චි පක්ෂය | 4 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| 20 | ගෝපාල ක්‍රිෂ්ණන් රාජ්කුමාර් | ලේකම් | වවුනියාව දෙමළ මව්බිමේ භාර දී හා පැහැරගෙන අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ සංගමය | 0 | 0 | 0 | 1 | 1 | 0 | 2 |
| 21 | ශිවානන්දන් ජෙනීටා | සභාපති | උතුරු නැගෙනහිර බලහත්කාරයෙන් අතුරුදහන්වූවන්ගේ ඥාතීන්ගේ සංගමය | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 22 | කාන්ද රාසා නිරෝජන් | සභාපති | මලර්වදී ක්‍රිඩා සංගමය | 4 | 0 | 0 | 0 | 0 | 0 | 4 |
| 23 | ශාන්ත කුමාර් | සාමාජික | දෙමළ ජාතික ජනතා පෙරමුණ | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 24 | කන්දසාමි ක්‍රිෂ්ණමූර්ති | සාමාජික | මහවිරු පවුල් සාමාජික | 0 | 0 | 0 | 2 | 0 | 0 | 2 |
| 25 | ඉහත පාර්ශව කරුවන්ට අමතරව ප්‍රධාන පාර්ශවයක් හදුනාගෙන නොමැති එහෙත් උතුරු පළාතේ විවිධ ස්ථානයන්හි සුලු පුද්ගලයින් පිරිසක් සහභාගි කරවා ගනිමින් (තම නිවස ඉදිරිපිට, තම ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිට මල් තබා පහනක් දැල්වීම, නිවස ඉදිරිපිට බෆල් යොදා ගනිමින් උදාන ගී වාදනය ) වැනි සැමරුම් 74 ක් පවත්වා ඇත. එය පුද්ගලයින් 74 දෙනෙකු විසින් සිදුකර ඇත. | | | 0 | 13 | 25 | 30 | 0 | 6 | 74 |
| කොට්ඨාස මට්ටමින් සිදුකර ඇති සැමරුම් එකතුව | | | | 58 | 68 | 41 | 36 | 3 | 6 | 212 |

නැගෙනහිර පළාත

| අනු අංකය | සංවිධානය කරන ලද අයගේ නම | තනතුර | සංවිධානය |
|---|---|---|---|
| 01 | තම්බිපිල්ලේ බාස්කරන් | තරවයි සුසාන භූමි සංගමයේ සභාපති | දෙමළ ජනතා එක්සත් පෙරමුණ පක්‍ෂය |
| 02 | වේලායුදම් බාස්කරන් | වාකරේ සංවිධායක | ඉලංගෙයි තමිල් අරසු පක්ෂය |
| 03 | පාක්‍යොසල්වම් අරියනේන්ද්‍රන් | මඩකළපුව හිටපු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී | දෙමළ ජාතික සන්ධානය |
| 04 | වඩිවේල් ප්‍රදීපන් | පක්ෂ ආධාරකරු | දමිල ජනතා එක්සත් පෙරමුණ |
| 05 | නිර්මල කුමාර් නිදර්ශන් | උප සභාපති | උතුරු නැගෙනහිර විශ්ව විද්‍යාල වල දෙමළ ශිෂ්‍ය සංගමය |
| 06 | රාසමානික්කම් රාසපුත්‍ර සානක්‍යන් | මඩකළපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී | දමිල ජාතික සන්ධානය |
| 07 | නාගමනි ක්‍රිෂ්නපිල්ලේ නොහොත් කුට්ටමනී | පුනරුත්තාපන වූ එල්.ටී.ටී.ඊ. සාමාජික | - |

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iii) නැත.

(iv) බුද්ධි වාර්තා මගින් පොලිස් ස්ථාන දැනුවත් වී ඇත.

(v) 2011.08.29 දිනැති අංක 1721/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 2 වන වගන්තිය මඟින් ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය තහනම් සංවිධානයක් බවට ප්‍රකාශ කර ඇත.

කිසිම තැනැත්තෙකු විසින්, එල්ටීටීඊ සංවිධානයේ හෝ එම සංවිධානය නියෝජනය කරන හෝ එම සංවිධානය වෙනුවෙන් ක්‍රියා කරනු ලබන වෙනත් යම් සංවිධානයක හෝ එවැනි ක්‍රියාකාරකම්වලට සම්බන්ධිත හෝ සලකනු ලබන හෝ සම්බන්ධිත බවට සාධාරණ ලෙස සැක කරනු ලබන යම් සංවිධානයක එම ගැසට් පත්‍රයේ 3 (අ) සිට (ක) දක්වා සඳහන් දෙයක් සිදු කරන්නේ නම් එය වරදක් වන නමුත් එසේ නොවන මියගිය පුද්ගලයන් සිහි කිරීමේ සැමරුම් උත්සව පැවැත්වීමට බාධාවක් නොමැත.

(vi) උතුරු පළාත තුළ 2024 වර්ෂයේ මිය ගිය තම ඥාතීන් සිහිකිරීම සඳහා සැමරුම් 212ක් සිදු කර ඇති අතර, එයින් සැමරුම් 07ක පමණක් එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය විය හැකි ආකාරයේ යම් යම් කටයුතු සිදු කර තිබූ බව නිරීක්ෂණය වී ඇත. එම සැමරුම් උත්සව පිළිබඳව කිලිනොච්චිය, පේදුරුතුඩුව සහ යාපනය මහෙස්ත්‍රාත් අධිකරණ වෙත කරුණු වාර්තා කිරීමට පියවර ගෙන, එම සිද්ධීන් 07 සම්බන්ධයෙන් පුළුල් විමර්ශන සිදු කර, මේ වනවිට ගොනු 03ක් නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇති අතර, අනෙක් සිද්ධීන් 04 සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශන කරමින් පවතී.

නැඟෙනහිර පළාතේ දෙමළ දේශපාලන පක්ෂ නියෝජිතයින් හා ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල සිසුන් විසින් 2024 නොවැම්බර් මාසයේ යුද සමයේ මියගිය පුද්ගලයින් සිහි කිරීමට කටයුතු කරන බවට බුද්ධි තොරතුරු වාර්තා විය. ඒ අනුව, මෙම උත්සව සංවිධානය කරනු ලබන පුද්ගලයින් විසින් එල්ටීටීඊ සංවිධානය පිළිබඳව බෙදුම්වාදී අදහස් සමාජගත කර එම සංවිධානය නැවත ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන බවට නිරීක්ෂණය වුවහොත් අදාළ පුද්ගලයින්ට විරුද්ධව 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27 වන වගන්තියට අනුව හා 2011.08.29 දිනැති අංක 1721/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ වගන්ති 03 (ඇ) සහ 03(ඇ) යටතේ අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට නැඟෙනහිර පළාතේ සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කරන ලදී.

(vii) තහනම් සංවිධානයක නීතිවිරෝධී සැමරුම් උත්සව පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය විසින් විමර්ශන සිදු කරනු ලබන අතර, එහිදී අනාවරණය වන කරුණු මත නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලබයි.

(ආ) පැන නොනඟී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මෙතෙක් කල් සම්ප්‍රදාය වෙලා තිබුණේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් වූ කාරණය ගැනද කථා කරන්නේ?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. නැත්නම් වෙන මොනවාද අහන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග සම්පූර්ණයෙන් කියවන්න. ඔබතුමා ඒ ගැන දන්නේ නැහැ. කරුණාකර ස්ථාවර නියෝග කියවන්න. ස්ථාවර නියෝගවල තිබෙන්නේ අදාළ මන්ත්‍රීතුමාගේ කැමැත්ත අනුව එතුමාට පුළුවන් දෙවැනි,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන්න ඕනෑ ඔබතුමායි. අතුරු ප්‍රශ්න දෙකක් අහන්න- *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අදාළ මන්ත්‍රීවරයාටයි ඒ අවස්ථාව තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ මන්ත්‍රීවරයාට ඒ අවස්ථාව තිබෙනවා. ඒ මන්ත්‍රීවරයා අතුරු ප්‍රශ්නයක් ඇහුවේ නැති වුණාම ඒ අවස්ථාව උපයෝගී කර ගන්න පුළුවන්, මේ 225දෙනා අතර ඉන්න වෙනත් මන්ත්‍රීවරයෙකුට.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඇත්තටම බෙහෙවින් කනගාටු වෙනවා. මෙතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. අදාළ මන්ත්‍රීවරයාට පමණයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්. වෙනත් අයට අහන්න පුළුවන් ක්‍රමයක් කවදාවත් තිබිලා නැහැ. එහෙම නම්, අදාළ මන්ත්‍රීවරයා අවසර දෙන්න ඕනෑ. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පිටුපසින් ඉන්න ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා එතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නා, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමාට. ඒක තමයි ක්‍රමය. ඔබතුමා කරුණාකරලා Standing Orders කියවන්න. මේ සභාවේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ස්ථාවර නියෝග කියවලා එන්න, ඊළඟ දවසේ එනකොට. එතකොට හරි. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියවලා තමයි මම- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එය කියවලා එන්න. එතකොට ඔබතුමා තේරුම් ගනියි, මේ කියන කාරණාව මොකක්ද කියලා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 27ක් පමණ ඉඳලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ ස්ථාවර නියෝගය ගැන නොදැනුවත් වීම තමයි ප්‍රශ්නය. ඔබතුමාගේ නොදැනුවත්භාවය පිළිබඳව තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ප්‍රශ්න අංක 4 -192/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුරක්කන්හේනේගෙදර පානීය ජල ව්‍යාපෘතිය: ප්‍රගතිය
## குரக்கன்ஹேனேகெதர குடிநீர் கருத்திட்டம்: முன்னேற்றம்
## KURAKKANHENEGEDARA DRINKING WATER PROJECT: PROGRESS

335/2024

**7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹக்கீம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rauff Hakeem, Attorney-at-Law)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුපොත, 'කුරක්කන්හේනේගෙදර පානීය ජල ව්‍යාපෘතිය' නමින් ප්‍රජා ජල ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු සඳහා වියදම් කරනු ලැබූ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) එම ප්‍රදේශයේ ඇති රෝහල සහ කුරක්කන්හේනේගෙදර, සපුමල්පුරය, දංගොල්ල හා කටුපොත යන ප්‍රදේශවල පවුල් ඒකක 700කට අධික සංඛ්‍යාවකට අයත් ජනතාව ආවරණය වන පරිදි එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බව දන්නේද;

(v) මේ වන විට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නතර වීමට හේතු කවරේද;

(vi) එම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කර ඉහත සඳහන් ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරා ලීමට පියවර ගන්නේද;

(vii) එසේ නම්, එය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில் கட்டுபொத்த 'குரக்கன் ஹேனேகெதர குடிநீர் கருத்திட்டம்' என்ற பெயரில் சமுதாய நீர் வழங்கல் கருத்திட்ட மொன்று ஆரம்பிக்கப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் பூர்வாங்கப் பணிகளுக் காகச் செலவிடப்பட்ட தொகை யாதென் பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

(iv) மேற்படி பிரதேசத்திலுள்ள வைத்தியசாலையை யும், குரக்கன்ஹேனேகெதர, சபுமல்புரய, தங்கொல்ல மற்றும் கட்டுபொத்த ஆகிய பிரதேசங்களிலுள்ள 700க்கும் மேற்பட்ட குடும்ப அலகுகளிலுள்ள மக்களை உள்வாங்கும் வகையில், மேற்படி கருத்திட்டம் நடைமுறைப் படுத்தப்பட்டதை அறிவாரா என்பதையும்;

(v) தற்போது மேற்படி கருத்திட்டம் முழுமையாகச் செயலிழந்துள்ளமைக்கான காரணங்கள் யாவை யென்பதையும்;

(vi) மேற்படி கருத்திட்டத்தை துரிதமாக நடைமுறைப் படுத்தி மேற்குறிப்பிடப்பட்ட மக்களின் குடிநீர்த் தேவையைப் பூர்த்திசெய்ய நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(vii) ஆமெனில், அது ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House-

(i) whether he is aware that a community water project called 'Kurakkanhenegedara Drinking Water Project' has been started in Katupotha in the Kurunegala District;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) the amount spent on the initial activities of the aforesaid project;

iii) the present progress of the aforesaid project;

(iv) whether he is aware that the aforesaid project was implemented so that the hospital located in that area and people belonging to more than 700 family units in the areas of Kurakkanhenegedara, Sapumalpuraya, Dangolla and Katupotha are covered by the project;

(v) the reasons for the aforesaid project to come to a standstill by now;

(vi) whether steps will be taken to fulfill the drinking water requirement of the people in the above-mentioned areas by expeditiously implementing the aforesaid project; and

(vii) if so, the date on which the aforesaid project will resume?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙම ව්‍යාපෘතිය කුලියාපිටිය නැඟෙනහිර ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීමකට අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කුලියාපිටිය නැඟෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස නොගැඹුරු ළිඳක් ඉදි කිරීමටත්, දෙවන අදියර ලෙස නළ එළීම මඟින් එහි ජලය ප්‍රාදේශීය රෝහලට සහ ගම්මානවලට බෙදා හැරීමටත් නියමිතව ඇත.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියට අදාළ ළිඳ ඉදි කිරීම හා ඊට අදාළ සෙසු වියදම් සඳහා රුපියල් 3,211,697.19ක මුදලක් වැය කර ඇති අතර, එම වියදම් සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2017.08.11 දිනැති අංක 300903 දරන චෙක්පත මඟින් ප්‍රතිපාදන ලබා දී ඇත.

(iii) එම ව්‍යාපෘතියේ පළමුවන අදියර වන නොගැඹුරු ළිඳ සකස් කිරීම කුලියාපිටිය - නැඟෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් 2019.05.04 දින ඉදි කිරීම් සිදු කර අවසන් කරන ලදී.

(iv) ඔව්. ප්‍රදේශයේ රෝහල සහ මෙහි සඳහන් ගම්මානවල ජල සැපයුම ආවරණය කිරීම අපේක්ෂාවෙන් ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

(v) ළිඳ ඉදි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබුණු අතර, එය ඉදි කර කුලියාපිටිය නැඟෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී ඇත. නමුත් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දී නැත.

(vi) ප්‍රාදේශීය ලේකම් කුලියාපිටිය - නැඟෙනහිර විසින් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් එය අවසන් කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හැකියාව ඇති බව දන්වා සිටී.

(vii) ප්‍රතිපාදන ලද පසු ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කළ හැක.

(ආ) අදාළ නැත.

## යුධ හා ගුවන් හමුදාපතිවරුන්: පත් කිරීම
## இராணுவ மற்றும் விமானப்படைத் தளபதிகள்: நியமனம்
## COMMANDERS OF THE ARMY AND THE AIR FORCE: APPOINTMENT

560/2025

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chamara Sampath Dasanayake)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන යුද්ධ හමුදාපති සහ ගුවන් හමුදාපති පත් කරන ලද ක්‍රමවේදය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) යුද්ධ හමුදාපති තනතුර සහ ගුවන් හමුදාපති තනතුර සඳහා පත් කිරීමට වර්තමාන යුද්ධ හමුදාපතිවරයාට සහ ගුවන් හමුදාපතිවරයාට වඩා ජ්‍යෙෂ්ඨ සහ සුදුසුකම් සහිත නිලධාරීන් නොසිටියේද;

(iii) ජ්‍යෙෂ්ඨ සහ සුදුසුකම් සහිත වෙනත් නිලධාරීන් සිටියේ නම්, එම නිලධාරීන් නොසලකා හැර වර්තමාන යුද්ධ හමුදාපති සහ ගුවන් හමුදාපති පත් කිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) හමුදාපතිවරුන් පත් කිරීමේදී, ජ්‍යෙෂ්ඨත්වය හැර සලකා බලනු ලබන වෙනත් නිර්ණායක තිබේද;

(v) එසේ නම්, එම නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) இலங்கையின் தற்போதைய இராணுவத் தளபதியும் விமானப்படைத் தளபதியும் நியமிக்கப் பட்டுள்ள வழிமுறை வெவ்வேறாக யாதென்பதையும்;

(ii ) இராணுவத் தளபதி மற்றும் விமானப்படைத் தளபதி பதவிகளுக்கான நியமனங்களுக்கு, தற்போதைய இராணுவத் தளபதியையும் விமானப்படைத் தளபதியையும்விட சிரேஷ்ட மற்றும் தகுதியான அதிகாரிகள் இருக்க வில்லையா என்பதையும்;

(iii) மூப்புரிமையும் தகைமையும் கொண்ட வேறு அதிகாரிகள் இருந்திருப்பார்களாயின், அந்த அதிகாரிகளைப் புறக்கணித்து தற்போதைய இராணுவத் தளபதியையும் விமானப்படைத்

தளபதியையும் நியமிப்பதற்கான காரணங்கள் வெவ்வேறாக யாது என்பதையும்;

(iv) இராணுவத் தளபதிகளை நியமிக்கும்போது, மூப்புரிமையைத் தவிர கவனத்திற் கொள்ளப்படும் வேறு ஏதும் அளவுகோல்கள் உள்ளனவா என்பதையும்;

(v) அவ்வாறாயின், அத்தகைய அளவுகோல்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House-

(i) the procedure through which the present Commander of the Army and the Commander of the Air Force of Sri Lanka were appointed, separately;

(ii) whether there were no other more senior and qualified officers than the present Commander of the Army and the Commander of the Air Force to be appointed to the posts of Commander of the Army and Commander of the Air Force;

(iii) the reasons for appointing the present Commander of the Army and the Commander of the Air Force, separately, ignoring the other more senior and qualified officers, if any;

(iv) the other criteria that are considered in the appointment of Commanders of forces, other than the seniority criterion; and

(v) if so, what those criteria are?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 ඉ.(අ) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව යුද්ධ හමුදාධිපති හා ගුවන් හමුදාධිපති පත් කරන ලදී.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

## රජයේ රෝහල්වල බාහිර රෝගී අංශ: සංවර්ධනය
### அரசாங்க வைத்தியசாலைகளிலுள்ள வெளிநோயாளர் பிரிவுகள்: அபிவிருத்தி
### OUTPATIENT DEPARTMENTS IN GOVERNMENT HOSPITALS: DEVELOPMENT

617/2025

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු කිංස් නෙල්සන් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு கிங்ஸ் நெல்சன் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Kins Nelson)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල බාහිර රෝගී අංශවලින් ප්‍රතිකාර ලබා ගත් රෝගීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ රජයේ රෝහල්වල බාහිර රෝගී ප්‍රතිකාර අංශ සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශක ඉහළ අගයක් ගැනීමට බාහිර රෝගී ප්‍රතිකාර අංශ විශාල දායකත්වයක් ලබා දෙන බව පිළිගන්නේද;

(iv) එම අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இலங்கையிலுள்ள அரசாங்க வைத்தியசாலை களில் வெளிநோயாளர் பிரிவுகளில் சிகிச்சை பெற்றுக்கொண்ட நோயாளர்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியில் அரசாங்க வைத்திய சாலைகளில் வெளிநோயாளர் சிகிச்சைப் பிரிவுகளை அபிவிருத்தி செய்வதற்குச் செலவிடப்பட்ட தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) இலங்கையில் சுகாதார சுட்டிகள் உயர் பெறுமானத்தை அடைவதற்கு வெளிநோயாளர் சிகிச்சைப் பிரிவுகள் பாரிய பங்களிப்பை வழங்கிவருவதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) மேற்படி பிரிவை மேலும் அபிவிருத்தி செய்வ தற்கு மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of patients who received treatments at outpatient departments of government hospitals in each of the years from 2015 up until now, separately;

(ii) the amounts spent on developing outpatient departments of government hospitals in each of the years during the period referred to above, separately;

(iii) whether he accepts that the outpatient departments make a significant contribution towards achieving a high level in terms of health indicators in Sri Lanka; and

(iv) the measures that will be taken for developing that aspect further?

(b) If not why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**සභාபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) ඇමුණුම **01** මගින් දක්වා ඇත.

**Number of OPD Attendance by the type of Institutions 2015-2023**

| Type of Institution | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|
| TH | 1,342,198 | 5,092,587 | 4,969,147 | 5,465,832 | 5,811,240 | 3,355,416 | 2,407,910 | 3,995,838 | 5,554,473 |
| PGH | 304,238 | 1,191,823 | 1,194,867 | 873,517 | 897,506 | 439,502 | 112,514 | 271,712 | 0 |
| DGH | 1,225,410 | 4,810,322 | 4,801,976 | 4,893,237 | 4,574,690 | 2,939,792 | 1,760,756 | 2,888,308 | 3,720,679 |
| BHA | 1,054,395 | 4,168,930 | 4,221,791 | 4,813,004 | 5,023,726 | 3,865,971 | 2,295,835 | 3,967,802 | 5,475,926 |
| BHB | 1,497,650 | 5,902,246 | 6,695,708 | 6,600,840 | 6,515,994 | 4,160,456 | 2,190,008 | 3,929,311 | 5,213,106 |
| DHA | 1,117,720 | 4,527,516 | 4,507,434 | 4,703,746 | 4,600,260 | 3,594,219 | 2,217,366 | 4,080,931 | 5,119,707 |
| DHB | 2,019,004 | 8,168,948 | 8,350,131 | 8,508,747 | 8,813,185 | 6,358,385 | 4,157,030 | 7,491,340 | 9,218,577 |
| DHC | 2,605,971 | 9,968,502 | 10,340,922 | 10,769,883 | 11,279,707 | 6,840,619 | 5,099,693 | 8,260,519 | 9,924,680 |
| OTHER* | 268,744 | 1,913,252 | 1,880,191 | 1,794,434 | 2,166,019 | 1,056,421 | 817,500 | 1,325,525 | 1,916,409 |
| PMCU | 2,002,670 | 7,876,123 | 8,437,168 | 8,940,233 | 9,102,585 | 6,301,841 | 5,036,333 | 8,193,257 | 9,075,992 |
| **TOTAL** | **13,438,000** | **53,620,249** | **55,399,335** | **57,363,473** | **58,784,912** | **38,912,622** | **26,094,945** | **44,404,543** | **55,219,549** |

Source Medical Statistics Unit

* Other Hospitals includes institutions with indoor facilities such as Prison, Chest, Leprosy, Mental, Police, Cancer, Dental and Rehabilitation hospitals

(ii) ඇමුණුම **02** මගින් දක්වා ඇත.

**බාහිර රෝගී ප්‍රතිකාර අංශ සංවර්ධනය කිරීම සඳහා වැය කර ඇති මුදල්**

| No | Hospital | Year | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 (Rs.) | 2016 (Rs.) | 2017 (Rs.) | 2018 (Rs.) | 2019 (Rs.) | 2020 (Rs.) | 2021 (Rs.) | 2022 (Rs.) | 2023 (Rs.) | 2024 (Rs.) | 2025 (Rs.) |
| 1 | National Hospital Sri Lanka | - | 1,127,514.00 | 2,399,965.00 | 5,836,926.25 | 3,379,230.00 | 201,000.00 | 756,252.63 | 389,175.00 | - | 4,326,495.00 | - |
| 2 | Colombo South Teaching Hospital | 4,538,375.00 | 2,587,360.00 | 1,606,190.00 | 1,582,077.00 | 1,941,929.00 | 2,478,298.00 | 2,590,416.00 | - | 1,107,139.00 | 5,451,329.00 | 885,720.00 |
| 3 | Lady Ridgeway Hospital | 99,190.33 | 486,229.80 | 5,331,138.69 | 3,614,019.61 | 7,442,045.47 | 964,251.87 | 1,838,242.90 | 1,010,068.47 | 1,244,558.84 | 7,342,441.95 | - |
| 4 | Apeksha Hospital Maharagama | - | - | - | 343,000.00 | 532,947.86 | 2,196,304.35 | 408,307.12 | 2,130,394.08 | 3,860,906.84 | 906,293.48 | 31,502.90 |
| 5 | Colombo East Base Hospital Mulleriyawa | 599,542.35 | 128,000.00 | 169,811.10 | | 477,430.10 | | | | | 14,739,371.17 | |
| 6 | IDH | | | | | | | | | | | |
| 7 | NIMH - Mulleriyawa | | | | | | | | | | | |
| 8 | De Soysa hospital | - | - | - | - | 71,156.25 | 400,485.04 | 115,806.24 | - | 89,530.38 | 373,267.94 | - |
| 9 | Castle street hospital for women | | | | | | | | | | | |
| 10 | National Eye Hospital | | | | | | | | | | | |
| 11 | IOH - Maharagama | | | | | | | | | | | |
| 12 | National Dental Hospital | - | - | - | - | - | - | - | - | - | - | - |
| 13 | Colombo North Teaching Hospital - Ragama | - | 1,255,678.01 | 2,660,048.44 | 5,785,393.95 | 936,536.81 | 311,920.74 | 330,607.74 | - | 528,168.74 | 302,561.02 | - |
| 14 | Rheumatology & Rehabilitation Hospital,Ragama | | | | | | | | | | | |
| 15 | DH Kandana | | | | | | | | | | | |
| 16 | National Hospital for Respiratory Diseases, Welisara | - | - | - | 113,750.00 | - | 558,664.44 | 693,215.63 | - | - | - | - |
| 17 | Leprosy Hospital - Handala | - | - | - | - | - | - | - | - | - | - | - |
| 18 | DGH Negambo | - | - | - | - | - | - | - | - | - | 382,150.00 | - |
| 19 | TH Kalutara | | | | | | | | | | | |
| 20 | National Hospital - Kandy | | | | | 4,035,580.00 | | | | 2,988,400.00 | 2,700,000.00 | |
| 21 | BH Gampola | | | | | | | | | | | |
| 22 | TH Peradeniya | 125,000.00 | 5,939,900.19 | 424,159.03 | 1,446,169.74 | 124,098.06 | 646,985.16 | 1,240,850.14 | 305,608.76 | 558,265.11 | | |
| 23 | Sirimawo Bandaranayake Hospital - Peradeniya | | | | 5,745,268.34 | | | | | | | |

| No | Hospital | Year | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 (Rs.) | 2016 (Rs.) | 2017 (Rs.) | 2018 (Rs.) | 2019 (Rs.) | 2020 (Rs.) | 2021 (Rs.) | 2022 (Rs.) | 2023 (Rs.) | 2024 (Rs.) | 2025 (Rs.) |
| 24 | DGH Nawalapitiya | | | | | | | | 1,002,832.00 | 2,969,219.00 | 2,217,399.00 | |
| 25 | DGH NuwaraEliya | - | - | - | - | - | - | - | - | - | - | - |
| 26 | DGH Mathale | - | - | - | - | - | - | - | - | 590,401.03 | 62,820,850.02 | - |
| 27 | National Hospital - Galle | 225,948.55 | 225,948.55 | 1,574,255.05 | 7,733,998.55 | - | 5,558,880.09 | - | - | 1,463,102.63 | 20,694,455.36 | |
| 28 | German Sri Lanka Friendship Hospital for Women - Galle | - | - | - | - | - | - | - | - | - | - | - |
| 29 | TH Matara | | | | | | | | | | | |
| 31 | TH Hambantota | | | | | | | | | | | |
| 32 | TH Jaffna | - | - | - | - | - | - | - | - | - | - | - |
| 33 | BH Akkaraipattu | 904,373.20 | - | - | - | - | - | - | - | 1,273,540.00 | 924,523.00 | - |
| 34 | Ashroff Hospital - Kalmunai | - | - | 4,157,157.75 | - | - | - | - | | - | - | - |
| 35 | BH Kalmunai (North) | - | - | - | - | - | 500,000.00 | 454,780.83 | | - | - | - |
| 36 | DGH Ampara | | | | | 2,271,465.00 | 834,178.00 | | 834,178.00 | 1,559,222.00 | 323,376.08 | 500,000.00 |
| 37 | BH Pottuvil | | | | | | | | | | | |
| 38 | TH Trincomalee | - | - | - | - | - | - | 4,666,525.00 | 730,000.00 | 4,669,900.00 | - | - |
| 39 | BH Kantale | 1,992,248.38 | | | | 141,321.00 | | | | | | |
| 40 | TH Batticaloa | | | | | | | | | | | |
| 41 | DGH Chilaw | - | 2,355,711.79 | 87,631.62 | - | - | 35,795.03 | - | 486,017.00 | - | 408,117.31 | - |
| 42 | TH Kurunagala | | | | | | | | | | | |
| 43 | TH Kuliyapitiya | - | - | - | - | - | 588,566.72 | 4,079,625.00 | 436,907.00 | 8,055,486.00 | 193,361.90 | - |
| 44 | TH Polonnaruwa | | | | | | | | | | | |
| 45 | CKD Hospital Polonnaruwa | - | - | - | - | - | - | - | - | - | - | - |
| 46 | TH Anuradhapura | | | | | | | | | | | |
| 47 | TH Badulla | 1,173,884.32 | 310,757.35 | - | - | 6,658,247.75 | 2,747,717.70 | 3,339,103.48 | 133,227.02 | 3,195,767.65 | 755,841.91 | - |
| 48 | TH Monaragala | - | - | - | 5,732,394.50 | - | 333,120.00 | - | - | 271,148.00 | 2,565,310.47 | - |
| 49 | DGH Kegalle | - | - | - | 2,121,439.91 | 1,236,116.88 | 1,262,415.24 | 254,885.60 | - | - | 19,738,457.83 | |
| 50 | TH Rathnapura | 3,658,766.18 | 6,340,374.67 | 127,362.50 | 2,024,961.28 | 4,686,216.73 | 1,046,204.64 | 676,627.24 | 7,110,792.34 | 10,859,221.69 | 32,019,672.48 | 3,981,058.43 |
| 51 | DGH Embilipitiya | | | | | | | | | | | |
| | Total | 13,317,328.31 | 20,757,474.36 | 18,537,719.18 | 42,079,399.13 | 33,934,320.91 | 20,664,787.02 | 21,445,245.55 | 14,569,199.67 | 45,283,976.91 | 179,185,274.92 | 5,398,281.33 |

(iii) ඔව්. ශ්‍රී ලංකා සෞඛ්‍ය දර්ශකය ඉහළ අගයක් ගැනීමට බාහිර රෝගී ප්‍රතිකාර අංශයට අමතරව ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා රෝග බෝ වීම වැළැක්වීම යන අංශ විශාල දායකත්වයක් ලබා දේ.

(iv) දැනට ලෝක බැංකු මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 1067 (PHSEP) මඟින් දිවයින පුරා පිහිටි හඳුනාගත් ප්‍රාථමික වෛද්‍ය සත්කාර සේවා ආයතනවල ප්‍රතිකාර සේවා වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පිරිවැය ප්‍රතිසාධන විදුලි බිල, SVAT අහෝසි කිරීම සහ ඩිජිටල් අපනයන සඳහා බද්ද
### செலவு மீளாக்க மின் கட்டணம், SVAT நீக்கம் மற்றும் டிஜிட்டல் ஏற்றுமதிகளின் வரி
### COST-REFLECTIVE ELECTRICITY TARIFF, ABOLITION OF SVAT AND TAX ON DIGITAL EXPORTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. දුප්පත් හා අසරණභාවයට පත් කොට ඇති ජනතාව එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් හා නිවැරැදි වැඩ පිළිවෙළක අඩංගුව හා එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ නැවත සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුවේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වුවද, වත්මන් රජය ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පෙර පැවැති රජයේ ප්‍රතිපත්ති හා අනුව යමින් කටයුතු කරන ආකාරය දක්නට ලැබේ. ඒ කියන්නේ එතැනදී රජය මැතිවරණ පොරොන්දුව කඩ කර තිබෙනවා. එබැවින්, ජනතාව වෙනුවෙන් පහත සඳහන් ප්‍රශ්න මම යොමු කරමි.

1. පසුගිය දා පැවැති IMF සිව්වන සමාලෝචනය පිළිබඳ කාර්ය මණ්ඩල ගිවිසුම සම්බන්ධයෙන් වන මාධ්‍ය සාකච්ඡාවේදී විදුලි බිල "පිරිවැය - ප්‍රතිසාධන පදනම" - cost-recovery method - මත පිහිටි මිල ගැළපුම් යන්ත්‍රණය නිසි ක්‍රියාකාරිත්වයට ගෙන ආ යුතු බව ප්‍රකාශයට පත් විය. ඒ කියන්නේ, IMF එක කියනවා cost-recovery method එක ක්‍රියාත්මක කරලා, ප්‍රතිසාධන පදනම යටතේ විදුලි ගාස්තු වැඩි කරන්න කියලා. එම ස්ථාවරය තුළ ඉදිමින් වර්තමාන රජය විසින් විදුලි ගාස්තු වැඩි කිරීමට කටයුතු කරන්නේද?

   විශේෂයෙන්ම මට මේ කාරණය කියන්න අවසර දෙන්න, ගරු කථානායකතුමනි. IMF එක කියන cost-recovery method එක සහ අපේ මහජන උපයෝගිතා කොමිසම - PUCSL - ක්‍රියාත්මක කරන cost-recovery pricing එක අතර ලොකු පරස්පරයක් තිබෙනවා. හැබැයි රජය IMF එකේ cost recovery ක්‍රමවේදය පිළිගෙන තිබෙනවා, PUCSL එකේ cost recovery ක්‍රමවේදය බැහැර කරලා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපට සෘජු පිළිතුරක් අවශ්‍යයි.

2. එසේ විදුලි ගාස්තු වැඩි කිරීම හරහා ජනතාවට සිදු වන බලපෑම පිළිබඳව රජය විසින් මේ වන විට තක්සේරුවක් සිදු කර තිබේද? ඒ කියන්නේ ඒකක 0-90 යටතේ එක් එක් කාණ්ඩවල විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි බිල යළි කොපමණ ප්‍රමාණයක් වැඩි වේද? විශේෂයෙන්ම 0-90 ගැන අප කථා කළේ, ඒ අය මේ ජන සමාජයේ ඉන්න අසරණම ජන කොට්ඨාසය වන නිසා.

   මේ IMF ගිවිසුමේ කොන්දේසිවලට යටත් වීම තුළ විදුලි බිල කොපමණ ප්‍රමාණයකින් වැඩි කරන්නට රජය කටයුතු කරනවාද කියන එක අපි අහන්න කැමැතියි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

3. SVAT අවසන් කොට හඳුන්වා දීමට බලාපොරොත්තු වන නව යන්ත්‍රණය සකස් කොට අවසන්ද? ඒ කුමක්ද? නව ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර, මීට පෙර වූ වසර ගණනාවක VAT ආපසු ගෙවීම් හිඟයන් පියවීම සඳහා රජය කටයුතු කරන්නේද? නව බදු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තරම් තාක්ෂණික හා මානව සම්පත් සූදානමක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු වේද?

4. අපනයන ක්ෂේත්‍රය දැනටමත් ජාත්‍යන්තර වෙළෙඳ පොළ වෙනස්කම් හමුවේ අභියෝගවලට මුහුණ දෙන අවස්ථාවකදී SVAT අහෝසි කිරීමෙන් අපනයනකරුවන් මත පැනවෙන අමතර පීඩනය සම්බන්ධව රජය අධ්‍යයනයක් සිදු කළේ ද? විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික අපනයනකරුවන්ට ඇති වන මූල්‍ය පීඩනය සම්බන්ධයෙන් රජය විශේෂ අවධානයක් දක්වා තිබේ ද? එසේ නම්, ඒ කුමක්ද?

ඇත්ත වශයෙන්ම මේ SVAT එක ක්‍රියාත්මක කිරීම අහෝසි කරන්නේත් IMF එකේ උපදෙස් මත ද කියන එක මම අහන්න කැමැතියි. මම කියන්න කැමැතියි, මේ SVAT එක නැවත ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, ඒක අපේ අපනයනකරුවන්ට ලබා දෙන ශක්තියක්.

5. රජය විදේශීය ඩිජිටල් සේවා සපයන්නන් වෙනුවෙන් පැනවූ බදු මඟින් අපේක්ෂිත ආදායම කොපමණද? මෙම තීරණයට බලපෑ IMF නිර්දේශ කවරේද?

මොකද, අපට අහන්න ලැබුණා, IMF එක සියයට 30ක් බදු ගහන්න කිව්වා, රජය බදු ගහන්නේ සියයට 15යි කියලා. ඇයි, මේවාට බදු අය කරන්නේ? ඒක IMF කොන්දේසියක් ද? අපි ඒ ගැන දැන ගන්නට ඕනෑ. ඩිජිටල් සේවා සපයන්නන්ගේ සේවා ප්‍රතිලාභ කෙරෙහි මෙමඟින් ඇති වන බලපෑම සම්බන්ධව රජයේ ඇගයීම කෙබඳු ද?

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ digital exportsවලින් විශාල මුදල් ප්‍රමාණයක් - අතිවිශාල මුදලක් - උපයනවා. මේ, අපේ රටේ ව්‍යවසායකයින්. හැබැයි, මේ ව්‍යවසායකත්වයට එරෙහිව මේ රජය digital exports මත පනවා තිබෙනවා, සියයට 15ක බද්දක්. මම අහන්න කැමැතියි, ඒකත් IMF කොන්දේසියක් ද කියන ප්‍රශ්නය.

6. රජය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ජූලි 01 වැනි දින සිට සංශෝධිත විශේෂ පොලී යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නංවන බව පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කෙරුණි. එය සියයට 15ක අවම පොලී ප්‍රතිශතයක් තහවුරු කරයි ද?

අපි පෙන්වා දීලා තිබෙනවා, ආණ්ඩු ගණනාවක් භේදයකින් තොරව මේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් සියයට 15ක පොලී ප්‍රතිශතයක් ඒ අයගේ තැන්පතු වෙනුවෙන් -උපරිමය ලක්ෂ 15ක තැන්පතු වෙනුවෙන්- ලබා දුන්නා කියන කාරණය. නමුත්, දැන් ඒක ලැබෙන්නේ නැහැ. ඒක ලබා නොදෙන්නේත් IMF කොන්දේසි මත ද කියන එක මම අහන්න කැමැතියි.

ළමා තැන්පතු මඟින් අය කරන රඳවා ගැනීම් බදු නිසා සාමාන්‍ය ජනතාවට ඉමහත් ගැටලු ඇති කර තිබෙන බව රජය දන්නේ ද? ඒ සම්බන්ධයෙන් රජය ලබා දෙන විසඳුම් කවරේ ද?

ගරු කථානායකතුමනි, පොඩි දරුවන්ගේ ගිණුම්වලටත් බදු ගහනවා; Tax අය කර ගන්නවා, කුඩා දරුවන්ගේ ගිණුම්වලින්. ඒක සාධාරණ ද? ඒකත් IMF ගිවිසුමේ ප්‍රතිඵලයක් ද කියන එක මම අහන්න කැමැතියි.

7. ආණ්ඩුව විසින් වයස අවුරුදු 18ට වැඩි සෑම අයෙකුටම TIN අංකයක් ලබා ගැනීමට නියම කර තිබුණ ද, එම අංකය ලබා ගැනීම ගැටලුසහගත වී තිබෙනවා. එබැවින්, TIN අංකය ලබා දීමට අනුගමනය කරනු ලබන වැඩ පිළිවෙළ පැහැදිලි කරන්නේ ද?

මේ ඉදිරිපත් කළ ප්‍රශ්නවලට මම රජයෙන් විධිමත් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. IMF එකට අනුව, පිළිගත් ක්‍රමවේදයකට අනුව විදුලි මිල ගැළපීම් කරන බව සඳහන් කෙරුණා. එය සම්පූර්ණයෙන්ම වැරැදි ප්‍රකාශයක්.

දැනටමත් ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකතුව, පවතින ව්‍යුහාත්මක මිනුම් දඬු අනුව විදුලි ගාස්තු සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිසාධන පදනම - cost-recovery basis - මත පිහිටි මිල ගැළපුම් යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ඉදිරියට සිදු වන විදුලි ගාස්තු සංශෝධනය ද පිරිවැය ප්‍රතිසාධන පදනම මත පිහිටි මිල ගැළපුම් යන්ත්‍රණයකට අනුව ක්‍රියාත්මක වීමට නියමිත අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම විදුලි ගාස්තු සංශෝධනය සඳහා අවශ්‍ය ක්‍රමවේද පිළිබඳව නිගමනය කර ගැනීමට අදාළ ගණනය කිරීම් සිදු කරමින් පවතින බව දැන ගන්නට ඇත.

එම තොරතුරු පදනම් කරගෙන ස්වාධීනව, මහජන උපයෝගිතා කොමිසම විසින් පවතින ක්‍රමයට අනුගතව අවශ්‍ය වැඩ කටයුතු කර ඒ පිළිබඳ තීරණය ප්‍රකාශයට පත් කරනු ඇත.

2. ඉහත පළමුවෙනි ප්‍රශ්නයට දුන් පිළිතුරට අනුව විදුලිබල මණ්ඩලය විසින් අදාළ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බැවින් ප්‍රශ්න අංක 2 යටතේ සඳහන් කරුණු නැවත පැන නොනඟී.

3. SVAT සම්බන්ධයෙන් නව යන්ත්‍රණයක් සකස් කරමින් තිබෙන බවත්, ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් අය වැය කථා බහ තුළ දී ප්‍රකාශයට පත් කරන්නට යෙදුණ අතර, එය අවදානම පදනම් කරගත් - risk-based - ආපසු ගෙවීමේ ක්‍රමයකි. බදු ගෙවන්නාගේ අවදානම -අඩු අවදානම, මධ්‍යම අවදානම සහ ඉහළ අවදානම මත- කාණ්ඩගත කර එම ආපසු ගෙවීම් සිදු කරයි. වැට් බදු ආපසු ගෙවීමේ හිඟ පියවීමට කටයුතු කරමින් පවතී. හිඟ ආපසු ගෙවීම් ලේඛනගත කිරීම අවසන් කිරීමට නොහැකිවීමට හේතු කැඳවීම් සිදු කරමින් පවතින අතර, බදු ගෙවන්නන් විසින් අදාළ තොරතුරු නිසි පරිදි භාර නොදීම ද ආපසු ගෙවීම ප්‍රමාද වීමට හේතු වී ඇත. මේ පිළිබඳව බදු ගෙවන්නන් දැනුවත් කරමින් පවතී. මේ කාර්යය විධිමත්ව සහ වේගවත්ව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සම්පත් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 වර්ෂයේ දී පුද්ගලයන් - සේවකයන් - 100දෙනෙකු, 2026 වර්ෂයේ දී සුදුසු නිලධාරින් 200දෙනෙකු වශයෙන් නව නිලධාරින් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

4. මෙම ප්‍රශ්නයත් SVAT සම්බන්ධයෙන්මයි.

සුදුසුකම් ලබන අපනයනකරුවන්හට ඔවුන් නියමිත පරිදි බදු වාර්තා ලබා දී ආපසු ගෙවීම ඉල්ලා ඇත්නම් බදු වාර්තාව ලබා දීමට නියමිත දින සිට දින 45ක් ඇතුළත ආපසු ගෙවීම් කිරීමට කටයුතු සකස් කරමින් පවතී. නිසි

සුදුසුකම් ලබන අපනයනකරුවන් තේරීමේ දී ඔවුන්ගේ මුළු සැපයුමෙන් අපනයන ප්‍රතිශතය සියයට 50ක් ඉක්මවන බදු ගෙවන්නෙක් නම්, සුදුසුකම් ලබන බදු ගෙවන්නෙක් ලෙස හඳුනා ගනු ලැබේ. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් ද ඔවුන්ගේ අපනයන සඳහා දක්වන දායකත්වය මත සුදුසුකම් ලබන අපනයනකරුවන් ලෙස තේරීමට අවස්ථාව සලසා දී ඇත. මේ තුළින් සියයට 50කට වඩා අඩු අපනයනකරුවෙක් වුවද සියයට 50කට වඩා වැඩි අපනයනකරුවෙක් කිරීම සඳහා උනන්දු කිරීමක් ද සිදු කළ හැකිය. මෙම තෝරා ගැනීම වාර්ෂිකව සිදු කරනු ලැබේ.

5. මෙම ප්‍රශ්නය ඩිජිටල් සේවාකරණය සම්බන්ධයෙන් අසා තිබෙන්නේ.

2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනත යටතේ දක්වා ඇති පරිදි පාරිභෝගිකයන් වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා, digital platform එකක් හරහා අන්තර්ජාල සේවා සපයන්නෙකු විසින් ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් සේවා විකිණීම් ඇතුළත් කර එකතු කළ අගය මත බද්දෙහි - Value Added Tax - එකෙහි විෂය පථය පුළුල් කිරීමට අපේක්ෂා කරනු ලබයි. 2025 ඔක්තෝබර් මස පළමුවෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නිර්වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ තැනැත්තෙකු වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සපයනු ලබන සේවා සඳහා එකතු කළ අගය මත බදු මේ අනුව අදාළ වේ. වැට් බද්ද අවසානයේ ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයා වන බැවින් ගෝලීයකරණය වූ ව්‍යාපාරික ලෝකය ශීඝ්‍රයෙන් වෙනස්වීම හමුවේ අනේවාසික පුද්ගලයන් විසින් ඩිජිටල් ලෙස සපයනු ලබන සේවා සඳහා VAT එක යෙදීම සාධාරණ මෙන්ම අත්‍යවශ්‍ය කරුණක් ලෙස හඳුනා ගෙන ඇත. මෙම ප්‍රවේශය දේශීය සේවා සපයන්නන්හට අවාසියක් නොවන බවත්, මෙරට බදු ක්‍රමය වර්ධනය වන ඩිජිටල් ආර්ථිකයකට අනුගතවන බවත් සහතික කරයි. මෙම ක්‍රමය සඳහා ලියාපදිංචි වීම, ගෙවීම් කිරීම සහ අනුකූලතාව දැක්වීම පිළිබඳව කාර්ය පටිපාටිය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් යථා කාලයේ දී නිශ්චිතව දක්වනු ලැබේ. "ඉලෙක්ට්‍රොනික වේදිකාව" - "digital platform", "ස්ථිර ස්ථානය", "නිර්වාසික තැනැත්තා" යන පද එකතු කළ අගය පිළිබඳව බදු පැනවීම සඳහා තිබෙන පනතේ නිර්වචනය කර ඇත.

මෙම බද්දට අයත් ප්‍රධාන සේවා ඔබතුමා විසින් ඉල්ලා තිබුණා. ඒ සේවාවන් ලැයිස්තුවක් ඇමුණුමක් ලෙස මම **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

6. මෙම ප්‍රශ්නය අසා තිබෙන්නේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලිය සම්බන්ධයෙන්.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය 2025 ජූලි 01වැනි දින සිට ක්‍රියාත්මක වන අතර, 2025 ජූලි 01වැනි දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් මාස 12ක කාලයකට විවෘත කරනු ලබන නව ස්ථාවර තැන්පතු මෙම යෝජනා ක්‍රමයට අදාළ වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවෙකුට යෝජනා ක්‍රමයකට ක්‍රියාත්මක වන ඕනෑම බැංකුවක් හරහා තැන්පත් කළ හැකි උපරිම මුදල රුපියල් මිලියන 1ක් වේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තමන්ගේ සෞඛ්‍ය සේවා වියදම් වැනි අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රකාශිත බරිත සාමාන්‍ය ප්‍රමුඛ තැන්පතු අනුපාතයට -Weighted Average Prime Deposit Rate එකට - අමතරව සියයට 3ක වාර්ෂික අමතර පොලියක් ගෙවනු ලැබේ. බැංකු වෙත ගෙවිය යුතු අමතර පොලිය පියවීම සඳහා වූ යෝජනා ක්‍රමය වෙනුවෙන් දැරිය යුතු රුපියල් බිලියන 15ක් මෙම වසරේ අය වැය මඟින් වෙන් කර ඇත. මෙම යෝජනා ක්‍රමය තෝරාගත් රාජ්‍ය බැංකු හරහා ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

2023 වසරේ ජනවාරි 01වැනි දින සිට පැවැත්වෙන පරිදි සියලු පොලී ගෙවීම් සඳහා රඳවා ගැනීමේ බද්ද සියයට 5ක් ලෙස පනවනු ලැබිණි. තවද, 2018 සිට ක්‍රියාත්මක වූ සියයට 5 රඳවා ගැනීමේ බද්ද බාල වයස්කාර දරුවන්ටත් එම බද්දෙන් කිසිදු ආකාරයක සහනයක් ලබාගත නොහැකි -විශේෂයෙන්ම ඒක emphasize කරනවා, ගරු කථානායකතුමනි- අවසාන රඳවා ගැනීමේ බද්දක් ලෙස ක්‍රියාත්මක විය. එනමුත් 2025 අප්‍රේල් 01වැනි දා සිට මේ සඳහා වෙනස්වීම් යෝජනා කර තිබෙනවා. එම යෝජනාවලට අනුව 2025 අප්‍රේල් 01වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලී අනුව රඳවා ගැනීමේ බද්ද සියයට 10ක් ලෙස දැනුවත් කර තිබෙනවා. පනතට අනුව ආදායම් බදු අරමුණු සඳහා බාල වයස්කාර දරුවන් ද වෙනත් ඕනෑම පුද්ගලයෙකු ලෙස පිළිගැනේ. ඒ අනුව 2025 මාර්තු 31වැනි දින කාලය තෙක් බාලවයස්කාර ගිණුම් සඳහා ලැබෙන පොලියෙන් සියයට 5ක් සාමාන්‍ය පරිදි රඳවා ගැනීමේ බද්දට යටත් විය. ගරු කථානායකතුමනි, ඒක අලුත් වාතාවරණයක් නොවෙයි. මේ දක්වාත් ඒ විධියටම තමයි ක්‍රියාත්මක කෙරුණේ. නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ආදායම් බදු ආපසු ගෙවීමේ ක්‍රමය යටතේ රඳවා ගැනීමේ බදු ආපසු ලබා ගැනීමටත් ක්‍රමයක් සූදානම් කර ඇත. ඒ අදාළ බාල වයස්කරුවන් සඳහා බදු ආපසු ගෙවීමක් තිබේ නම් ඒ සඳහා විශේෂයෙන් ක්‍රමයක් සූදානම් කර තිබෙනවා. ඒ හැර මෙම රඳවා ගැනීමේ බද්දෙන් ඔවුන් නිදහස් කිරීමට පසුගිය කාලයේදී කිසිම යාන්ත්‍රණයක් නොතිබිණි. කෙසේ වෙතත්, 2025 අප්‍රේල් මස 01වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බාල වයස්කරුවන්ගේ භාරකරුවන්ටද අදාළ බැංකුව හෝ මූල්‍ය ආයතන වෙත ස්වයං ප්‍රකාශනයක් - self-declaration එකක් - නිකුත් කර හැකි අතර, මේ රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් වීමේ සහනය ඒ අනුව ලබා ගත හැකිය. අවශ්‍ය චක්‍රලේඛ සහ ක්‍රියා පටිපාටිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

7. ඊළඟට, TIN අංකය සම්බන්ධයෙන් ගත්තාම, ඊ-සේවාව මඟින් TIN අංකයක් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇත. එසේ නොහැකි තැනැත්තෙකුට ඒ කියන්නේ online ක්‍රමය විසින් ලබා ගන්නට නොහැකි නම් ඕනෑම තැනැත්තෙකුට ප්‍රාදේශීය කාර්යාලයකට අයදුම්පතක් ඉදිරිපත් කර TIN අංකය ලබා ගත හැකිය. ඒ, දෙවැනි ක්‍රමයයි. තුන්වැනි ක්‍රමය මෙයයි. TIN අංකය ලබා දීම කඩිනම් කිරීම සඳහා bulk forced registration ක්‍රමය මඟින්ද වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ඇත. ඒ කියන්නේ ආයතනය තුළ තිබෙන දැනට පවතින දත්ත පදනම් කර ඒ registration ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබනවා. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රම භාවිත කර මේ වන විටත් TIN අංක මිලියන 10ක් නිකුත් කර ඇති අතර එම ක්‍රම භාවිත කර තවදුරටත් TIN අංකය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම මේ විවාදයක් ඇති කර ගන්න යනවා නොවෙයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පළමු ප්‍රශ්නයට පිළිතුරු දීමේදී කිව්වේ, මේ විදුලි බිල ඉහළ දැමීමේ වැඩ පිළිවෙළ තුළ IMF එකේ කොන්දේසිවලට යට වෙලා නැති බව. හැබැයි මම එතුමාගේ අවධානය යොමු කරවනවා, Evan Papageorgiouගේ ප්‍රකාශයට. ඔහු තමයි, IMF Mission Chief for Sri Lanka. 2025 අප්‍රේල් 29වැනි දා ඔහුම ප්‍රකාශ කරනවා, two conditions. ඔහුගේ ප්‍රකාශයේ මෙසේ සඳහන් වනවා:

> ".... the implementation of prior actions relating to restoring electricity cost-recovery pricing and ensuring proper function of the automatic electricity price adjustment mechanism."

IMF Mission Chief for Sri Lanka ලංකාවේදීම කියනවා, ඔව්, කොන්දේසියක් තිබෙනවා, විස්තීර්ණ ණය පහසුකම් වාරිකය ලබා දීමට තිබෙන එක කොන්දේසියක් තමයි, electricity cost-recovery pricing වැඩසටහන කියලා. ඉතින්, නියෝජ්‍ය ඇමතිතුමා කොහොමද කියන්නේ ඒක කොන්දේසියක් නොවෙයි කියලා? දැන් ඔබතුමා පළමු උත්තරයේම කියනවා, ඒක කොන්දේසියක් නොවෙයි කියලා. දෙවැනි ප්‍රශ්නයට දුන් උත්තරේදී ඔබතුමා කියනවා, ඔව්, ඒක කොන්දේසියක් කියලා. ඒ සම්බන්ධව මම ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් කර ගන්න කැමැතියි. IMF Mission Chiefගේ ප්‍රකාශය ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ඔහුම කියනවා, කොන්දේසි තිබෙනවා, ඒ කොන්දේසි අනුගමනය නොකිරීම තුළ තමයි විස්තීර්ණ ණය පහසුකම් වාරිකය - tranche එක - ලබා දීම යම් කාලයකට කල් ගිහිල්ලා තිබෙන්නේ කියලා. ජනාධිපතිතුමාත් පිළිගෙන තිබෙනවා, විදුලි බිල ඉහළ දමනවා කියලා. ඇයි පැහැදිලිව නොකියන්නේ, IMF එක සමඟ අත්සන් කරපු ගිවිසුමේ කොන්දේසිය නිසා විදුලි බිල ඉහළ යනවාය කියලා? ඇයි ඒ කාරණාව රටට හෙළිදරව් නොකරන්නේ? ඒක නේ ඇත්ත කථාව. විදුලි බිල වැඩි කරන කල් විස්තීර්ණ ණය පහසුකම් වාරිකය - tranche එක - ලැබෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, මෙතුමා කිව්වා, පළමු ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් පසුව, දෙවැනි ප්‍රශ්නයේදී ඒකට පරස්පර පිළිතුරක් දුන්නාය කියලා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා නැවත වතාවක් පිළිතුරට ඇහුම්කන් දුන්නොත් හොඳයි. දෙවැනි ප්‍රශ්නයට පිළිතුර ලෙස මා සඳහන් කළේ, පළමුවෙනි ප්‍රශ්නයට දුන් පිළිතුරට අනුව දෙවැනි ප්‍රශ්නය යටතේ පවතින කරුණු නැවත පැන නොනඟී කියලා. එහිදී contradictory පිළිතුරක් දුන්නේ නැහැ. මම හිතනවා, ඔබතුමා උත්තරය සාවධානව අහගෙන ඉන්න ඇති කියලා. ගරු කථානායකතුමනි, නමුත් මා එය නැවත වතාවක් reiterate කරන්නම්. IMF එකේ වැඩ පිළිවෙළ යටතේ සාකච්ඡා කරන්නේ, රටේ දැනට තිබෙන නීති සහ ක්‍රමවේදයන්ට අනුගතව තිබෙන පිරිවැය ප්‍රතිසාධන ක්‍රමය - cost-recovery method එක - ක්‍රියාත්මක කළ යුතුයි කියලා. ඒක අලුත් දෙයක් නොවෙයි. මම පැහැදිලිව සඳහන් කළේ එයයි. එම ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්නට රටක් විධියට ශ්‍රී ලංකාව එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එම වැඩ පිළිවෙළ ඒ ක්‍රමවේදයට අනුව කරගෙන යනවා.

ඊළඟට, වැරදි අදහසක් සමාජගත කරන්නට උත්සාහ කළා, IMF ණය වාරිකය ලබා දීම කල් ගිහින් තිබෙනවාය කියලා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ දැනගැනීම සඳහා ඒ ගැන මම පොඩ්ඩක් පැහැදිලි කරන්නම්. එය ක්‍රියාත්මක වෙන්නේ යම්කිසි process එකකට අනුවයි. අද දවසේ Staff-level Agreement එක අත්සන් කරලා, ඊළඟ දවසේ ලංකාවට මුදල් ලබා දෙන්නේ නැහැ, විපක්ෂ නායකතුමනි. පළමුවෙන් කරන්නේ, Staff-level Agreement එකක් අත්සන් කිරීම. පසුව, ඒ Staff-level Agreement එක IMF Executive Board එකට ඉදිරිපත් කරනවා. Board එක රැස්වන දිනයක් තිබෙනවා. ඒ රැස්වන දිනයේදී Board එකේදී ඒ පිළිබඳව සලකා බලා තමයි මුදල් දීම පිළිබඳව තීරණයක් ගන්නේ. එම නිසා, කල් ගිහින් තිබෙනවාය කියන එකත් වැරදි ප්‍රකාශයක්.

ගරු කථානායකතුමනි, එතුමා පැහැදිලි කිරීමක් කරන ලෙස සඳහන් කළ නිසායි මම මේ කරුණු ඉදිරිපත් කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමාගේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே! பாராளுமன்ற, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I am extremely disappointed in the manner we are treated in this House. I say this with a lot of pain.

Sir, Standing Order No. 33(1), which you told me to refer to - either I do not understand Sinhala or English - very clearly specifies, I quote:

> "Any Member may put not more than two supplementary questions on any such answer given under Standing Order 32:
>
> Provided that, such supplementary questions shall not introduce matters not included in the original question, and shall be put only for the purpose of further elucidating any matter arising out of an oral answer:"

So, there is no such thing that prevents from asking a second Supplementary Question. There is a propriety to ask two Supplementary Questions by one Hon. Member. You told me to refer to that. So, where is it referred to in this Standing Order?

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයා - *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, ඒක වැරැදියි. It states "Any Member". - *[Interruption.]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
At least, a sense of respect should be shown to the Hon. Members here. We may make mistakes, we certainly accept that, but we rise in this House just because we also want to get a point across. So, Sir, all I say is, very specifically two Supplementary Questions could be asked on a Question and that is the reason why, when the Hon. Member who asked the Quesion got up and said that he was not asking the second Supplementary Question, I got up to ask that. After I was found fault with and deprived of asking that Supplementary Question, now I cannot go back and ask the Hon. Deputy Minister to answer that. So, please show a little more respect when we ask a question.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 33(1)හි සඳහන් වනවා, 32වන ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අහන්න බැහැ කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම තුන්වැනි වතාවටයි පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයෙකු විධියට තේරී පත් වෙලා ඉන්නේ. මම ඒ හැම වතාවකම විරුද්ධ පක්ෂයේ ඉඳලාත් අතුරු ප්‍රශ්න අහලා තිබෙනවා. ඒ වාගේම මේ සම්ප්‍රදාය ගැන අවබෝධයකුත් තිබෙනවා. ප්‍රශ්නය අහන යම් මන්ත්‍රීවරයෙකුට හැම වෙලාවේදීම අතුරු ප්‍රශ්න දෙකක් අහන්න අවසර තිබෙනවා, එහෙම නැත්නම් අයිතිවාසිකමක් තිබෙනවා. එම මන්ත්‍රීවරයාගේ කැමැත්ත ඇතිව සභාවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ තවත් මන්ත්‍රීවරයකුට ඉතිරි අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව එම මන්ත්‍රීවරයාට පවරන්න පුළුවන්. ඒක සම්ප්‍රදාය. "යම් මන්ත්‍රීවරයකු" කියන්නේ එම මන්ත්‍රීවරයා පමණක් කියන එක නොවෙයි. අපේ ආණ්ඩු පක්ෂයේ බිමල් රත්නායක මැතිතුමාත් ඒ සම්ප්‍රදාය පිළිබඳව හොඳාකාරව දන්නවා. අනන්තවත් අවස්ථා තිබෙනවා, එක් මන්ත්‍රීවරයෙකු පළමුවැනි අතුරු ප්‍රශ්නය අහලා දෙවැනි අතුරු ප්‍රශ්නය තවත් මන්ත්‍රීවරයකුට පවරන. ඒක සාමාන්‍යයෙන් වෙච්ච දෙයක්. ඒකෙන් කිසි පාඩුවක් වෙන්නේ නැහැ. ඒක සම්ප්‍රදාය, නීතිය, සිදු වෙච්ච දෙය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයත් අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු කථානායකතුමනි, අපේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ස්ථාවර නියෝග 33(1)හි මෙසේ සඳහන් වෙනවා:

> "32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය:"

"යම් මන්ත්‍රීවරයකු" කියන්නේ මේ ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයා. ඒක හරි. නමුත් ඔබතුමා රවී කරුණානායක මන්ත්‍රීතුමාට උත්තර දෙනකොට කිව්වා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ඒ මන්ත්‍රීවරයාගේ අවසර ගන්න ඕනෑය කියලා ස්ථාවර නියෝගවල තිබෙනවා කියලා. ස්ථාවර නියෝගවල කොතැනකවත් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න අදාළ මන්ත්‍රීවරයාගේ අවසරය ගන්න ඕනෑය කියලා එකක් නැහැ. ඒක තිබෙන්නේ, අගමැතිතුමියගෙන් ප්‍රශ්න අහනකොට. ස්ථාවර නියෝග 38(7)හි මෙසේ සඳහන් වෙනවා:

> "අග්‍රාමාත්‍යවරයා විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමෙන් අනතුරුව ප්‍රශ්න අසන ලද මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබිය හැකි ය. ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව, පාර්ලිමේන්තුවේ වෙනත් ඕනෑම මන්ත්‍රීවරයකුට එම අතුරු ප්‍රශ්නවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් අසනු ලැබිය හැකි ය:"

ඒක හරි. ඔබතුමා කියන තර්කය හරි. ඒක තිබෙන්නේ අගමැතිතුමියගෙන් අහන ප්‍රශ්නවලට විතරයි. සාමාන්‍යයෙන් ස්ථාවර නියෝගවල කොතැනකවත් නැහැ, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න අවස්ථාවේ ඒ මන්ත්‍රීවරයා අතුරු ප්‍රශ්න ඇහුවේ නැත්නම් තවත් මන්ත්‍රීවරයකුට අතුරු ප්‍රශ්නයක් අහන්න

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

බැහැ කියලා. නමුත් ඔබතුමා පැහැදිලිව සභාවට කිව්වා, එහෙම තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් හුඟක් තිබුණා. එතුමන්ලා අපිත් එක්ක විපක්ෂයේ ඉන්නකොට මේ සභාවේ නැඟිටලා ඇමතිවරුන්ගෙන් අනන්ත අප්‍රමාණ ප්‍රශ්න අහලා තිබෙනවා. එලෙස ප්‍රශ්නයක් අහනකොට ඒ හිටපු ඇමතිවරුන් විරුද්ධ වුණේ නැහැ. අද එතුමන්ලා කියනවා, අපට සම්ප්‍රදායයන් වැඩක් නැහැ, අපි ස්ථාවර නියෝග තමයි follow කරන්නේ කියලා. හරි. නමුත් මේ ප්‍රශ්නයේදී සම්ප්‍රදාය ගැන කථා කරනවා. ඒ කියන්නේ තමන්ට වාසි වෙනකොට සම්ප්‍රදාය හොඳයි. තමන්ට ප්‍රශ්නයක් වෙනකොට සම්ප්‍රදාය හොඳ නැහැ. එහෙම කරන්න බැහැ, ගරු කථානායකතුමනි. සම්ප්‍රදායයක් තිබෙනවා නම් ඒ සම්ප්‍රදාය follow කරන්න ඕනෑ. ස්ථාවර නියෝගවලට අනුවම කටයුතු කරනවා නම් අපි සම්ප්‍රදාය ඕනෑ නැහැ කියලා ස්ථාවර නියෝගවලට අනුවම කටයුතු කරමු.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, පළමුවැනි කාරණය විධියට මට කියන්න තිබෙන්නේ මේකයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 31 සහ 32හි ප්‍රශ්න පිළිබඳව සඳහන්ව තිබෙනවා. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 32(1)හි මෙසේ සඳහන් වනවා:

> "වාචික පිළිතුරක් ඉල්ලා ඇති යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි පළ වූ අවස්ථාවක, එම ප්‍රශ්නය පළ වී තිබෙන්නේ යම් මන්ත්‍රීවරයකුගේ නමින් ද, කථානායකවරයා විසින් එම මන්ත්‍රීවරයා අමතනු ලැබිය යුතු අතර, එසේ අමතනු ලැබූ මන්ත්‍රීවරයා ස්වකීය ස්ථානයෙහි නැඟී සිට ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි දී ඇති අංකය සඳහන් කරමින් එය අසනු ලැබිය යුත්තේ ය. එවිට ප්‍රශ්නය යොමු කරනු ලැබූ අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඊට පිළිතුරු දෙනු ලැබිය යුත්තේ ය."

ගරු කථානායකතුමනි, ඒ විධියට ඉදිරියට ගියාම 33වන ස්ථාවර නියෝගය refer කරන්නේ, 32වන ස්ථාවර නියෝගයට.

ස්ථාවර නියෝග 33(1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "32 ස්ථාවර නියෝගය යටතේ සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය:"

ගරු කථානායකතුමනි, එතකොට ඒක කියවන්න ඕනෑ ස්ථාවර නියෝග අංක 32ත් එක්ක. කවුද, ඒ යම් මන්ත්‍රීවරයා? ඒ යම් මන්ත්‍රීවරයාට තමයි, අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලබන්න පුළුවන්කම තිබෙන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

අපිත් කියන්නේ ඒක තමයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒක තමයි. ඒ යම් මන්ත්‍රීවරයා තමයි, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීවරයා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

යම් මන්ත්‍රීවරයා කියන්නේ ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ නිසා හරි පැහැදිලියි, මේ සිද්ධියේදී යම් මන්ත්‍රීවරයා කියන්නේ, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා බව. එතුමාට තමයි අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්කම තිබෙන්නේ. සම්ප්‍රදායක් ලෙස තමයි ඒ මන්ත්‍රීවරයාගේ කැමැත්ත මත වෙනත් මන්ත්‍රීවරයෙකුට අතුරු ප්‍රශ්න එකක් හෝ දෙකක් අහන්න පුළුවන් කියලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, හැබැයි, යම් මන්ත්‍රීවරයෙක් අතුරු ප්‍රශ්න එකක් විතරයි නම් අහන්නේ, දෙවැනි අතුරු ප්‍රශ්නය එතුමාගේ අවසරයකින් තොරව වෙනත් මන්ත්‍රීවරයෙකුට අහන්න බැහැ. මන්ත්‍රීවරුන් තමන්ගේ කැමැත්ත අනුව තමයි, තමන්ට සුදුසුයි කියලා හිතන ප්‍රශ්න මෙතැනදී අහන්නේ. ඒක තනිකරම මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතියක්. ඒ අයිතිය වෙනත් මන්ත්‍රීවරයෙකුට ගන්න බැහැ.

උදාහරණයක් විධියට ගත්තොත්, අපි අද රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ විදේශ සංචාර ගැන ප්‍රශ්නයක් ඇහුවා. හැබැයි, අපේ ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය අතුරු ප්‍රශ්න ඇහුවේ නැහැ. ස්ථාවර නියෝගවල පැහැදිලිව තිබෙනවා, "එසේ වුවද, එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නඟින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය" කියලා. ගරු කථානායකතුමනි, මම ඒක නැවත කියන්නම්. ස්ථාවර නියෝග 33(1) යටතේ තවදුරටත් සඳහන් වෙනවා, "එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, ..." කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ගරු කථානායකතුමනි, මුල් ප්‍රශ්නය අහන්නේ, originally ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමා. එතුමා තමයි ඒ ප්‍රශ්නය අහන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ඒක ගරු කථානායකතුමා තීන්දු කරන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒක තීන්දු කරන්නේ ගරු කථානායකතුමා නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා සම්ප්‍රදාය ගැන කථා කළා. එක එක වචනත් කිව්වා. කරුණාකරලා ඇහුම්කන් දෙන්න. අතුරු ප්‍රශ්න අහන්න ඕනෑකම තිබෙන්නේ, ඒ මන්ත්‍රීතුමා අහපු original ප්‍රශ්නයට අදාළව, ඒක ඇතුළේ. එතකොට අවසරයක් ඇතිව අහනවා නම් අපි දන්නවා, අවසරයක් දෙන මන්ත්‍රීතුමා අහන්න යන්නේ මොන වාගේ ප්‍රශ්නයක්ද කියලා. සාමාන්‍යයෙන් ඒක අපට කියනවා. අපිත් එහෙම කරලා තිබෙනවා. අපි හිතමු, ලංගම බස් ගැන ප්‍රශ්නයක් අහනවා නම්, "හොරොව්පතාන ඩිපෝවේ ප්‍රශ්නයකුත් මම අහන්නද?" කියලා සමහර විට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්. එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහපු නැති නිසා අපි කොහොමද දන්නේ, අපි නොදන්නා මන්ත්‍රීවරයෙක් මුල් ප්‍රශ්නයේ ඇතුළත් වන කාරණාම මතු කරයිද, නැද්ද කියලා? ඒක නිසා තමයි, ස්ථාවර නියෝගවල තිබෙන්නේ, original ප්‍රශ්නය අහපු මන්ත්‍රීතුමාටවත් අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයේ ඇතුළත් නොවන ඒවා අහන්න බැහැ කියලා. ඒක තමයි, ස්ථාවර නියෝගවල හරි පැහැදිලිව තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, දෙවැනි කාරණය මෙයයි. මේක මන්ත්‍රීවරුන්ට ඉතා තදින් බලපානවා. මොකද, කවුරු හරි මන්ත්‍රීවරයෙකු ප්‍රශ්නයක් අහලා, එතුමා ඊට අදාළව අතුරු ප්‍රශ්නයක් අහපු නැති නිසා මේ සභාවේ තව තව මන්ත්‍රීවරුන් නැඟිටලා ප්‍රශ්න අහන්න ගත්තොත්, ඒක පාර්ලිමේන්තුවේ ප්‍රධාන ප්‍රශ්නය අහපු මන්ත්‍රීතුමාට බරපතළ අසාධාරණයක් වෙනවා. අනෙක් එක තමයි, කවදාවත් ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයාගේ අවසරයෙන් තොරව අතුරු ප්‍රශ්න ඇහුවා කියලා මගේ නම් මතකයේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මෙතැන මොනවා හරි ලොකු වාදයක් ඇති කර ගන්න ඕනෑ නම්, අපි ඒ වාදයට ලෑහැස්තියි. ඒක ප්‍රශ්නයක් නැහැ. කාල සීමාව කියනවා නම්, මට මතක හැටියට මම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හතරවැනි හෝ පස්වැනි අවස්ථාව. ඒ කාල සීමාව ඇත්තටම මෙතැනට එච්චර වැදගත් නැහැ. මට කියන්න තිබෙන්නේ, හැමදාම අතුරු ප්‍රශ්න අහන මන්ත්‍රීවරුන් ප්‍රධාන ප්‍රශ්නය ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව තමයි අතුරු ප්‍රශ්න අහලා තිබෙන්නේ කියන එකයි. ඒක තමයි සම්ප්‍රදාය. ඒක තමයි, ස්ථාවර නියෝගවල තිබෙන සාරයට ගැළපෙන්නේත්. ඒ නිසා මම මේ මන්ත්‍රීවරුන්ගෙන් යම් ඉල්ලීමක් කරන්න කැමැතියි. පාර්ලිමේන්තුවේදී අපට ඕනෑ දෙයක් සම්බන්ධයෙන් ඇති තරම් විවාද කරන්න පුළුවන්. හැබැයි, මේ ගැන නම්, ගරු කථානායකතුමාගේ Ruling එකට අපි එකඟ වෙනවා. ඒ වාගේම කාට හෝ මෙහි යම් කිසි අපැහැදිලිතාවක් තිබෙනවා නම්, ගරු කථානායකතුමාට ඒ සඳහාත් බලතල තිබෙනවා. ගරු කථානායකතුමනි, තවත් අවශ්‍ය නම්, මේ ගැන පසුව සාකච්ඡා කරන්න කියලාත් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේක ඉතා පැහැදිලියි. මෙහි තිබෙන ආකාරයට ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාට පමණයි, අතුරු ප්‍රශ්න දෙක අහන්න පුළුවන් වන්නේ. ඇත්තටම හිතවත්කම මත හෝ එකඟතාව මත හෝ අතුරු ප්‍රශ්නයක් අහන්නවත් ස්ථාවර නියෝග අනුව වෙන කෙනෙකුට ඉඩ දීලා නැහැ. ඒකයි ඇත්ත. ඔබතුමන්ලා කියන එකේ total opposite තිබෙන්නේ මේ ස්ථාවර නියෝගවල.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, -

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
Sir, I rise to a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපේ පැත්තටත් අවස්ථාව දෙන්න. මෙතුමන්ලාගේ පැත්තෙන් ගොඩක් අය කථා කළා නේ. ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා ගොඩක් වෙලා ඉඳලා හිටගෙන ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අද දවසේම උදාහරණයක් තිබුණා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවා. එතුමාගේ කැමැත්ත මත, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න විපක්ෂයේ වෙනත් සහෝදර මන්ත්‍රීවරයෙකුට අවස්ථාව දුන්නා. ඒ වාගේම තමයි, කලින් කථා කරපු ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව සඳහන් කළා, ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීතුමා විසින් දෙවැනි අතුරු ප්‍රශ්නය අසන්න වෙනත් මන්ත්‍රීවරයෙකුට පවරන්න පුළුවන් කියලා.

ඉතින් මේ සම්බන්ධව අපි පැහැදිලි කරන්න ඕනෑ නැහැ. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාව නැවත සැරයක් අහන්න. ඒකෙන්ම හරි පැහැදිලියි, පළමු අතුරු ප්‍රශ්නය ඇසූ මන්ත්‍රීවරයා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ නැත්නම් ඒක කරන්න පුළුවන්කම තිබෙන්නේ ප්‍රශ්නය ඇසූ මන්ත්‍රීවරයා විසින් ඒක වෙනත් මන්ත්‍රීවරයෙකුට පැවරුවොත් පමණයි කියන එක. එහෙම පැවරුවේ නැතොත්, ඒ කියන්නේ එතුමාගේ කැමැත්ත මත එය සිද්ධ වෙන්නේ නැත්නම්, වෙනත් අවස්ථාවක් ගැන ස්ථාවර නියෝගවල සඳහනක් වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත සහ ඒක තමයි සම්ප්‍රදාය.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මේ සිද්ධිය අපි ඔක්කෝම දැක්කා. රවී කරුණානායක මන්ත්‍රීතුමා කියන්නේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මෙතැන කරුණු කාරණා කියපු අපි ඔක්කෝටම වඩා එතුමා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳව දන්නවා. ප්‍රධාන ප්‍රශ්නය ඇසූ මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්කම තිබෙන බව අපි දන්නවා. එතුමා ඉතාම වැදගත් විධියට කිව්වා, මම අහන්නේ එක අතුරු ප්‍රශ්නයයි කියලා. ඒක අපි ඉතාම හොඳින් දැක්කා. එතකොට තමයි රවී කරුණානායක මැතිතුමා ඊට අදාළ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා කිව්වේ. ඒකට සවන්දීමක් නොකරම, එතුමාට ඒ අවස්ථාව නොදීම ගැන, - *[බාධා කිරීමක්]* එතුමා කිව්වා නේ, එකයි අහන්නේ කියලා. අවසරය වගේ නේ. *[බාධා කිරීමක්]*

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු කථානායකතුමනි, විශේෂයෙන් මට කියන්න තිබෙන පළමුවැනි කාරණය මෙයයි. ස්ථාවර නියෝග 33(1) යටතේ සහ 37(1) යටතේ මේ පිළිබඳව තිබෙනවා. පළමුවෙන්ම කියන්න ඕනෑ, මම ඉතා පැහැදිලිව කිව්වා, අතුරු ප්‍රශ්න එකක් පමණයි මම

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

අහන්නේ කියලා. මොකද, මා තමයි ප්‍රශ්නය යොමු කළේ. මම අතුරු ප්‍රශ්න එකක් පමණක් යොමු කරනවා කියන එක පැහැදිලිව කීවේ එකක් පමණක් නිසා. මොකද, ස්ථාවර නියෝගවල තිබෙන්නේ "අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි" කියලා. නොවැඩි කිව්වාම අතුරු ප්‍රශ්න එකක් කියන්නේ දෙකට අඩුයි. ඒ කියන්නේ "නොවැඩියි" කිව්වොත්, එකක් කියන්නේ අඩු සංඛ්‍යාවක්. ස්ථාවර නියෝග 33(1) යටතේ ඒක එනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ නමත් "රවි" මගේ නමත් "රවි". ඒක වෙනම ප්‍රශ්නයක්.

ඊළඟට ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 37(1) යටතේ මෙසේ සඳහන් වනවා:

> "මෙම ස්ථාවර නියෝග යටතේ යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දිය හැකි ද, නොහැකි ද, යන්න කථානායකවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, යම් ප්‍රශ්නයක් ප්‍රශ්න ඇසීමේ අයිතිය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමක් හෝ එය පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටියට බාධා කිරීමට හෝ අගතිදායක ලෙස බලපෑමට සිතාමතා අසනු ලබන බව හෝ එමඟින් යම් ස්ථාවර නියෝගයක් උල්ලංඝනය වන බව කථානායකවරයාගේ මතය වේ නම්, කථානායකවරයා විසින් එම ප්‍රශ්නය ඇසීමට ඉඩ නොදී සිටිය හැකි ය. කථානායකවරයා විසින් යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ නොදීම, ඒ සඳහා හේතු ද සමඟ මහ ලේකම්වරයා විසින් අදාළ මන්ත්‍රීවරයාට ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුත්තේ ය."

ඉතින් මේ සිදුවීම පිළිබඳව මම ඉතාම කනගාටු වෙනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත්, තවත් මන්ත්‍රීවරුනුත් නැඟිටලා ඉන්නවා. ගොඩක් අත්දැකීම් තිබෙන අය නේ ඔය කථා කරන්නේ. නමුත් මේ ස්ථාවර නියෝග හරියට කියවලා නැහැ.

ඒ වාගේම ස්ථාවර නියෝග 34(2) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් කර නොගත යුත්තේ ය."

ඒක තමයි ඊළඟට අනික් කාරණය හැටියට කරන්නේ සහ ඉතාම පැහැදිලිව මම අතුරු ප්‍රශ්න එකක් පමණක් අසන බව කියා තිබියදී, මේ විධියට මා වෙනුවෙන් අතුරු ප්‍රශ්න ඇසීම මම හිතන විධියට ලජ්ජා සහගත දෙයක්. එය නොවිය යුතු දෙයක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ නම කියපු නිසායි මම මේ වෙලාවේ මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්නේ.

මම සන්තෝෂ වෙනවා, එක දෙයක් ගැන. පසුගිය මාස 5ටම NPP මන්ත්‍රීවරුන් කවුරුවත් විහිළු කළේ නැහැ. හරි serious mood එකෙන් හිටියේ. අද හරි මේ වාගේ දැවැන්ත පරාජයක් ලබා තිබෙන වෙලාවේ හොඳ mood එකකට ඇවිල්ලා, විහිළුවක් කරන්න අපේ මේ මන්ත්‍රීතුමා ඉදිරිපත් වෙච්ච එක බොහොම හොඳ දෙයක්. ඒක ගැන බොහොම සන්තෝෂ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ කාරණයට අදාළව කථා කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කාරණයට අදාළව මම මේ දේ කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, කැමැත්ත ප්‍රකාශ කිරීම වාචිකව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ඉඟියක් පෑමෙන් වෙන්න පුළුවන්. එතකොට ඒ මන්ත්‍රීවරයා පළමුවෙනි අතුරු ප්‍රශ්නය ඇසූ පසු, දෙවැනි අතුරු ප්‍රශ්නය රවි කරුණානායක මැතිතුමා අහනවාට විරුද්ධ වුණේ නැහැ නේ. මේකට අපි කැමැති නැහැ කියලා එතුමාගේ ජ්‍යෝෂ්ඨයන් කියනකොට දැන් එතුමා කියනවා, මට අහන්න ඕනෑ වුණේ එක අතුරු ප්‍රශ්නයයි කියලා. එතකොට එතුමා අවස්ථාව දුන්නා. එතුමා කිව්වා, එක අතුරු ප්‍රශ්නයයි අහන්නේ කියලා. අවස්ථා දෙකක් තිබෙනවා. ඉතිරි අවස්ථාවට කැමැත්ත දුන්නා. ඒ නිසා ප්‍රායෝගිකව ගරු කථානායකතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එකම කාරණයක් ගැනයි මේ නැවත නැවත කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මගේ අවස්ථාව දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාට ඇති වෙන්න අවස්ථාව දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩුම ගණනේ පෙර වරු 11.30ටවත් ප්‍රධාන වැඩකටයුතු පටන් ගන්න කියලා. ස්ථාවර නියෝගවල මේ සම්බන්ධව ඉතාම පැහැදිලිව තිබෙනවා. ඒ වාගේම මට තේරෙන්නේ නැහැ, ලේකම් මණ්ඩලය මොකක්ද මෙතැන කරන්නේ කියලා. අපි ලේකම් මණ්ඩලයෙන් දැනගන්න කැමැතියි, මේ ගැන එතුමන්ලාගේ නිර්වචනය මොකක්ද කියලා. මම කියන්න කැමැතියි, ඉතා පැහැදිලිව අදාළ මන්ත්‍රීවරයාට පමණමයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් කියන එක. ඒ පිළිබඳව ඉතා පැහැදිලිව ස්ථාවර නියෝගවල සඳහන් කරලා තිබෙනවා. ඔබතුමා Ruling එකක් දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා තවත් අවශ්‍ය නම් සාකච්ඡා කරන්න.

අපි කියන්න කැමැතියි, මේ අය තමන්ගේ එක ආසනයක්වත් දිනලා නැති බව. මුළු එක්සත් ජාතික පක්ෂ ඉතිහාසයටම, මුළු සජබ ඉතිහාසයටම එක මහ නගර සභාවක් දිනලා නැහැ, මේ එක්කෙනෙක්වත්. මේ එක්කෙනෙක්වත් තමන්ගේ ආසනය දිනලා නැහැ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

ඒ නිසා අපි කියන්න කැමැතියි,- *[බාධා කිරීමක්]* අපි ජය පරාජය ගැන පසුව කථා කරමු. මේවා සම්පූර්ණයෙන්ම drama නේ. මේවා දවල් 12.00ට කලින් තිබෙන drama. අපි dramaවලට කැමැතියි; අපිත් drama කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මම දන්නා ඉතිහාසය තුළ කවදාවත් මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයාගේ අවසරයකින් තොරව වෙනත් මන්ත්‍රීවරයෙකු අතුරු ප්‍රශ්නයක් අසා නැහැ. මම ලේකම් මණ්ඩලයට අභියෝග කරනවා, එහෙම අවස්ථා තිබෙනවා ද කියලා පුළුවන් නම් පෙන්වන්න කියලා. එහෙම අවස්ථා තිබුණා වුණත් ඒක වැරදියි; එහෙම අවස්ථා තිබුණා වුණත් ඒක වැරදියි. එම නිසා කරුණාකර ස්ථාවර නියෝග 32 සහ 33 අනුව කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරයෙක් මගේ නම කියමින් සඳහන් කළා, Standing Orders ගැන අපි දන්නේ නැහැ කියලා. ගරු කථානායකතුමනි, දැන් අපේ සභානායකතුමා කිව්ව සම්ප්‍රදාය ඇත්ත. මෙච්චර කාලයකට පාර්ලිමේන්තුවේ එවැනි දෙයක් සිදු වෙලා නැතුව ඇති. ගරු සභානායකතුමනි, ඔබතුමා කියන කාරණය හරි. ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාගෙන් අහලා තමයි ඊළඟ මන්ත්‍රීවරයා එතුමාගේ අවසර ඇතුව අතුරු ප්‍රශ්නය අහන්නේ. ගරු සභානායකතුමනි, ඔබතුමා කියන එක හරි. ඒක නොවෙයි මම මතු කරන්නේ. මම මතු කරන්නේ මෙයයි. ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතැන උත්තර දීමේදී කිව්වා, Standing Ordersවල තිබෙනවා කියලා, අතුරු ප්‍රශ්නය ඇසීමට ඒ අදාළ මන්ත්‍රීවරයාගේ අවසරය ඕනෑ කියලා. මම කියන්නේ Standing Ordersවල එහෙම දෙයක් නැහැ කියායි, ගරු කථානායකතුමනි. Standing Ordersවල ඒක නැහැ. එහෙම නම් ඒක අලුතින් එකතු කරන්න. දැන් තිබෙන Standing Ordersවලට අනුව ඒක නැහැ. එහෙම නම් ඒක Standing Ordersවලට ඇතුළත් කරන්න. මෙහෙම නේ. සභානායකතුමා එතුමාගේ ආසනය ළඟ ඉඳගෙන මොනවා හරි කියපු ගමන් ඔබතුමා "ඔව්" කියලා ඔළුව වනනවා. එහෙම කරන්න එපා, ගරු කථානායකතුමනි. ඔබතුමා ලේකම් මණ්ඩලයෙන් ඒ ගැන අහන්න. සභානායකවරයාට ඕනෑ විධියට පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැහැ. කථානායකවරයා හැටියට ඔබතුමාට මොකක් හරි තේරෙන්නේ නැත්නම් ඒ ගැන ලේකම් මණ්ඩලයෙන් අහන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මගේ තීරණය මම හෙට දිනයේදී ලබා දෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමාට ruling එකක් දෙන්න තරම්වත් දෙයක් නැහැ කියන එක. ස්ථාවර නියෝග 33 (1) යටතේ ඉතා පැහැදිලිව තිබෙනවා, "... යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට නොවැඩි සංඛ්‍යාවක් අසනු ලැබිය හැකි ය: එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මඟින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, ..." යනුවෙන්. ගරු කථානායකතුමනි, ඉතින් මේ ස්ථාවර නියෝගයේ තිබෙන්නේ මොකක්ද? මේ ස්ථාවර නියෝගයට අනුව ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාටවත් බැහැ, අදාළ ප්‍රශ්නයට පිටින් අතුරු ප්‍රශ්න අහන්න. ඒ අනුව වෙනත් මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් ඒක අදාළම නැහැ. ඒක තේරුම් ගන්න බැරි එකට මට කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා සාධාරණව මේ කාරණය ගැන කල්පනා කර බලන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා තත්පරයකට ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමාට සිග්නල් එකක් දීලා, "මන්ත්‍රීතුමා, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්" කියලා, courtesy එකක් ඇතුව කථා කළා නම් මේ ප්‍රශ්න මුකුත් ඇති වෙන්නේ නැහැ. මෙතැන උද්ධච්චකමට වැඩ කරන්න බැහැ නේ. මෙතැන සිදුවීම හරි පැහැදිලියි. ගරු කථානායකතුමනි, ඔබතුමාට කරපු අපහාසය ගැන මම ඉතා කනගාටු වෙනවා. ඔබතුමා තමයි මේ සම්බන්ධයෙන් ස්ථාවර නියෝග මට කලින් කියැවුයේ. මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයකට අවස්ථාව දීලා ඊට පසුවයි මම කථා කරන්න නැඟිට්ටේ. ඔබතුමන්ලා මොළය උදුම්මවාගෙන ඒ වාගේ ජරා කථා කියන්න එපා. ඉතා පැහැදිලියි මේක. ප්‍රශ්නය අහන මන්ත්‍රීතුමාට පමණයි අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්කම තිබෙන්නේ. එතුමා කැමති නම් වෙනත් කෙනෙකුට අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව ලබා දෙන්න පුළුවන්. ඔබතුමාට තීන්දු කරන්න පුළුවන්, ඒ අවස්ථාව ලබා දෙනවාද, නැද්ද කියලා, ගරු කථානායකතුමනි. ඒක තමයි Standing Orders අනුව තිබෙන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Speaker, in terms of Standing Order No. 33(1), a Member has the right to ask two Supplementary Questions. Also, there is a basic norm in law that what is not prohibited is permitted. So, if the Member who raised the Question does not ask two Supplementary Qestions, any other Member of the House has the right to do so, because in terms of Standing Order No. 33(1), the Hon. Speaker can object only if there is a violation. So, if there is a violation, the Standing Orders should specifically say that it is a violation. I just want to bring it to the notice of the House.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் வடக்கு, கிழக்கிலுள்ள காணிகள் சம்பந்தமாக மிக முக்கியமான -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න හදන්නේත් දැන් මේ කථා කරපු කාරණය සම්බන්ධයෙන් නම් ඒ පිළිබඳව මම හෙට දිනයේදී පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මම මතු කරන්න හදන්නේ ඒකට අදාළ කාරණයක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, මම මේ කාරණය මතු කරන්නේ ස්ථාවර නියෝග 92 (2) යටතේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කරුණාකර සජීවී විකාශය අත්හිටුවීමට කටයුතු කරන්න.

***[මේ අවස්ථාවේදී, 2025.03.19 දිනැති ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි ගරු රාමනාදන් අර්ච්චුනා මහතාගේ කථාවේ සජීවී විකාශය අත්හිටුවන ලදී.]***

*[இச்சந்தர்ப்பத்தில், 2025.03.19ஆந் திகதிய மாண்புமிகு சபாநாயகரின் கட்டளைப்படி மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரையினது நேரடி ஒளி/ஒலிபரப்பு இடைநிறுத்தப்பட்டது.]*

*[At this stage, as per the Order made by Hon. Speaker on 19.03.2025, the live telecast of the Hon. Ramanathan Archchuna's speech is suspended.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, live telecast එක නවත්වන්න. ඔබතුමා මට දුන්නු Ruling එක තවම ක්‍රියාත්මකව තිබෙනවා. ඒ නිසා live telecast එක නවත්වන්න. මට ඒ ගැන කිසි අවුලක් නැහැ. උතුරට ගිහිල්ලා නේ තිබෙන්නේ. මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, Standing Order No. 92(2) යටතේ මම මේක මතු කරන්නේ. මම Parliament (Powers and Privileges) Act එක ගැන කථා කරන්නේ. Privilege issue එකක් මම raise කරලා තිබෙනවා, බිමල් රත්නායකට විරුද්ධව තුන් වතාවක්. ගරු කථානායකතුමනි, තුන්වැනි වතාවේ මම ඔබතුමාට ලිපියක් දුන්නා. මම කථා කරන්නේ සිංහලෙන්. හැබැයි, මම දෙමළ නිසා Parliament (Powers and Privileges) Act එකට අනුව මා raise කරපු Privilege issue එක අද වෙනකම් දාලා නැහැ. ඒ, ඇයි? Tamil මන්ත්‍රීවරයෙකුට විතරක් ඇයි එහෙම කරන්නේ? මම දෙමළ නිසාද එහෙම කරන්නේ? මම හොඳට උත්තර දීලා තිබෙනවා. ඒ නිසා තමයි දවස් 8ක් මාව නොමරා මැරුවේ. ඔබතුමාට සහ ගරු ඇමතිතුමාට විරුද්ධව මම දවස් තුනක් Privilege issue එකක් raise කරලා තිබෙනවා. ඇයි මට කථා කරන්න අවස්ථාවක් දුන්නේ නැත්තේ? ඇයි මට ඒ අවස්ථාව දෙන්නේ නැත්තේ? ඒ හේතුව මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ඒ Privilege matter එක ලිඛිතව ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අපට ඒක Committee on Ethics and Privileges වෙත යොමු කරන්න පුළුවන්. එච්චරයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඒක මම Parliament එකට present කරලා තිබෙන්නේ. මම ස්වස්තිකා අරුලිංගම් ගැන බොරු කිව්වා කියලා මෙතුමා,- *[බාධා කිරීමක්]* මම පැහැදිලිව ඒ ගැන කියන්නම්. මට ඒ සඳහා තත්පරයක කාලයක් ලබා දෙන්න. Parliament (Powers and Privileges) Act එකේ Section 22 (2) යටතේ සඳහන් වෙනවා, එහි Schedule Part A හෝ B අනුව කවුරු හරි බැණ්ණොත් ඒක Penal Code Section 190 අනුව බරපතළ breach of Parliamentary Privileges කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ Privilege matter එක ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මම තුන් වතාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. කලින් කිව්වා, ආණ්ඩු පක්ෂය මට public apology එකක් කරනවා කියලා. මම කිව්වා, මට එපා කියලා. මම three times ලියුම් ලියලා තිබෙනවා. මම දැන් Supreme Court එකට යන්නද? දැන් ආණ්ඩු කරන්නේ ඔබතුමන්ලා නේ. මම දැන් වෙන රටක Supreme Court එකකට යන්නද? UN එකට ගිහිල්ලා මේක ගැන කථා කරන්න කියලාද මට කියන්නේ? දෙමළ මිනිහෙකුට Privilege issue එකක් raise කරන්න බැරි ඇයි?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එහෙම දෙයක් අපි දන්නේත් නැහැ. Public apology එකක් කරන්න අපි කාටවත් වැරදි කරලාත් නැහැ. *[බාධා කිරීමක්]* කරුණාකරලා මට කථා කරන්න දෙන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මට ඉතා පැහැදිලිව කියන්න තිබෙන්නේ මේකයි. අපි කිසිම කෙනෙකුට public apology එකක් කරනවා කියලා නැහැ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මෙතුමා තමන්ගේ දේශපාලන වුවමනාවක් වෙනුවෙන් මෙතැන කෑ ගහන එක ගැන මම කනගාටු වෙනවා. දෙමළ ජනතාව කියලා හෝ සිංහල ජනතාව කියලා හෝ මුස්ලිම් ජනතාව කියලා හෝ අපේ කිසිදු විරෝධතාවක් නැහැ. අපි කාටත් සමානව සලකනවා. *[බාධා කිරීමක්]* මෙතුමාගේ විතරක් නොවෙයි, වෙනත් ඕනෑම කෙනෙකුගේ Privilege issue එකකදී අපි ඉදිරිපත් වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මෙතුමා පොලීසියත් එක්ක රණ්ඩුවෙලා රිමාන්ඩ් කළා කියලා පත්තරෙන් දැනගත්තාම, මෙතුමා කථා කරන්නත් කලින්

මම තමයි ඔබතුමාට කථා කරලා ඒ පිළිබඳව ඉස්සෙල්ලාම දැනුවත් කළේ. මට කියන්න තිබෙන්නේ මේකයි. මේක ඉතාම කරදරයක්, ගරු කථානායකතුමනි. මේ සභාව තුළ අවම සදාචාරසම්පන්න හැසිරීමක් හෝ අපට අවශ්‍යයි. එහෙම නැතුව මේ සභාවේ කටයුතු කරගෙන යන්න බැහැ. එම නිසා කරුණාකරලා ඔබතුමා බොරු කියන්න එපා, අපි public apology එකක් කරනවා කිව්වා කියලා, ගරු මන්ත්‍රීතුමනි. මෙතුමා කරන මේ වැඩවලට අපි apologize කරන්නේ මොකටද, ගරු කථානායකතුමනි? මෙතුමා ඕනෑම Privilege issue එකක් ඉදිරිපත් කරලා තිබෙනවා නම් ඔබතුමා ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න, ගරු කථානායකතුමනි. එහෙම නැතිව, මෙතුමා මේ මොනවාද කියන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එවැනි වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත්වෙලා තිබෙනවා නම්, ලේකම් මණ්ඩලය විසින් මූලාසනය දැනුවත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Privilege issue එකක් පිළිබඳව එවැනි ලිපියක් ලේකම් මණ්ඩලය වෙත ලැබී නොමැත.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම බොහොම කරුණාවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමිය ගරු කථානායකතුමාට කෙළින්ම කිව්වා නම්, එහෙම එකක් ලැබිලා නැහැ කියලා, මේ ප්‍රශ්නය මෙච්චර ඇදෙන්නේ නැහැ. ඔබතුමියලා ඒක කියන්නේ නැති වුණාම,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ලියුම් තුනක් දුන්නා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ මන්ත්‍රීතුමා කියනවා, ලියුම් තුනක් දුන්නා කියලා. එතුමා අපිව විවේචනය කරනවා. එතුමා මේ ගැන පසුව හෝ රටට කියනවා. මම කියන්නේ, ලේකම් මණ්ඩලය විධියට කරුණාකරලා ඒ වාගේ දේවල් ගැන සභාව දැනුවත් කරන්න. මේ සභාව සම්පූර්ණයෙන් අවුල් කරන්න කාට හෝ වුවමනාවක් තිබෙනවාද දන්නේ නැහැ. නමුත් අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා මට කියන්න තිබෙන්නේ, කරුණාකරලා අදාළ පැහැදිලි කිරීම් ලේකම් මණ්ඩලය මඟින් ගරු කථානායකතුමාට සහ මේ සභාවට කරන්න කියන එකයි. කිසිම තේරුමක් නැතුව මේ සභාවේ කටයුතු පටලවන්න දෙන්න එපා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීතුමා යම් වරදක් කර තිබෙන නිසා ඒ සඳහා දඬුවමක් දීලා තිබෙනවා. ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ, එතුමාට දඬුවමක් දුන්නත්, නැතත්, එතුමා පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා නම්, ඒ වරප්‍රසාද ප්‍රශ්නය හරි වුණත්, වැරදි වුණත්, වරප්‍රසාද තිබුණත්, නැතත් ඒක මේ සභාව තුළදී ඉදිරිපත් කිරීමට අවස්ථාව දිය යුතුයි. *[බාධා කිරීමක්]* ඉන් පසුව එය අදාළ කමිටුවට ඉදිරිපත් කළ යුතුයි. ගරු කථානායකතුමනි, මේ මන්ත්‍රීවරයාට ඔබතුමා අවවාද කරනවා නම්, ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා -ඔය ලිපිය ලැබිලා නැත්නම් අලුතින් හෝ ලිපිය ඉදිරිපත් කරන්න කියනවා නම්- ඔය ප්‍රශ්නය අවසන් වෙනවා. අපි එහෙම ඔය ප්‍රශ්නය අවසන් කර ගනිමු. මොකද, එතුමාට අවස්ථාව තිබෙනවා, ඒ ප්‍රශ්නය නඟන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව සොයා බලා ඔබතුමාට හෙට දිනය වනකොට අදාළ කරන තොරතුරු ලැබීමට සලස්වන්නම්.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## උතුරු සහ නැඟෙනහිර දමිළ ජනතාවගේ පාරම්පරික ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැසට් නිවේදනය

வடக்கு, கிழக்கிலுள்ள தமிழர்களின் பூர்வீக நிலங்களைச் சுவீகரிப்பது சம்பந்தமான வர்த்தமானி அறிவித்தல்

GAZETTE NOTIFICATION ON ACQUISITION OF TRADITIONAL LANDS OF TAMIL PEOPLE IN NORTH AND EAST

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நீங்கள் கிட்டத்தட்ட ஆறு தடவை என்னுடைய பெயரைக் குறிப்பிடவேண்டிய நிலை ஏற்பட்டதால், நான் மீண்டும் மீண்டும் எழுந்திருக்க வேண்டி யேற்பட்டது.

வடக்கு, கிழக்கில் வாழ்கின்ற தமிழ் மக்களுடைய காணிகள் பலவற்றில் இப்பொழுதும் இராணுவ முகாம்கள் இருக்கின்றன. இராணுவத்தினர் வசம்தான் பெரும்பாலான காணிகள் இருக்கின்றன. வடக்கு, கிழக்கில் பெருமளவான இடங்களிலுள்ள மக்கள் இப்பொழுதும் அகதிகளாக உறவினர், நண்பர் வீடுகளிலும் முகாம்களிலும்தான் வாழ்கின்றார்கள். குறிப்பாக, பலாலியில் 3,000 ஏக்கருக்கும் மேற்பட்ட காணிகள் இராணுவத்தினரால் ஆக்கிரமிக்கப்பட்டுள்ளதால், மக்கள் தமது சொந்த நிலங்களில் வாழ முடியாமல், வெவ்வேறு இடங்களில் குடியேறி வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். கிளிநொச்சி நகர்ப் பகுதியிலுள்ள கிட்டத்தட்ட 41 சதவீதமான காணிகள் இராணுவத்தினர் வசமுண்டு.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

1956-1970 வரையான காலப்பகுதியில் அநுராத புரத்திலிருந்து 26,000 தமிழ்க் குடும்பங்கள் வெளியேற்றப் பட்டன. அக்குடும்பத்தினர் இன்னும் மீள்குடியேற்றம் செய்யப் படவில்லை. இவ்வாறு எங்களுடைய மக்கள் தமது சொந்தக் காணிகளைவிட்டு, முகாம்களில் அகதிகளாக வாழ்ந்து வருகின்ற இந்தக் காலகட்டத்தில் யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், முல்லைத்தீவு ஆகிய மாவட்டங்களில் காணிகளைச் சுவீகரிப்பதற்கான வர்த்தமானி அறிவித்தல் வெளிவந்து இருக்கின்றது. இவ்விடயம் சார்ந்த பின்வரும் வினாக்களை நான் நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் கௌரவ கே.டீ. லால் காந்த அவர்களிடம் கேட்கின்றேன்.

1. வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள தமிழர்களின் பூர்வீக நிலங்களைச் சுவீகரிப்பதற்காக 2025.03.28ஆம் திகதிய 2430ஆம் இலக்க வர்த்தமானி அறிவித்தல் வெளியிடப்பட்டுள்ளதை அமைச்சர் அறிவாரா?

2. மேற்குறித்த வர்த்தமானி அறிவித்தல்மூலம் என்ன தேவைக்காகக் காணிகள் கோரப்பட்டுள்ளன என்பதையும், 5,700 ஏக்கர் வரையான காணிகளை அவசரமாக சுவீகரிப்பதற்கான காரணம் என்ன என்பதையும் அமைச்சர் இச்சபைக்கு அறிவிப்பாரா?

3. வடக்கு, கிழக்கு மாகாணங்களில் நீண்டகாலம் நடைபெற்ற யுத்தம் காரணமாக மக்கள் இடம்பெயர்ந்து உள்நாட்டிலும் வெளிநாட்டிலும் உறவினர் - நண்பர் வீடுகளிலும் வாழும்போது, அவர்களுடைய காணிகளை விடுவிக்க நடவடிக்கை எடுக்காமல், மக்களின் காணிகளைச் சுவீகரிக்கும் இந்த வர்த்தமானி அறிவித்தலின் உள்நோக்கம் என்ன என்பதை அமைச்சர் அறிவிப்பாரா?

4. தமிழ் மக்கள்மீது மேற்கொள்ளப்பட்ட நீண்டகால யுத்தம் காரணமாக அவர்களது காணி ஆவணங்கள் தவறவிடப்பட்டுள்ளதாக மாவட்டச் செயலகங்கள் தெரிவிக்கும் நிலையில், இப்புதிய வர்த்தமானி அறிவித்தல்மூலம் காணி உரிமையை உறுதிப் படுத்துமாறு எவ்வாறு கோரமுடியும் என்பதை அமைச்சர் இந்த உயரிய சபைக்கு அறிவிப்பாரா?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්න සතියක් කල් ඉල්ලනවා කියලා අදාළ ඇමතිතුමා දැනුම් දීලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය, ගරු වසන්ත සමරසිංහ මැතිතුමා.

## සහල් නිෂ්පාදනය, පරිභෝජනය සහ ආනයනය: වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## அரிசி உற்பத்தி, நுகர்வு மற்றும் இறக்குமதி: வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று
## PRODUCTION, CONSUMPTION AND IMPORT OF RICE: STATEMENT BY MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2025 අප්‍රේල් මස 10 වන දින අසන ලද ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මෙය විස්තර සහිත පිටු 3ක ලේඛනයක්. අවශ්‍ය නම් මෙය කියවන්නත් පුළුවන්; කාලය මදි නිසා සභාගත කරන්නත් පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මොකක් හෝ කරුණක් අහන්න තිබෙනවා නම් අහන්න. එතකොට මම ඒක කියන්නම්. එහෙම නැත්නම් වෙලාව අපරාදේ. දැන් වෙලාව සෑහෙන්න ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා මම පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන භෝග පුරෝකථන වාර්තාවට (2025- අප්‍රේල්) අනුව, 2024/25 මහ කන්නය සඳහා වී මෙට්‍රික් ටොන් මිලියන 2.6ක අස්වැන්නක් පුරෝකථනය කර තිබේ. මෙම අස්වැන්නෙන් සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.6ක ප්‍රමාණයක් ලබා ගත හැකි වනු ඇත. මෙම සහල් ප්‍රමාණයෙන් දේශීය පරිභෝජනයට අමතරව සත්ව ආහාර සඳහා මෙට්‍රික් ටොන් ලක්ෂ 2ක ප්‍රමාණයක් භාවිතයට ගනු ලබන අතර අනෙකුත් කර්මාන්තයන් සඳහා මෙට්‍රික් ටොන් 90,000ක පමණ ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත. එමෙන්ම, වාර්ෂිකව ශ්‍රී ලංකාවට පැමිණෙන මිලියන 2ක් පමණ වූ සංචාරකයින් වෙනුවෙන් ද සහල් අවශ්‍යතාවක් පවතී. තවද, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ ද ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ප්‍රජාවගේ ද අවශ්‍යතාව සඳහා යම් සහල් ප්‍රමාණයක් අපනයනය කෙරේ.

2024/25 මහ කන්නයේ සම්බා/කීරි සම්බා වී වැඩිපුර වගා කර ඇති බවත්, නාඩු වී අඩුවෙන් වගා කර ඇති බවත්, 2023/24 මහ කන්නයේ වී අස්වැන්නට සාපේක්ෂව 2024/25 මහ කන්නයේ වී අස්වැන්නෙහි සියයට 5.7ක අඩු වීමක් ද අපේක්ෂිත බවත් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ වාර්තා අනුව නිරීක්ෂණය වේ. දිස්ත්‍රික් මට්ටමින් 2024/25 මහ කන්නයේ වී වගා කර ඇති තොරතුරු පහත දැක්වේ.

Socio Economics & Planning Centre, Department of Agriculture

Crop Forecast

**Table 1: Paddy : Target and Sown Extent as at end March 2025 and production forecast for Maha 2024/25 (based on the progress)**

| District | Area target for the season (ha) | Sown area as at end March 2025 (ha) | Cultivation progress as a % from target | Production forecast based on the sown area as at end March 2025 (mt) | Affected area by the expected average yield reduction as a % (ha) | | | | Affected area by the source of damage (ha) | | | | | Total affected area (ha) | Expected production loss from affected area (mt) | Revised production forecast* (mt) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 100% | 75% | 50% | 25% | Flood | Drought | Pest & Dis. | Yellowing | Other | | | |
| **Provincial Areas** | **611,815** | **569,324** | | **1,814,038** | **22,516** | **22,114** | **10,615** | **6,662** | **60,601** | **0** | **12** | **1,288** | **6** | **61,906** | **140,097** | **1,673,941** |
| Colombo | 4,155 | 3,119 | 75 | 8,298 | 15 | 0 | 36 | 94 | 145 | 0 | 0 | 0 | 0 | 145 | 150 | 8,148 |
| Gampaha | 13,135 | 9,671 | 74 | 27,209 | 192 | 71 | 165 | 77 | 505 | 0 | 0 | 0 | 0 | 505 | 977 | 26,231 |
| Kalutara | 13,667 | 9,413 | 69 | 25,008 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 25,008 |
| Galle | 12,790 | 6,732 | 53 | 14,540 | 16 | 3 | 13 | 73 | 100 | 0 | 5 | 0 | 0 | 105 | 93 | 14,447 |
| Matara | 15,414 | 10,332 | 67 | 26,755 | 83 | 54 | 48 | 54 | 232 | 0 | 1 | 0 | 6 | 239 | 417 | 26,339 |
| Ratnapura | 12,225 | 9,508 | 78 | 32,570 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 32,570 |
| Kegalle | 7,781 | 6,644 | 85 | 22,407 | 9 | 13 | 8 | 80 | 104 | 0 | 6 | 0 | 0 | 110 | 145 | 22,263 |
| Kurunagala | 81,041 | 80,983 | 100 | 298,018 | 369 | 106 | 401 | 1,001 | 1877 | 0 | 0 | 0 | 0 | 1877 | 3310 | 294,708 |
| Puttalam | 22,825 | 20,830 | 91 | 65,688 | 782 | 0 | 0 | 0 | 782 | 0 | 0 | 0 | 0 | 782 | 2467 | 63,220 |
| Kandy | 7,790 | 7,103 | 91 | 20,678 | 17 | 5 | 18 | 29 | 69 | 0 | 0 | 0 | 0 | 69 | 108 | 20,570 |
| Matale | 16,962 | 14,100 | 83 | 54,270 | 45 | 9 | 90 | 9 | 153 | 0 | 0 | 0 | 0 | 153 | 383 | 53,887 |
| N eliya | 4,976 | 4,917 | 99 | 11,277 | 62 | 0 | 416 | 0 | 478 | 0 | 0 | 0 | 0 | 478 | 619 | 10,659 |
| Badulla | 14,636 | 11,969 | 82 | 41,510 | 0 | 2 | 2 | 0 | 4 | 0 | 0 | 0 | 0 | 4 | 9 | 41,501 |
| Monaragala | 29,970 | 27,104 | 90 | 108,106 | 200 | 0 | 0 | 1 | 201 | 0 | 0 | 0 | 0 | 201 | 798 | 107,307 |
| Jaffna | 12,739 | 10,748 | 84 | 26,610 | 1,404 | 2,062 | 65 | 1,624 | 5155 | 0 | 0 | 0 | 0 | 5155 | 8390 | 18,220 |
| Kilinochchi | 28,779 | 28,980 | 101 | 67,834 | 807 | 0 | 687 | 182 | 1675 | 0 | 0 | 0 | 0 | 1675 | 2799 | 65,036 |
| Vavuniya | 25,103 | 23,992 | 96 | 76,285 | 596 | 668 | 1,186 | 853 | 3303 | 0 | 0 | 0 | 0 | 3303 | 6052 | 70,233 |
| Mullativu | 24,362 | 23,744 | 97 | 69,000 | 594 | 594 | 1,179 | 2,158 | 4525 | 0 | 0 | 0 | 0 | 4525 | 6302 | 62,699 |
| Mannar | 24,167 | 24,167 | 100 | 90,220 | 5,505 | 0 | 0 | 384 | 5889 | 0 | 0 | 0 | 0 | 5889 | 20912 | 69,308 |
| Anuradhapura | 83,108 | 79,626 | 96 | 271,475 | 2,255 | 763 | 192 | 20 | 3230 | 0 | 0 | 0 | 0 | 3230 | 9984 | 261,492 |
| Trincomalee | 56,416 | 56,330 | 100 | 171,121 | 4,989 | 17,756 | 5,989 | 0 | 27446 | 0 | 0 | 1288 | 0 | 28734 | 64707 | 106,414 |
| Batticaloa | 77,600 | 77,600 | 100 | 188,348 | 3,647 | 0 | 0 | 0 | 3647 | 0 | 0 | 0 | 0 | 3647 | 8853 | 179,495 |
| Ampara | 9,125 | 9,049 | 99 | 35,182 | 928 | 8 | 118 | 25 | 1079 | 0 | 0 | 0 | 0 | 1079 | 2625 | 32,557 |
| Hambantota | 13,050 | 12,664 | 97 | 61,629 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 61,629 |
| **Inter Province Areas** | **165,357** | **162,302** | | **651,329** | **7,717** | **4,747** | **2,625** | **8,400** | **20,581** | - | **2,906** | - | **4** | **23,490** | **61,224** | **590,104** |
| Polonnaruwa IP | 30,020 | 29,588 | 99 | 119,352 | 3 | 1,988 | 1 | 0 | 1992 | 0 | 0 | 0 | 0 | 1992 | 5997 | 113,355 |
| Ampara IP | 68,429 | 67,159 | 98 | 282,319 | 7,399 | 2,759 | 2,224 | 7,249 | 17874 | 0 | 1754 | 0 | 4 | 19631 | 52347 | 229,971 |
| Monaragala IP | 6,419 | 6,092 | 95 | 24,297 | 0 | 0 | 85 | 0 | 85 | 0 | 0 | 0 | 0 | 85 | 170 | 24,127 |
| Hambantota IP | 15,762 | 15,515 | 98 | 75,186 | 13 | 0 | 77 | 94 | 91 | 0 | 94 | 0 | 0 | 185 | 366 | 74,820 |
| Hasalaka IP | 14,528 | 14,514 | 100 | 50,335 | 0 | 0 | 0 | 1,058 | 0 | 0 | 1058 | 0 | 0 | 1058 | 917 | 49,418 |
| Anuradhapura IP | 30,198 | 29,434 | 97 | 99,840 | 302 | 0 | 238 | 0 | 540 | 0 | 0 | 0 | 0 | 540 | 1428 | 98,413 |
| **Mahaweli Systems** | **93,787** | **94,243** | | **365,435** | **1,305** | - | **3,662** | - | **4,966** | - | - | - | - | **4,966** | **11,331** | **354,104** |
| Udawalawa | 11,810 | 11,500 | 97 | 54,428 | 9 | 0 | 21 | 0 | 30 | 0 | 0 | 0 | 0 | 30 | 91 | 54,337 |
| System H | 21,003 | 21,968 | 105 | 88,908 | 0 | 0 | 160 | 0 | 160 | 0 | 0 | 0 | 0 | 160 | 324 | 88,585 |
| System H1 | 7,961 | 8,590 | 108 | 34,765 | 66 | 0 | 139 | 0 | 205 | 0 | 0 | 0 | 0 | 205 | 547 | 34,218 |
| System B | 20,006 | 20,038 | 100 | 73,788 | 450 | 0 | 1,657 | 0 | 2107 | 0 | 0 | 0 | 0 | 2107 | 4708 | 69,080 |
| System C | 22,851 | 21,073 | 92 | 77,599 | 526 | 0 | 1,064 | 0 | 1590 | 0 | 0 | 0 | 0 | 1590 | 3896 | 73,703 |
| System G | 5,646 | 6,118 | 108 | 20,946 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 20,946 |
| System D | 1,380 | 1,643 | 119 | 6,050 | 0 | 0 | 240 | 0 | 240 | 0 | 0 | 0 | 0 | 240 | 442 | 5,608 |
| Rambakanoya | 1,050 | 1,013 | 96 | 3,282 | 174 | 0 | 241 | 0 | 415 | 0 | 0 | 0 | 0 | 415 | 954 | 2,328 |
| System L | 2,080 | 2,300 | 111 | 5,667 | 80 | 0 | 140 | 0 | 220 | 0 | 0 | 0 | 0 | 220 | 370 | 5,298 |
| **Sri Lanka** | **870,959** | **825,869** | **95** | **2,830,802** | **31,538** | **26,861** | **16,902** | **15,062** | **86,148** | - | **2,917** | **1,288** | **9** | **90,363** | **212,653** | **2,618,149** |

Sources : Deputy Director of Agriculture Offices at Province and Inter Province and Mahaweli Authority of Sri Lanka

04

15th April 2025

02. ශ්‍රී ලංකා රේගු වාර්තාවන්ට අනුව 2025.01.01 දින සිට 2025.03.31 දක්වා කාලය තුළ රු. මිලියන 16,107.14ක් වටිනා සහල් මෙට්‍රික් ටොන් 103,409.8ක ප්‍රමාණයක් ආනයනය කර තිබුණි.

ආනයනකරුවන් විසින් ආනයනය කරනු ලබන සහල් සෘජුවම පාරිභෝගිකයා වෙතට නිකුත් නොකරන අතර තොග වෙළඳුන් කීපදෙනෙකු හරහා විශාල සිල්ලර වෙළෙඳුන් ප්‍රමාණයක් මඟින් බෙදා හැරීමේ ක්‍රියාවලිය සිදු වන බව නිරීක්ෂණය වේ. එබැවින්, පෞද්ගලික ආනයනකරුවන් විසින් ආනයනය කරන ලද සහල්වලින් කොපමණ ප්‍රමාණයක් අළෙවි කර තිබේ ද යන්නත් කොපමණ ප්‍රමාණයක් ගබඩා කර තිබේ ද යන්නත් හා ඒ ඒ සහල්වල තොග පවත්වාගෙන යාමේ ප්‍රමාණය කොපමණ ද යන්නත් ප්‍රායෝගිකව සිදු කළ නොහැකිය.

03. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව 2019 ඒක පුද්ගල සහල් පරිභෝජනය කිලෝග්‍රෑම් 104ක් වන අතර පසු වර්ෂවලට අදාළ දත්තයන් ඔවුන් විසින් සකස් කරමින් පවතී.

04. රේඛීය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, වී අලෙවි මණ්ඩලය යනාදී ආයතන සමඟ පැවති සාකච්ඡාවන්හිදී අනාවරණය වී ඇති පරිදි 2024/25 මහ කන්නය තුළදී වගා කරන ලද වපසරිය හා වගා කරන ලද වී ප්‍රභේදයන් සැලකීමේ දී හා ඉහත අංක 01හි සඳහන් කරුණු හේතුවෙන්, සම්බා සහල් සහ කීරි සම්බාවල හිඟතාවන් ඇති විය හැකි බවට කරුණු නිරීක්ෂණය වී තිබේ. විශේෂයෙන්ම, අප්‍රේල් මස අග වන විට මෙම තත්ත්වය වෙළෙඳ පොළ තුළින් නිරීක්ෂණය වී ඇත.

05. මහා පරිමාණ මෝල් හිමියන් විසින් අතරමැදියන් මඟින් විශාල ලෙස වී මිලදී ගෙන ඇති බවට කරුණු වාර්තා වී තිබේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්තාවලට අනුව මෙම මහා පරිමාණ මෝල් හිමියන් විසින් විශාල ලෙස වී ගබඩා කර නොමැති නමුත් අතරමැදියන්ගේ බලපෑමෙන් සහල් වෙළෙඳ පොළ තුළ අසාමාන්‍ය තත්ත්වයක් ඇති විය හැකි බවට කරුණු නිරීක්ෂණය වේ. මහා පරිමාණ මෝල් හිමියන් හා අතරමැදියන් විසින් සහල් වෙළෙඳ පොළ කටයුතුවලට බලපෑමක් එල්ල කිරීමේ හැකියාව පවතින බව ද නිරීක්ෂණය වේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරින් විසින් මහා පරිමාණ මෝල් හිමියන්ගේ ගබඩා තුළ ඇති වී, දෛනික සහල් නිෂ්පාදනය මෙන්ම එම සහල් වෙළෙඳ පොළට නිකුත් කිරීම පිළිබඳ වන දෛනික වාර්තා සිංහල දෙමළ අවුරුදු සමය දක්වා පිළියෙළ කරන ලදී.

එවැනි තත්ත්වයක් ඇති වුවහොත් ඊට මුහුණ දීම සඳහා රජය විසින් පෞද්ගලික වෙළෙඳුන් මඟින් සහල් ආනයනය කිරීම සඳහා 2025.04.01 දින පැවති ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේදී සාකච්ඡා කරන ලද අතර ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

06. 2024/25 මහ කන්නයේ වී අස්වැන්න 2025 අප්‍රේල් මස වන විට අවසන් වන අතර එම අස්වැන්න සහතික මිලක් යටතේ මිලදී ගැනීමේ කටයුතු සිදු කර ඇත. එසේ වුවත්, රජයේ සහතික මිලට වඩා වැඩි මිලට පෞද්ගලික වෙළෙඳුන් විසින් වී මිලට ගනු ලැබ ඇති අතර, එම වී ගබඩා කොට සහල් බවට පත් කිරීමේදී මිල ඉහළ යාම අපේක්ෂා කළ හැක. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දෛනිකව සිදු කරනු ලබන පරීක්ෂාවන්ට අනුව වැඩි මිලක් යටතේ මිලදී ගනු ලබන වී, සහල් බවට පත් කළ විට ඒවායේ පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 250 සිට රුපියල් 350 දක්වා පරාසයක් තුළ පැවති බව නිරීක්ෂණය වේ. එබැවින් අතරමැදියන් සතුව පවතින වී තොග වැඩි මිලට සහල් බවට වෙළෙඳ පොළ තුළට පැමිණීම වැළැක්වීමේ ක්‍රමවේදය වනුයේ යම් කාලයක් සඳහා තෝරාගත් සහල් වර්ගයන් කිහිපයක් ආනයනය කර එම සහල් රජයේ උපරිම සිල්ලර මිල යටතේ පාරිභෝගික ජනතාව වෙත අළෙවි කිරීම වේ.

07. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් පොහොර සහනාධාරය ඇතුළු අනෙකුත් අවශ්‍ය පහසුකම් ලබා දෙන අතර, දේශීය ගොවියා හට සාධාරණ මිලක් වී සඳහා ලබා දීමේ අරමුණින් වී මිලදී ගැනීම සඳහා සහතික මිලක් 2024/25 මහ කන්නයේ දී පහත සඳහන් පරිදි නියම කරන ලදී.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

| සහල් වර්ගය | අවම සහතික මිල (කිලෝ ග්‍රෑමයකට රුපියල්) | |
|---|---|---|
| | තෙතමනය (14%) | තෙතමනය (22%) |
| නාඩු | 120.00 | 102.00 |
| සම්බා | 125.00 | 105.00 |
| කිරි සම්බා | 132.00 | 102.00 |

එමෙන්ම අසාධාරණ ලෙස මිල ඉහළ දැමීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම උදෙසා 2025.12.09 දිනැති හා අංක 2414/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පහත සඳහන් පරිදි උපරිම තොග හා සිල්ලර මිලක් නියම කරන ලදී.

| සහල් වර්ගය | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|
| කැකුළු රතු/සුදු | 215.00 | 220.00 |
| නාඩු | 225.00 | 230.00 |
| සම්බා | 235.00 | 240.00 |
| කිරි සම්බා | 255.00 | 260.00 |

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමන්ලා ඉදිරි දැක්මක් සහිතව කටයුතු කරන්නේ කොහොමද කියලා කිව්වොත් ඒ ඇති.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇහුවා වාගේම ඔබතුමාත් දන්නවා, අප හැමෝමත් මේ පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කළා. විශේෂයෙන් මේ කන්නයේත්, ඒ කියන්නේ 2024/2025 මහ කන්නයෙත් අපේක්ෂා කළ වී අස්වැන්නට වඩා මෙට්‍රික් ටොන් ලක්ෂ 2ක් අඩුවෙන් තමයි අපට අස්වැන්න ලැබිලා තිබෙන්නේ. ඒ නිසා මේ කන්නයේත් බලාපොරොත්තු වෙච්ච අස්වැන්න අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මේ වනකොටත් ආහාර සුරක්ෂිතතා කමිටුවේ මේ ගැන අපි සාකච්ඡාවට යොමු කර තිබෙනවා. ඒ කියන්නේ, ජනතාවට අඩුවකින් තොරව වෙළෙඳ පොළ තුළ විවිධ වර්ගවල සහල් පරිභෝජනයට ගැනීම සඳහා තිබෙනවා. සියයට 65ක් පමණ නාඩු සහල්, සම්බා සහ කීරි සම්බා වාගේම රතු සහල් තිබෙනවා. මේ වර්ග හතරෙන් තමයි තිබෙන්නේ. අපි වෙළෙඳ පොළ තුළ හඳුන්වන නම්වලින් මේ තිබෙන්නේ. අඩුවකින් තොරව ජනතාවට සහල් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා. කීරි සම්බාවල හිඟයක් පවතින බවට මේ වනකොට market එක තුළ කථාවක් හැදෙමින් තිබෙනවා. ඒකටත් අපි තීරණයක් ගෙන තිබෙනවා, අවශ්‍ය වුණොත් සහල් යම් ප්‍රමාණයක් ගෙන්වන්න. දැනට අනෙකුත් සහල්වල හිඟයක් නැහැ. අවශ්‍ය ප්‍රමාණය අනුව සහල් පවතින බව තමයි අදාළ ආයතන මඟින් අපව දැනුවත් කර තිබෙන්නේ. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සොයා ගත් තොරතුරු අනුව එය තහවුරු කර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මට කියන්න තිබෙන්නේ එක දෙයයි. මේ රටේ ඵලදායිතාව වැඩි කරන තාක්කල් මේ ප්‍රශ්නය ඇති වෙනවා. මම එක ඉල්ලීමක් කරනවා. කරුණාකර තීරු බදු දාලා ඊට පසුව මේ මාර්කට් එක open කරන්න; තරගකාරීත්වයක් ඇති කරන්න. එතකොට කවදාවත් ඔබතුමන්ලාට minimum guaranteed price වැනි දේවල් ඇති කරන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, ඔබතුමන්ලා බයයි, බියර් සඳහා සහල් යනවාද, අනෙක් ඒවාට යනවාද කියලා. මේකට බදු ගහන්න. නිෂ්පාදන කරන වියදමක් දාන්න. ඊට පස්සේ මාර්කට් එක විවෘත කරන්න. එතකොට තමයි පාරිභෝගිකයාටයි, ඔබ සියලුදෙනාටයි මේකෙන් යම් විධියකට තෘප්තියක් ලැබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන්නේ බයක් පිළිබඳ ප්‍රශ්නය නොවෙයි. අපේ රටේ සියයට 27ක් වූ ගොවි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වී නිෂ්පාදනය; කුඹුරු ගොවිතැන. ඒ නිසා ගොවියා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් තමයි දැනට සහල් ආනයනය සඳහා සීමා පනවා තිබෙන්නේ. අවශ්‍යතාව අනුව අපි සහල් ආනයනය කරනවා. ඔබතුමා මතු කරන කාරණය තමයි සත්ව නිෂ්පාදන සඳහා - poultry industry එකට - වුවමනා ප්‍රමාණයක් තිබෙනවා. ඒගොල්ලන් වී මිලදී ගන්නවා. අපි ඒකට උත්තරයක් ලෙස බඩඉරිඟු ගෙන ඒම සඳහා මේ වනකොටත් පර්මිට් දීලා තිබෙනවා. ඒ අදාළ නිෂ්පාදකයන්ට මෙට්‍රික් ටොන් ලක්ෂ 2ක බඩඉරිඟු අරගෙන එන්න දැනට පර්මිට් නිකුත් කර තිබෙනවා.

ඊට අමතරව අපි ආහාර සුරක්ෂිතතා කමිටුවේදීත් සාකච්ඡා කළා දේශීය සහල් අනෙකුත් නිෂ්පාදන සඳහා ගන්නා එක වෙනුවට, -විශේෂයෙන් බියර් සඳහා අවුරුද්දකට සහල් මෙට්‍රික්ටොන් 18,000ක් පමණ පාවිච්චි කරනවා- ඒ නිෂ්පාදකයන් සමඟ සාකච්ඡා කර, ඒ අයට අවශ්‍ය සහල් ටික ගෙන්වා දෙන්න අවශ්‍ය නම් ඒ ගැන කථා කරන්න. ඒ තීරණය අපි ගෙන තිබෙනවා. ඒ ගෙන්වන සහල් මාර්කට් එකට යන්නේ නැහැ. එතකොට අපේ දේශීය නිෂ්පාදන අපට ප්‍රමාණවත් ලෙස තිබෙනවා. දැනට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ සත්ව ආහාර සහ අනෙකුත් නිෂ්පාදන සඳහා වෙළෙඳ පොළේ තිබෙන සහල් මිලදී ගන්න එකයි. විශේෂයෙන්ම කැකුළු හාල්. ඒ නිසා අවශ්‍ය ප්‍රමාණවලට කැකුළු හාල් ගෙනැවිත් දෙන්න අපි තීරණයක් අරගෙන තිබෙනවා. ඒගොල්ලන් එක්ක කථා කරලා ඉදිරියේදී අපි ඒ කටයුත්ත කරනවා. එතකොට කර්මාන්තය සුරක්ෂිතයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කථා කරන්නේ පාරිභෝගිකයා ගැන විතරයි. අනෙක් අතුරු භෝග ගැන නොවෙයි මේ අවශ්‍යතාව. ගොවියාට වී කිලෝවක් නිෂ්පාදනය කරන්න යන වියදම ගැන ඔබතුමා දන්නවා නේ. දැන් සහල් කිලෝවක් විකුණන්නේ රුපියල් 260ට නම්, ඒක 1.6න් බෙදුවාම දන්නවා නිෂ්පාදන වියදම කීයද කියලා. ඒකට තීරු බද්දත් දැමුවාට පසුව මේක පරිභෝජනයටද, වෙනත් දෙයකටද කියන එක ගැන ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ; කිසිසේත් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඉතින්, market forces තුළින් තමයි ඉදිරි ගමන ගෙනයන්න පුළුවන් වෙන්නේ. කරුණාකර, ඒකට ආයෝජනය කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

පාරිභෝගිකයාත්, ගොවියාත් යන දෙදෙනාම අපි රැකගන්න ඕනෑ. මොකද, අපේ රටේ ගොවි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය තමයි කෘෂි කර්මාන්තය. ඒ නිසා ගොවියාත්, පාරිභෝගිකයාත් කියන දෙදෙනාම රකින්න තමයි අපි සහල්වලට උපරිම සිල්ලර මිලක් නියම කරලා, වී සඳහා සහතික මිලක් ලබා දී තිබෙන්නේ.

ඒ නිසා මේ දෙකම ඇතුළේ ගොවියා මෙවර හොඳ මිලකට තමන්ගේ අස්වැන්න විකිණුවා. ඒ වාගේම, පාරිභෝගිකයාට අඩුවකින් තොරව සහල් ගන්න පුළුවන් වෙන්න අපි මාර්කට් එක හදන්න ඕනෑ. ඒ නිසා මාර්කට් එක open කළත්, තීරු බද්දක් දාලා නිදහස් කළත් මේකේ වෙන්නේ ඒක නේ. අවශ්‍යතාවට සරිලන ප්‍රමාණයට සහල් ගෙනැල්ලා වෙළෙඳ පොළේ තිබෙන එක. දැනට වෙළෙඳ පොළේ ප්‍රමාණවත් ලෙස සහල් තිබෙනවා. ගොවියාත් ආරක්ෂා වෙලා තිබෙනවා. ඔහුගේ අස්වැන්නත් හොඳ මිලකට විකුණාගෙන තිබෙනවා. අඩුවක් වෙන්නේ නැතුව වෙළෙඳ පොළට සහල් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

අදාළ පිළිතුර හෙට දිනයේ ලබා දීමට කාලය ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, මීට කලින් ඇති වුණු සාකච්ඡාව පිළිබඳව පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු විධියට අදහසක් ඉදිරිපත් කරන්න මට අවශ්‍යයි. ගරු අර්චුනා මන්ත්‍රීතුමා මේ කාරක සභාවට ප්‍රධාන වශයෙන් කාරණා 3ක් ඉදිරිපත් කළා. අපි ඒ පිළිබඳව සාකච්ඡා කළා. පළමුවෙන්ම එතුමා ඉදිරිපත් කළා විපක්ෂ නායක කාර්යාලයේ ඇති වුණු සිදුවීමක් පිළිබඳව; එතුමාට කථා කිරීමට කාලය ලබා නොදීම පිළිබඳව. ඒ පිළිබඳව අපි කාරක සභාවේදී සාකච්ඡා කරලා, අපේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. දෙවනුව එතුමා තවත් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, කිසියම් හෝටලයකදී එතුමාට කරන ලද පහරදීමක් සම්බන්ධයෙන්. ඒ සම්බන්ධවත් අපේ කාරක සභාවේදී සාකච්ඡා කර, ඒ පිළිබඳවත් තීන්දුවක් ලබා දී තිබෙනවා. අපේ කාරක සභාව විසින් එතුමාත් ගෙන්වලා අවශ්‍ය සාක්ෂි විමසා ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර තිබෙනවා. ඊට අමතරව, එතුමාගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් පිළිබඳව අපේ කාරක සභාවට තවත් ප්‍රශ්නයක් යොමු කර තිබුණා. ඒ, මාර්ග නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්. ඒ පිළිබඳව මේ වන විට විමර්ශන කටයුතු සිදු වෙමින් පවතිනවා. හෙට දිනයේත් අපේ කාරක සභාව රැස්වෙනවා. ඒ රැස්වීමේදී අපි මේ පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු සිදු කරන බව සභාවට දැනුම් දෙන්න කැමැතියි.

# පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විදේශීය ණය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
### வெளிநாட்டுக் கடன்கள் (நீக்குதல்) சட்டமூலம்
### FOREIGN LOANS (REPEAL) BILL

"1957 අංක 29 දරන විදේශීය ණය පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 මැයි 22වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக் கப்பட்டது.*

*2025 மே 22, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, on behalf of the Minister of Finance, Planning and Economic Development; to be read a Second time upon Thursday, 22nd May, 2025 and to be printed; and to be referred to the Committee on Public Finance.*

### පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත
### தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்
### PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL

"2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 මැයි 22වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*டிஜிட்டல் பொருளாதார அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 மே 22, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake on behalf of the Minister of Digital Economy; to be read a Second time upon Thursday, 22nd May, 2025 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

## ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත
## தேசிய போக்குவரத்து ஆணைக்குழு (திருத்தம்) சட்டமூலம்
## NATIONAL TRANSPORT COMMISSION (AMENDMENT) BILL

"1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 මැයි 22වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 மே 22, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, Minister of Transport, Highways, Ports and Civil Aviation; to be read a Second time upon Thursday, 22nd May, 2025 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
# தனி உறுப்பினர் சட்டமூலங்கள்
# PRIVATE MEMBERS' BILLS

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ (අවලංගු කිරීමේ) පනත් කෙටුම්පත
## நிகழ்நிலைக் காப்புச் சட்டம் (இரத்துச் செய்தல்) சட்டமூலம்
## ONLINE SAFETY (REPEAL) BILL

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to repeal the Online Safety Act, No.9 of 2024."

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to. Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Health and Mass Media.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථා පරිවර්තක නිලධාරි මහත්මයෙකුගේ අභාවය පිළිබඳ දැනුවත් කිරීමක් කරන්න ඔබතුමා මට විනාඩියක කාලයකට අවසර දෙන්න.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ කථා පරිවර්තක කාර්යාලයේ සිංහල/ඉංග්‍රීසි/සිංහල අංශයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු කථා පරිවර්තක වජිර නිලන්ත ධම්මගේ මහතා ඊයේ දිනයේ හදිසියේ අභාවප්‍රාප්ත වී තිබෙනවා. එතුමා අවුරුදු 20කට වැඩි කාලයක් කථා පරිවර්තකයෙකු වශයෙන් මේ පාර්ලිමේන්තුවේ සේවය කරලා තිබෙනවා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාගේ පළමුවැනි රාජ්‍ය නිල සංචාරයේදීත් එතුමා භාෂා පරිවර්තකයෙකු වශයෙන් සම්බන්ධ වුණා. ජනාධිපතිතුමා වෙනත් රාජ්‍ය තාන්ත්‍රිකයන් සමඟ පැවැති සාකච්ඡාවලටත් එතුමා සම්බන්ධ වෙලා තිබෙනවා. එතුමාගේ හදිසි අභාවය පිළිබඳ අපි බෙහෙවින් කනගාටු වන ගමන්, එතුමාගේ සේවය පිළිබඳ අගය කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## රේගු ආඥා පනත: යෝජනා සම්මතය
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) 'අ' උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2025.04.09 දින ඉදිරිපත් කරන ලද යෝජනා සම්මතය අනුමත කළ යුතු ය.

(2025 ජනවාරි 27 දිනැති අංක 2421/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.02]

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මෙම ගැසට් පත්‍රය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමේදී කිව යුතු කාරණා කිහිපයක් තිබෙනවා. එක පැත්තකින්, රාජ්‍ය ආදායමට අවශ්‍ය කරන අරමුදල් සම්පාදනය කර ගැනීම, රටේ අවශ්‍යතාව අනුව වාහන ආනයනය සෑහෙන කාලයක් -වසර ගණනාවක්- තහනම් කර තිබීම ආදි කරුණු සියල්ල සැලකිල්ලට භාජන කරලා වාහන ආනයනය කිරීම සඳහා තිබූ බාධාව ඉවත් කිරීම වෙනුවෙන් තමයි මෙමඟින් කටයුතු කරන්නේ. මෙයට අදාළව ගැසට් නිවේදන ගණනාවක් නිකුත් කෙරුණා. ඒවායෙන් එක ගැසට් නිවේදනයක් වන 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද 2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනයේ සඳහන් යෝජනාව සම්බන්ධයෙන් තමයි අද මේ විවාදය පැවැත්වීමට සූදානම් කරලා තිබෙන්නේ.

මේ ගැසට් නිවේදනයේ සඳහන් යෝජනාව සම්බන්ධයෙන් බලන කොට රටට වාහන ආනයනය කරන්නට අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කරන්නට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තහනම ඉවත් කරමින් මේ රටට අවශ්‍ය වාහන ආනයනය කිරීමට අවස්ථාව ලබා දීමේදී ක්‍රමවේද ගණනාවක් ඔස්සේ සලකා බලා, පළමුවැනි අදියරේදී මඟී ප්‍රවාහනය සඳහා අවශ්‍ය කරන වාහන, බස් රථ රටට ආනයනය කිරීමට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සූදානම් කරලා ක්‍රියාත්මක කරවූවා. දෙවැනි අදියර ලෙස commercial vehicles, එහෙම නැත්නම් වාණිජ ක්ෂේත්‍රයට, ව්‍යාපාරික ක්ෂේත්‍රයට අවශ්‍ය කරන වාහන රටට ආනයනය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවා, තුන්වැනි අදියර ලෙස තමයි පෞද්ගලික වාහන ආනයනය සඳහා ඉඩ ප්‍රස්තාව සූදානම් කරලා දුන්නේ. මේ තහනම ඉවත් කිරීමේදී එයට සමගාමීව තිබෙන CID - Customs Import Duty - සම්බන්ධයෙන්, තීරු බදු සම්බන්ධයෙන් මේ ගැසට් පත්‍රයේ සඳහන් කිරීම් අදාළ වෙනවා. තහනම ඉවත් කරනවාත් සමඟම ආනයනය කරන වාහනවලට තීරු බද්ද ලෙස මේ දක්වා සියයට 20ක ප්‍රමාණයක් තමයි පනවා තිබුණේ. රටේ තිබුණු වාතාවරණය සැලකිල්ලට ගෙන අපේ තිබෙන සංචිතවලට අවශ්‍ය කරන සුරක්ෂිතභාවය ලබා දීම, ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සැලකිල්ලට ගැනීම වැනි කරුණු රාශියක් පදනම් කරගෙන, සියයට 20ක් ලෙස තිබූ තීරු බද්දට තවත් අමතර සියයට 10ක ප්‍රමාණයක් එකතු කරලා සියයට 30 දක්වා වැඩි කරන්නටත් මීට සමගාමීව වැඩ කටයුතු කෙරුණා. ඒකට හේතුව තමයි, මා අර කලින් පැහැදිලි කළා වාගේම වසර ගණනාවක් තිස්සේ රටට වාහන ආනයනය කිරීම තහනම් වෙලා තිබුණු නිසා එක සැරේ වාහන අතිවිශාල ප්‍රමාණයක් රට තුළට ඇතුළු වුණොත් ඒකෙන් බලපෑම් කිහිපයක් විය හැකිව තිබීම. මම කලින් සඳහන් කළා වාගේ, අපේ සංචිතවලට තිබෙන බලපෑම ගැන බලන්නට ඕනෑ. අපේ විදේශ විනිමය සම්බන්ධයෙන්, ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය මත අපනයනකරුවන්ට සිදු වන බලපෑම ගැන බලන්නට ඕනෑ. ඒ වාගේ කරුණු රාශියක් පදනම් කරගෙන තමයි මේ ප්‍රතිශතය තීරණය කරනු ලැබුවේ. මේ අවස්ථාව රටට උදා වීම තුළින් අපට පෙනෙනවා, මේ වන කොට වාහන අතිවිශාල ප්‍රමාණයක් ලංකාවට ඇවිත් තිබෙන බව. අපේ බලාපොරොත්තුවක් තිබුණා, යම්කිසි estimation එකක්, projection එකක් තිබුණා, මාසයක් ඇතුළත, මාස දෙකක් ඇතුළත, කාර්තුවක් ඇතුළත යනාදී වශයෙන් රට තුළ බැංකු පද්ධතිය හරහා LCs මෙපමණ ප්‍රමාණයක් open වෙයි, ඒ හරහා මෙපමණ වාහන ප්‍රමාණයක් රටට ළඟා වෙයි කියලා.

ඒ projectionsවලට අනුව, ඒ ඉදිරි ඇස්තමේන්තු කිරීම්වලට අනුගතව මේ වෙනකොට ඉතා සාර්ථකව එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන බව අපට දත්ත අනුව දකින්නට පුළුවන්කම තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩ පිළිවෙළට අනුව වාහන ආනයනය කරන්නට රටක් විධියට අපි එකඟ වෙනවාත් එක්කම, අපි ඉදිරියේදීත් ඒකට අවස්ථාව ලබා දෙනවාත් එක්කම අපි සඳහන් කළ යුතුයි, රටේ ආර්ථික ස්ථාවරභාවය යම් කිසි මට්ටමකට ඇවිල්ලා තිබෙන නිසා තමයි අපට මේ සඳහා යොමු වෙන්න අවස්ථාව ලැබුණේ කියන කාරණයත්.

ආර්ථික ස්ථාවරභාවයක් ඇති වෙලා තිබෙනවා කියන එකෙන් අපි මොකක්ද අදහස් කරන්නේ? එය වචනයකට සීමා කරනවා වෙනුවට, අපට බලන්න පුළුවන් ඒකට තිබෙන නිර්ණායක දිහා. උදාහරණයක් විධියට රටේ විදේශ සංචිත ප්‍රමාණය කොච්චර තිබෙනවාද, ඒක වර්ධනය වීමේ ප්‍රතිශතය කුමක්ද, ඉදිරියට ඒ සම්බන්ධයෙන් තිබෙන බලාපොරොත්තුව මොකක්ද කියලා අපට බලන්න පුළුවන්. මේ වෙනකොට ඩොලර් බිලියන 6.5ක පමණ විදේශ සංචිත ප්‍රමාණයක් තිබෙනවා. Projection එකට අනුව වසර අවසාන වෙනකොට මෙම ප්‍රමාණය ඉතා සාර්ථක ලෙස බිලියන 7 සීමාව පසු කරගෙන ඉදිරියට යයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඊට සමගාමීව තමයි රුපියලට සහ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට තිබෙන විනිමය අනුපාතය තීරණය වෙන්නේ. විපක්ෂයේ පිරිස කිව්වා, ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටෙන්නට පුළුවන් කියලා නැවත වතාවක්. නමුත් අද වෙනකොට මෙතරම් ජාත්‍යන්තරයේ කථා බහට ලක් වෙලා තිබෙන US tariff issue එක ඇති වෙලා තිබෙන අවස්ථාවේ පවා ඉතාම හොඳ මට්ටමකට ශ්‍රී ලංකා රුපියලට වටිනාකම නියම වෙලා තිබෙනවා, ඩොලරයට සාපේක්ෂව. මේකෙනුත් පැහැදිලි වෙන්නේ සාර්ථකව ආර්ථිකය කළමනාකරණය කරන මේ වැඩ පිළිවෙළේ තිබෙන ප්‍රගතිය පිළිබඳවයි.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

ඊළඟ කාරණය මේකයි. මම කිව්වා රටේ ස්ථාවරභාවය බලන්න පුළුවන් ක්‍රම කිහිපයක් තිබෙනවා කියලා. එයින් තව එක ක්‍රමයක් තමයි අපේ රටේ උද්ධමන - inflation - අනුපාතය. මේ වෙනකොට රටේ උද්ධමන අනුපාතය ස්ථාවර මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. කාර්තු කිහිපයක් තිස්සේ සෘණ - negative - මට්ටමක තිබුණු උද්ධමනය මේ වෙනකොට බලාපොරොත්තු වන සීමාව තුළ පවත්වා ගෙන යෑමට රජයට, මහ බැංකුවට හැකියාව ලැබී තිබෙනවා. මේ විධියට ආර්ථිකය සාර්ථකව කළමනාකරණය කිරීමේදී රජයේ වැඩ කටයුතු විතරක් නොවෙයි, ඊට වැදගත් වන තවත් අංගයක් තිබෙනවා. පෞද්ගලික අංශයට, ව්‍යාපාරිකයන්ට රටේ ආර්ථික කටයුතුවලට සහභාගි වෙන්නට අවස්ථාව තිබෙනවා, ණය ලබා ගැනීම තුළින්.

රටේ ණය අනුපාතය මෙහිදී බලන්න පුළුවන් තවත් සාධකයක් විධියට අපට තිබෙනවා. මේ රටට දරාගත නොහැකිව තිබුණු ණය අනුපාතය මේ වෙනකොට ඉතාම සාධනීය මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම මේ ආර්ථික ස්ථාවරභාවය තුළින් රජයේ ආදායම ඉහළ නංවා ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. ලංකා ඉතිහාසයේ වැඩිම රාජ්‍ය ආදායම පසුගිය වසරේදී අපේ රජය විසින් උපයාගෙන තිබුණා. ඊටත් වඩා වැඩි රාජ්‍ය ආදායමක් 2025 වර්ෂයේදී උපයා ගැනීමට අපට විශාල බලාපොරොත්තුවක් තිබෙනවා, ඒකට වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා. ඒ අනුව එක පැත්තකින් අපේ ආර්ථිකය ස්ථාවර කරන්නට අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කර තිබෙනවා. අනෙක් පැත්තෙන්, ආදායම වැඩි කරගන්නට අවශ්‍ය වැඩ කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ වාගේම වියදම් අඩු කරගන්නට -අනවශ්‍ය වියදම් ඉවත් කිරීම තුළින් වියදම් නිසි ලෙස කළමනාකරණය කරගන්නටත්- වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා.

ඒ වාගේම exports තුළින් රටට ලැබෙන ආදායම මේ වර්ෂයේදී ඉතාම ඉහළ අගයකට ගෙනෙන්නටත් අපි බලපොරොත්තු වෙනවා. ඒ වාගේම රටට ලැබෙන ප්‍රේෂණ - remittances - තුළින් විශාල ප්‍රමාණයක ආදායමක් මේ වර්ෂයේදී උපයා ගන්නත් අප බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අපි තීරු බදු - customs duty, ආදායම් බදු යනාදියෙන් ආදායම් උපයා ගන්නවා. ඒවාත් අදාළ ප්‍රතිසංස්කරණවලට භාජන කිරීම තුළින් ඒවායේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය වැඩි කර ගැනීමටත්, ඉහළ නංවා ගැනීමටත් වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා.

අපි ගෙන යන මේ වැඩ පිළිවෙළ පිළිබඳව ප්‍රශංසාව තිබෙන්නේ සහ සාධනීය ප්‍රකාශ තිබෙන්නේ රජය පැත්තෙන් විතරක් නොවෙයි. ඒ දේවල් අපි කියනවා විතරක් නොවෙයි. මේවාට සම්බන්ධ අනෙක් ආයතන ගැන අපි දන්නවා. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ලංකාව ණය ශ්‍රේණිගත කිරීම තුළ ඉහළ අගයකට ඔසවා තබන්නට අවශ්‍ය වැඩ පිළිවෙළ පසුගිය වසරේදී ක්‍රියාත්මක කරනු ලැබුවා. අපි බලාපොරොත්තු වෙනවා, එම කටයුත්ත තවදුරටත් ඉදිරියට ගිහිල්ලා ණය ශ්‍රේණිගතකරණයේදී කාණ්ඩ කිහිපයකින් ඉදිරියට යන්නට ඉදිරියේදී ශ්‍රී ලංකාවට අවස්ථාව එළඹෙයි කියලා.

ඊට අමතරව, ඉදිරි වර්ෂ කිහිපය තුළ ලෝක බැංකුව විසින් ලංකාවට ඇමෙරිකානු ඩොලර් බිලියන එකක ආයෝජන, ණය ආධාර ලබා දීමට අවශ්‍ය එකඟතාව පළ වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි IMF වැඩ පිළිවෙළ තුළ මේ දක්වා තිබුණු සමාලෝචනය. එහෙම නැත්නම් පසුගිය දින කිහිපයේ දී අවසාන කරන්නට යෙදුණු fourth review එක. ඒ තුළින් staff-level agreement එකකට එන්න අවස්ථාව අප්‍රේල් මාසයේ අග භාගයේ දී අපට හැකියාව ලැබුණා. ඒ එකඟතාව අනුව IMF ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒ අදාළ වාර්තා ලබා දීමෙන් පසුව ලබන ජූනි මස අවසාන වන විට අපි බලාපොරොත්තු වෙනවා ඒ අනුමැතිය ලබා ගෙන, ඊළඟ වාරිකය අවශ්‍ය කාලසීමාව තුළ ලංකාවට ලැබෙයි කියලා. මේක මුදල්වලට විතරක් සීමා වෙච්ච ගනුදෙනුවක් නොවෙයි. මේ වැඩ පිළිවෙළට සමගාමීව අපේ good governance, එහෙම නැත්නම් යහ ආණ්ඩුකරණ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්නටත්, ඉතාම උනන්දුවෙන් වර්තමාන ආණ්ඩුව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නටත් ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වචනවලට සීමා කිරීමක් වෙනුවට මම උදාහරණයක් දෙන්නම්. මේ වැඩසටහන තුළ තිබුණා, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල රුපියල් බිලියනයකට වැඩි මිලදී ගැනීම් තිබෙනවා නම් ඒ ටෙන්ඩර් පටිපාටියට සහභාගි වෙච්ච පිරිසට ඒ පිළිබඳ තොරතුරු ලබා ගන්නට අවශ්‍ය විනිවිදභාවයකින් යුතු ක්‍රමයක් තිබෙන්නට ඕනෑ කියලා. මේ දක්වා ඒ ක්‍රමය ඉදිරිපත් කරලා තිබුණේ නැහැ. නමුත්, වර්තමාන ආණ්ඩුව ඒක ක්‍රියාත්මක කරලා මේ වෙනකොට ලෝකයේ ඕනෑම පුරවැසියෙකුට බලන්න පුළුවන් ලෙස ඒ තොරතුරු ආයතන 10ක් පදනම් කරගෙන අපි පළමුවෙනි අදියර ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඉදිරියේ දී සියලු ආයතනවලට ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා.

මම කලින් වතාවේදීත් කථා කරනකොට සඳහන් කළ විධියට මේ අවස්ථාවේ දී ලෝකයේ යම් කිසි development එකක් තිබෙනවා. ඒ තමයි මේ US tariffs සම්බන්ධයෙන් තිබෙන කථා බහ. ඒකට ශ්‍රී ලංකාවේ රජය නිසි ලෙස, නිසි කලට මැදිහත්වීම නිසා මේ වෙනකොට ඉතාම සතුටුදායක ප්‍රගතියක් ඇති කර ගෙන තිබෙන බව මේ සභාවට ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ ප්‍රගතිය ලබා ගැනීම සඳහා පළමුවෙන්ම රාජ්‍ය තාන්ත්‍රික විධියට ජනාධිපතිතුමා විසින් ඇමෙරිකානු ජනාධිපතිතුමා වෙත ලිඛිතව අපේ වැඩ පිළිවෙළ පිළිබඳව, ක්‍රමය පිළිබඳව අදහස් දැක්වීමක් ඉදිරිපත් කළා. ඒකට සාපේක්ෂව තවත් ලිපි කිහිපයක් හරහා අදහස් හුවමාරු කර ගැනීම කරනු ලැබුවා, මෙන්න මේ ආකාරයට තමයි ඒ tariffs පිළිබඳව සහ non-tariff පිළිබඳව සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකාවේ රජය බලාපොරොත්තු වෙන්නේ කියලා. ඒ ලිපි හුවමාරුවට සමගාමීව අපි අන්තර්ජාලය හරහා සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා, US tariffs පිළිබඳ වැඩසටහන සමාලෝචනය කරලා බලන කණ්ඩායම ලෙස. ඊට අමතරව ඒ සාකච්ඡාවලදී ලබා ගත් ප්‍රගතිය නිසා රටවල් ගණනාවක් මේ වෙලාවේ උත්සාහ කරනවා ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සම්බන්ධ වෙලා සාකච්ඡාවට සහභාගි වන්නට. එහිදී ලංකාව සද්භාවයෙන් කරපු වැඩ පිළිවෙළ නිසා අපට ඒකට ගිහිල්ලා සහභාගි වෙලා සාකච්ඡාවක් ගන්නට, USTR එකේ ඉහළම නිලධාරියා සමඟ සම්බන්ධ වෙලා ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණා. ඊට අමතරව දෙවැනි සාකච්ඡා වටයකුත් ඇමෙරිකාවේ දී මේ සම්බන්ධයෙන් පැවැත්වුණා. මේ වෙලාවේ බොහොම සතුටුයි කියන්නට ඒ සාකච්ඡාවල ප්‍රගතිය අනුව මේ වෙනකොට අප දැනුවත් කරලා තිබෙනවා ඊළඟ වටයේ සාකච්ඡා සඳහා සූදානම් වෙන්නට අවස්ථාව දැන් අපට තිබෙනවා කියලා. ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගන්නටත් වැඩ කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ ගමනේ බලාපොරොත්තුව මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපේ රටේ ඉන්න මේ අපනයකරුවන්ට මෙතුවක් කල් තිබුණා competitive advantage එකක්. මේ කලාපය තුළ අපිත් එක්ක තරග කරන අනෙක් රටවල්වලට සාපේක්ෂව ඒ තරගකාරීත්වය නඩත්තු කරවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිඵලයක් ලබා ගැනීමයි මේ තුළින් කරන උත්සාහය. අපට මේ වැඩසටහනට සහභාගි වෙලා කථා බහ කරන්නට දින 90ක විතර කාලයක් තිබෙනවා. මේ වෙනකොටත් එයින් යම් කිසි දින ගණනක් ගත වෙලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව තමයි මේ සාකච්ඡා සාර්ථක කරගෙන රටට අවශ්‍ය විධියට, ගැළපෙන විධියට එකඟතාවකට පැමිණීම. අපි බලාපොරොත්තු වෙනවා ඒ තුළින් අපට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වෙයි කියලා. මේ කටයුත්ත පිළිබඳව සඳහන්

කරන්නේ මේ නිසායි. අපි මේ යන ගමනේ ආර්ථිකයේ ස්ථාවරභාවයට බාහිරින් තිබෙන කරුණුවලට මැදිහත් වෙන්නට පුළුවන්, අපේ control එකෙන් තොරව, අපේ කළමනාකරණයෙන් පරිබාහිරව,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙහෙම ගැටලු මතු වෙලා තිබෙන අවස්ථාවක පවා රටේ විදේශ විනිමය අනුපාත නිසි ලෙස නඩත්තු කරගෙන, රටේ සංචිත නඩත්තු කරගෙන රටේ ව්‍යාපාරිකයන්ට, කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් සලසන්න සියලු කටයුතු සූදානම් කරන්නට රජය මේ වන කොට වැඩකටයුතු කරලා තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන් ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, do you permit it?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Okay.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා වාහන ආනයනය කිරීම ගැන සඳහන් කරමින් කිව්වා, මේ වසරේ ලොකු ආදායමක් බලාපොරොත්තු වන බව. රුපියල් බිලියන 428ක් ද කොහේද target කර තිබෙන බවත් කියලා තිබුණා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් මා ප්‍රශ්නයක් අහන්න කැමැතියි. අර luxury වාහනවලින් ඒවා ගන්න එක වටිනවා. මේ ආදායම උපයන ආකාරයට-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, could you shorten your question, please?

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මේ කාල පරිච්ඡේදය තුළ මෝටර්බයිසිකල් එකක මිල රුපියල් ලක්ෂ 5 ඉඳලා ලක්ෂ 10 දක්වා වැඩි වෙලා. ත්‍රිරෝද රථයක මිල රුපියල් ලක්ෂ 12 ඉඳලා ලක්ෂ 20 දක්වා වැඩි වෙලා. "ඇල්ටෝ" කාර් එකක මිල රුපියල් ලක්ෂ 40 ඉඳලා රුපියල් ලක්ෂ 75 දක්වා වැඩි වෙලා. ඒක හරි නැහැ; සාධාරණ නැහැ. ඒ නිසා ඒ category එකේ පොඩි වාහනවල; පුංචි මිනිසුන්ගේ වාහනවල බද්ද අඩු කරන එක සාධාරණයි කියලා අපි යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, you may make your answer short, because we are pressed for time.

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතනවා අපේ කණ්ඩායම නියෝජනය කරමින් කථා කරන අය ඉදිරි පිළිතුරු දීම්වලදී මේ පිළිබඳව පැහැදිලි කිරීම් කරයි කියලා. ගරු මන්ත්‍රීතුමා, මේ වන කොට මේ ක්‍රමවේදය තුළ බලාපොරොත්තු වන ආදායමෙන් ඉතාම සාර්ථක ලෙස අවශ්‍ය ප්‍රතිශතය ලබා ගෙන තිබෙනවා. LCs ඉතා විශාල ප්‍රමාණයක් open වෙලා තිබෙනවා. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදීත් මේ ක්‍රමයට අනුගත වෙච්ච පිරිස, මේ අවස්ථාවේදී වාහනයක් මිල දී ගන්නට හැකියාව තිබෙන පිරිස පළමු අදියරේදී සම්බන්ධ වෙලා මේ අවස්ථාවේදී මේ වාහන ආනයනය කරයි කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Harsha de Silva.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ravi Karunanayake? Could you please make it short as we are highly pressed for time? I have been curtailing every Hon. Member's time.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, the Hon. Deputy Minister was supposed to explain the success story of his trade negotiations in the US, but, it was not mentioned. I was deprived of getting my Supplementary Question answered in the morning nor did I get an answer through the Debate.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, do you want to answer to that?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Sir, I will quickly respond to that.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

I think I responded to that, indicating the multiple steps we took and their outcome: the initial letters, subsequent virtual discussions and physical meetings. Based on the successful outcome of all that, the Cabinet has approved to proceed with the next round of negotiations. That is the status, as of now, and the final outcome is yet to be decided.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Harsha de Silva. By the way, you have only six minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Ah?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We had to reduced time from both sides of the House.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
How can I make my speech within six minutes? Why is it only six minutes have been allotted to the first speech from the Opposition? You have to be a little bit fairer than that, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is what the Parliament Secretariat informs me. Your original time was eight minutes and we had to reduce two minutes from it.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Sir, give him two minutes more so that he will have his eight minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
The lunch break is in ten minutes. So, do you want me to finish in eight minutes?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We have earmarked another speech after that. Anyway, you are getting two minutes extra from the Chief Opposition Whip.

[12.20 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you. - *[Interruption.]* That is enough.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිවරයා දැන් මහා ලොකු කථා වගයක් කිව්වා මම අහගෙන හිටියා. ආර්ථික වර්ධන වේගය වැඩි වෙලා ලු; උද්ධමනය අඩු වෙලා ලු; පොලී අනුපාත අඩු වෙලා ලු; ජනතාව සුඛිත මුදිත වෙලා ලු. හැබැයි, ඊට කලින් එතුමා කාගේද ප්‍රශ්නයකට උත්තරයක් දුන්නා, 2024 ආර්ථික වර්ධන වේගය සියයට 5යි කියලා. හැබැයි, 2025දී එතුමන්ලා බලාපොරොත්තු වන ආර්ථික වර්ධන වේගය සියයට 5 දක්වා වැඩි වෙනවා නොවෙයි ලු, සියයට 3 1/2 දක්වා අඩු වෙනවා ලු. ආර්ථික වර්ධන වේගය තමයි මූලික දේ. ආර්ථික වර්ධන වේගය වැඩි කර ගන්න බැරි නම් ආණ්ඩුවෙන් ඇති වැඩක් නැහැ. දුප්පත්කම සියයට 33ට වැඩි වෙලා තිබෙන බව කියනවා. දුප්පත්කම වැඩි වෙලා නම්, ආර්ථික වර්ධනයක් නැත්නම් කොහොමද රැකියා නිර්මාණය වෙන්නේ? මොනවාද මේ කථා කරන්නේ? ආර්ථික වර්ධන වේගය 2024 වර්ෂයට වඩා 2025 වර්ෂයේදී වැඩි වෙන්න එපා යැ. දැන් කියනවා, 2025දී ආර්ථික වර්ධන වේගය සියයට 3 1/2යි ලු. 2026 ආර්ථික වර්ධන වේගය සියයට 3.1යි ලු. 2026 ආර්ථික වර්ධන වේගය සියයට 3.1 නම් ඔබතුමන්ලාගේ model එක වෙනස් කර ගන්න. මෙතැන ඇවිල්ලා මොනවාටද කියන්නේ, 2030 වනකල් ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට වඩා වැඩි වෙන්නේ නැහැ කියලා? මේක ආණ්ඩුවක් ද? එතකොට ආණ්ඩුවක් මොනවාට ද? 2026 ආර්ථික වර්ධන වේගය සියයට 3.1ක් වෙනවා කියලා අද කියනවා නම්, ඔබතුමන්ලාගේ ආර්ථික model එක වෙනස් කර ගන්න. ඒක තමයි ඔබතුමන්ලාට වෙලා තිබෙන අවුල. ඔබතුමන්ලා දන්නේ නැහැ, ආර්ථික වර්ධනය කර ගන්න මොන model එකට ද යන්නේ කියලා.

ඔබතුමන්ලා මහා ලොකු පොරොන්දු දුන්නා. දුප්පත්කම අඩු කරනවා කියලා කිව්වා. අනෙක් කට්ටියට හිනා වුණා, ආර්ථික වර්ධන වේගය සියයට 3ට ගෙනැල්ලා මොකටද, සියයට 5ට ගෙන යන්න ඕනෑ, සියයට 6ට ගෙන යන්න ඕනෑ කියලා.

රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා කිව්වා, 2048 වන කොට අපේ රට සංවර්ධිත රටක් කරන්න නම් ආර්ථික වර්ධන වේගය සියයට 8 1/2ට, 9ට ගෙන යන්න ඕනෑ කියලා. ඔබතුමන්ලා කිව්වා, ඔබතුමන්ලා ඊට කලින් ඒක කරනවා කියලා. සියයට 3ට ආර්ථිකය වර්ධනය කරලා වර්ෂ 2075දීවත් අපේ රට සංවර්ධිත රටක් කරන්න බැහැ.

ඔබතුමන්ලා බලයට ආවේ මොනවා කියාගෙනද? ඔබතුමන්ලා මොන ජාතියේ පොරොන්දුද දුන්නේ? ඔය 159ක මන්ත්‍රී සංඛ්‍යාවක් ඉන්න ආණ්ඩුවට ලජ්ජා නැද්ද අද මෙතැන නැඟිටලා කියන්න, "ආර්ථික වර්ධන වේගය මේ අවුරුද්දේ සියයට තුනහමාරට බස්සනවා" කියලා. එහෙම කියන්න ලජ්ජා නැද්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමන්ලාට ලජ්ජා නැද්ද මෙතැනට ඇවිල්ලා කියන්න, "2027 වර්ෂයේ ආර්ථික වර්ධන වේගය 2026 වර්ෂයටත් වඩා

අඩුයි. අපි ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට බස්සනවා" කියලා? කෝ, ආණ්ඩුව උත්තර දෙන්න. මන්ත්‍රීවරු 159දෙනාටම මම අභියෝග කරනවා, උත්තරයක් දෙන්න කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා කථා කරලා ඉවර කරන්නකෝ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ මිත්‍රයා මට කියනවා, කථා කරලා ඉවර කරන්න කියලා. මේක තමයි කථාව. ඔබතුමන්ලා අද කියනවා, ආර්ථිකය ස්ථාවර කළා ලු. ඒ credit එක කලින් හිටපු ආණ්ඩුවට දෙන්න. මොකද, උද්ධමනය අඩු වුණේ මේ කාලයේ නොවෙයි, ඒ කාලයේ; පොලිය අඩු වුණේ මේ කාලයේ නොවෙයි, ඒ කාලයේ. දැන් අවශ්‍ය ආර්ථික වර්ධනයයි. මට තේරෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂයේ ආර්ථික වර්ධන වේගය 2024 වර්ෂයට වඩා අඩු කරනවා කියා මෙතැනට ඇවිල්ලා කියන්නේ කොහොමද කියලා. අඩු ගණනේ try කරන්න එපා යැ, ඒක වැඩි කරන්න.

ගරු අනිල් ජයන්ත මැතිතුමා එය ඉදිරිපත් කරන කොට මෙහිදී අප අතර තර්කයක් ඇති වුණා මට මතකයි. එතුමා කිව්වා, ආර්ථික වර්ධන model එක හදන්නේ autoregressive model එකකටයි කියලා. ඒ බව ඔබතුමාට මතක ඇති. එය autoregressive model එකක් කියලා කිව්වා. එහිදී මම ඇහුවා, “autoregressive” කියන එකේ තේරුම මොකක්ද කියලා. ඒ කියන්නේ, පසුගිය කාලවලට සාපේක්ෂව අපි ඉදිරියට යනවා කියන එක ලු. මම කිව්වා, ඔබතුමන්ලාගේ model එක පසුගිය model එක වෙන්න බැහැ නේ කියලා. මොකද, ඔබතුමන්ලා අලුත් model එකක් ගෙනෙනවා කිව්වා. කෝ, අලුත් model එක? මොකක්ද ඔබතුමන්ලාගේ model එක? ඒක තමයි මම කිව්වේ, ඔබතුමන්ලා IMF එක අස්සේ හිර වෙලා කියලා. IMF එක අස්සේ හිර වෙලා මොකක්ද කොරන්නේ කියලා තේරුම් ගන්න බැහැ.

මම තව උදාහරණයක් දෙන්නම්. මේ ඡන්දයට කලින් ජනාධිපතිවරයා කිව්වා, "ඔව්, ජූනි මාසයේ විදුලි බිල වැඩි වනවා" කියලා. බලශක්ති ඇමතිවරයා මෙතැනදී කියනවා, එහෙම වෙන්නේ නැහැ කියලා. මොකක්ද මේ කියන කථාවල තේරුම? මම කියන්නම් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. වෙලා තිබෙන්නේ මේකයි. ඔබතුමන්ලා අඩුම ගණනේ පොත කියවලා හරි මේක ඉගෙන ගන්න. විදුලි බිල මාස හයෙන් හයට සංශෝධනය කරන්න තමයි අපි එකඟ වෙලා තිබුණේ. දැන් ඔබතුමන්ලා ගිහිල්ලා මාස තුනෙන් තුනට සංශෝධනය කරන්න එකඟ වෙලා. ඒක නේ Evan Papageorgiou කියන්නේ. ඔබතුමන්ලා ඒකට එකඟ වුණා. මෙතැනදී කවුදෝ කිව්වා, ජූනි මාසයේ Staff-level Agreement එක IMF Board එකට දාලා approval එක දෙනවා කියලා. බොරු නේ. මම කියනවා, ඒ කිව්වේ පට්ටපල් බොරුවක් කියලා. IMF එක ජූනි මාසයේ Staff-level Agreement එක Board එකට දාලා approval එක දෙන්නේ ඔබතුමන්ලා විදුලි බිල වැඩි කළොත් විතරයි. ඒක තමයි ඇත්ත. ඔබතුමන්ලා මෙතැන ඇවිල්ලා පට්ටපල් බොරු කියන්න එපා. මොකද, මෙතැන ඔක්කෝම විස්තරය තිබෙනවා. Evan Papageorgiou ගේ විස්තරය ඒගොල්ලෝ transcribe කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාස හයෙන් හයට තමයි විදුලි බිල වෙනස් වෙන්න තිබුණේ. එහිදී අපි උපකල්පනයක්, පුරෝකථනයක් - forecast එකක් - කරනවා. ඒ පුරෝකථනය අනුව බලනවා, actual ලෙස මොකද වුණේ කියලා. අපි හිතමු, අපට එකතු කර ගන්න ඕනෑ රුපියල් 100යි කියලා. මොකද, cost-reflective නේ. අපේ වියදම රුපියල් 100ක් නම්, අප එකතු කර ගන්න ඕනෑ රුපියල් 110ක්. හරි නේ. ඒක තමයි විධිය. පොඩි profit එකකුත් එක්ක ඒ විධියට තමයි බිල හදන්නේ. යම්කිසි හේතුවක් නිසා අපේ වියදම රුපියල් 100ට වඩා අඩු වෙනවා කියලා හිතමු. ඒක වෙන්නේ කොහොමද? හේතු දෙකක් තිබෙනවා. පළමුවෙනි එක මොකක්ද? හොඳට වහිනවා, ඒ නිසා අපි ජල විදුලිය නිෂ්පාදනය කරනවා. අපේ ආණ්ඩුවලින් හදපු රන්දෙනිගල, රන්ටැඹේ, වික්ටෝරියා, කොත්මලේ ආදි බලාගාරවලින් විදුලිය ඒකකයක් රුපියල් 2.50 ගණනේ ගන්නවා. එම නිසා පිරිවැය අඩු වෙනවා. එතකොට බලාපොරොත්තු වුණු රුපියල් 10ට වඩා රුපියල් 30ක, 40ක profit එකක් ලැබෙනවා කියලා අපි හිතමු. තව විධියක් තිබෙනවා. ඒ තමයි ඉල්ලුම අඩු වීම. ඒ කොහොමද ඉල්ලුම අඩු වෙන්නේ? ආර්ථිකයේ වර්ධනය සියයට 5ක් කියලා අප පුරෝකථනය කරලා තිබෙනවා නම්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව එය සියයට 3.1ට අඩු කරනවා නම්, factories ක්‍රියාත්මක වෙනවා අඩුයි; කර්මාන්ත ක්‍රියාත්මක වෙනවා අඩුයි. එතකොට ඉල්ලුම අඩුයි. ඉල්ලුම අඩු වනකොට, electricity generation ලබා ගන්නේ marginal merit order dispatch එකෙන් නිසා high-cost generating assets පාවිච්චි වෙන්නේ නැහැ. එම නිසා marginal cost එක අඩු වනකොට average cost එක අඩු වෙනවා. ඒ නිසාත් පිරිවැය අඩු වෙනවා. එතකොට profit එක වැඩි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් එකඟ වෙලා තිබෙන දේ මා කියන්නම්. ඒක හරිම වැදගත්. යම් විධියකට බලාපොරොත්තු වුණු - පුරෝකථනය කරපු - ලාභයට වඩා විශාල ලාභයක් ලැබුණොතින් එම ලාභය විදුලි පාරිභෝගිකයන්ට ලබා දිය යුතුයි. ඒක තමයි simple logic එක. ඒකට තමයි අප කියන්නේ clawback එකක් කියලා. ඒ clawback එක දෙන්න ඕනෑ. එය පුරවැසියාට දෙන්න ඕනෑ. ගියවර ඔබතුමන්ලා මෙතැන තර්ක කළා, ඇමතිවරයා තර්ක කළා, සියයට 1ක් වාගේ තමයි මිල අඩු කරන්න පුළුවන් කියලා. අපි තර්ක කළා, නැහැ, ඊට වඩා අඩු කරන්න පුළුවන්. මොකද, clawback එකක් තිබෙනවා කියලා.

අවසානයේදී ඔබතුමන්ලාට සියයට 20කින් මිල අඩු කරන්න සිදු වුණා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? පළමුවැනි මාස හය ජනවාරි සිට ජූනි දක්වා නේ. දෙවැනි මාස හය ජූලි සිට දෙසැම්බර් දක්වා. Tariff එක 2025ට පුරෝකථනය කරන්න, 2024 ජූලි සිට දෙසැම්බර් දක්වා මාස හයට මොකක්ද වුණේ කියලා බලන්න ඕනෑ. එතකොට ඒ දත්ත ඉදිරිපත් කරන්න ඕනෑ. දත්ත ඉදිරිපත් කරලා පුරෝකථනයයි, තථ්‍ය වාර්තාවයි අරගෙන ඒකේ තිබෙන වෙනස බලලා, අඩු නම් පාරිභෝගිකයාගෙන් නැවත ලබා ගන්න ඕනෑ. Profit එක වැඩි නම් පාරිභෝගිකයාට නැවත ලබා දෙන්න ඕනෑ. ඕක තමයි simple equation එක. අපි ඔක්කෝම ඒක දන්නවා. ඔබතුමන්ලා ඒ අස්සේ ගිහිල්ලා ඒක කරනවා වෙනුවට IMF එකත් එක්ක එකඟ වුණා, මේක වෙනස් කරන්න. ඒ, ඇයි? මොකක්ද කරන්න ඕනෑ කියලා දන්නේ නැහැ. IMF එකත් එක්ක එකඟ වුණා, ජූනි මාසය වෙනුවට අපි අප්‍රේල් මාසයේදී මේක වෙනස් කරනවා කියලා. දැන් Papageorgiou කියනවා, "ඔබතුමන්ලා ඒක වෙනස් කරලා නැති නිසා කොච්චර Staff-level Agreement එකක් තිබුණත්, අපි Board එකට දාන්නේ නැහැ" කියලා. මම කියන දේ වැරදි නම් ඔප්පු කරලා පෙන්වන්න. Prior commitment එක, continuous structural benchmark එක ඔබතුමන්ලා adopt කරන්න ඕනෑ, ඒකට agree වෙන්න ඕනෑ. ඒ අතරතුරේ මොකක්ද කරන්නේ? ඔබතුමන්ලා ගිහිල්ලා Cabinet Paper එකක් දානවා. Cabinet Paper එකක් දාලා කියනවා, "සහස්දනවී" කියලා combined cycle power

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

plant එකක් හදන්න යනවා කියලා. ඒක මාධ්‍යයේ තිබෙනවා. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධව බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ට යැවූ එම document එක මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, you have two more minutes. You have been given four minutes extra.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Okay, Sir.

හොඳට අහගන්න. මේවා නොවෙයි නම් දූෂණය, වෙන මොනවාද කියලා ඔබතුමා මට කියන්න. සහස්දනවි බලාගාරයෙන් unit එකක් රුපියල් 20ට ගන්නවා කියලා තිබෙනවා. එම කැබිනට් පත්‍රිකාව දමන්නේ කවදාද? ජනවාරි මාසයේ 31වැනි දා. ඊට පස්සේ solar powerවල tariff එක කපනවා; රුපියල් 27යි ගණනට තිබුණු tariff එක ඔබතුමන්ලා කපලා දානවා. රුපියල් 20 ඉඳලා රුපියල් 14 වෙනකල් අඩු කරනවා. ඔබතුමන්ලා කියනවා, අපට සහස්දනවි බලාගාරයෙන් රුපියල් 20ට ගන්න පුළුවන් නම්, අපට solar එක අඩු කරන්න බැරි මොකද කියලා. රුපියල් 14.46ක් වෙනකල් solarවලින් ලබා ගන්න විදුලි ඒකකයක මිල අඩු කරනවා. ඊට පස්සේ PUCSL එකට යවනවා, tariff එක approve කරන්න. PUCSL එකෙන් ආණ්ඩුවට ලියුමක් යවනවා. ඔවුන් අහනවා, ඔබතුමන්ලාට මොනවාද කැවිලා තිබෙන්නේ, රුපියල් 20ට කොහොමද මේක ගන්නේ කියලා. ගන්න බැරි හේතු තුනක් ඔවුන් කියනවා.

පළමුවැනි හේතුව විධියට කියනවා, ඔබතුමන්ලා natural gas price කරලා තිබෙන්නේ MMBtu එකක් ඩොලර් 10 ගණනේ කියලා. ඩීසල්වලින් නිපදවන ඒකකයක මිල තිබෙන්නේ රුපියල් 110 ගණනේ කියනවා. Exchange rate එක රුපියල් 195ට අරගෙන තිබෙන්නේ? ඔබතුමන්ලා මොකක්ද මේ කරන්නේ? ඔබතුමන්ලා කොහොමද ජනවාරි මාසයේ Cabinet Paper එකක් දාලා කියන්නේ ඩොලර් එකක අගය රුපියල් 195යි කියලා? මේ මොනවාද? Were you all smoking something when you put this Cabinet Paper, saying that a Dollar was Rs. 195? Were you all smoking something? මොනවා හරි බීලා හිටියාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, give me just 30 seconds and I will finish up.

ඊට පස්සේ මේගොල්ලන් කියනවා, ඩොලරය රුපියල් 300යි, එහෙම නම් MMBtu එකක් - for natural gas - ඩොලර් 11.2ක්, ඩොලර් 15.5ක් වෙනවා, එම නිසා unit එක සාමාන්‍ය වශයෙන් රුපියල් 43.25ක් වෙනවා කියලා. හැබැයි ඔබතුමන්ලා මෙච්චර කල් කිව්වේ LNG ගෙනැල්ලා dual fuel දානවා කියලා. හැබැයි, තවම එක දවසක්වත් LNG ගෙනැල්ලා dual fuel දාලා නැහැ. ඒක නිසා මේගොල්ලන් කියනවා, unit එකක් රුපියල් 72ක් වෙනවා කියලා. Unit එකක් රුපියල් 72ක් වෙනවා නම් රුපියල් 20ක් දාලා Cabinet Paper එකක් දැම්මේ ඇයි? ඇමතිවරයා කියනවා, අපි ගන්නේ least cost එකට ලු. ඊට පස්සේ කියනවා, IMF එකේ system එකට ලු අපි යන්නේ. ඔබතුමන්ලා මේ ආර්ථික කළමනාකරණය සම්පූර්ණයෙන්ම අනාගෙන තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, your time is up. Please conclude.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I will conclude.

The point is this. You can speak in any language you wish, but the fact remains that you all have not understood how to run this economy. You all are imprisoned by the ideology of the IMF.

ඔබතුමන්ලා කිව්වේ, IMF එක පන්නනවා කියලා. IMF එක පන්නන්න තියා ඔබතුමන්ලාට අඩු ගණනේ ලයිට් බිල වෙනස් කරන්න PUCSL එක කියන එකට එකඟ වෙන්නත් බැහැ. IMF එකට වඳිනවා. දෙයියෝ සාක්කි! මේ රටට මොකක්ද මේ වෙන්න යන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Nimal Palihena. You have ten minutes.

[අ.භා. 1.00]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද විවාදයට ලක් කරනු ලබන්නේ 2025 ජනවාරි 27 දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනයට අදාළව මෝටර් රථ ආනයනය සම්බන්ධයෙන් වූ සීමා ලිහිල් කිරීම සහ ඒ සඳහා වන ආනයන තීරු බදු පැනවීම

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සම්බන්ධවයි. රජයක් විසින් රටේ ආදායම නිශ්චය කිරීමේදී බදු පිළිබඳ විශේෂයෙන්ම සැලකිල්ලට භාජන කරනවා වාගේම ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කරනකොට අපේ රටේ සංචිත පිළිබඳව අවධානය යොමු කළ යුතු වෙනවා. ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය තුළ ආර්ථික වශයෙන් ඉතා පහත් අඩියකට ඇද වැටුණා කියනවාට වඩා අපිට කියන්න වෙන්නේ ඇද දැම්මා කියන කාරණාවයි. පසුගිය කාලයේ සිටි පාලකයන්, එහෙම නැත්නම් පසුගිය රජයන් විසින් කරගෙන ආපු වැරැදි ආර්ථික ප්‍රතිපත්ති වාගේම ඥාති සංග්‍රහ ආදී කරුණු සැලකිල්ලට ගත්තාම අපිට හොඳටම පෙනෙන ලක්ෂණයක් තමයි, ඒ සියල්ල ඇතුළේ අපේ රට ණය ගෙවා ගත නොහැකි තත්ත්වයකට පත් වුණු බව. ඒක 2022 අප්‍රේල් මස 12වැනි දා මහ බැංකු අධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළා.

හාස්‍යයට කාරණය මේකයි. අපි මේ ආණ්ඩුව භාරගෙන මාස හයක් ගෙවෙන මේ මොහොතේ පෙර ආණ්ඩු කරපු අය, එහෙම නැත්නම් එම ආණ්ඩුවල කටයුතුවලට සෘජුව හෝ වක්‍රාකාරයෙන් සහයෝගය දුන්නු අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ සභාවේ අදහස් දක්වන ආකාරය දිහා බැලුවාම ඒක අපට පුදුමයට කාරණයක්. ඒක හාස්‍යජනකයි. මාස හයක් තුළ ඔය කියන ආකාරයේ ආර්ථික ස්ථාවරභාවයක්, එහෙම නැත්නම් සංවර්ධනයක් ළඟා කරගැනීම ඉතා අපහසු කාරණාවක් කියන එක හොඳටම අවබෝධ කර ගත් පක්ෂයක්, අපි. රජයක් විධියට අපි ඒ සම්බන්ධයෙන් ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගනිමින්, මේ රටේ ජනතාවට අවශ්‍ය කරන පහසුකම් සලසන්න සුදුසු අවස්ථාවේදී ගන්නා තවත් එක් පියවරක් තමයි, මේ මෝටර් රථ ආනයනය සම්බන්ධයෙන් වූ සීමා ලිහිල් කිරීම. ඒකට හේතුව මේකයි. යම් කර්මාන්තයක් සඳහා අවශ්‍ය කරන පහසුකම් සැලසීමේදී මෝටර් රථ කියන්නේ අත්‍යවශ්‍ය අංගයක්. මීට පෙරත් රජය විසින් මේ කාරණය පිළිබඳව වැඩි අවධානයකට ලක් කරමින් විශේෂයෙන් මගී ප්‍රවාහනය සඳහා අවශ්‍ය කරන බස් රථ ආනයනය කිරීම සඳහා වන සීමා ලිහිල් කිරීම සිදු කළා. ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය කරන පහසුකම් සැලසීමට ඇම්බියුලන්ස් වැනි වාහන ආනයනය කිරීම සඳහා වන සීමා ලිහිල් කිරීම කරනු ලැබුවා. ඒ අතර රටේ සාමාන්‍ය ජනතාවට, කර්මාන්තකරුවන්ට, ව්‍යාපාරිකයන්ට අවශ්‍ය කාරණා ඉෂ්ට සිද්ධ කර ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මේ නිදහස් කිරීම් සිදු කරනවා.

ඒ වාගේම ඇත්තටම තවදුරටත් යම් ප්‍රමාණයකට ඒවායේ සීමාවක් ඇති කර ගැනීමේ වුවමනාවකුත් රජය පැත්තෙන් තිබෙනවා. අපි මේ සඳහා විදේශ සංචිත සියල්ල භාවිත කරනවා නම් අපේ රටේ අනෙකුත් කටයුතුවලදී ගැටලුසහගත තත්ත්වයන්ට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා පැවති සියයට 20ක ආනයන තීරු ගාස්තුවට සියයට 50ක අධිභාරයක් එකතු කරමින්, සියයට 30ක් දක්වා තීරු ගාස්තුව වැඩි කරමින් නැවත බදු පැනවීමක් කරනු ලැබුවා. ඒකෙන් අපි අපේක්ෂා කරන්නේ ආනයන සීමා කිරීම වාගේම අපේ විදේශ සංචිත ආරක්ෂා කර ගැනීම කියන කාරණා. ඒ වාගේම, IMF ගිවිසුම් ප්‍රකාරව අප රට විසින් අනුගමනය කළ යුතු, නැත්නම් අපේ එකඟතා ඇතුළේ ක්‍රියාත්මක කළ යුතු යම් යම් තත්ත්ව තිබෙනවා. ඒ වාගේම අපි ළඟා කර ගත යුතු ආදායම් සීමා තිබෙනවා. ඒ අනුව මේ සියයට 50ක අධිභාරයක් සහිතව සියයට 30ක් දක්වා බදු ප්‍රතිශතය වැඩි කිරීමෙන් රජය අපේක්ෂා කරන ආදායම් සීමා කරා ළඟාවීමට එය අස්වැසිල්ලක්, උදවුවක් වෙයි කියන විශ්වාසය අපි තුළ තිබෙනවා. ඒකෙන් කෙසේවත් අදහස් කරන්නේ නැහැ, අපේ රටේ ජනතාව යම් විධියකින් අපහසුතාවකට පත් කරමින් අපි රජය කරගෙන යෑම සඳහා වන ආදායම් උත්පාදනය කරනවා කියන එක. විශේෂයෙන්ම සැලකිල්ලට භාජන කළ යුතු කරුණක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අදහස් දැක්වීමේදී විශේෂයෙන් මේ බදු සම්බන්ධයෙන් කරුණු, කාරණා පැහැදිලි කරමින් සඳහන් කළා, නැවත පැහැදිලි කිරීමක් අවශ්‍යයි, ජනතාවට දරන්න බැරි මට්ටමින් ඉහළ බදු ප්‍රතිශතයන් අය කරනවා කියන කාරණාව.

විශේෂයෙන්ම, ආනයන තීරු ගාස්තු සියයට 30යි. ඒකේ වෙනසක් නැහැ. ඒ වාගේම, අපිට වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද තිබෙනවා. ඒක සියයට 10 කියන සීමාවේ තමයි තිබෙන්නේ. ඒ එක්කම Excise Duty එක, වාහනයේ ධාරිතාව, භාවිත කරන ඉන්ධන වර්ගය සහ වාහනයේ නිෂ්පාදිත වර්ෂය කියන කරුණු පදනම් කර ගන්නවා. ඒ අනුව අපි විශ්වාස කරනවා, ජනතාවගේ අතේ රැඳෙන මුදල් ප්‍රමාණය අනුව ඔවුන්ගේ පහසුව සඳහා, එහෙම නැත්නම් ව්‍යාපාරික කටයුතු සඳහා, කර්මාන්ත සඳහා අවශ්‍ය කරන වාහනය ආනයනය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා කියලා.

විශේෂයෙන්ම සුඛෝපභෝගී වාහනවල - luxury vehiclesවල - එන්ජින් ධාරිතා මට්ටම් සහ භාවිත කරන ඉන්ධන වර්ගය අනුව සියයට 100, සියයට 120 කියන උපරිම තත්ත්වයන්ගෙන් සහ හයිබ්‍රිඩ් වාහනවලට සියයට 80, සියයට 90 වාගේ බදු තමයි පනවා තිබෙන්නේ. ඒ ගැන කියනකොට විශේෂයෙන්ම සඳහන් කළ යුතු වෙන්නේ මේවා සියයට දෙතුන් සියයකින් වැඩි කරලා නැහැ, සාධාරණ බදු අනුපාත තමයි ඒවා මත පනවා තිබෙන්නේ කියන එක තමයි.

විශේෂයෙන්ම වාහනවල මිල ඉතා අධික වුණා, නැත්නම් සාමාන්‍ය ජනතාවට වාහනයක් ගෙන්වා ගැනීමට හැකියාවක් නැහැ කියන තර්කය පිළිබඳව අපි වෙනත් පැත්තකින් කථා කරනවා නම් අපට කියන්න තිබෙන්නේ මෙයයි. ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව අපේ රටේ රුපියලේ අගය රුපියල් 150ට, රුපියල් 160ට වාගේ තිබුණත්, පසුගිය රජයේ ක්‍රියාකාරිත්වය නිසා ඇති වූ ආර්ථිකයේ ඇද වැටීම තුළ ඩොලරයේ අගය රුපියල් 370, රුපියල් 380 දක්වා ඉහළ ගියා. අපේ ආණ්ඩුව ආවට පස්සේ ඩොලරයේ අගය ආසන්න වශයෙන් රුපියල් 300ට ළංවෙලා තිබියදී තමයි වාහනවල මිල මේ තරම් අධික වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම් වාහනවල මිල බොහෝ දුරට මීට වඩා අඩකින් අඩු වෙන්න තිබුණා. ඒ තත්ත්වය අපි ඇති කරපු එකක් නොවෙයි. මෙය පසුගිය කාලයේ සිටි පාලකයන් විසින් ගෙන ගිය කළමනාකරණයේ තිබුණු වැරදි, එහෙම නැත්නම් ඔවුන්ගේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා අපේ රටට අත් වුණු දෙයක් මිසක් අපි රජය භාර අරගෙන ගත වුණු මාස 5 තුළ ඇති වුණු දෙයක් නොවෙයි. ඒක අපි අවබෝධ කරගත යුතු වෙනවා. කනගාටුවට කාරණය, මේ කරුණු අහන්න විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ අවස්ථාවේදී මෙම සභාවේ නැති එකයි.

මම මේ වෙලාවේ විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ ජනතාව මහජන නියෝජිතයන් වශයෙන් අපිව මේ සභාවට එවලා තිබෙන්නේ මේ රටේ ප්‍රගතිය, අභිවෘද්ධිය, යහපත, රටේ හෙට දවස පිළිබඳ යම් ආකාරයක අපේක්ෂාවකින්. ඇත්තටම මහජන නියෝජිතයින් පාර්ලිමේන්තුවට එවීමෙන් ජනතාව අපේක්ෂා කරන දේ සිද්ධ වෙනවාද කියන ප්‍රශ්නය අද මේ සභාව දෙස බැලුවාම අපට පැහැදිලි වෙනවා. ඒ ගැටලුව අපේ රටේ ජනතාවට තිබෙනවා. නමුත්, එදා ස්වාධීන සහ සාම්ප්‍රදායික පක්ෂ විධියට මහ මැතිවරණයට ඉදිරිපත් නොවූ පක්ෂ සියල්ල මෙවර පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙලා තිබියදීත් අපිව නැවත වටයකින් පරීක්ෂාවට ලක් කරමින් මේ රටේ ජනතාවගේ ප්‍රසාදය අඩුවක් නැතුව අප වෙත ලබා දෙන්න කටයුතු කර තිබෙනවාය කියන කාරණය මේ අවස්ථාවේදී මම මතක් කරන්න අවශ්‍යයි. ජනාධිපතිවරණයේදී අපි ලැබූ ප්‍රතිඵලයට වඩා සියයට 43.2ක ඉහළ ප්‍රතිඵලයක්, ජනතා ප්‍රසාදයක් අපේ රජය වෙත ලබා දී තිබෙනවා.

[ගරු නිමල් පලිහේන මහතා]

ඒ වාගේම පළාත් පාලන ආයතන පිළිබඳව සැලකුවොත්, පළාත් පාලන ආයතන 267ක් අපිව අනුමත කරලා තිබෙනවා; අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. ඒ වාගේම මන්ත්‍රී ආසන ගැන සැලකුවොත්, සියයට 40 ඉක්මවූ ප්‍රමාණයක්, ඒ කියන්නේ මන්ත්‍රී ආසන 3,927ක් ජයග්‍රහණය කරන්න අපේ ජාතික ජන බලවේගයට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව අපට පෙනී යන්නේ අපේ රටේ ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය තවමත් පලුදු කරලා නැහැ, එහෙම නැත්නම් ඔවුන් ඒ තුළම ජීවත් වෙමින් ඒ විශ්වාසය තවදුරටත් රකින බවයි.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමතියි. මේ ක්‍රමෝපායයන් තුළ අපි අපේක්ෂා කරන්නේ යහපත් වූ රටක් ගොඩනැඟීම වාගේම අප ජනතාවට දුන් බලාපොරොත්තු ඉෂ්ට කිරීමයි. ඒ වාගේම යම් යම් අවස්ථාවලදී අපට සීමා පනවන්න සිද්ධ වෙනවා. එම නිසා වාහන ආනයනය වෙනුවෙන් අපි ලබා දෙන නිදහස තුළින් යම් ආකාරයකට අපේ සංචිතවලට ඇති වන බලපෑම අවම කර ගැනීම සඳහා වන අවශ්‍යතාව මත සියයට 30ක ආනයන තීරු බද්දක් පැනවීමට තීරණය කිරීම රටේ ජනතාවගේ අද දවස මෙන්ම අනාගතය සම්බන්ධයෙනුත් ගනු ලැබූ තීරණයක් බව විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම මතක් කළ යුතු වෙනවා.

ඒ වාගේම රටේ පොදු පහසුකම් සංවර්ධනය කරන්න නැත්නම් රටේ ජනතාවගේ පහසුව සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම කරන්න අපි ආදායම් උත්පාදනය කළ යුතු වෙනවා. ඒ අතින් ගත්තාම බදු කියන්නේ ඒ සඳහා අපට තිබෙන එක මූලාශ්‍රයක්. ඉතින්, මෙන්න මේ කියන කරුණු අනුව මා මේ ගෞරවනීය සභාවට අදහස් දක්වමින් කියා සිටින්නේ ජනතාවගේ අද දවස වාගේම මේ රටේ අනාගතය සුරක්ෂිත කිරීම වෙනුවෙන් අපි ක්‍රියාමාර්ග ගන්නා බවයි. ඒ කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sivagnanam Shritharan. You have six minutes.

[பி.ப. 1.10]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற சுங்கக் கட்டளைச் சட்டத்தின்கீழான தீர்மானம் சம்பந்தமான விவாதத்தில் கலந்துகொண்டு, முக்கிய மானதொரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன்.

இப்போது நாட்டில் கல்வியியற் கல்லூரிகளிலிருந்து வெளியேறிய ஆசிரிய மாணவர்களுக்கான ஆசிரியர் நியமனங்கள் வழங்கப்படுகின்றன. கல்வியியற் கல்லூரி களுக்குத் தெரிவுசெய்யப்பட்ட இந்த ஆசிரிய மாணவர்கள், அந்தந்த மாவட்டங்களில் இருக்கும் வெற்றிடங்களை நிரப்பும் வகையில்தான் குறித்த பாடத்துறைகளுக்கு ஆங்கில மொழி மூலமும் தமிழ் மொழிமூலமும் தெரிவு செய்யப்பட்டார்கள். எனினும், அந்தந்த மாவட்டங்களில் இப்பொழுதும் ஆசிரிய வெற்றிடங்கள் இருக்கும் நிலையில், அவ்வாறு தெரிவு செய்யப்பட்ட ஆசிரிய மாணவர்கள் தூரப் பிரதேசங்களுக்கு நியமனம் செய்யப்படுகின்றார்கள்.

உதாரணத்துக்கு, யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார், வவுனியா, முல்லைத்தீவு போன்ற மாவட்டங்களிலிருந்து அந்தந்த மாவட்டங்களின் கோட்டா அடிப்படையில் தெரிவு செய்யப்பட்ட இந்த ஆசிரிய மாணவர்கள், அவர்களுடைய மூன்று ஆண்டு முகிழ்நிலைக் காலம் முடிந்த பிற்பாடு களுத்துறை, கேகாலை, இரத்தினபுரி போன்ற மாவட்டங் களுக்கு நியமனம் செய்யப்படுகின்றார்கள். இதனால் அவர்களால் ஆசிரியர் பணியைச் சிறப்பாக ஆற்றமுடியாமல் இருக்கின்றது. களுத்துறை மாவட்டத்திலுள்ள சிங்கள மொழிமூலப் பாடசாலைகளுக்குக்கூட அவர்கள் நியமிக்கப் படுகின்றார்கள். ஆனால், அங்கு அவர்களுக்கான தேவைப்பாடுகூட இல்லை. அதேநேரம், கிளிநொச்சியில் அவர்களுக்கான ஆசிரிய வெற்றிடம் உண்டு. இவ்வாறு நியமனங்கள் வழங்கப்படுவது மிக மேசாமானது. அந்தந்தப் பிரதேச செயலாளர் பிரிவுகளில் எத்தனை ஆசிரியர் வெற்றிடங்கள் உண்டு, அதுவும் என்ன என்ன பாடங்களுக்கு உண்டு என்பதன் அடிப்படையில்தான் ஆசிரிய மாணவர்கள் கல்வியியற் கல்லூரிகளுக்குத் தெரிவு செய்யப்படுகின்றார்கள்.

அகில இலங்கை ரீதியான ஒரு கோட்டா அடிப்படையில், இலங்கை தீவின் எந்த இடத்துக்கும் சென்று சேவையாற்று வதற்குத் தயார் என்ற அடிப்படையில் நீங்கள் அவர்களை கல்வியியற் கல்லூரிகளுக்குத் தெரிவுசெய்திருந்தால் பரவாயில்லை! மாவட்டங்களுக்கெனச் சொல்லி, பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள ஆசிரியர் வெற்றிடங்களின் அடிப்படையில் கல்வியியற் கல்லூரிகளுக்கு உள்வாங்கி, பயிற்சியை முடித்த பிற்பாடு அவர்களை நீங்கள் வேறு மாவட்டங்களுக்கு நியமிப்பது எவ்வளவு மோசமானது. உதாரணத்துக்கு, மூன்று ஆண்டு கால கல்வியற் கல்லூரிப் படிப்பை முடித்திருக்கின்ற யாழ்ப்பாணம், ஊர்காவற் றுறையைச் சேர்ந்த ஓர் ஆசிரிய மாணவிக்கு களுத்துறையில் நியமனம் வழங்கப்பட்டு இருக்கின்றது. அவருடைய தாயார் நோய்வாய்ப்பட்டு படுக்கையில் இருக்கிறார். அவர் ஊர்காவற் றுறையிலிருந்து யாழ்ப்பாணம் கடந்து களுத்துறைக்கு வந்து கற்பித்து, தனக்குக் கிடைக்கின்ற 50,000 ரூபாய் மாதச் சம்பளத்தில் களுத்துறையில் வாடகைக்கு வீடு எடுத்து, தனது செலவையும் பார்த்து, தன்னுடைய சுகவீனமுற்றிருக்கின்ற தாய்க்கான செலவையும் பார்க்க முடியாத இக்கட்டான நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்.

அதேபோல கிளிநொச்சியைச் சேர்ந்த ஓர் ஆசிரிய மாணவனுக்கு களுத்துறையில் நியமனம் வழங்கப்பட்டு இருக்கின்றது. அவருக்குக் கிடைக்கின்ற சம்பளத்தில் சாப்பாட்டுச் செலவு, வீட்டு வாடகை, கிழமைக்கு ஒரு தடவை கிளிநொச்சிக்குப் போய்வந்தால் அதற்கான செலவு உட்பட போக்குவரத்துச் செலவு என்பவற்றை எவ்வாறு ஈடுசெய்ய முடியும் என்பதை நீங்கள் சற்று யோசித்துப் பாருங்கள்! அவர் பெறுகின்ற சம்பளம் இந்தச் செலவுகளுக்குக்கூட போதாது. இது மோசமான ஒரு காரியம்! நீங்கள் அந்தந்த மாவட்டங் களுக்கு, அந்தந்தப் பிரதேச செயலாளர் பிரிவுகளுக்கென ஆசிரிய மாணவர்களைத் தெரிவுசெய்துவிட்டு, இவ்வாறு நடந்துகொள்வது நல்லதல்ல.

சிறிது நேரத்துக்கு முன்னர், நான் பாராளுமன்ற உணவகத்தில் வைத்து மாண்புமிகு பிரதமர் (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களோடு இது பற்றி பேசினேன். தான்

அதனைப் பரிசீலனை செய்வதாக அவர் சொன்னார். தென் பகுதியிலும் சில இடங்களில் vacancies இருக்கின்றன. அவற்றுக்கு நாங்கள் என்ன செய்வதென அவர் கேட்டார். அதற்கு நீங்கள் கல்வியியற் கல்லூரிகளுக்கு ஆசிரிய மாணவர்களைத் தெரிவுசெய்யும்போது, அங்குள்ள வெற்றிடங்களுக்கு ஏற்ப, அங்கு இருக்கின்றவர்களில் பொருத்தமானவர்களை இனங்கண்டு உள்வாங்கியிருக்க வேண்டும். நீங்கள் அவ்வாறு செய்யாமல், வடக்கு, கிழக்குப் பகுதிகளைச் சேர்ந்த ஆசிரிய மாணவர்களை அங்கு வெற்றிடங்கள் இருக்கத்தக்கதாக தூரப் பிரதேசங்களுக்கு நியமித்து மிகக் கஷ்டத்துக்கு உள்ளாக்குவது மோசமான காரியமாகும். ஏனெனில், அவர்கள் ஏற்கெனவே யுத்தத்தால் பாதிக்கப்பட்டு, மிகக் கஷ்டங்களுக்கு மத்தியில் படித்து, கல்வியியற் கல்லூரிகளுக்குச் சென்றவர்கள். பல்கலைக்கழக அனுமதி கிடைக்காத காரணத்தால்தான் கல்வியியற் கல்லூரிக்கு விண்ணப்பிக்கிறார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இது மனிதாபிமானத்தோடு சம்பந்தப் பட்ட ஒரு விடயமாகும். இவ்வாறு ஒரு மாணவன் கல்வியியற் கல்லூரிக்குச் சென்று ஓர் ஆசிரியராக வெளியேறும்போது, அவனுக்குத் தூர இடங்களுக்கு நியமனம் வழங்கப்பட்டால், அவனால் கல்வியின் நல்ல போதனா வினைத்திறனை அங்கும் வழங்க முடியாது; தன்னுடைய குடும்பத்துக்கும் வழங்க முடியாது. அதுமாத்திரமன்றி, அவர்களுக்கு 8 ஆண்டுகள் இடமாற்றம் பெறமுடியாது என்ற கட்டாயமும் உண்டு.

அப்படியென்றால், ஒரு நிபந்தனை இருக்க வேண்டும். அதாவது, இரண்டு அல்லது மூன்று ஆண்டுகளில் தங்களுடைய சொந்த மாவட்டத்துக்கு இடமாற்றம் பெற்றுச்செல்வதற்கு அனுமதிக்கப்படுமென்ற உத்தரவாதம் அவர்களுக்கு வழங்கப்பட வேண்டும். அது அவர்களுடைய நியமனக் கடிதத்தில் குறிப்பிடப்பட வேண்டும். அப்படி இருந்தாலாவது, அவர்கள் இரண்டு அல்லது மூன்று ஆண்டுகள் கற்பித்து விட்டுத் தங்களுடைய சொந்த இடத்துக்குப் போகலாம். புதிதாக ஆசிரியர் நியமனம் பெற்று வருபவர்கள் அந்த இடங்களில் கற்பித்தல் நடவடிக்கைகளைச் செய்யலாம். எனவே, இந்த வரையறைகளைச் செய்யுங்கள்!

ஓர் ஆசிரிய மாணவனுக்குத் தண்டனைபோல - punishment மாதிரி - இவ்வாறு தென் பகுதியிலுள்ள பாடசாலை ஒன்றுக்கு நியமனத்தைக் கொடுத்துவிட்டு, அங்கு எட்டு ஆண்டுகள் கடமையாற்ற வேண்டும் என்று சொன்னால், அவனுடைய இளமைக் காலம் அதிலேயே போய்விடும். அதுமாத்திரமன்றி, அவன் தன்னுடைய தாய், தந்தை, குடும்பத்தினர், எதிர்காலம் எதுவும் இல்லாமல், கைக்குக் கிடைக்கின்ற வருமானம்கூட மிகுதியாக இல்லாமல், மிகப் பெரிய ஒட்டாண்டியாகத் தெருவுக்கு வரக்கூடிய நிலைமையை அரசாங்கம் உருவாக்கி இருக்கின்றது. இன்று நான் கௌரவ பிரதமர் அவர்களோடு இது பற்றி பேசியிருந்தேன். அவர்தான் இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சராகவும் இருக்கின்றார். எனவே, இந்த விடயத்தில் அதிகமான கரிசனையைச் செலுத்தி, இந்த நியமன விடயத்தில் அக்கறை காட்டுமாறு தயவாகக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. K.V. Samantha Viddyarathna. You have 13 minutes.

[අ.භා. 1.16]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද දවසේ අපි විවාද කරන්නේ රේගු ආඥාපනතේ 235 අධිකාරය යටතේ ආනයන තීරු බදු පැනවීම සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතය පිළිබඳවයි. අපේ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාත් පැහැදිලි කළ විධියට රටක් හැටියට ආර්ථික කළමනාකරණය ඇතුළේ නව රජය ගත් තීන්දු තීරණවල එක් පියවරක් තමයි අද අපි මේ විවාදයට ලක් කරන්නේ. අපි දන්නවා, මේ රට අප භාර ගන්නකොට මේ රටේ ආර්ථිකය තිබුණු ස්ථානය මොකක්ද කියන එක. පසුගිය කාලයේ රටේ ආර්ථිකය තිබුණු තැන කාටත් අමතක නැතිව ඇති. මේ රටට වාහන ආනයනය කිරීම සීමා කරලා විතරක් නොවෙයි, සම්පූර්ණයෙන් එය අත්හිටවූ යුගයක් තමයි පසුගිය කාලයේ තිබුණේ. වාහන විතරක් නොවෙයි, මේ රටට අත්‍යවශ්‍ය ආහාර - කහ ටික පවා - ගෙනෙන්නේ නැතිව තහනම් වෙච්ච යුග මේ රටේ තිබුණා. පසුගිය ආණ්ඩුවලට ඒවා කළමනාකරණය කර ගැනීමට තිබුණු දුෂ්කරතාව තමයි ඒ විධියට පැහැදිලි වුණේ.

මේ ගරු සභාවේදී විපක්ෂය පැත්තෙන් බොහෝ අදහස් ඉදිරිපත් වුණා. ඒ, මේ බදු ප්‍රමාණය වැඩියි අඩු කර දෙන්න, කළමනාකරණයක් කරලා නැහැ, ආර්ථික වර්ධන වේගයක් අපට ලබා ගන්න බැරි වුණා කියන එක. නමුත්, දේශපාලනික වශයෙන් කුහක නොවී බැලුවොත්, මේ වාහන සම්බන්ධයෙන් ගත්තොත්, වාහන ආනයනය නවත්වලා තිබුණාට පසුව මේ රටේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඒ පැත්තෙනුත් සිද්ධ වුණා කියා අපි හිතනවා. මේ රටේ පොදු මගී ප්‍රවාහනයට බලපෑම් සිද්ධ වුණා. මේ රටේ ආර්ථිකය වර්ධනය කර ගැනීම සඳහා බලපෑම් සිද්ධ වුණා. අත්‍යවශ්‍ය වාහන ගෙන්වා ගන්න බැරි වීම නිසා විශේෂයෙන් සංචාරක ව්‍යාපාරයට, කර්මාන්ත ක්ෂේත්‍රයට මේ රටේ ආර්ථික වර්ධනයට ඒ තීන්දු විශාල අඩ කොට බවට පත් වෙලා තිබුණා. රටේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව තමයි නව රජය මේ වාගේ බදු තීන්දු ගත්තේ. ආපසු දොර ඇර දාලා, පසුගිය කාලයේ ආර්ථික කළමනාකරණය දුර්වල වෙලා රටේ ජනතාව ඒ වාගේ වද වේදනා විඳීම්වලට ලක් වුණා. එවැනි තත්ත්වයකට ආර්ථිකය කළමනාකරණය කරන්න අපි සූදානම් නැහැ.

අපි කවුරුත් දන්නවා, අපි තවම ණය ගෙවා ගැනීමට අපහසු තත්ත්වයකයි ඉන්නේ කියන එක. අපේ රටේ සංචිත අත්‍යවශ්‍ය ප්‍රමාණයට තවම වර්ධනය කරගෙන නැහැ. එවැනි තත්ත්වයක් තුළ ආර්ථිකයත් පවත්වාගෙන, සංචිතත් ආරක්ෂා කරගෙන, ආර්ථික වර්ධන වේගයත් අදාළ අනුපාතයෙන් තබා ගෙන යන්න නව රජය හැටියට අපට පුළුවන්කම ලැබීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. මේ රටේ බුද්ධිමත් ජනතාව මේවා තේරුම් ගනීවි කියලා අපි බොහෝ දුරට විශ්වාස කරනවා. මේ තහනමට ලක් වෙච්ච වාහන ආනයනයට ඉඩ දීමත් එක්කම අපට පෙනෙනවා, ව්‍යාපාරික ක්ෂේත්‍රයේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ යම් ප්‍රබෝධයක් ඇති වෙලා වාහන සඳහා විශාල ඉල්ලුමක් ඇති වෙලා තිබෙන බව.

අපි මේ කාරණය ගැන පැහැදිලි කළා. වාහන ආනයනයේදී පළමුවෙන්ම දොර විවෘත කළේ විශේෂයෙන්ම පොදු මගී ප්‍රවාහන සේවාවන් සඳහායි. මොකද, ජනතාව පැත්තෙන් එවැනි

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

අවශ්‍යතාවක් තිබුණා. ඒ කටයුත්ත සාර්ථකයි. පොදු මඟී ප්‍රවාහනය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක වාහන ඇණවුම් ලැබිලා තිබෙනවා, LCs විවෘත කරලා තිබෙනවා; ඒ අනුව වාහන ආනයනය කරලා තිබෙනවා. ඊළඟට, අපි දෙවැනි අවස්ථාව උදා කරලා දුන්නා, විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය ද ඇතුළුව මේ රටේ ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන්. ඉතින් අපි දකිනවා, මේ බදු ප්‍රමාණයට එකඟ වෙමින් ජනතාව ඒ සඳහා අවශ්‍ය ඇණවුම් ලබා දීලා තිබෙන ආකාරය. ඒ හින්දා වාහන සැලකිය යුතු ප්‍රමාණයක් මේ වන විට ආනයනය කරලා වෙළෙඳ පොළ තුළට, ආර්ථිකය තුළට ඇවිත් තිබෙනවා. අපි කල්පනා කරනවා, ඒ ප්‍රතිලාභය මේ වසර තුළ ඒ වාගේම ඉදිරි වසරවල මේ රටේ ආර්ථිකයට එයි කියලා.

කොහොම නමුත්, මේ රටේ තිබෙන ඩොලර් සංචිතයට අනුවයි අපට ආනයනයට දොර විවෘත කරන්න වෙන්නේ. ඒ අනුව සැලසුම් කරලා තමයි බදු අනුපාත පවා තීන්දු කළේ. බදු ප්‍රතිශත ඉතාම අඩු මට්ටමට ගෙන ආවා නම් අපි හිතනවා, විශාල වශයෙන් වාහන ආනයනය කරයි කියලා. ජනතාවට ඒ අවස්ථාව දෙන්න අපට බැරිකමක් නැහැ. නමුත්, ඒ තුළ ආපසු සංචිතය පහළට වැටිලා අනෙකුත් ආනයන සඳහා සීමා පැනවිලා, අනෙක් පැත්තෙන් උද්ධමනය ඉහළ ගියොත්, ඒක වැරැදි කළමනාකරණයක් යැයි ඔය විපක්ෂයටම කියන්න සිදු වෙනවා. නමුත් අද නිසි කළමනාකරණයක් වුණු නිසා අනෙකුත් ආනයනික භාණ්ඩත් -ඉන්ධන වෙන්න පුළුවන්, වෙනත් දෙයක් වෙන්නත් පුළුවන්- යම් ස්ථාවරභාවයකට පත් කරලා වාහන ආනයනයටත් අපි ඉඩකඩ ලබා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මම හිතනවා, මේ රටේ ආර්ථිකය ගැන දැනුමක් තිබෙන, අවබෝධයක් තිබෙන අය මේ කළමනාකරණය සම්බන්ධයෙන් සතුටට පත් වෙයි කියලා. කොහොම නමුත්, අපි එක දෙයක් ගැන සන්තෝෂ වෙනවා. මේ වාගේ මට්ටමකට මේ රට ගේන්න පුළුවන්කම ලැබුණේ, යම් යම් මට්ටම්වලින් අස්ථාවරව තිබුණු ආර්ථිකය ස්ථාවර මට්ටමට ගේන්න පුළුවන්කම ලැබුණු නිසායි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please take your seat. You may raise your point of Order after the Hon. Minister's speech.

Hon. Minister, you carry on.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඒ නිසා තමයි අද මේ තත්ත්වයට එන්න අපට පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවේදී ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් වුණත් පැහැදිලි වන දෙයක් තිබෙනවා. අද විපක්ෂයේ ඉන්න කට්ටිය පසුගිය අවුරුදු 76ක කාල සීමාවේ ආණ්ඩු කරන කොට, රට පාලනය කරපු කාල වකවානු එක්ක සන්සන්දනය කරලා බලන කොට වැඩිම ප්‍රාග්ධන වියදම සිදු කරන අය වැය ලේඛනය බවට අපි 2025 අය වැය ලේඛනය පත් කළා. මොකද, රුපියල් බිලියන 1,400කට ආසන්න මුදලක් ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව ගත්තාම, රටේ ප්‍රධානම ආයෝජකයා බවට පත් වෙලා ඉන්නේ ආණ්ඩුවයි. ආණ්ඩුව විශාල ආයෝජනයක් කරනවා. ඒ ආයෝජනය සිදු කරන්නේ විශේෂයෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට, ඒ වාගේම අපේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයටයි. ඉතින් විපක්ෂය කෙසේ කීවත්, ඒ හරහා අපි බලාපොරොත්තු වෙනවා, හොඳ ආර්ථික වර්ධන වේගයක් 2025 වසරේදී ලබා ගන්නට. මෙය නිකම් ඉබාගාතේ යන ගමනක් නොව, සැලසුම් සහගතව යන ගමනක් කියන එක අපි ඒ තුළ පෙන්නුම් කර තිබෙනවා. එවැනි ගමනක් තුළ තමයි වාහන ආනයනය සඳහා වුණත් දොර කවුළු විවෘත කර ගන්න පුළුවන්කම ලැබුණේ. මා ඒ කාරණය විශේෂයෙන් මතු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහොම නමුත්, අපි සතුටු වෙනවා මේ රටේ ආර්ථිකය ස්ථාවර වීම තුළ දේශපාලනයත් බොහෝ දුරට ස්ථාවර වෙමින් පැවතීම ගැන. ඒක අපට පෙනුණා, ඊයේ පෙරේදා පවත්වපු පළාත් පාලන මැතිවරණයේදීත්. ඇත්තටම දේශපාලන ස්ථාවරත්වය තුළ තමයි ආර්ථික ස්ථාවරත්වයත්, සමාජ ස්ථාවරත්වයත් රැක ගන්න පුළුවන් වෙන්නේ. විපක්ෂය කෙසේ කීවත්, නව රජයක් හැටියට අපට නව ආර්ථික ගමනක් තිබෙනවා; නව දේශපාලන ගමනක් තිබෙනවා; නව සමාජ ගමනක් තිබෙනවා. මේ රටේ ජනතාව මේ පවතින සමාජ ක්‍රමය, system එක change කරන්න තමයි බලයක් දුන්නේ. ඉතින් ඒ බලය ලබා දුන් බුද්ධිමත් ජනතාවට තේරෙනවා ඇති කියලා අපි හිතනවා, ඒ බලය ලැබීමත් එක්කම ප්‍රධාන වශයෙන් ඒ ක්ෂේත්‍ර තුනේ -දේශපාලනය, ආර්ථිකය, සමාජය කියන ක්ෂේත්‍ර තුළ- අපි ජයග්‍රහණ ලබමින් තිබෙනවා කියලා. දේශපාලන ක්ෂේත්‍රයේ වුණත්, ඊයේ පෙරේදා අපි සාර්ථක ස්ථාවරත්වයක් අත්පත් කර ගත්තා. නමුත් ඒ මැතිවරණ ප්‍රතිඵලය ගැන විපක්ෂය, ඔවුන්ට පක්ෂපාත සමහර මාධ්‍ය විවිධ විධියට උදන් ඇනුවා. ඒ කවුරු උදන් ඇනුවත් සාර්ථක දේශපාලනික ස්ථාවරත්වයක් පළාත් පාලන මැතිවරණයේදීත් අප අත්පත් කර ගත් බව මම මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ පළාත් පාලන ආයතන 339ක් සඳහා තමයි පසුගිය 6වන දා ඡන්ද විමසීම පැවැත්වුණේ. ඒ පළාත් පාලන ආයතන 339න් මාලිමාව හැටියට, ජාතික ජන බලවේගය හැටියට අපි පළාත් පාලන ආයතන 267ක් ජයග්‍රහණය කර තිබෙනවා. බහුතර මන්ත්‍රී ධුර ප්‍රමාණය ලබා ගත්තු දේශපාලන පක්ෂය හැටියට අපි පළාත් පාලන ආයතන 267ක් ජයග්‍රහණය කරලා තිබෙනවා. එම ප්‍රමාණය, බොහෝ ජය කෙහෙළි නංවපු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට 2018දීවත් ගන්න බැරි වෙච්ච ප්‍රමාණයක්. අපි පළාත් පාලන ආයතන 267ක් ජය ගන්න කොට 2018දී ඔවුන්ට ජය ගන්න ලැබුණේ පළාත් පාලන 226යි. එදා බොහොම උච්ච ස්ථානයකට ඇවිල්ලා, පැවතිච්ච ආණ්ඩුවට විශාල විරෝධයකුත් ඇවිල්ලා, පක්ෂ කණ්ඩායම් ගොඩක් එකතු කරලා පවා ඔවුන් ආසන 226ක් ජය ගනිද්දී, අපි ජාතික ජන බලවේගය හැටියට විපක්ෂය සතුව තිබුණු පළාත් පාලන ආයතන 267ක් අපේ ග්‍රහණයට ගෙන තිබෙනවා; ජයග්‍රහණය කරලා තිබෙනවා.

ඒ 267න් ආයතන 120ක සාතිශය බහුතරය අපට තිබෙනවා. කිසිම ගැටලුවක් නැතිව අපට ඒවායේ බලය පිහිටුවන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම, ආයතන 32ක බලය සමාන වෙලා තිබෙනවා. පනතට අනුව ඒවායේත් බලය පිහිටුවන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. අපි තවත් සභා 115ක බලය තහවුරු කරගෙන තිබෙනවා; බහුතර බලය ලබාගෙන තිබෙනවා.

මං හිතන විධියට, එක්සත් ජාතික පක්ෂයට, සජබයට උදන් අනන්න දෙයක් නැහැ. 2018දී සජබයයි, එක්සත් ජාතික පක්ෂයයි එකට හිටපු කාලයේ ඔවුන්ට දිනා ගන්න පුළුවන් වුණා මට මතක හැටියට සභා 30කට ආසන්න ප්‍රමාණයක්. ඒ කියන්නේ, ඔවුන් 2018දී සභා 30ක් පමණ දිනාගෙන තිබෙනවා. නමුත්, මේ වන විට සජබයට මොනවා හරි බහුතර බලයක් තිබෙන්නේ සභා 14ක පමණයි. ඒ අනුව පෙනෙනවා, අප විශිෂ්ට ජයග්‍රහණයක් ලබා තිබෙන බව. කොහොම වුණත් අපි බිම් මට්ටමේ සංවර්ධනයේ විශාල යන්ත්‍රණයක් මේ වන විට අත්පත් කරගෙන තිබෙනවා. මම ඒ ගැනත් මතක් කළේ විවිධ මත සමාජයේ පළ කරමින් තිබෙන නිසා.

මේ පළාත් පාලන මැතිවරණයේදී අපි දේශපාලන ස්ථාවරත්වය තවත් ශක්තිමත් කර ගත්තා. ජනාධිපති ධුරය ලබලා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට අධික බලයක් ලබලා, පළාත් පාලන ආයතන තුළත් මේ ලබන දේශපාලන ස්ථාවරත්වය, ශක්තිමත්භාවය මේ රටේ ඉදිරි ආර්ථික ස්ථාවරත්වය තවත් තර කර ගන්න, ගමන වේගවත් කරන්න අපට ඉවහල් වෙනවා කියන කාරණය මතු කරන්නයි මම මේ අදහස් පළ කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපති ධුරයත් දිනාගෙන, පාර්ලිමේන්තු බලයත් දිනාගෙන අපි මේ රටේ වහලා තිබුණු වාහන වෙළෙඳ පොළ ආපහු විවෘත කළා වාගේම තවත් වෙළෙඳ පොළවල් ගණනාවක් විවෘත කළා. විශේෂයෙන්ම පසුගිය ඉතිහාසය පුරාවටම අරගෙන බැලුවොත් අපේ රටේ සංචාරක ව්‍යාපාරයේ විශාල වර්ධනයක් ලබා ගත්තේ 2025 වසරේ මුල් කාර්තුව තුළයි. 2025 වසරේ මුල් කාර්තුව තුළ අපි විශාල ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා. පසුගිය ඉතිහාසය පුරාවට අපි අරගෙන බැලුවොත්, රජයක් හැටියට අපේ රටේ ඉතිහාසයේ වැඩිම ආදායමක් උපයා ගත්තු කාර්තුව බවට පත් වුණේ 2025 අවුරුද්දේ ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ මුල් කාර්තුවයි. අපි ඒ ගැන සතුටින් කියන්න ඕනෑ. විවිධ ක්ෂේත්‍රවලින් අපි ඉදිරියට ඇවිත් තිබෙනවා. මා නියෝජනය කරන වැවිලි කටයුතු අමාත්‍යාංශය ගත්තොත් වසර 11කට පස්සේ, මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුව තුළ තේවලින් වැඩිම ආදායමක් ලබපු වර්ෂය බවට, නිෂ්පාදනය වැඩි කර ගත්තු වර්ෂය බවට අපි මේ වර්ෂය පත් කරගෙන තිබෙනවා. වාහන බදු ආදායම වැඩි කර ගැනීම මේ රටේ ජනතාව ප්‍රශ්නයක් කර ගන්නේ නැහැ කියලා අපි හිතනවා. එම බදු ප්‍රමාණය සියයට 20 සිට සියයට 30 දක්වා ගෙන යන්න වෙච්ච හේතු අපේ ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා පැහැදිලි කළා. අපේ රටේ තිබෙන සංචිතවල ප්‍රමාණය, ඒ වාගේම රුපියල ශක්තිමත් කර ගැනීමේ ප්‍රමාණය ආදි සියල්ල සලකා තමයි නිසි කළමනාකරණයක් ඇතුළේ අපට සිද්ධ වුණේ, ඒ බදු ප්‍රමාණය වැඩි කරන්න. ඉදිරියේදී මේ රටේ ඇති වන ආර්ථික වර්ධනයන්ට අනුව මීට වඩා සහන ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරනවා. ව්‍යාපාර ක්ෂේත්‍රයට වෙන්න පුළුවන්, මඟී ප්‍රවාහනය, වාහන ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවලට වෙන්න පුළුවන් ඒ සහනය ලබා දෙන්න අප සූදානම් කියන පණිවුඩය මම ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා වුණත්, අප කවුරු වුණත් වියදම් කරන්නේ ගෙදර තිබෙන ආර්ථිකය අනුවයි. රටේ තිබෙන ආර්ථිකයට අනුව තමයි රජයක් තීන්දු ගන්නේ. පසුගිය රජයන් එහෙම තීන්දු නොගත්තු නිසා තමයි ජනතාවට විඳවන්න සිද්ධ වුණේ; පෝලිම්වල ලගින්න සිද්ධ වුණේ. පසුගිය රජයන් එවැනි තීන්දු නොගත්තු නිසා තමයි වාහන ආනයනය කිරීම සම්පූර්ණයෙන් නවතා දැමීමට ඒ රජයන්ට සිද්ධ වුණේ. එවැනි තත්ත්වයක් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ මේ රටට උදා කරන්න අපේ සූදානමක් නැහැ. ඒ නිසා අප මේ ගන්නා තීන්දු නිසි තොරතුරු, සංඛ්‍යා දත්ත මත සාකච්ඡා කරලා ගන්නා තීන්දු මිසක, කිසි කෙනෙකුගේ පෞද්ගලික වුවමනාවන් මත ගන්නා තීන්දු නොවෙයි කියන කාරණයත් අපි සඳහන් කරනවා. ඒ නිසා අපේ රටේ ආර්ථිකය දැන් පණ ගහන්න පටන් ගෙන තිබෙනවා; නැඟිටින්න පටන් ගෙන තිබෙනවා. ඒ ගැන විපක්ෂයේ සමහරුන්ට යම් කුහකකමක්, ඊර්ෂ්‍යාවක් තිබෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තවත් කාරණයක් මතක් කරන්න කැමැතියි. පසුගිය මැතිවරණවලදීත් විපක්ෂය මේ මැතිවරණයේදී හැඳුවා වාගේම වැරැදි මත හැඳුවා. අපට බලය එනකොට සමහරු හදපු මතයක් තමයි, වාහන දෙකක් තිබෙනවා නම් ඒවායෙන් එක වාහනයක් ආණ්ඩුව ගනීවි, ඒ නිසා ජාතික ජන බලවේගයට ඡන්දය දෙන්න එපා කියන එක. ඔවුන් බලයට ආවොත් දේපළ පවරා ගනීවි කිව්වා. විපක්ෂය ගණන් හැදුවේ අපේ ආණ්ඩුවට මාස 3ක්වත් ආර්ථිකය ගෙන යන්න බැහැ කියලායි. මේ ආර්ථිකය බිඳ වැටෙයි කියන මතයයි ඔවුන් හැදුවේ. අද ඔවුන්ට තිබෙන ප්‍රශ්නය තමයි, ඔවුන් වහපු දොරවල් ඇරලා අප මේ රටේ ආර්ථිකය ඉදිරියට අරගෙන යන එක. විපක්ෂයේ මන්ත්‍රීවරුන් පළ කරන මේ අදහස් අනුව අපට පෙනෙනවා, ඔවුන්ට එය දරා ගන්න බැරි ස්වභාවයක් තිබෙන බව.

කොහොම නමුත්, අපි මේ රටේ ජනතාවට මතක් කරන්න කැමැතියි, අප මේ රටේ ආර්ථිකය නඟා සිටුවමින් තිබෙන බව; නැඟිටුවමින් තිබෙන බව. තවත් කාලයක් ගත වන කොට එහි හොඳ ප්‍රතිලාභ ලබා ගන්න ජනතාවට පුළුවන්. ඒ ප්‍රතිලාභවලින් කොටසක් මේ වන කොට මේ රටේ දුගී දුප්පත් ජනතාවට අස්වැසුම ප්‍රතිලාභ හරහා වැඩි කරලා දුන්නා. අස්වැසුම ප්‍රතිලාභ ලබන මාසයේ සිට අලුතින් පවුල් ලක්ෂ 4කට දෙන්න සැලසුම් කරලා තිබෙනවා.

මේ රටේ රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩි කරලා තිබෙනවා. මේ රටේ කර්මාන්ත, ව්‍යාපාරවලට යම් යම් බදු සහන ලබා දීලා තිබෙනවා. ඉදිරියේදීත් යම් සහන ලබා දීලා මේ රටේ ආර්ථිකය ගෙනයන්න අපි සූදානම්. විපක්ෂයේ සමහරුන් තුළ මේක බිඳ වැටෙනකල් සිහින බලාපොරොත්තුවක් තිබෙනවා. මේක බිඳ වැටෙයි කියන සිහින තිබෙනවා; ජනාධිපති සිහින තිබෙනවා, විවිධ සිහින තිබෙනවා. ඒවා කුඩුපට්ටම් කරමින් ආණ්ඩුවක් හැටියට අපි ඉදිරියේදී මේ රටේ ජනතාවටත් සහන දීලා, නව පිම්මක් ඇතිව ආර්ථිකය නඟාසිටුවන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

What is the point of Order, Hon. Member? Please turn off the live transmission, as per the order of the Hon. Speaker.

***[මේ අවස්ථාවේදී, 2025.03.19 දිනැති ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි ගරු රාමනාදන් අර්ච්චුනා මහතාගේ කථාවේ සජීවී විකාශය අත්හිටුවන ලදී.]***

*[இச்சந்தர்ப்பத்தில், 2025.03.19ஆந் திகதிய மாண்புமிகு சபாநாயகரின் கட்டளைப்படி மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரையினது நேரடி ஒளி/ஒலிபரப்பு இடைநிறுத்தப்பட்டது.]*

*[At this stage, as per the Order made by Hon. Speaker on 19.03.2025, the live telecast of the Hon. Ramanathan Archchuna's speech is suspended.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Hon. Deputy Speaker.

ඔබතුමා දන්නේ නැහැ කලින් වෙච්ච දේවල්. මෙතැන කියලා තිබෙනවා මම පැහැදිලිව ලියුමක් දීලා නැහැ කියලා. මම ලියුම් 3ක් දීලා තිබෙනවා. මගේ Privilege issue එකක් ගැන ඇවිල්ලා කථා කරලා ඔබතුමාටත් අතින් දුන්නා. මම 2025.04.08වැනි දා දීපු ලියුමත් තිබෙනවා. ඒක මම table කරන්න කැමැතියි. ඊට පස්සේ ආයෙත් 2025.04.09 වැනි දා ලියුමක් දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, would you listen to me, please? You did give me a letter and I have brought its contents to the notice of the Hon. Speaker. I think he assured you this morning, if I remember right and if I heard right, that he is going to a make a proclamation on that tomorrow.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Deputy Speaker, let me speak and let me explain.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, I saw your letter. You had amply explained it in the way that we all understood.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

එතකොට මේක හැන්සාඩ්ගත වෙනවා; ඔබතුමා මගේ ලියුම දැක්කා කියලා හැන්සාඩ්ගත වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, I have brought the contents of it to the knowledge of the Hon. Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Deputy Speaker, මේ සභාවේ Secretary-General කියලා තිබෙනවා එහෙම ලියුමක් ඇවිල්ලා නැහැ කියලා. Parliament (Powers and Privileges) Act එකේ තිබෙනවා, කවුරු හෝ මේ සභාවට අසත්‍යයක් කියනවා නම් ඒක Penal Code Ordinance එකේ Section 190 අනුව එයාට අවුරුදු 7ක් බරපතළ දඬුවම් දෙන්න පුළුවන් වරදක් කියලා. එතකොට, මට තව Privilege matter එකක් raise කරන්න දෙන්න. මේ Secretary-General මේ පාර්ලිමේන්තුවේ අසත්‍යයක් කියලා තිබෙනවා එහෙම ලියුමක් හම්බ වෙලා නැහැ කියලා. So, let me raise that Privilege matter as well.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, the Hon. Speaker will definitely address your matter of Privilege. Thank you.

The next speaker is the Hon. Ravi Karunanayake. - *[Not in the Chamber.]*

Then, the Hon. S.M. Marikkar. You have six minutes.

[අ.භා. 1.32]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මට පෙර කථා කරපු ඇමතිතුමා කිව්වා විපක්ෂයට උදන් අනන්න දෙයක් නැහැ කියලා. ඔව්, එහෙම වෙන්න පුළුවන්. නමුත්, මම ප්‍රථමයෙන්ම කියන්න ඕනෑ, සමගි ජන බලවේගය පළමු වතාවට තරග කරලා මන්ත්‍රී ධුර 1,767ක් ලබාගන්න ඡන්දය දුන් සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා කියලා. එතුමා දන්නේ නැතුව ඇති, ස්වාධීන කණ්ඩායම් නැතුව සමස්ත විපක්ෂය අරගෙන තිබෙනවා මන්ත්‍රී ධුර 4,150ක්. ජාතික ජන බලවේගය අරගෙන තිබෙන්නේ මන්ත්‍රී ධුර 3,927යි. ඒ වාගේම, මාස 7ක් තිස්සේ අපට බැණ බැණ හිටියා, ඒගොල්ලන් විපක්ෂය වාගේ හැසිරුණා. ඒකට ප්‍රතිඵල ලැබී තිබෙනවා. ජනාධිපතිවරණයේදී ඡන්ද 5,740,179ක් අරගෙන, මහ මැතිවරණයේදී ඒක ඡන්ද 6,863,186කට වැඩි කරගෙන, දැන් ඒ ප්‍රමාණය ඡන්ද 4,503,930කට අඩු කරගෙන තිබෙනවා. ඡන්ද ලක්ෂ 23ක් වැටිලා නැහැ, මාස 06ක් ඇතුළත. ඒ නිසා අපට බණින්න එපා. ඒ කියන්නේ බොරු කරපු එකේ, බොරු කියපු එකේ, දිගටම ජනතාව අන්දපු එකේ විපාක දීලා තිබෙනවා. ඒ නිසා කරුණාකර දැන්වත් බොරු කියන එක නවත්වන්න. දැන් මැතිවරණ ඉවරයි. විපක්ෂය විධියට අපටත් වගකීමක් තිබෙනවා රටේ ප්‍රශ්නවලදී රජයට සහයෝගය ලබා දෙන්න. ඒ සහයෝගය අපි ලබා දිය යුතුයි. ඒක ඇමෙරිකානු බද්ද සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් යුරෝපා සංගමයේ GSP Plus සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ආර්ථික වර්ධන වේගය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, ආයෝජකයන් ලංකාවට ගෙන්වන එක සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. අපි වුණත් ඒවාට සහයෝගය දෙන්න ඕනෑ. ඒ නිසා දැන් ජනතාවට අවශ්‍ය දේවල් කරන්න. හැබැයි, ආණ්ඩුව බොරු කියන එක නවත්වන්න ඕනෑ. මොකද, ලක්ෂ 23ක් ඡන්දය දීලා නැහැ. කලින් කථා කරපු ඇමතිතුමාගේ දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ සහ මහියංගනය ප්‍රාදේශීය සභාවේ තත්ත්වය සමානයි. කොහොමද එහෙම වුණේ එච්චර වැඩ්ඩෝ නම්? බදුල්ල දිස්ත්‍රික්කයේ විතරක් ඡන්ද 100,000ක් අඩු වෙලා තිබෙනවා. අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. මම එතුමාගේ නම කියන්නේ නැහැ. එතුමා නොවෙයි. දැන් ඩීල් යනවා. අනික් ඔක්කොම හොරු නේ. ඒගොල්ලන් විතරයි හොඳ. කොළඹ නගර සභාවේ ඔළු ගෙඩියකට මිලියන ගණන් offer කරනවා. කොහොමද, හොරු එක්ක එකතු වෙන්නේ බලය සඳහා? දැන් මේ මොහොතේ හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ බලය ලබා ගැනීම සඳහා විපක්ෂයේ පක්ෂයක මන්ත්‍රීවරයෙක් එක්ක පැලවත්ත කාර්යාලයේ සාකච්ඡා යනවා කියලා අපට ආරංචියි.

දැන් උත්තරයක් දෙයි, ඒගොල්ලන් ස්වාධීන කණ්ඩායම්වලට කථා කරනවා කියලා. කොළඹ මහ නගර සභාවේ සමගි ජන බලවේගයේ සහ විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන්ට කථා කරනවා.

මිලියන ගණන් දීලා ඒ අය ගන්න කථා කරන්නේ. මම අහන්නේ මේ සල්ලි කොහෙන්ද? සල්ලි දීලා හොරු එක්ක එකතු වෙන්න පුළුවන්ද? සභික ධුර 48ක් ගත්ත අයට උත්සාහය අතහැරලා නිකම් ඉන්න කියලා අපි කියන්නේ නැහැ. ඒක දේශපාලනයේ හැටි. නමුත් ඒගොල්ලන්ට අනුව, ඒගොල්ලෝ නේ කිව්වේ, "මහ හොරු පැරුද්දුවා, පොඩි හොරු පරද්දමු" කියලා. දැන් දිනලා ආපු පොඩි හොරුන්ට offers දෙනවා එකතු වෙන්න කියලා! මාර වැඩක් නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා මේක දන්නේ නැහැ. ඔබතුමාත් කොළඹ නගරය නියෝජනය කරන හින්දා පොඩ්ඩක් මේ කථාව ගැන හොයලා බලන්න. ජනතාව අපට පණිවුඩයක් දීලා තිබෙනවා, විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ ඒකාබද්ධ වෙලා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ කටයුතු කරන්න කියලා. අපි අපට කරන්න පුළුවන් විධියට ඒ කාර්යය කරනවා. ඔබතුමන්ලාට ජන වරමක් ලැබුණේ මේ අයත් එක්ක එකතු වෙන්න නොවෙයි. ඒ එක්කම අපි පැහැදිලිව කියන්න ඕනෑ, මේ වෙනකොට ඔයගොල්ලන්ට ජන මතයක් නැහැ කියලා. මේ වෙනකොට ජන මතයක් නැහැ. ජන මතය කැඩිලා. අපට මෙතැන ඉඳන් දේශනා දුන්නා නේ. ජන වරමේ තරම තේරුම් ගන්න කියලා නේ මාස හය හතක් අපට දේශනා දුන්නේ. ඕන්න, ජන වරම මොකක්ද කියලා ජනතාව පෙන්වලා තිබෙනවා. ජන වරම මොකක්ද කියලා පෙන්වලා තිබෙනවා. අපි දන්නවා දැන් මේ පසුබෑම වහගන්නයි හදන්නේ කියලා. කොහොම හරි කොළඹ මහ නගර සභාව පිහිටුවලා කථාවක් හදන්න යනවා, ඕන්න අපි පිහිටෙව්වා කියලා. දැන් අර පසුබෑම වසා ගැනීමේ ක්‍රමයක් යනවා. ඉතින්, ඇටමාලවලින් මාල හදනවා වාගේ වැඩක් තමයි මේ. අපි මේ කාරණය ඉතාම පැහැදිලිව කියන්න කැමතියි. ආර්ථිකය සම්බන්ධව වෙන්න පුළුවන්, සෞඛ්‍ය සම්බන්ධව වෙන්න පුළුවන්, අනෙක් දේවල් සම්බන්ධව වෙන්න පුළුවන්, පට්ටපල් බොරු තමයි මේ රටේ ජනතාවට සමාජගත කළේ. ඒක නේ "පචයෝ" කියලා මිනිස්සු කිව්වේ.

දැන් මේගොල්ලන් රට රටවල්වලට යනවා. මම දන්නේ නැහැ, ඒ රටවලින් මොනවාද ලැබුණේ කියලා. හැබැයි, අපේ ඒවා නම් දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවත් එක්ක ගහපු ගිවිසුම් එකක්වත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැහැ. නමුත් කොහොමද මේගොල්ලන් හැසිරෙන්නේ? ජනතාව වරම දුන්නේ පාර්ලිමේන්තුවට හංගලා පිටරටවල් එක්ක ගිවිසුම් ගහන්නද? ඇවිත් ඒක ගැන කියන්නෙත් වෙනස්ම විධියකට.

ඔබතුමන්ලාගේ campaign එක පක්ෂ යන්ත්‍රණයට දුන්නේ නැහැ වෙන කණ්ඩායමක් තමයි කළේ කියලා පොඩි ප්‍රශ්නයක් තිබෙනවා ලු. ඒක අපට වැඩක් නැහැ. ඒවා එයි. අපි එකම ඉල්ලීමයි කරන්නේ. දෙවියන්ගේ නාමයෙන් බොරු කියන එක නවත්වන්න; බොරු කරන එක නවත්වන්න; රවට්ටන එක නවත්වන්න. මෙන්න මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා, මෙන්න මෙතැන අවුලක් තිබෙනවා කියලා දැන්වත් ඇත්ත කියන්න. අපි ඒ ටික හදාගමු. ඒක හදාගන්න ඔයගොල්ලන් උදව් කරන්න. මොකද, තව අවුරුදු තුනකට, හතරකට මැතිවරණයක් නැහැ. මැතිවරණ කාලයේ කියපු බොරු ටික ඉවර කරලා, යථාර්ථය තේරුම් අරගෙන ජනතාවට ඇත්ත කියලා, දැන් ඔයගොල්ලන්ට ජනමතයක් නැහැ කියලා පිළිගෙන කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Riyas Farook. You have 10 minutes.

[අ.භා. 1.37]

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහන ආනයනය සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් කරන විවාදයේදී විපක්ෂයේ අය ආර්ථිකය ගැන මහ ලොකුවට සද්දේ දාලා කථා කරනවා. කොයි වාගේ ආර්ථික තත්ත්වයක් තිබියදීද අපි මේ රට භාර ගත්තේ කියලා දන්නවා නේ.

පසුගිය රජය වාහන ගෙන්වීම එක රැයකින් නතර කරලා දැම්මා. එක රැයකින් නතර කරලා දැම්මා. LCs open කරලා තිබුණු වාහන ලොකු ප්‍රමාණයක් වරායේ තිබුණා. තවත් ලොකු ප්‍රමාණයක් නැවෙන් ගෙනෙන ගමන් තිබුණා. ඒ වෙලාවේ තහනම පැනෙව්වා. LC documents බැංකුවට ආවාම බැංකුව documents භාර ගත්තේ නැහැ. එදා ආපු වාහන ටික තවමත් වරායේ දිරනවා. සමහර ඒවා ගත්තා; සමහරක් ඒවා දිරනවා. ඒ වාගේම මම හිතන විධියට, 2015දී වරායේ -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Let the Hon. Farook finish his speech. Do not interrupt him, please.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, you asked me to table that letter.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Do you want to table it now?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Yes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. But, now, you are interrupting the Hon. Farook's speech. Could you wait until he finishes, please? - *[Interruption.]* Hon. Member, would you please sit down and wait. I gave you time earlier also. So, I will definitely give you time.

Hon. Farook, you may continue with your speech.

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
2015දී වාහන නැවෙන් ගෙනෙන අතරේදී duty එක වැඩි කළා. ඒ කොහොමද? මෙහේ විකුණන ගණනට duty එක ගත්තා.

[ගරු රියාස් ෆාරුක් මහතා]

දෙගුණයක් duty එක ගත්තා; රුපියල් 3,500,000ට රුපියල් 7,000,000ක් duty එක ගත්තා. ඒ වාහන ටිකත් තවම හම්බන්තොට වරායේ තිබෙනවා. ඒ විධියට ආර්ථිකය ගෙන ගිය, ආනයන කරපු කට්ටිය තමයි දැන් මේ සද්ද දාලා කථා කරන්නේ. අපි වාහන ආනයනය open කරලා ක්‍රමය හදාගෙන යන ගමන් ඉන්නේ. වාහන ගෙන්වීමේ ක්‍රමය අපි තවදුරටත් හදාගෙන යනවා. මේ තිබෙන ආර්ථික ප්‍රශ්නත් නිරවුල් කරගෙන අපි ඉදිරියට යනවා.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானம் சம்பந்தமான இன்றைய விவாதத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் ஆர்ථිக சம்பந்தமாக உரத்த குரலில் பேசுகின்றார்கள். கடந்த ஆட்சிக் காலத்தில் வாகன இறக்குமதியை ஒரே இரவில் திடீரென நிறுத்தினார்கள் என்பது உங்களுக்குத் தெரியும்! அப்பொழுது, யப்பானிலுள்ள harbourஇல் LCs open பண்ணப்பட்ட அதிகளவான வாகனங்கள் இருந்ததோடு, இன்னும் அதிகளவான வாகனங்கள் shipsஇல் இலங்கைக்கு வந்துகொண்டிருந்தன. இவ்வாறு திடீரென வாகன இறக்குமதியை நிறுத்தியதனால், அந்த documentsஐ banks பாரமெடுக்கவில்லை. அதனால் இன்னும் நிறைய வாகனங்கள் clear பண்ண முடியாத நிலையில் harbourஇல் துருப்பிடித்துக்கொண்டு இருக்கின்றன.

அதேபோல, 2015இல் shipsஇல் வாகனங்கள் வந்துகொண்டு இருந்த timeஇல் திடீரென dutyஐ அதிகரித்தார்கள். சுமார் 35 இலட்சம் ரூபாய் dutyஐ 70 இலட்சம் ரூபாயாக அதிகரித்தார்கள். அந்த வாகனங்களை clear பண்ணுவதால் எந்தப் பயனும் கிடைப்பதில்லை என்பதனால், இறக்குமதியாளர்கள் அவற்றை clear பண்ணுவதில்லை. இதனால் அவை harbourஇல் துருப்பிடித்துக்கொண்டு இருக்கின்றன. இந்த மாதிரியான, திட்டமிடல் - planning - இல்லாத வேலைகளைச் செய்தவர்கள், எமது அரசாங்கத்துக்கு இந்த வேலைகளைச் செய்யத் தெரியாதென்ற நிலைப்பாட்டில் இருந்துகொண்டு argue பண்ணிக்கொண்டு இருக்கின்றார்கள்.

இப்பொழுது எமது அரசாங்கம் வாகன இறக்குமதி விடயத்தை systemஆகவும் கவனமாகவும் செய்துகொண்டு இருக்கின்றது. யப்பானிலுள்ள banks இன்னுமே எங்களுடைய வாகன இறக்குமதி விடயத்தில் அவநம்பிக்கையுடன்தான் இருக்கின்றன. எங்களுடைய LCsஐ நம்புவதில்லை. Importersஇடமிருந்து எழுத்துமூலமாக அல்லாது, வாய்மொழி மூலமாகத் தகவல் பெற்றுத் தயாரிக்கப்படுகின்ற Documentsஇற்குத் தாங்கள் பொறுப்புச் சொல்ல மாட்டோம் என்று அவை சொல்கின்றன. அதாவது, உரிய LCக்கு வாகனத்தை அனுப்புவதற்கான அனுமதியைத் தந்தாலும் அத்தகைய Documentsஇற்குப் பொறுப்புக்கூற மாட்டோ மென்று அவை சொல்கின்றன. இந்தளவுக்கு நாட்டின் ஆர්ථිකஐ வீழ்ச்சியடைச் செய்த எதிர்க்கட்சியினர், இந்த விடயம் சம்பந்தமாக எங்களுக்கு எதிராகக் குற்றச்சாட்டுகளை - චෝදනා - முன்வைக்கின்றார்கள். இந்த நாட்டின் ஆர්ථිකஐ develop செய்த கட்சியினர் போன்று, சிறந்த ஆட்சி செய்த கட்சியினர் போன்று இவர்கள் கதைக்கின்றார்கள். இந்த அரசாங்கம் வாகன இறக்குமதியை systemஆகச் செய்து வருகின்றது. அதாவது, எல்லோரும் நம்பிக்கையோடு வாகனத்தை இறக்குமதி செய்யக்கூடிய வகையில் இதனைச் செய்து வருகின்றது.

கடந்த காலங்களில் நிறைய ஊழல்கள் நடந்தன என்பது உங்களுக்குத் தெரியும்! සීනි බදු වංචාව உட்பட பல ஊழல்கள் நடந்தன. இறக்குமதி செய்யப்படக்கூடிய வாகனங்களின் yearஐ 5 இலிருந்து 7ஆக மாற்றினார்கள். அது எப்படி என்றால், யப்பானிலுள்ள வாகன ஏற்றுமதியாளர்களுடன் deal ஒன்றைச் செய்து, அங்கு 7 வருடங்களுக்குள்ளான வாகனங்கள் எல்லாவற்றையும் வாங்கி வைத்துவிட்டு, இங்கு gazette பண்ணி, திறந்துவிட்டார்கள். இதில் பாரிய தொகை වංචාව நடந்தது. பின்னர் அதை short periodஇல் நிறுத்திவிட்டார்கள். இவ்வாறான deals இல்லாமல், முறையானதொரு விதத்தில் இந்த அரசாங்கம் வாகன இறக்குமதி விடயத்தைச் செய்துகொண்டு வருகின்றது. அதற்கு உங்கள் எல்லோருடைய ஒத்துழைப்பும் தேவையெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Harshana Rajakaruna.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may raise your point of Order. We have already decided on your matter. Is that not so? Do you want to table your documents?

***[මේ අවස්ථාවේදී, 2025.03.19 දිනැති ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි ගරු රාමනාදන් අර්චුනා මහතාගේ කථාවේ සජීවී විකාශය අත්හිටුවන ලදී.]***

*[இச்சந்தர்ப்பத்தில், 2025.03.19ஆந் திகதிய மாண்புமிகு சபாநாயகரின் கட்டளைப்படி மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரையினது நேரடி ஒளி/ஒலிபரப்பு இடைநிறுத்தப்பட்டது.]*

*[At this stage, as per the Order made by Hon. Speaker on 19.03.2025, the live telecast of the Hon. Ramanathan Archchuna's speech is suspended.]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Yes, Sir, I want to table the documents. I sent these letters but, unfortunately, they are rejecting to accept those. I gave these letters dated the 08th, 09th and 21st of April, 2025, and the Hon. Speaker asked me to retable those. When I send these letters, they reject them. The Hon. Speaker asked me to table the letters.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may table them now, please.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir. I **table*** the letters.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Rajakaruna. You have six minutes and your time starts now.

[අ.භා. 1.44]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Thank you, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. මට මේ වෙලාවේ මතක් වෙන්නේ විට්ස් කාර් එකක් ලක්ෂ 12කට ගන්න පුළුවන් කියපු කථාවයි. ඒ වාගේම තවත් වත්මන් ඇමතිවරයෙක් පසුගිය කාලයේ කිව්වා, "ඩොලර් 20,000ක වාහනයක් මෙහාට ගෙන්වනකොට ඩොලර් 60,000ක් වෙනවා. ඒක කොච්චර primitiveද?" කියලා. "ඒක කොච්චර අසාධාරණද, අපි නම් ඒ විධියට කාර් ආනයනය කරන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ" කියලාත් කිව්වා. එහෙම කියපු පුද්ගලයින් අද වනවිට මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඇමතිකම් දරනවා. නමුත් අර ගැන තවම කථාවක් නැහැ.

ඔය වාගේ කතන්දර, පව දහස් ගණනක් කියා තමයි මේ ආණ්ඩුව බලයට ආවේ. මේ ආණ්ඩුව කියපු පවවලට තමයි මේ රටේ ජනතාව පුදුම විධියට රැවටුණේ. ජනාධිපතිවරණයේදී සියයට 42ක සුළුතරයකින් මේ රටේ ජනාධිපති පත් වුණා. හැබැයි,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ ජනාධිපති අපේක්ෂකයා හැටියට සුන්දර විධියට පව කිව්වේ. ඒක නම් හරිම සුන්දරයි. අපිටත් අහගෙන ඉන්න ආසා හිතුණා. සුන්දර විධියට පව කියලා එතුමා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වුණා. නමුත් මේ පව වැඩි කල් පවතින්නේ නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වෙලා තවම මාස 6යි ගත වුණේ. පසුගිය දා පැවැති පළාත් පාලන මැතිවරණයේදී මේ ආණ්ඩුවට ඡන්ද ලක්ෂ විසිගණනක් අඩු වුණා. තමුන්නාන්සේලා දැන් කියන්න පුළුවන්, ලක්ෂ විසිගණන සංසන්දනය කරන්න බැහැ, පාර්ලිමේන්තු මැතිවරණයයි, පළාත් පාලන මැතිවරණයයි එක්ක කියලා. හරි, අපි ප්‍රතිශතයක් හැටියට ගනිමු. ප්‍රතිශතයක් හැටියට ගත්තාම, පාර්ලිමේන්තු ඡන්දයේදී මාලිමාව පක්ෂය සියයට 61ක් ගත්තා. මෙවර ඒක සියයට 43කට අඩු වෙලා තිබෙනවා. එතකොට, සියයට 20කට ආසන්න ප්‍රමාණයකින් මෙවර මැතිවරණයේදී ඡන්ද අඩු වීම තුළින් පෙන්නුම් කරන්නේ එදා ඒ කියපු පව යථාර්ථයක් වෙන්නේ නැහැ කියන එක මේ රටේ ජනතාව දැන් තේරුම් අරගෙන තිබෙනවා කියන එකයි.

මෙවර මැතිවරණයේදී සමගි ජන බලවේගයට මේ රටේ ජනතාව ඡන්ද විශාල ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. ලක්ෂ 19 සිට ලක්ෂ 22කට, 23කට ආසන්න ප්‍රමාණයකින්; සියයට 17 සිට සියයට 22කට වැඩි මට්ටමකින් ජනතාව අපේ පක්ෂයට ඡන්දය ලබා දී තිබීම පිළිබඳව අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මා නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයෙන් මාලිමාවට ලැබී තිබෙන ඡන්ද ප්‍රමාණය ලක්ෂ 9 ඉඳලා ලක්ෂ 6 දක්වා අඩු වෙලා තිබෙනවා. සමගි ජන බලවේගයට ඡන්ද සියයට 12 සිට සියයට 21කට වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ 150,000 සිට 225,000 දක්වා. මාලිමාවේ ඡන්ද සියයට 72 සිට සියයට 54කට අඩු වෙලා තිබෙනවා. මේ අඩුවීම සිදු වුණේ වෙන කිසිම හේතුවක් නිසා නොවෙයි, මේ රටේ ජනතාවට ලොකු පව ගැහුවාට ඒ පව දැන් ජනතාව පිළිගන්නේ නැති මට්ටමකට පත් වෙලා තිබෙන නිසායි. ජනතාව ඒවා පිළිගන්නේ නැති මට්ටමට දැන් පත් වෙලා තිබෙනවා. අන්තිමට ගහපු පවය මොකක්ද? මම අහන්නේ, මෙහෙමත් පව කියන්න පුළුවන්ද?

මැතිවරණ වේදිකාවේදී කිව්වා, පාස්කු ප්‍රහාරයේ - Easter attack එකේ - මහ මොළකරු ඇතුළු අනෙකුත් අයව පාස්කු දිනට කලින් ජනතාවට හෙළි කරනවා කියලා. මේ විධියට වේදිකාවල කිව්වේ රටේ ජනාධිපතිවරයා. අපි අහනවා, කෝ තවම ඒවා හෙළි කළාද? ඒක රටේ ජනාධිපතිවරයා කිව්ව දෙයක්.

අපි කියන්නේ, දැන් තමුන්නාන්සේලා සියලුදෙනා මේක තේරුම් ගන්න. තවමත් උද්ධච්ච වෙන්න එපා, මේක පිළිගන්නේ නැතිව. තමුන්නාන්සේලා, "නැහැ, අපිට එහෙම වුණේ නැහැ. මේ ආණ්ඩුවට ජන වරමක් තිබෙනවා. ඒ ජන වරම අනුවයි අපි ක්‍රියාත්මක කරන්නේ" කියමින් ඉන්නවා. ඇත්තටම දැන්වත් මේ උද්ධච්චකම අතහැරලා පොඩ්ඩක් මහපොළොවට එන්න. මහපොළොවට ඇවිල්ලා මේ රටේ ජනතාව ලබා දුන්න ඒ පණිවුඩය ගැන දෙපාරක් හිතන්න; වෙනස් වෙන්න. මොකද, අපිටත් අවශ්‍යා මේ රටේ ජනතාවට යහපත් රටක් බිහි කරන්න. ඒ යහපත් රටක් බිහි කරන්න තමුන්නාන්සේලාට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ අවස්ථාවෙන් මේ රටේ ජනතාවට යහපතක්ම සිදු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා වියට්නාමයට ගියා. එතුමා වියට්නාමයට ගිහිල්ලා එනකොට ආවේ private jet එකක. අපි අහනවා, ඒ private jet එකට කවුද වියදම් කළේ කියලා. අපිට ආරංචියි ඒ private jet එකට වියට්නාමයේ ආණ්ඩුව වියදම් කර තිබෙනවා කියලා. ඒ වාගේම සමාජ මාධ්‍යයේ යනවා වියට්නාමයේ යම් සමාගමක් ඒකට වැය බරක් දැරුවා කියලා. ඉතා පැහැදිලිවම මම විශ්වාස කරනවා මේ රටේ ජනතාව මේ ගැන දැන ගන්න අවශ්‍යයි කියා. මේකේ මිල ගණන් පිළිබඳව Internet එකේ තිබෙනවා. ඒ නිසා වැරැද්දක් වෙලා තිබෙනවා නම් තමුන්නාන්සේලා එය නිවැරදි කරන්න. ඉතා පැහැදිලිවම මේ රටේ ජනතාවට දැනුවත් කරන්න. *[බාධා කිරීමක්]* මගේ කථාවෙන් පස්සේ ඒ ගැන දැනුවත් කරන්න, ගරු ඇමතිතුමා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. මේ රටේ ජනතාවට ඒ පිළිබඳ සැකයක් මතු වෙලා තිබෙනවා.

දැන් මේ රටේ ජනතාව පණිවුඩයක් ලබා දීලා තිබෙනවා. මේ ආණ්ඩුවට විරුද්ධව රතු එළියක් පෙන්වා තිබෙනවා. මෙවර මැතිවරණයේදී ඔබතුමන්ලාට ලක්ෂ විසිගණනක ඡන්ද ප්‍රමාණයක් -ඡන්ද විශාල ප්‍රමාණයක්- අඩු වෙලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ ආණ්ඩුව පත් වෙලා මාස හයක් වැනි කෙටි කාලයක් ඇතුළත. වැඩි කාලයක් ගිහිල්ලා නොවෙයි. මාස හයක් වැනි කෙටි කාලයක් ඇතුළත ජන වරම මෙච්චර ප්‍රමාණයකින් අහිමි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා -ගරු විජිත හේරත් ඇමතිතුමා, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා- විපක්ෂයේ ඉන්නකොට, 2018දී ඒ විධියට ජන වරම අහිමි වනකොට කිව්වා, පාර්ලිමේන්තුව විසුරුවන්න කියලා. අපේ යහ

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

පාලන රජය 2018දී පළාත් පාලන මැතිවරණය පරාජයට පත් වුණාම, "දැන් ජන වරමක් නැහැ. පාර්ලිමේන්තුව විසුරුවන්න" කියලා කිව්වා. තමුන්නාන්සේලාගෙන් මම මේ කාරණය අහනවා. දැන් මේ විධියට ජන වරම විකෘති වෙලා තිබෙනවා, මේ රටේ ජනතාව දැන් තේරුම් අරගෙන තිබෙනවා, මේ රටේ ජනතාවට පුළුවන් වෙලා තිබෙනවා ඇත්ත අවබෝධ කර ගන්න. එහෙම නම් මේ ආණ්ඩුව; තමුන්නාන්සේලා ඒ පිළිබඳව දරන මතය මොකක්ද? මම ඉතා පැහැදිලිවම කියන්න කැමැතියි, තමුන්නාන්සේලා මහා ජයග්‍රහණයක් ලැබුවා කියලා හිතුවාට එහෙම ජයග්‍රහණයක් ලැබිලා නැති බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Harshana Rajakaruna, would you please wind up now?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

ඒ වාගේම ඔබතුමන්ලා මේ කාරණයත් තේරුම් ගනිවි. පළාත් පාලන ආයතන 180ක් වාගේ තිබෙනවා. ඉදිරි සති කිහිපය තුළ විපක්ෂය එකට එකතු වුණාම ඒ අවස්ථාව තමුන්නාන්සේලාට ලැබෙන්නේ නැහැ. එම නිසා අපි ආරාධනා කරනවා විපක්ෂයක් හැටියට අපි එකතු වෙමු කියලා. එකතු වෙලා මේ ආණ්ඩුවට විරුද්ධව, මේ ජන මතයට සාධාරණයක් ඉටු කරන්න කටයුතු කරමු කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වියට්නාමයේ ජනාධිපතිතුමා රාජ්‍ය තාන්ත්‍රික ගමනකට අපට ආරාධනා කළේ. ජනාධිපතිතුමාත්, මමත්, අපේ නිලධාරින් කිහිප දෙනෙකුත් ඒකට සහභාගි වුණා. එකක්, එය රාජ්‍ය ආරාධනාවක්. දෙවැන්න, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙසක් උත්සවය පැවැත්වුණෙත් වියට්නාමයේ. මේ කරුණු දෙකටම තමයි අපිට ආරාධනා කළේ. 6වෙනි දා උදේ තමයි වෙසක් උත්සවය පැවැත්වුණේ. එහි විශේෂ ආරාධිත කථාව යොමු කර තිබුණේ අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාටයි. අපි ඇත්තටම ඒ අයට දැනුම් දුන්නා 6වෙනි දා උදේ ඒ කථාව කරලා ඡන්දය වෙනුවෙන් ලංකාවට එන්න විධියක් නැහැ, ඒ නිසා අපිට ඒ ගමනට එන්න අමාරුයි කියලා.

ඊට පසු තමයි වියට්නාමයේ බෞද්ධ සංගමයෙන් සම්පූර්ණ වියදම දරලා විශේෂ ගුවන් යානයක් අපට ලැහැස්ති කළේ ලංකාවට එන්න. ඒ වෙනුවෙන් ලංකාවෙන් ශත පහක් අපි වියදම් කරලා නැහැ. ඇත්තටම ගත්තොත්, අපේ ටිකට්වල වියදමත් මුළුමනින්ම ඉතුරුයි. අපට යන්න ටිකට් වියදම අපේ රජයෙන් දැරුවා. එන්න සම්පූර්ණ වියදම දැරුවේ වියට්නාමයේ බෞද්ධ සංගමය. එම නිසා එය රටට විශාල වාසියක්. එහෙම නැතුව අපි වියදම් කරලා හෝ මේ රටේ ජනතාවගේ මුදල් වියදම් කරලා අපි පෞද්ගලික ගුවන් යානයකින් ආවේ නැහැ. ඒ කරුණු පිළිබඳව අපි ඉතා පැහැදිලිව රටේ ජනතාව දැනුවත් කරනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Rajakaruna? Make it very short, please. The Hon. Minister has given a comprehensive explanation.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලාම රජය නිවේදනය කළා, වියට්නාම රජය විසින් එම වියදම දැරුවාය කියලා. දැන් මෙතුමා කියනවා, වියට්නාම රජය විසින් එම වියදම දැරුවා නොවෙයි, වියට්නාමයේ වෙන සමිතියකින් එම වියදම දැරුවා කියලා. තමුන්නාන්සේලාම මීට දවස් කිහිපයකට කලින් මේ සම්බන්ධව එක කථාවක් කිව්වා, දැන් වෙන කථාවක් කියනවා. ඒ පිළිබඳවත් ලොකු ගැටලුවක් දැන් මතු වනවා. වියට්නාම රජය එම වියදම දැරුවා නම් ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. එම වියදම දරා තිබෙන්නේ වියට්නාම රජය නොවෙයි නේ, සමිතියක් විසින් නේ. එම සමිතියේ ඉන්න ව්‍යාපාරිකයෝ කවුද, අනික් අය කවුද කියලා අපි කොහොමද දන්නේ? මේ රටේ ජනතාව කොහොමද දන්නේ? එය වියට්නාම රජයෙන් කරපු ආරාධනාවක් නම්, ඔබතුමන්ලාට ඡන්දය පාවිච්චි කරන්න හදිසියේ එන්න අවශ්‍ය වුණා නම් එම වියදම දරන්න ඕනෑ වියට්නාම රජය විසින් නේද? වියට්නාමයේ බෞද්ධ චේවා, කතෝලික චේවා වෙන සමිතියකින් එම වියදම දරලා -

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නොදන්නාකම ප්‍රදර්ශනය කරන්න ගිහිල්ලා අමාරුවේ වැටිලා තිබෙන බව මට තේරෙනවා. ගරු මන්ත්‍රීතුමනි, කරුණු වරද්ද ගන්න එපා. ඒ රටේ උත්සව දෙකක් තිබුණා. එකක් තමයි, වියට්නාම ජනාධිපතිවරයාගේ නිල රාජ්‍ය තාන්ත්‍රික ආරාධනාව. දෙක, එක්සත් ජාතීන්ගේ සංවිධානය ජාත්‍යන්තර වශයෙන් පවත්වන වාර්ෂික වෙසක් උත්සවය. එම වාර්ෂික වෙසක් උත්සවයේ සම්පූර්ණ සංවිධායකත්වය දරන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ වෙසක් සංවිධාන කමිටුව. එම කමිටුවේ ලංකාවේ අපේ ගෞරවනීය හාමුදුරුවන් වහන්සේලාත් ඉන්නවා. අපේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අනුනායක නියංගොඩ විජිතසිරි හාමුදුරුවන් ඇතුළු අපේ ගෞරවනීය හාමුදුරුවන් වහන්සේලා සියනමක් විතර එයට වැඩම කරලා සිටියා. ගිහි පිරිසත් සිටියා. ඒ උත්සව දෙකටම තමයි අපි සහභාගි වුණේ. වියට්නාම රජය අපට අවශ්‍ය නවාතැන් පහසුකම්, අභ්‍යන්තර ගමන් බිමන් පහසුකම් ආදී සියල්ලම ලබා දුන්නා. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ වෙසක් සංවිධාන කමිටුව විසින් ඉතිරි කටයුතු සංවිධානය කළා. ඒක තමයි ඇත්ත කථාව. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කලින් කිව්වේ සහ රටට කියන්න ගත්තේ මොකක්ද? *[බාධා කිරීමක්]* වියට්නාම රජයත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ වෙසක් සංවිධාන කමිටුවත් ඒකාබද්ධව තමයි ඒ සියල්ල සම්පාදනය කරනු ලැබුවේ. එයට වියට්නාම රජය සම්බන්ධ වුණා කියන එක ඉතා පැහැදිලියි. එහි කිසි වැරැද්දක් නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
නැහැ, මම අහන්නේ -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have other speakers due to speak. Could you make your point very short, please?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Please, Sir, I want a clarification.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Make it very short because a lot of other speakers are due to speak.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉස්සෙල්ලා කියපු කථාවට පරස්පර විරෝධී කථාවක් තමයි දැන් කියන්නේ. ඉස්සෙල්ලා කිව්වා, බෞද්ධ සමිතියක් කියලා. මම මේ අහන්නේ ඉතා පැහැදිලිවම private jet එකකින් ආපු එක ගැන. අනෙක් රැස්වීම් ගැන නොවෙයි. ඔබතුමන්ලා රැස්වීම්වලට ගියා. ඒ ගියේත් මේ රටේ මුදල් වියම් කරලා නේ. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ජනාධිපතිවරයා හැටියට රටේ මුදල්වලින් පිට රට යන්න පුළුවන්. නමුත්, එනකොට ආවේ private jet එකකින්. මම අහන්නේ, ඒ private jet එකට වියදම් කළේ කවුද කියලායි. දැන් ඔබතුමා කියනවා, බෞද්ධ සමිතියෙන් වියදම් කළා කියලා. ඊළඟට කියනවා, දෙගොල්ලන්ම එකතු වෙලා වියදම් කළා කියලා. මට ඉතා පැහැදිලිව දැනගන්න ඕනෑ, ඒකට වියදම් කළේ කවුද කියලා. මොකද, සමාජ මාධ්‍යවල තිබුණේ සම්පූර්ණයෙන්ම මේ පිළිබඳව අපැහැදිලි කථාවක්. එම නිසා ඔබතුමාගේ වගකීම ඒක පැහැදිලි කරන එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Could we move on to the next speaker?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Vjitha Herath, make it very brief, please. We cannot debate this for the rest of the day.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා නිරවුල්ව මම එය පැහැදිලි කළා. වියට්නාම ගමනේදී ප්‍රධාන උත්සව දෙකකට අපි සම්බන්ධ වුණා. එකක් තමයි, වියට්නාම ජනාධිපතිවරයාගේ ආරාධනය පරිදි රාජ්‍ය තාන්ත්‍රික උත්සවය.

ගරු මන්ත්‍රීතුමනි, මේක හොඳට අහගන්න. දෙවැනි එක තමයි, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පවත්වන වෙසක් උත්සවය. ඒ කියන්නේ ලෝකයේ විවිධ රටවල් ඒකාබද්ධව පවත්වන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්ෂික වෙසක් උත්සවය. ඒ වාර්ෂික වෙසක් උත්සවය සංවිධානය කරන්න ලෝකයේ විවිධ රටවල නියෝජිතයෝ, සාමාජිකයෝ සම්බන්ධ වෙනවා. ලංකාවේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාත් ඒ සංවිධායක කමිටුව නියෝජනය කරනවා. මේ දෙගොල්ලන් ඒකාබද්ධව තමයි ඒ සියල්ල සංවිධානය කළේ. වියට්නාම් රජයත් මැදිහත් වුණා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බෞද්ධ සංවිධාන කමිටුවත් මැදිහත් වුණා. *[බාධා කිරීමක්]* ඒ ගුවන් යානාව සඳහා සම්පූර්ණ වියදම දැරුවේ ඔවුන්. අපි මේ රටේ ජනතාවගේ බදු මුදල් ශත පහක්වත් වියදම් කළේ නැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
වියදම් කළේ කවුද?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ වියට්නාමය තුළ ක්‍රියාත්මක වන බෞද්ධ සංවිධානය. වියට්නාම ආණ්ඩුව තමයි ඒ සියලු පහසුකම් සැලසීම් සංවිධානය කළේ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ කියන්නේ ඒ වියදම් දැරුවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජාත්‍යන්තර වෙසක් සංවිධාන කමිටුව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have 12 minutes.

[අ.භා. 1.59]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේරෙන්නේ නැති එකයි, බොරුවට අහන එකයි දෙකක්. පාර්ලිමේන්තුවේදී නිල විධියට ඇමතිවරයෙකු උත්තර දෙනකොට සමාජ මාධ්‍යයේ තිබුණු එකක් ගැන කථා කරනවා. වගකීමෙන් අදාළ ඇමතිවරයා මෙතැන උත්තර දෙනවා. නමුත් සමාජ මාධ්‍යයේ එකක් ඔළුවේ තියාගෙන ඒ ගැන ප්‍රශ්න කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙහෙම දෙයක් කියන්න කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, දැනගෙන බොරුවට මෙතැන රඟපාන්න එපා. පසුගිය කාලයේ රුපියල් බිලියන එකයි දශම ගණනක් වියදම් කරලා හිටපු ජනාධිපතිවරු රවුම් ගැහුවා. අහගෙන හිටියේ නැද්ද? උදේ කියපු list එක

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය ]

අහගෙන හිටියේ නැද්ද? කවුද ගිහිල්ලා තිබෙන්නේ? මොනවාද කරලා තිබෙන්නේ? මොකටද ගියේ? මේ රට නියෝජනය කරමින්ද ගියේ? ඒ ජනාධිපතිවරු රවුම් ගහලා රුපියල් බිලියන ගණනක් මේ රටේ සල්ලි වියදම් කරලා තිබෙනවා. ජනාධිපති විතරක් නොවෙයි, ජනාධිපති ඇතුළු ජනාධිපතිගේ නියෝජිතයිනුත් ගිහිල්ලා රටේ සල්ලි වියදම් කරලා, දැන් මේ සභාවට ඇවිල්ලා රටට ඇහෙන්න බොරු කියනවා. අද උදේ මේ සභාවේදී ඒ තොරතුරු ඉදිරිපත් වුණා, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්තයා මොකක්ද කරලා තිබෙන්නේ කියලා. අවුරුදු දෙකක් යන්න කලින් විදේශ ගමන් 23කට වැඩිය ගිහිල්ලා රුපියල් බිලියන ගණනකට වැඩිය මුදල් වියදම් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවට බාධා කරන්න එපා කියන්න. මම කාගේවත් නම කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා මගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Harshana Rajakaruna, would you please take your seat?

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

මන්ත්‍රීතුමනි, ඔය බොරු ඔබතුමන්ලා බලන සමාජ මාධ්‍යවලට කියාගන්න. සමාජ මාධ්‍යවල දේශපාලනය කරන්නත් ඕනෑ, මහ පොළොවේ දේශපාලනය කරන්නත් ඕනෑ. මම ඉස්සරහට කියන්නම්, ජනතාව මේගොල්ලන් කැලේට වීසි කරලා තිබෙන හැටි. දන්නේ නැත්නම්, මම ඉතුරු ටිකත් හොඳට කියන්නම්. මෙහෙම බොරු කිව්වොත් ඉදිරියේදී මේගොල්ලන් කොහේ හරි කෞතුකාගාරයකින් තමයි හොයාගන්න වෙන්නේ. දැන් මෙතැනට එනවා, බොරු කියන්න. අපිත් මේ මහ පොළොවේ දේශපාලනය කරන මිනිස්සු. මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් ලෝකය වටේ ගිහිල්ලා රුපියල් බිලියන ගණනක් ගිලපු අය ගැන අපි මෙච්චර පැහැදිලි කරද්දීත්, බොරු කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් අද විවාදයට සම්බන්ධ වෙන්නම්. රේගු ආඥාපනතේ උපලේඛනවලට අදාළව ආනයන තීරුබදු යෝජනා පිළිබඳවයි අද මේ විවාදය තිබෙන්නේ. මේ විවාදය තුළදී රටට බොරු කියද්දී ජනතාව හොඳට තේරුම් ගන්න ඕනෑ, මේගොල්ලන් මොන තැන්වලද තියන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ මේ කථා කරන අය ආර්ථිකය කඩා වැට්ටුවා. කඩා වට්ටලා අඩු ගණනේ මිනිස්සුන්ට බෙහෙත් ටිකක් ගෙනෙන්නවත් සංචිත ඉතුරු කළේ නැහැ; බෙහෙත් ටිකක් ගෙනෙන්න සල්ලි ඉතුරු කළේ නැහැ. එහෙමයි හොරකම් කළේ. එහෙමයි ලෝකය වටේ රවුම් ගැහුවේ. එතකොට මේ තර්ක විතර්ක කොහේද තිබුණේ? එතකොට කොහේ රිංගාගෙනද නිදාගෙන හිටියේ? දැන් මෙතැනදී කෑ ගහගෙන එනවා. එදා රුපියලක් තිබුණේ නැහැ, සංචිත කඩාගෙන වැටිලා තිබුණේ. බෙහෙත් ටික ගෙනෙන්න සල්ලි තිබුණේ නැහැ. ඉන්ධන ගෙනෙන්න සල්ලි තිබුණේ නැහැ. ඒවාට සංචිත තිබුණේ නැහැ. එදා කොහොමද ආර්ථිකය කඩාගෙන වැටිලා තිබුණේ? අලුතින් වාහන ගෙන්වන්න තියා කන්න බොන්නවත් සල්ලි තිබුණේ නැහැ. එහෙමයි ඒගොල්ලන් ආර්ථිකය කඩා වට්ටලා තිබුණේ. දැන් ආර්ථිකය ගැන මහා ලොකුවට කථා කරලා අපට කියනවා, මේ ආර්ථික ක්‍රමය වැරදියි ලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට වැරැදිලා නම් අපි අද මේ වාහන ආනයනය කරන්න අවස්ථා හදන්නේ කොහොමද? ඒවා දිහා කුහක නොවී බලන්න විපක්ෂයට බැරි නම් මම දන්නේ නැහැ, මේ තිබෙන්නේ මොන විපක්ෂයක්ද කියලා. අපට ඕනෑ ශක්තිමත් විපක්ෂයක්. ඇයි ඒ? ශක්තිමත් විපක්ෂයක් තිබුණොත් තමයි, ආණ්ඩුවට ශක්තිමත් විධියට ගමනක් යන්න පුළුවන් වෙන්නේ. අපි ප්‍රාර්ථනා කරනවා ශක්තිමත් විපක්ෂයක්. නමුත්, රුපියල් බිලියන ගණනක් සල්ලි වියදම් කරමින් ලෝකය වටේ රවුම් ගහලා, දැන් මෙතැනට අදාළ නැති ඒවා කියන්න එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අපේ රටට වාහන ආනයනය කරන එක තහනම් කරලා තිබුණු බව ඔබතුමා දන්නවා. අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, නැවේ තිබුණු වාහන ටික ගොඩට ගේන්න පුළුවන්කමක් තිබුණේ නැහැ, ලොකු බද්දක් ගැහුවා, ඩොලර් නැති නිසා LCs open කරන්න බැරි වුණා, ඒ වාහන තවමත් වරායේ ගොඩ ගැහිලා තිබෙනවා, ඒක තමයි ඇත්ත, ඒ තරමට ආර්ථිකය කඩාගෙන වැටුණා කියලා. හැබැයි, අපි දැන් මොකක්ද කරන්නේ? අපි හදපු ආර්ථිකයක් නොවෙයි නේ, මීට කලින් තිබුණේ. ඒ වට්ටපු ආර්ථිකය තුළින්ම තමයි අපි ගොඩ එන්නේ. අපේ ආර්ථික න්‍යාය ගැන අපට හොඳ අවබෝධයක් තිබෙනවා. මේගොල්ලන්ගේ ආර්ථික න්‍යාය පැත්තකට විසි කරලා, අපේ රටේ නිෂ්පාදනය වැඩි කරමින්, පුළුවන් තරම් ඉතුරු කරමින්, දූෂණය නැති කරමින් අපි කටයුතු කරනවා. ඒක තමයි අපේ ආර්ථික න්‍යාය. අපේ ආර්ථිකයට, පුළුවන් තරම් වැඩ කරන අයට එහෙම නැත්නම් ආයතනවලට, ආයෝජකයන්ට එන්න අවස්ථාව ලබා දෙමින් ඒකට අවශ්‍ය දේශපාලන පසුබිම හදන එක තමයි අපේ ආර්ථික න්‍යාය වෙන්නේ. ඒ නිසා තමයි අපට කඩාගෙන වැටුණු ආර්ථිකය ගොඩගන්න පුළුවන් වුණේ. ඒ කඩාගෙන වැටුණු, බංකොලොත් වුණු ආර්ථිකයෙන් ගොඩට එන්න අපට පුළුවන්වෙලා තිබෙනවා. බංකොලොත් වූ ආර්ථිකයෙන් අපි ගොඩට ආවා. අපේ රටේ ජනතාව ඇතුළු විශාල පිරිසක් ඒ වෙනුවෙන් කැප කිරීම් කළාය කියන එකත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. දේශපාලන පක්ෂයක් විධියට අපේ අයත් ඒ කැප කිරීම් කරපු නිසා තමයි, කඩාගෙන වැටුණු ආර්ථිකයෙන් අද වෙද්දී අපට ගොඩ එන්න පුළුවන් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි, ටිකෙන් ටික අපේ සංචිත ඉතුරු කර ගන්න අපට පුළුවන්වෙලා තිබෙන්නේ. අද අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 6.5ක විතර සංචිතයක් හදාගෙන තිබෙනවා. එ් සංචිතය හදාගෙන තිබෙන්නේ රටක් විධියට පරිත්‍යාග කරලා, මහන්සිවෙලා. ආර්ථිකයක් විධියට ඒ සංචිත පරිස්සමින් තබා ගත්ත නිසා තමයි, අනෙක් පැත්තෙන් මේ රේගු ආඥාපනත අනුව පසුගිය කාලයේ නවත්වා තිබුණු වාහන ආනයනය කිරීම සඳහා ඉඩ දෙන්න අපට දැන් පුළුවන්වෙලා තිබෙන්නේ. ඒකේ ප්‍රතිඵලයක් විධියට අපි මූලික වටයේදී මේ රටේ ප්‍රවාහනයට ඕනෑ කරන වාහන ටික ගෙන්වන්න අවස්ථාව ලබා දුන්නා. ඒක හොඳ දෙයක් නොවෙයිද? ඒක මේගොල්ලන් කරපු දෙයක් නොවෙයි.

ඊට පස්සේ අපට පුළුවන් වුණා, ආයෝජකයන්ට, සංචාරක කර්මාන්තයට ඕනෑ කරන වාහන ගෙන්වන්න අවස්ථාව ලබා දෙන්න. ඒක හොඳ දෙයක් නොවෙයිද? අපට ඊළඟට පුළුවන් වුණා, පෞද්ගලිකව තමන්ට පුළුවන් විධියේ වාහන ගෙන්වන්න අවස්ථාවක් ලබා දෙන්න. දැන් මේ ගරු සභාවේදී කිව්වා, අරහෙම කිව්වා, මෙහෙම කිව්වා, ඒවා කෝ, ජනතාවට වාහන සිහිනයක් තිබුණා කියලා. අපි ඉතා වගකීමෙන් කියනවා, අපි ජනතාවට යම් පොරොන්දුවක් වුණා නම්, අපේ පාලන කාලය තුළ දුන්නු ඒ පොරොන්දු හා අපි කිව්ව ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න අප බැඳිලා ඉන්නවාය කියන එක. ඒක අපි අනිවාර්යයෙන්ම අදත්

කියනවා. අපේ පාලන කාලය තුළ ඒ සඳහා මහන්සිවෙලා හොඳ සැලසුම්සහගත ආර්ථික ක්‍රමයකට යනවා. ඒ නිසා තමයි අපට අද වෙද්දී අපේ ආර්ථිකයේ තිබෙන අනෙකුත් කාරණා වන උද්ධමනය වැඩි වෙන්නේ නැතුව, ගෙවුම් ශේෂයේ වෙනස - ආනයන හා අපනයන අතර වෙනස- ගැන වාගේම විදේශ සංචිතය පිළිබඳව සැලකිලිමත් වෙමින්, යම් බද්දක් අය කරමින් හා පාලනයක් කරමින් අවශ්‍යතාවට අනුව වාහන ආනයනය කරන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන් වුණේ. මම හිතන විධියට, ඒක රටක් විධියට අපි ලබපු ජයග්‍රහණයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ ආර්ථික ප්‍රතිපත්තිය අනුවම යමින් අද වෙද්දී අපට අපේ අපනයන ආදායම වැඩි කර ගන්න පුළුවන්වෙලා තිබෙන බව ඔබ දන්නවා. මොකද, ආනයන හා අපනයන අතර වෙනස පිළිබඳව සැලකිලිමත් වුණේ නැත්නම් අපේ සංචිත ටික අඩු වෙනවා.

ඒ නිසා 2025 අවුරුද්දේ පළමුවැනි කාර්තුවේ විතරක් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 4.2ක වාර්තාගත අපනයන ආදායමක් ගේන්න පුළුවන්වෙලා තිබෙනවා. ඒ වාගේම, තවදුරටත් ආයෝජකයන් හරහා අපේ වෙළෙඳ පොළ ශක්තිමත් කරමින් සංචාරක කර්මාන්තය වාගේ දේවල්වලින් අපේ ආදායම් වැඩි කර ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් අපට ඉතා කෙටි කාලයක් තුළ අනෙකුත් අවශ්‍යතා සඳහාත් වාහන ගෙන්වන්න පුළුවන් වෙයි.

ඒ වාගේම අපි ලබපු තවත් ජයග්‍රහණයක් තමයි, ලෝක බැංකු සමූහය මඟින් ඩොලර් බිලියනයක පැකේජයක් අපට ලබා දීම. ලෝකයේ තිබෙන ආයතන අපේ ආර්ථික කළමනාකරණය නිසා දිරිගැන්වීමක් හැටියට අපට දුන්නු පැකේජයක් ලෙස තමයි අපි එය දකින්නේ. කෘෂි කර්මාන්තය, සංචාරක කර්මාන්තය ඇතුළු විවිධ අංශවල -ප්‍රාදේශීය සංවර්ධනය සහිතව- රැකියා අවස්ථා වර්ධනය කර ගන්න මේ පැකේජයෙන් ලැබුණු ඩොලර් බිලියනයක මුදල් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා.

මේ වෙද්දීත් අපේ රටේ ජනතාවට LCs open කරලා වාහන ගෙන්වන්න පුළුවන්. හැබැයි, අපි බලාපොරොත්තු වෙනවා, අපේ ආදායම් හා අනෙකුත් ආර්ථික මට්ටම ස්ථායීකරණය කර ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අපේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය අනුව අපට පුළුවන් වුණා, පසුගිය මැතිවරණයෙනුත් අපේ රටේ ජනතාවට අලුත් බලාපොරොත්තු ටිකක් ඇති කරවන්න. මොකද, මේ මැතිවරණයෙන් වැඩිම සභික සංඛ්‍යාවක් -4,000කට ආසන්න සභික සංඛ්‍යාවක්- දිනපු තනි පක්ෂය තමයි ජාතික ජන බලවේගය. අපි තනි පක්ෂයක්. අනෙක් අය දැන් බලනවා කොහොමද විපක්ෂයේ ඔක්කෝම එකතු කරගෙන පක්ෂයක් හදන්නේ කියලා. හැබැයි, දැන් අපට පාර්ලිමේන්තුවේ අතිබහුතරයක් වාගේම, බිම් මට්ටමින් පළාත් පාලන ආයතනවල වැඩ කරන්න අතිවිශාල සභික සංඛ්‍යාවකුත් ඉන්නවා. මම හිතන විධියට ඒක අපි ලැබූ ලොකු ජයග්‍රහණයක්. අනිවාර්යයෙන්ම පළාත් පාලන ආයතන 267ක් වාගේ ප්‍රමාණයක බලය පිහිටුවා ගන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. අපි රටට හඳුන්වා දුන්නු අලුත් දේශපාලන සංස්කෘතිය තුළින් අපේ දරුවන්ට පුළුවන්කම ලැබුණා, පසුගිය දවස්වල පැවති පළාත් පාලන මැතිවරණය පැවති දිනට පසු දිනම පාසල්වලට ගිහිල්ලා ඉගෙන ගන්න. මැතිවරණයකින් පස්සේ ඇඳිරි නීතිය දමන්නේ නැති, භයක් සැකක් නැතිව කටයුතු කළ හැකි, ප්‍රශ්නයක් නැති අලුත් දේශපාලන සංස්කෘතියක් අපේ රටේ ඇති කරන්න අපට පුළුවන් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට හිතෙන විධියට ඒ අලුත් දේශපාලන සංස්කෘතිය මේ ඡන්දවලටත් වැඩිය වටිනවා. ඒ නිසා අපි හිතනවා, ඉදිරි කාලය තුළ විශාල පිරිසක් එක්ක ජනතාවගේ අවශ්‍යතා සඳහා කටයුතු කරන්න පුළුවන් මහක් තිබෙනවා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. G.G. Ponnambalam. You have nine minutes.

[பி.ப. 2.11]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Deputy Speaker, கடந்த மார்ச் மாதம் 28ஆம் திகதி அரசாங்கம் ஒரு வர்த்தமானி அறிவித்தலை வெளியிட்டு இருக்கின்றது. அதில் விசேடமாக, வட மாகாணத்தைச் சார்ந்த நான்கு மாவட்டங்களில் உள்ள காணிகள் தொடர்பாகக் குறிப்பிடப்பட்டு இருக்கின்றது. அதாவது, யாழ்ப்பாண மாவட்டத்தில் 3,669 ஏக்கரும் முல்லைத்தீவு மாவட்டத்தில் 1,703 ஏக்கரும் கிளிநொச்சி மாவட்டத்தில் 515 ஏக்கரும் மன்னார் மாவட்டத்தில் 54 ஏக்கருமாக மொத்தம் 5,941 ஏக்கர் காணிகளுக்குரிய உரித்தை, குறிப்பிட்ட பிரதேசங்களில் இருக்கக்கூடிய தனியார் தங்களுக்குரிய காணிகள் என உறுதிப்படுத்தாத பட்சத்தில் அவை அரச காணிகளாகப் பிரகடனப்படுத்தப்படும் என அதில் குறிப்பிடப்பட்டு இருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைக்கு வடக்கு, கிழக்கு தமிழர் தாயக நிலப்பரப்பில் வாழ்ந்துகொண்டு இருக்கக்கூடிய தமிழ் மக்களின் சனத்தொகைக்குச் சரிசமமான அளவினர் வெளிநாடுகளில் புலம்பெயர் தமிழ் மக்களாக வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்! அவர்கள் உயிர் அச்சுறுத்தல் காரணமாகவே இலங்கைத் தீவைவிட்டு வெளியேறினார்கள். அப்போது அவர்கள் தங்களுடைய அனைத்துச் சொத்துக்களையும் விட்டுவிட்டுத்தான் வெளியேறினார்கள். அவர்களில் பெரும்பாலானோர் சட்டவிரோதமாகத்தான் அந்த நாடுகளுக்குள் நுழைந்தார்கள். சட்டவிரோதமாக நுழைந்து, asylum கேட்கும் அளவுக்குத்தான் நிலைமைகள் இருந்தன. இன்றைக்கு ஈழத் தமிழர்களின் சனத்தொகையின் அரைவாசிப் பங்கினர் புலம்பெயர் தமிழ் மக்களாக வெளிநாடுகளில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். இந்தக் காணிகளின் உரிமையாளர்கள் நாட்டுக்குத் திரும்ப முடியாத நிலைமையில் வெளிநாடுகளில் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள் என்பதை நீங்கள் இதன்மூலம் விளங்கிக்கொள்ளலாம். அதுமட்டுமல்லாமல், வெளிநாட்டில் வாழ்கின்ற எங்களுடைய மக்களுக்குத் தங்களுடைய காணிகளை உறுதிப்படுத்த முடியாத நிலைமை கணிசமாக இருந்ததை இதற்கு முதலிருந்த அரசாங்கங்கள் ஏற்றுக்கொண்டிருந்தன.

வெளிநாடுகளில் வாழுகின்ற அந்த மக்களுடைய காணிகளில் போர் காலத்தில் சட்டவிரோதமாகக் குடியேறி யிருந்த மக்கள் prescription-writeஐ claim பண்ணமுடியாத வகையில் குறித்த சட்டத்தைத் தடுத்து வைத்திருந்தன.

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

புலம்பெயர்ந்த தமிழ் மக்களுடைய காணி தொடர்பான விடயத்தில் பாரதூரமான அநீதிகள் நடைபெறும் என்ற காரணத்தால்தான் அவ்வாறு செய்யப்பட்டது. இதற்கு முதல் ஆட்சி செய்த அரசாங்கங்களை 'இனவாதம்கொண்ட அரசாங்கங்கள்' என்று இந்த அரசாங்கம் சொல்கின்றது. ஆனால், அந்தளவு தூரத்துக்கு ஒரு பிரச்சினை இருக்கிறது என்பதை அவை விளங்கி இருந்தன.

இந்த அரசாங்கம் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை நீக்காமல், அதைத் தொடர்ந்து அமுல்படுத்திக்கொண்டு இருக்கின்றது. அப்படிப்பட்ட ஒரு சூழலில், புலம்பெயர் நாடுகளிலுள்ள அந்தக் காணிகளின் உரிமையாளர்கள் இங்கு வந்து, மூன்று மாதங்களுக்குள் தங்களுடைய காணிகளை உறுதிப்படுத்த முடியாத ஒரு நிலைமைதான் இன்றைக்கு இருக்கின்றது. இது புலம்பெயர்ந்த தமிழ் மக்கள் பற்றிய விஷயம்! அதைவிட, இன்றைக்கு வட, கிழக்குத் தமிழர் தாயகத்தில் வாழுகின்ற மக்கள் அவற்றுக்கான உரிமையைக் கோரக்கூடிய நிலையில் இருந்தும்கூட, அவர்கள் பல தடவை இடம்பெயரவேண்டிய - multiple displacements - நிலைமை ஏற்பட்டது. அதாவது, போர் காரணமாக எத்தனையோ தடவை தங்களுடைய அனைத்து சொத்துக்களையும் விட்டுவிட்டு ஓடவேண்டிய நிலைமை அவர்களுக்கு ஏற்பட்டது. அப்படிப்பட்ட ஒரு நிலைமையில், இந்தக் காணிகளை உறுதிப்படுத்துமாறு மூன்று மாத கால அவகாசம் கொடுப்பது ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயமா? என நான் கேட்கின்றேன். காணி சம்பந்தப்பட்ட விடயங்கள் தமிழருடைய இனப் பிரச்சினையின் அடிப்படைக் காரணம் என்பதை நீங்கள் விளங்கிக்கொள்ள வேண்டும். இது அரசாங்கத்துக்குத் தெரியாது என்று சொல்கின்றீர்களா?

தமிழர்களுடைய காணி சம்பந்தப்பட்ட இந்த விடயத்தை இந்தளவு தூரத்துக்கு நியாயமில்லாத வகையில், gazette notification ஒன்றின்மூலம் மூன்று மாத கால அவகாசத்தை வழங்கி, அக்காலப்பகுதிக்குள் அந்தக் காணிகளின் உரித்தை உறுதிப்படுத்தாவிட்டால், அவற்றை அரச காணிகளாகப் பிரகடனப்படுத்துவோம் என்று சொல்வது எந்தளவுக்கு நியாயமானது? திட்டமிட்ட வகையில், எங்களுடைய மக்களின் காணிகளை இயற்கை நீதிக்கு முரணாகப் பறித்தெடுத்து, அவற்றைக் குடியேற்றங்களுக்குப் பயன்படுத்தப் போகிறார்கள் என்பதை நான் இங்கு பொறுப்போடு கூறுகின்றேன். அதுதான் உண்மை! இது இந்த அரசாங்கம் நிலைமையைப் புரிந்துகொள்ளாமல் தவறாக, அவசரப்பட்டுச் செய்கின்ற ஒரு விஷயமல்ல! நான் இதற்கு முதலும் பல தடவை இதனை இந்தப் பாராளுமன்றத்துக்கு உள்ளேயும், வெளியேயும் சுட்டிக்காட்டி இருக்கின்றேன்.

இன்றைக்கு வட, கிழக்கில் இருக்கக்கூடிய இராணுவத்தினர் உட்பட முப்படையினர் அங்கு வாழுகின்ற தமிழ் மக்களை முழுக்க முழுக்க 'எதிரி' என்ற கண்ணோட்டத்தில்தான் பார்க்கின்றார்கள். இதற்கு முதலிருந்த அரசாங்கங்களைப்போல இந்த அரசாங்கமும் தமிழ் மக்களுடைய உரிமைகளை அங்கீகரிக்கத் தயாரில்லை. சுமார் 30 வருடங்கள் ஆயுத ரீதியாகப் போராடிய அந்த மக்களுடைய போராட்டம் தற்போது மௌனிக்கப்பட்டு இருந்தாலும்கூட, சிலவேளை எதிர்காலத்தில் மீளவும் அவர்கள் போராட முற்படலாம் என்ற பயம் காரணமாக திட்டமிட்ட வகையில், தமிழர் தாயக நிலப்பரப்பின் கரையோரப் பிரதேசம் முழுவதையும் சுவீகரிப்பதற்கான செயற்பாடுகள் இன்று நடைபெறுகின்றன. போர் காலத்தில் கடற்றொழிலைச் செய்ய முடியாத ஒரு நிலைமையை அந்த மக்களுக்கு ஏற்படுத்தினார்கள். அதன்மூலம், முழுமையாகத் தங்களுடைய வாழ்வாதாரத்தை இழக்கின்ற அளவுக்கு, தங்களுடைய வாழ்க்கையைக் கொண்டுநடாத்த முடியாத அளவுக்கு முற்றுமுழுதான ஒரு பொருளாதாரத் தடையை 30 வருடங்களுக்கும் மேலாக அவர்களுக்கு ஏற்படுத்தி, அந்த மக்களை ஏழ்மை நிலைக்குக் கொண்டுவந்தார்கள். அதனால் அந்த மக்கள் இந்த மண்ணில் வாழ முடியாதெனச் சொல்லி வெளியேறினார்கள். அவர்கள்தான் இன்று வெளிநாடுகளில் புலம்பெயர் தமிழ் மக்களாக இருக்கின்றார்கள்.

நீங்கள் திட்டமிட்ட வகையில், எமது மக்களுடைய பொருளாதாரத்தை அழிப்பதனூடாக இவ்வாறான காணி சுவீகரிப்பை மேற்கொள்கின்றீர்கள். நீங்கள் இதனை ஏற்கெனவே போர் காலத்தில் செய்தீர்கள்; இன்றைக்கும் அதைத்தான் செய்யப் போகின்றீர்கள். இதுதான் மிச்சம்! அந்த மக்களின் காணிகளுக்குரிய அடையாளங்களை நிரந்தரமாக இல்லாமல் செய்து, அவற்றைப் பறிக்கின்ற வேலைத் திட்டத்தை இன்றைக்கு இந்த அரசாங்கம் செய்யப் போகின்றது. இந்த அரசாங்கத்தினர் யார்? இதற்கு முன்னர் ஆட்சியிலிருந்த சிங்களக் கட்சியினர் அனைவரும் தமிழர்களுக்கு எதிராக இனவாதத்தைக் கக்கியவர்கள் என்றும் தாங்கள் புனிதவான்கள் என்றும் சொல்லி ஆட்சிக்கு வந்தவர்கள்தான் இந்த அநியாயத்தைச் செய்யப் போகின்றார்கள் என்பதை நான் இங்கு பொறுப்புடன் சொல்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இது வெறுமனே தமிழர்களை மட்டும் குறிவைக்கின்ற விடயமல்ல. திட்டமிட்ட வகையில், தமிழ் பேசும் மக்களைக் குறிவைக்கின்ற ஒரு விடயமாக இது மாறும். நீங்கள் வேண்டுமென்றால் எழுதி வையுங்கள்! இன்றைக்கு வட மாகாணத்தைக் குறிவைக்கின்ற இந்த விடயம், கிழக்கு மாகாணத்துக்கும் போகும். ஏன் இவ்வாறு நடைபெறுகின்றது? ஒன்றில், இந்த அரசாங் கத்துக்கு முதுகெலும்பு இல்லை அல்லது இராணுவத்தின் தமிழ் விரோதச் செயற்பாடுகளைத் தடுத்து நிறுத்துவதற்கும் அவர்களின் மனோநிலையை முற்றுமுழுதாக மாற்றுவதற்கும் இந்த அரசாங்கத்தால் இயலாது. இராணுவத்தின் மிக மோசமான இனவாதச் செயற்பாடுகளுக்கு இந்த அரசாங்கமும் துணைபோகின்ற வகையில், முற்றுமுழுதாக அதற்கு உடந்தை யாக இந்த அரசாங்கம் செயற்படுகிறது. இவ்வாறுதான் நாங்கள் இதனைப் பார்க்கின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அண்மையில் நடைபெற்ற உள்ளூராட்சி மன்றத் தேர்தலில் இந்த அரசாங்கம் தமிழர் தாயகமான வடக்கு, கிழக்கில் சந்தித்திருக்கின்ற பாரிய பின்னடைவைச் சரியான கோணத்தில் விளங்கிக்கொள்ள வேண்டும். இந்தத் தெளிவான செய்தியை இந்த அரசாங்கம் இன்றைக்காவது விளங்கிக்கொண்டு, இந்த வர்த்தமானி அறிவித்தலை உடனடியாக இரத்துச் செய்ய வேண்டுமென நான் கேட்டுக் கொள்கின்றேன்.

காணி சம்பந்தப்பட்ட விடயம் என்பது, தமிழர்களுடைய அடிப்படைப் பிரச்சினையுடன் சம்பந்தப்பட்ட விடயமாகும். நீங்கள் இந்த விடயம் தொடர்பில் தமிழ்த் தலைவர்களோடு ஓர் இணக்கப்பாட்டுக்கு வராமல் ஒருதலைப்பட்சமாக இதைச் செய்வீர்களாக இருந்தால், வடக்கிலும் கிழக்கிலும் இருக்கக் கூடிய தமிழ் பேசும் மக்களுக்கும் தெற்கில் இருக்கக்கூடிய சிங்கள மக்களுக்கும் இடையில் ஏற்படக்கூடிய நல்லிணக் கத்துக்கு முற்றுப்புள்ளி வைக்கப்படும். அப்படித்தான் நீங்கள் இந்த விடயத்தைப் பார்க்க வேண்டும். நீங்கள் இந்த

வர்த்தமானி அறிவித்தலை வாபஸ் பெறாவிட்டால், வடக்கு, கிழக்கிலுள்ள தமிழ் பேசும் மக்களுக்கும் தெற்கில் வாழ்கின்ற சிங்கள மக்களுக்கும் இடையில் நல்லிணக்கம் ஏற்படுவதற்கான வாய்ப்புகள் முற்றுமுழுதாக இல்லாமல் போகும். அவ்வாறான தொரு செயற்பாட்டைத்தான் நீங்கள் முன்னெடுக்கின்றீர்கள் என்று நான் இன்றைக்கு எச்சரிக்க விரும்புகின்றேன். தயவுசெய்து, நீங்கள் இதனைச் சிறிய விடயமாக எடுத்துக் கொள்ளாதீர்கள்! காணி என்பது ஓர் இனத்தின் அடிப்படைத் தேவையாகும். நீங்கள் அதில் கைவைப்பீர்களாக இருந்தால், ஒட்டுமொத்த தமிழ் இனத்தையும் எதிரிகளாக மாற்றப் போகின்றீர்கள் என்பதை நான் இங்கு திட்டவட்டமாகச் சொல்ல விரும்புகின்றேன். தயவுசெய்து, இந்த அரசாங்கம் அந்த வர்த்தமானி அறிவித்தலை உடனடியாக இரத்துச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன்.

[අ.භා. 2.22]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි මේ පාර්ලිමේන්තුවේ විවාදයට ගනිමින් තිබෙන්නේ රේගු ආඥා පනත යටතේ ගෙන එන යෝජනා සම්මතයයි.

මීට පෙර වාහන ආනයනය කිරීම නවත්වා තිබුණා. අපි දැන් වාහන ආනයනය කිරීමට තිබෙන බාධා ඉවත් කරලා, එහෙම නැත්නම් වාහන ආනයනය කිරීමට අවශ්‍ය රෙගුලාසි පනවලා ඒ කටයුතු නිදහස්ව කරගෙන යන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා.

පසුගිය 6වන දා පැවැති පළාත් පාලන මැතිවරණය පිළිබඳවත්, ඒ මැතිවරණයේ ප්‍රතිඵල පිළිබඳවත්, ඒ වාගේම හිතින් මවාගත් කාරණා පිළිබඳවත් බොහෝ මන්ත්‍රීවරු මේ සංවාදයට එකතු වෙමින් කථා කළා. ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා කථා කරමින් කිව්වා, ආණ්ඩුවත්, හමුදාවත් එකතු වෙලා උතුරු, නැඟෙනහිර ප්‍රදේශවල ජාතිවාදය පතුරන්න කටයුතු කරනවා කියලා. නමුත් අපි මේ කාරණය කියන්න ඕනෑ. මේ ආණ්ඩුව තමයි අපේ රටේ ජාතිවාදය පරදවපු ආණ්ඩුව; ජාතිවාදයට නැවත ඉඩ හදන්නේ නැතුව මේ සමාජය එකට එකතු කරපු ආණ්ඩුව; උතුරත්, නැඟෙනහිරත් ඇතුළුව මුළු රටම එක මිටකට ගෙනාපු ආණ්ඩුව. එම නිසා මේ රටේ උතුර, දකුණ ඇතුළු හතර කොනේ ඉන්න සියලුදෙනාට නිදහසේ සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් හදන අපේ ආණ්ඩුව ජාතිවාදයට කිසිදු ආකාරයකින් ඉඩ දෙන්නේ නැහැ කියන කාරණය අපි බොහොම වගකීමෙන් කියනවා.

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සමහර කාරණා පිළිබඳව බිල්ලන් මවන්න හදනවා. එම තත්ත්වය ඉතිහාසයේ ඉඳන්ම තිබුණා. උතුරේ ජනතාවගේ ඉඩම් පිළිබඳව සහ නැඟෙනහිර ජනතාවගේ ඉඩම් පිළිබඳව කථා කරනවා වාගේම, අපේ රටේ ඉඩම් අත් පත් කර ගත් දේශපාලනඥයන් පිළිබඳවත් ඉදිරියේදී අපි කථා කරනවා. මොකද, තැන් තැන්වල ඉඩම් අල්ලාගෙන යාළුවන්ට සහ විවිධ අයට විකුණපු ඉඩම් ඇති තරම් තිබෙනවා. උතුරේත් එහෙම ඒවා තිබෙනවා. එම නිසා උතුරේ ජනතාවගේ ඉඩම් අයිතිය තවදුරටත් ලබා දීලා ඒ ඉඩම්වල ඒ අයට වැඩ කරන්න අවස්ථාව ලබා දීලා උතුර සංවර්ධනයට අවශ්‍ය කරන ඉලක්කය ඇතිව තමයි අපේ ආණ්ඩුව කටයුතු කරමින් ඉන්නේ. ඒ කාරණා හුවා දක්වනවා නම් අපට කියන්න තිබෙන්නේ ඒ ටික තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැවැති පළාත් පාලන මැතිවරණය පිළිබඳව යමක් කියන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, ජනාධිපතිවරයෙකු, පාර්ලිමේන්තුවක් තේරී පත් වුණාට පසුව පවත්වන පළාත් පාලන මැතිවරණයේදී ජනතාවගේ උනන්දුව කොහොමටත් අඩු වෙනවා කියලා. ඒක මැජික් එකක් නොවෙයි. ඒත් ජාතික ජන බලවේගය පළාත් පාලන ආයතන 269ක් ජයග්‍රහණය කරලායි තිබෙන්නේ. අනෙක් හැම තැනම ප්‍රතිඵලය ගත්තත් පෙනෙනවා සමහර අය දිනුවා කිව්වත්, මන්ත්‍රී ධුර තමයි වැඩි වෙලා තිබෙන්නේ කියලා. ඒක මේ ඡන්ද ක්‍රමයත් එක්ක සිද්ධ වන දෙයක්. අනෙක් ඔක්කෝම එකතු වුණත් ඒ අය ජාතික ජන බලවේගය තරම් ඡන්ද අරගෙන නැහැ; අපේ ආණ්ඩුව අරගෙන තිබෙන තරම් ඡන්ද අරගෙන නැහැ. එම නිසා ආණ්ඩුවක් ලෙස අපි හොඳින් කටයුතු කරමින් ඉස්සරහට යනවා. එසේ කටයුතු කරමින් යන අතරතුර විපක්ෂය මොකක්ද කියන්නේ?

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද උදේ අදහස් දක්වමින් කිව්වා, real GDP growth එක පිළිබඳව. එතුමා දැන් මේ සභාව තුළ නැතත් අපි එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. අපි ආර්ථික වර්ධනය ගණනය කරනවා, පවත්නා වෙළෙඳ පොළ මිල අනුව, එහෙම නැත්නම් යථාර්ථය නියෝජනය කරන වටිනාකම් අනුව. පවත්නා වෙළෙඳ පොළ මිල අනුව ගණනය කරනවා කියන්නේ, අපේ ආර්ථිකය වාර්ෂිකව වර්ධනය වන ප්‍රමාණයයි; විශාලත්වයයි. අපි ඒක forecast කරනවා. අපි forecast එකක් හදනවා, ලබන අවුරුද්දේ මෙච්චරයි, ඊළඟ අවුරුද්දේ මෙච්චරයි, ඊළඟ අවුරුද්දේ මෙච්චරයි කියලා. එතුමා කියන්න උත්සාහ කළා, 2025දී real GDP growth එක සියයට 3.1යි, 2027දීත් සියයට 3.1යි කියලා. ඔව්, ඒක forecast එක. එතුමා කරුණු දැනගෙන එතුමා දන්නවා කියන එක ජනතාවට පෙන්වන්න හදනවාද දන්නේ නැහැ. එතුමා කරුණු දැනගෙන තමයි ඒ විධියට කියන්නේ. 2025දී අපේ දළ ජාතික නිෂ්පාදිතය, ඒ කියන්නේ GDP - Gross Domestic Product - එක සියයට 3.5යි. ඉදිරි ආර්ථික වර්ධනය පිළිබඳ අපි forecast එකක් හදලා තිබෙනවා. සත්‍ය ආර්ථික වර්ධනය - real GDP growth එක - සියයට 3.1ට තමයි අපි forecast කරන්නේ. 2024දී විතරක් නොවෙයි, 2030 වන කල්ම එම මට්ටමේම පවතීවි කියලා අපි හිතනවා. ඒකෙන් කියන්නේ නැහැ, real GDP growth එක එතැනම තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නැත්නම් මේ විධියට කියන්නත් පුළුවන්. නාමික - nominal - දළ ජාතික නිෂ්පාදනය 2025 වර්ෂයේ රුපියල් බිලියන 32,036යි; 2026දී රුපියල් බිලියන 34,754යි; 2027දී රුපියල් බිලියන 37,664යි; 2028දී රුපියල් බිලියන 40,779යි; 2029දී රුපියල් බිලියන 44,163යි; 2030දී රුපියල් බිලියන 47,826යි. 2025 වර්ෂයත් එක්ක, including 2025, ගත්තොත්, 2025 ඉඳලා 2030 දක්වා වන අවුරුදු 6ට GDP එක වැඩි වෙනවා, රුපියල් බිලියන 15,000කින්, රුපියල් බිලියන 32,000 ඉඳලා රුපියල් බිලියන 47,000 දක්වා. ඒ කියන්නේ, ආර්ථිකය නවතින්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි වර්ධන වේගයේ ප්‍රමාණය ගත්තොත්, සියයට 7.1යි; සියයට 8.5යි; සියයට 8.4යි; සියයට 8.3යි; සියයට 8.3යි; සියයට 8.3යි. මේ අපේ nominal එකට අදාළ forecast එක. සත්‍ය ආර්ථික වර්ධනය සියයට 3.1ක් කියලා අපි හිතනවා. මොකද, අපි හිතනවා ඩොලරයේ අගය යම් මට්ටමක පවත්වාගෙන යන්න ඕනෑ කියලා. එය තව ටිකක් අඩු කර ගන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, ඒක කළ යුත්තේ ක්‍රමිකව. ඒක එකවර කරන්න හොඳ නැහැ. එකවර කළොත් මොකද වෙන්නේ? එය එකවර කඩා වැටුණොත් එය අපනයනවලට බලපානවා. මොකද, ආනයනික ගිවිසුම්වලට ගිහිල්ලා ආනයනකරුවන් මාස දෙකතුනකට අමු ද්‍රව්‍ය ගෙන එනවා. ඒ ගේන්නේ ඩොලරයේ අගය රුපියල් 300ට තිබියදී කියලා

[ගරු වසන්ත සමරසිංහ මහතා]

හිතන්න. හැබැයි, ඒ ගොල්ලන් ඒ නිෂ්පාදන විකුණලා එනකොට ඩොලරයක අගය රුපියල් 200යි නම් ඒ ගොල්ලන්ට ඒ නිෂ්පාදනවලින් බරපතළ පාඩුවක් වෙනවා. ඒ නිසා real GDP එක හදද්දී අප ඒ forecast එක තියලා තිබෙන්නේ මේවාත් එක්ක බලලායි. ඒ නිසා මේක සියයට 3.1 නවතින්නේ නැහැ. නමුත්, මේ රටට බොරු කියන්න හදනවා, දන්නා මිනිස්සුත්. ඒකයි ඉතිහාසය පුරාවට සිද්ධ වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ කාලයේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා ආණ්ඩුවේ හිටියා. හැබැයි, ආණ්ඩුවේ ඉඳගෙන කරන්න බැරි වුණු දේවල් අද කියනවා, අපි රට වැටිලා තිබුණු තැනින් ගොඩ ගනිමින් තිබෙන විට. ජාතික ජන බලවේගය ආණ්ඩුව භාර ගන්න කොට මේ රට බංකොලොත් රටක්. බංකොලොත් රට ඒ බංකොලොත්භාවයෙන් මුදාගෙන ආර්ථිකය ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක අපි ඉන්නවා. ඒ වැඩ පිළිවෙළ ඇතුළේ මේ අවුරුද්දේ විතරක් රුපියල් බිලියන 1,400කට ආසන්න මුදලක් ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කරනවා. ඒ, ගමේ පාරවල් හදන්නයි, බෝක්කු හදන්නයි, ඇළ වේලි ටික හදන්නයි, ඉස්පිරිතාල ටික හදන්නයි, පාසල් ටික හදන්නයි. ඒ වාගේම, හදලා අතරමඟ නවත්වපු ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සමහර ව්‍යාපෘතිවල ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ. එම නිසා ඒ ව්‍යාපෘති නැවත ක්‍රියාත්මක කරන්න ඕනෑ; ඒවාට අදාළ මුදල් වෙන් කරන්න ඕනෑ. අපි ඒ වෙන් කිරීම් කරලා එක පැත්තකින්, ආර්ථික වර්ධනය ඇති කරන්න අවශ්‍ය කරන යටිතල පහසුකම් හදනවා. අනෙක් පැත්තෙන්, කර්මාන්තවලට සහ ආයෝජකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙමින්, ඒ ක්ෂේත්‍රවලට ආයෝජකයන් කැඳවන්න අවශ්‍ය පහසුකම් සකස් කරනවා.

ඒ වාගේම අපි සංචාරක ව්‍යාපාරය වැනි ක්ෂේත්‍රවලට අවශ්‍ය පහසුකම් ඉදිරියේදී දෙන්න ඕනෑ; බදු සහන දෙන්න ඕනෑ. ඒ වාගේම, නිෂ්පාදන කර්මාන්තවලට අවශ්‍ය සහන දෙන්න ඕනෑ. පොලිය අඩු මට්ටමක තියා ගන්න ඕනෑ. එහෙම වුණාම තමයි ආයෝජන වැඩි වෙන්නේ. ඒ නිසා තමයි මේ ආණ්ඩුව මෙවර අය වැයෙන් වැඩිහිටියන්ගේ -ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ- ඉතිරි කිරීම් සඳහා සියයට 3ක් වෙන් කර තිබෙන්නේ, අමතර පොලියක් ගෙවන්න. ඇයි ඒ? ආයෝජන සඳහා මුදල් තිබෙනවා. අයෝජන කරන්න විශ්වාසය හැදිලා ආයෝජන කරද්දී Return of Investmentත් - RoI එකත් - හොඳට තිබෙන්න ඕනෑ. පොලිය අඩුවට තිබුණොත් තමයි බැංකුවෙන් අරගෙන ආයෝජනය කරන්නේ. හැබැයි, පොලිය අඩු වන කොට තැන්පත්කරුවන්ට වැඩිපුර පොලියක් ගෙවා ගන්න බැංකුවලට බැරි වෙනවා. ඒ නිසා තමයි විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතුවලට පොලිය හැටියට අමතර සියයට 3ක් අපේ ආණ්ඩුව ලබා දෙන්නේ. පැති ගණනාවකින් රට ගොඩ නැඟීමට අවශ්‍ය වැඩ කරන කොට දැන් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇවිල්ලා අහනවා real GDP එක සියයට 3.1ම තියාගෙන යන්නේ කොහොමද කියලා. මේක forecast එක. මේක සියයට 4 වෙන්න පුළුවන්, සියයට 4.5 වෙන්න පුළුවන්, සියයට 6 වෙන්න පුළුවන්. 3.1ම නොවෙයි, සමහර විට එය සියයට 3ම වෙන්නත් පුළුවන්. අපේ උත්සාහය real GDP එක යම් ප්‍රමාණයකින් පවත්වාගෙන යැමයි. හැබැයි, nominal එක සියයට 7.1 ඉඳලා සියයට 8.3 දක්වා අපි ඉස්සරහට අරගෙන යනවා. සියයට 8.5ත් අපේක්ෂා කරන වර්ෂ තිබෙනවා. 2026 nominal එක සියයට 8.5යි. වෙළෙඳ පොළ මිල අනුවත් ගණන් හදන්න පුළුවන්.

දැන් ආර්ථිකය වර්ධනය වනවා කියලා දැන ගත්තාම, අපි ආර්ථිකය පවත්වාගෙන යනවා කියලා දැන ගත්තාම, ආර්ථික ඔස්තාර්ලා කියලා හිතාගෙන හිටපු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලාට හිතෙනවා "දැන් ආර්ථිකය හොඳින් පවත්වාගෙන යනවා නේ" කියලා. ඒ නිසා ඔස්තාර්ලා දැන් බොරු කියන්න පටන් ගන්නවා; භය ඇති කරවන්න පටන් ගන්නවා. හැබැයි, එහෙම භය ඇති කරලා ජාතික ජන බලවේගය ආණ්ඩුව -මේ ආණ්ඩුව- වට්ටන්න හෝ ආපසු හරවන්න හෝ මේ අයට බැහැ. ඇයි ඒ? මේගොල්ලන් කියන බොරු අහනවා නම් මිනිස්සු ඡන්දය දෙන්න එපායැ. පසුගිය මාස හයේ මේ පාර්ලිමේන්තුවේ උදේ වරුවේ බොරු කියන්න දඟලපු දැඟලිල්ල අපි දැක්කා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමන්ලාට මේ සභාව පාලනය කර ගන්න බැරි වුණා නේ. අත්දැකීම් තිබෙනවා කිය කියා බොරු කියනවා; අත්දැකීම් තිබෙනවා කිය කියා බොරු කියනවා.

අපට කියන්න තිබෙන්නේ මේකයි. මේ පළාත් පාලන මැතිවරණයේදීත් ජනතාව ජාතික ජන බලවේගය තෝරාගෙන තිබෙනවා. මුළු රටේම -උතුර, නැඟෙනහිර ඇතුළුම හැම තැනම- ජනතාවට වඩා හොඳින් ජීවත් වෙන්න පුළුවන් රටක් ජාතික ජන බලවේගය ආණ්ඩුව හදයි කියලා ජනතාව විශ්වාස කර තිබෙනවා.

ඒ නිසා අපි රට හදන වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවා. අපට ලැබුණු ඡන්ද ප්‍රමාණය ලැබුණේ උතුරින්ද, නැඟෙනහිරින්ද, දකුණින්ද, බස්නාහිරින්ද කියන එක අදාළ නැහැ, අපි ඒ හැම තැනම යනවා. ඉතිහාසයේ විශාල කාලයකට පස්සේ බස්නාහිර පළාතේ, විශේෂයෙන් කොළඹ මහ නගර සභාවේ බලය පවා අපේ ජාතික ජන බලවේගය අත්පත් කරගෙන තිබෙනවා. දැන් මේවා වෙනුවෙන් බොරු කියනකොට, කිඹුල් කඳුළු හලනකොට තමයි මේ ප්‍රශ්න එන්නේ.

අද මේ විවාදය ගත්තේ වාහන ආනයනයේදී පවතින සීමා නිදහස් කරලා වාහන ආනයනය කරන්න කටයුතු කරන්නයි. අපි අපේක්ෂා කරනවා මේ අවුරුද්දේ -ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ කථාව ඉදිරිපත් කරද්දීත් කිව්වා- ඩොලර් බිලියනයක පමණ වාහන ගෙන්වයි කියලා. හැබැයි, මේ වෙනකොට L/C open කරලා ඩොලර් මිලියන 400කට වඩා වාහන ගෙන්වනවා. ඒ තුළින් අපි අපේක්ෂා කරන ආදායමක් තිබෙනවා. මේ අවුරුද්දේ තව මාස 7ක් තිබෙනවා. මේ රටේ වාහන ගෙන්වන්න බලාගෙන හිටපු අය ඉන්නවා. ඒ අයට වාහන ගෙන්වන්න ඕනෑ. වාහනවල මිල ඉහළ ගිය එක පිළිබඳව දැන් ආණ්ඩුවට චෝදනා කරලා හරියන්නේ නැහැ. මේ රට බංකොලොත් කරපු, බැංකු කඩපු මිනිස්සු මේවාට වග කියන්න ඕනෑ.

මහ බැංකුව කඩලා, එහි බලපෑම ඇවිල්ලා රට ආර්ථිකමය ලෙස කඩා වැටිලා, බංකොලොත් රටක් බවට පත් වුණා. අපි දැන් ඒ රට හරි පාරට ගෙනැල්ලා ඉස්සරහට ඇදගෙන යනකොට ආපසු ඇවිල්ලා කියනවා, බයිසිකලයේ ගණන් වැඩියි කියලා, ත්‍රීවීලර් එකේ ගණන් වැඩියි කියලා. ඔව්. නමුත් මේ ආර්ථිකයට දරන්න පුළුවන් වන ප්‍රමාණයට අපි මේක තවත් නිදහස් කරනවා. ඒ විතරක් නොවෙයි. රට තුළ එකලස් කරපු වාහන කර්මාන්තය දියුණු කරන්න අවශ්‍ය කරන සාකච්ඡාවක් තිබෙනවා. මේ රටට ගෙන්වන motorcycle එක රුපියල් ලක්ෂ 6ක් වෙනකොට, ඒ බයිසිකලය හා සමානව රුපියල් ලක්ෂ හතරහමාරට විකුණන්න පුළුවන් බයිසිකලයක් අපේ රටේ කර්මාන්තකරුවෝ දැන් හදමින් ඉන්නවා. අපි ඒ අයට උදවු කරමින් සිටිනවා. මේ රට ඉස්සරහට අරගෙන යනකොට වෙළෙඳ පොළ තුළ පවතින තරගය ඇතුළේ තවත් මිල අඩු කර ඒ පහසුව ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරනවා. ආර්ථිකය හරි පාරට අරගෙන දුවද්දී ආර්ථික ඔස්තාර්ලාට දැනිලා තිබෙනවා, දැන් ආර්ථිකය දුවනවා, දැන් ඒ ගොල්ලන්ට දුවන්න පාරක් නැති වෙනවා කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒගොල්ලන්ට දුවන්න පාරක් නැති වෙනකොට ඒගොල්ලන් බොරු පාරේ දුවනවා. ඒ නිසා අපි ඒගොල්ලන්ට

කියනවා, බොරු පාරේ දුවන්න එපා කියලා. මේ රට වැටුණු රටක්. ඒ වැටුණු රට ගොඩනඟමින් තිබෙනවා අපේ ආණ්ඩුව. ඒ වැටුණු රට ගොඩනඟනකොට හරි දේවල් කියන්න, ඒවා අපි භාරගන්නවා. නිවැරදි කරන්න ඕනෑ දේවල් තිබෙනවා නම් අපට කියන්න, අපි හදාගන්නම්. හැබැයි, බොරු කිය කියා හොර පාරවල්වල දුවන්න එපා. හරි පාරේ එන්න. හරි පාරේ ඇවිල්ලා ආණ්ඩුවට විවේචනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා නම්, ඒක භාරගන්න ආණ්ඩුව ලෑස්තියි. බොරු පාරවල්වල ගියාම ඔබතුමන්ලාට ගොඩ එන්න බැරි වළවල්වල වැටෙනවා කියලා විපක්ෂයට මතක් කරනවා. ජාතික ජන බලවේගය මේ මැතිවරණ තුනම ජයග්‍රහණය කළා වාගේම, මේ රට ආපසු හරවන්න දෙන්නේ නැතිව, ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් පොහොසත් රටක් හදන්න ගෙන යන කාර්යභාරය අඛණ්ඩව ඉදිරියට ගෙන යනවා කියන කාරණය සහතික කරමින් මා නවතිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Mano Ganesan. You have three minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Aravinda Senarath to the Chair?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I propose that the Hon. Aravinda Senarath do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.*

[பி.ப. 2.35]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஓர் அவசரப் பிரச்சினையை உங்கள் மூலமாக இந்தப் பாராளு மன்றத்தில் அரசாங்கத்தின் கவனத்திற்குக் கொண்டு வருவதற்காக நான் இந்தச் சந்தர்ப்பத்திலே இங்கே எழுந்து நிற்கிறேன். கொழும்பின் தெற்குப் பகுதியிலேயுள்ள ஒரு பிரபலமான மகளிர் பாடசாலையின் முன்பாக, அந்தப் பாடசாலையிலே படித்த, கொழும்பிலே வாழ்ந்துவந்த ஒரு மாணவிக்கு நிகழ்ந்த அநீதிக்கு எதிர்ப்புத் தெரிவித்து பெற்றோர், பழைய மாணவர்கள், சமூக ஆர்வலர்கள் அரசியல் பேதங்களுக்கு அப்பாற்பட்ட முறையிலே கூடியிருக் கின்றார்கள். பொதுமக்கள் பாதுகாப்புப் பிரதியமைச்சர் சுனில் வட்டகல அவர்கள் இங்கே இருக்கின்றார். இந்த விடயத்தை அவருடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். அந்தப் பாடசாலைக்கு முன்னால் கூடியிருப்பவர்கள் கலகக்காரர்கள் அல்லர், பயங்கரவாதிகளும் அல்லர், ஆயுதப் போராளிகளும் அல்லர். அந்தப் பெண் பிள்ளைக்கு நிகழ்ந்த அநீதியைப் பொறுக்க முடியாமல், அதற்கான நியாயத்தைத் கேட்டு நிற்கிறார்கள். அவ்வாறு கூடியிருப்பவர்களுக்கு எதிராக உங்களுடைய பொலிஸார் கண்ணீர்ப் புகைக் குண்டுதாரிகளையும் நீர்த்தாரை பிரயோகிப்பவர்களையும் ஆயத்தமாக அங்கு அருகில் நிறுத்தியிருப்பதாக அறிகின்றேன்; அதை அவர்கள்மீது பயன்படுத்த வேண்டாமென்று திட்ட வட்டமாகக் கூறிவைக்க விரும்புகின்றேன். மீளவும் சொல்கின்றேன், அவர்கள் கலகக்காரர்களோ, பயங்கர வாதிகளோ அல்லர். சரியாகப் புரிந்து கொள்ளுங்கள்! நியாயத்தைக் கேட்டு வந்திருக்கக்கூடிய பொதுமக்கள்! அவ்வளவுதான்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அடுத்து குறித்த விஷயத்திற்கு வருகின்றேன். கடந்த வருட இறுதியிலே அந்தப் பிரபலமான பாடசாலையிலே 15 plus வயதுடைய ஒரு மாணவிக்கு ஓர் அநீதி நிகழ்ந்திருக்கின்றது. குறித்த மாணவி அந்தப் பாடசாலையின் ஆசிரியர் ஒருவரால் பாலியல் சேஷ்டைக்கு உள்ளாக்கப்பட்டமை சம்பந்தமாக எடுத்துப் பேசப்பட்டதன் விளைவாக, கல்வித் திணைக்கள விசாரணை, பொலிஸ் விசாரணை மற்றும் நீதிமன்ற விசாரணை நடத்தப்பட்டு, சம்பந்தப்பட்ட ஆசிரியர் கைது செய்யப்பட்டு, பிறகு பிணையில் விடுவிக்கப் பட்டிருக்கின்றார் என்று நினைக்கின்றேன். அது சம்பந்தமாக விசாரணை நடந்து கொண்டிருக்கின்றது. அதற்குப் பிறகு அந்தப் பிள்ளையின் பெற்றோர் அதிருப்தியடைந்து, தமது பிள்ளையின் நலன்கருதி அவரை வட கொழும்புப் பகுதியிலுள்ள ஒரு பாடசாலையில் சேர்த்திருக்கின்றார்கள். அந்தப் பாடசாலையில் படித்துக் கொண்டிருந்த அதேவேளையிலே, வட கொழும்புப் பகுதியில் இருக்கக்கூடிய ஒரு தனியார் tuition வகுப்பொன்றுக்கும் அவர் சென்று படித்து வந்திருக்கிறார்.

முன்னைய சம்பவம் நடந்து சில மாதங்களுக்குப் பிறகு, அந்தத் தனியார் கல்வி நிலையத்தின் நிறுவனரான ஆசிரியர் ஒருவர் ஏற்கெனவே நடந்த சம்பவத்தைக் குறிப்பிட்டு அந்தப் பிள்ளையைப் பலர் முன்னிலையில் அவமானப்படுத்தி யிருப்பதாகச் செய்தி வந்திருக்கின்றது. அதாவது, "ஏற்கெனவே நீர் கற்ற பாடசாலையில் உமக்கு இப்படியான ஒரு சம்பவம் நடந்திருக்கின்றதுதானே!" என்று சொல்லி அந்தப் பிள்ளையை அவமானப் படுத்தியிருக்கின்றார். அதனால் பாரிய மன உளைச்சலுக்குள்ளான அந்தப் பிள்ளை, சம்பவம் நடந்து சில நாட்களுக்குப் பிறகு, தனது வசிப்பிடத்தின் 7ஆம் மாடியிலிருந்து குதித்துத் தற்கொலை செய்து கொண்டிருக்கிறார். மிகப் பெரிய சோகமான செய்தி அது என்பதை மறந்து விடக்கூடாது! ஆகவேதான், முதலில் வட கொழும்பு, கொட்டாஞ்சேனைப் பகுதியிலிருந்து கிளம்பிய பெற்றோர், பழைய மாணவர்கள், சமூக ஆர்வலர்கள் என அப்பாவி மக்கள் எல்லோரும் சேர்ந்து ஊர்வலமாகச் சென்று, கொட்டாஞ்சேனையில் அந்த மாணவி படிக்கச் சென்ற தனியார் கல்வி நிலையத்திற்கு முன்பாக அமைதி ஆர்ப்பாட்டம் செய்து, பிறகு அந்தப் பிள்ளையின் வீட்டுக்கும் சென்று, அங்கேயிருந்து பேருந்திலே கொழும்பு தெற்கிலேயுள்ள பாடசாலைக்கும் சென்று ஆர்ப்பாட்டம் செய்து கொண்டிருக்கின்றார்கள்; இப்பொழுதும் அந்த ஆர்ப்பாட்டம் நடந்து கொண்டிருக்கின்றது.

[ගරු මනෝ ගනේසන් මහතා]

அங்கே வந்த கல்வித் துறைசார்ந்த அதிகாரிகள், "இது மாகாணப் பாடசாலை அல்ல, தேசியப் பாடசாலை. நீங்கள் பத்தரமுல்லைக்குச் செல்லுங்கள்!" என்று சொல்லியிருக்கின்றார்களாம். வேடிக்கையாக இருக்கிறது! அது தேசியப் பாடசாலையா அல்லது மாகாணப் பாடசாலையா என்பது இப்போதைய பிரச்சினையல்லை. இப்போது நாட்டிலே மாகாண சபை கிடையாது. ஆகவே, கல்வித்துறை அதிகாரிகளும் சரி, பொலிஸ் துறையினரும் சரி, அரசாங்க அமைச்சர்களும் சரி, இந்த விடயத்தில் அக்கறை செலுத்தி உடனடியாக விசாரணை நடத்த வேண்டும். ஏற்கனவே முதலில் நடந்த சம்பவம் தொடர்பில் வழங்கப்பட்ட தீர்ப்பில் நியாயம் கிடைக்காததால், அதில் மக்களுக்குத் திருப்தி இல்லாத காரணத்தினாலேதான் அவர்கள் இப்பொழுது அந்த ஆர்ப்பாட்டத்தைச் செய்துகொண்டிருக்கின்றார்கள். ஆகவே, தயவுசெய்து அரசாங்கம் உடனடியாக பொலிஸ் மற்றும் கல்வித்துறை சார்ந்த அதிகாரிகளைக் கொண்ட விசேட குழுவொன்றை நியமித்து, இந்த விடயம் பற்றி விசாரிக்க வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அந்த மாணவி கற்ற கொழும்பு தெற்குப் பகுதியிலேயுள்ள பாடசாலை எதுவென்று எனக்குத் தெரியும்; அந்தப் பிள்ளையின் பெயர் தெரியும்; தந்தையின் பெயர் தெரியும்; தாயின் பெயர் தெரியும்; வட கொழும்பில் பிள்ளை கற்ற பாடசாலையின் பெயரும் தெரியும். ஆனால், அவற்றைக் குறிப்பிடுவது முறையல்ல என்பதனால் நான் எதனையும் பெயர் குறிப்பிட்டுச் சொல்லவில்லை. நான் கண்ணியமாக அரசியல் செய்கின்றேன். ஆனால், ஒரேயொரு விடயத்தைச் சொல்கின்றேன். அந்தப் பிள்ளை படித்த வட கொழும்புப் பகுதியிலேயுள்ள தனியார் கல்வி அதிபர் - நிறுவனர் - உங்களுடைய கட்சி சார்ந்தவர். உங்களுடைய கட்சியின் வட கொழும்பு அமைப்பாளர் அவர் என்பதை மறந்துவிட வேண்டாம். ஆகவேதான், இந்த விடயத்தில் நியாயம் கிடைக்குமா என்பதில் சந்தேகம் இருக்கின்றது. மக்களுடைய சந்தேகம் நியாயம்தானே? நான் குற்றஞ்சாட்டவில்லை; சந்தேகம் இருக்கிறது. தயவுசெய்து அதை மனதில்கொண்டு, கவனத்தில் கொண்டு, அரசியல் அழுத்தம் இல்லாத நியாயமான விசாரணை நடத்தப்பட்டு, அந்தப் பிள்ளையின் மரணத்துக்கு நியாயம் கிடைக்க நடவடிக்கை எடுக்க வேண்டும். அந்தப் பிள்ளையின் உயிரை மீண்டும் கொண்டுவர முடியாது; அந்தப் பிள்ளையின் பெற்றோரின் சோகத்தை ஆற்ற முடியாது; அதை ஒழித்துவிட முடியாது. இதற்குக் காலம்தான் பதில் சொல்லி ஆகவேண்டும்.

ஆனால், இத்தகைய ஒரு கொடுமை இன்னொரு பிள்ளைக்கு நடந்துவிடக்கூடாது என்பதனால்தான் ஆயிரக்கணக்கான மக்கள் ஊர்வலமாக வந்து அங்கு கூடி, மழையில் நனைந்துகொண்டும் தமது எதிர்ப்பைத் தெரிவித்துக் கொண்டிருக்கிறார்கள். இது சம்பந்தமாக அரசாங்கத்திற்குப் பொறுப்பு இருக்கின்றது. இங்கே பொலிஸுக்குப் பொறுப்பான பிரதி அமைச்சர் அவர்கள் இருக்கின்றார்; மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அமர்ந்திருக்கின்றார்; அரசாங்கத்தின் பிரதான அமைச்சர்கள் இருக்கிறார்கள். இதனைக் கவனத்தில் எடுங்கள்! நான் நாகரிகமாகப் பேசுகின்றேன்; நான் யாரையும் குற்றஞ்சாட்டவில்லை. இரண்டு தினங்களுக்கு முன்னர்தான் தேர்தல் நடைபெற்றது. தேர்தல் காலத்திலே இதை நான் பெரிதாக எடுத்துப் பேசி அரசியல் இலாபம் தேடியிருக்கலாம். நான் அதை விரும்பவில்லை; கண்ணியமாக நடந்து கொண்டேன். அதே கண்ணியம், நியாயம், நேர்மை அரசாங்கத்திற்கும் இருக்கும் என்று நம்புகின்றேன். நன்றி.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමිය.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

நான் இந்த நேரத்தில் இதுபற்றிய தெளிவான விளக்கமொன்றைக் கொடுக்கவேண்டுமென்று நினைக்கின்றேன். குறித்த மாணவியின் இறப்பு கடந்த 29ஆம் திகதி நடைபெற்றதையடுத்து, அது தொடர்பில் பூரண விசாரணையொன்றுக்கான நடவடிக்கைக்காக நாங்கள் கடந்த நாட்களில் தேவையான ஆவணங்கள் அனைத்தையும் சேகரித்து வருகின்றோம். 2024 டிசம்பரில்தான் ஆரம்பச் சம்பவம் நடந்திருக்கின்றது. அந்தச் சம்பவம் தொடர்பாக நாம் தேடிப் பார்க்கும்போது, ஏற்கனவே அந்த மாணவி ஒரு மனநல வைத்தியரிடமிருந்து வைத்தியம் பெற்றதாகவும், அதுமட்டுமல்லாமல் பாலியல் துஷ்பிரயோகம் நடந்தது என்ற அந்தக் குற்றச்சாட்டுக்குப் பிறகு அதற்கான உரிய நடவடிக்கைகளுக்காக அந்த மாணவி தொடர்பான ஒரு JMO report பெறப்பட்டிருப்பதாகவும் தெரியவருகின்றது. அந்த மாணவி கல்வி கற்ற பாடசாலையில் அவருடைய தகைமைகள், திறமைகள் பற்றியும், அவர் பழகிவந்த அவரது நண்பர்கள், சிநேகிதிகளிடமிருந்தும் பெறப்பட்ட தேவையான ஆவணங்கள் அனைத்தையும் உள்ளடக்கி நாங்கள் இப்போது ஒரு file தயாரித்திருக்கின்றோம்.

அதற்கு மேலதிகமாக, குறித்த மாணவியின் மரணத்திற்குப் பிறகு அவருடைய தாய் தந்தையரிடம் கடந்த 5ஆம் திகதி காலையில் தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபைக்கு - NCPA - வந்து உரியமுறையில் முறைப்பாடொன்றைச் செய்யுமாறு நான் குறிப்பிட்டபோதிலும் இன்று 4 நாட்களாகியும் இதுவரையும் அவர்கள் அந்தச் சட்ட நடவடிக்கைக்காக முன்வரவில்லை. அதேபோல, இன்று இந்த ஆர்ப்பாட்டத்தின்போது மகஜர் ஒன்றைக் கையளிப்பதற்காகக் கல்வி அமைச்சுக்கும் மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுக்கும் வருவதாகக் கூறியபோது, "மகஜர் சமர்ப்பிப்பதற்கான சந்தர்ப்பம் வழங்கப்படும். ஆனாலும் அவருடைய பெற்றோர் வந்து எம்மைச் சந்திக்க வேண்டும்" என்று நான் குறிப்பிட்டபோதிலும் அவர்கள் இன்றும் வரவில்லை. நாளை அல்லது நாளைய மறுதினம் எங்களை வந்து சந்திப்பதாகக் கூறியிருக்கின்றார்கள்.

நான் கூற விரும்புகின்ற விடயம் என்னவென்றால், முகநூலின் மூலமாகவோ அல்லது சமூகவலைத் தளங்கள் மூலமாகவோ இதற்கு நீதியைக் கோர முடியாது. இதற்குரிய நீதியைப் பெற்றுக்கொள்ள வேண்டுமாகவிருந்தால், சட்ட நடவடிக்கைகளை மேற்கொள்ளக்கூடிய நிறுவனங்களுக்கு அவர்கள் வந்து சேர வேண்டும். இந்தச் சம்பவத்திற்கான துரித நீதியை நாங்களும் எதிர்பார்க்கின்றோம். ஆனால், நீதியைப்

பெற்றுக்கொள்வதற்கான சரியான - அணுகுமுறை - பொறிமுறை ஒன்று இருக்கின்றது. நாங்கள் இந்தச் சமுதாயத்தைச் சீர்படுத்த வேண்டிய கட்டாயத்தில் இருக்கின்றோம். சமூகவலைத் தளங்களோ, ஏனைய சமுதாய அமைப்புகளோ சட்டத்தைக் கையிலெடுப்பதன்மூலம் இந்த நாட்டில் அமைதி நிலவாது. ஆகவே, இந்த விடயம் சம்பந்தமாக நீதியைக் கோருவதற்காக உரிய அமைப்புகளுடன் தொடர்பு கொள்ள வேண்டுமென்று சம்பந்தப்பட்ட தரப்பினரிடம் நாங்கள் உறுதியாகக் கூறுகின்றோம். நன்றி.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர் அவர்களின் பதிலைக் கேட்டேன்; எனக்கு ஆச்சரியமாக இருந்தது. காரணம், பிள்ளையை இழந்த பெற்றோர் பாரிய மன உளைச்சலில் இருக்கிறார்கள். அவர்கள் தன்னைத் தேடி வந்து புகார் செய்யவில்லையென்று சொல்லிக்கொண்டிருக்க வேண்டாம். தயவுசெய்து அவர்களுடைய வீட்டுக்கு உங்கள் அமைச்சின் அதிகாரிகளை அனுப்புங்கள்! பொலிஸாரை அனுப்புங்கள்! தங்களின் பிள்ளையை இழந்தவர்களுக்குத்தான் அந்தத் துன்ப துயரம் தெரியும், கஷ்டம் தெரியும்! எனக்கும் பிள்ளைகள் இருக்கிறார்கள்; உங்களுக்கும் பிள்ளைகள் இருக்கிறார்களென்று நினைக்கின்றேன்; உங்களுக்கும் அது தெரியும். ஆகவே, அப்படிச் சொல்லாதீர்கள்! நான் சொன்னது போல அங்கு ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டிருப் பவர்கள் கலகக்காரர்கள் அல்லர்; பயங்கரவாதிகளும் அல்லர். அவர்கள் பிள்ளையை இழந்த அந்தக் குடும்பம் சார்பாக நீதி வேண்டிப் போராட வந்திருக்கிறார்கள். அவர்கள் யாரும் சட்டத்தைக் கையில் எடுக்கவில்லை. ஆர்ப்பாட்டம் செய்வதென்பது சட்டத்தைக் கையில் எடுப்பதென்பதல்ல! அப்படித் தயவுசெய்து கதையைத் திசைதிருப்ப வேண்டாம்!

அடுத்து, நீங்கள் பாராளுமன்றத்தில் இருந்துகொண்டு எதேச்சாதிகாரமாக அந்தப் பிள்ளையை மனநோயாளியாக வர்ணிக்க முயற்சி செய்வது தெரிகின்றது; அவ்வாறு சொல்ல வேண்டாம். நானே நாகரிகமாக குறித்த பிள்ளையின் பெயரைச் சொல்லவில்லை; பாடசாலையின் பெயரைச் சொல்லவில்லை; எதையும் வெளிப்படுத்தவில்லை. என்னால் அவற்றை வெளிப்படுத்த முடியும். ஆனால், நீங்கள் குறித்த பிள்ளையை மனநோயாளி என்று பாராளுமன்றத்தில் பேசுகின்றீர்கள். அதற்காக நீங்கள் அவமானப்பட வேண்டும். அப்படிச் சொல்லாதீர்கள்!

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
Sir, I rise to a point of Order.

நான் இது தொடர்பில் தெளிவுபடுத்த வேண்டும் என்பதற்காக மாத்திரம்தான் கூறினேன். ஆனால், நான் குறித்த மாணவி பற்றியோ, சம்பந்தப்பட்ட பாடசாலை பற்றியோ, ஆசிரியர் பற்றியோ எந்தவொரு பெயரையும் இங்கே குறிப்பிடவில்லை. இந்த விடயம் தொடர்பில் நான் கூற விரும்புவது,

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
அந்தப் பிள்ளையைப் பற்றி சொன்னீர்கள்.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
நான் அந்த பிள்ளையைப் பற்றி கூற வந்த விடயம் -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමියට පිළිතුරක් දීමට අවස්ථාව දෙන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

நான் அந்த மாணவியைப் பற்றிய பொலிஸ் விசாரணையின்போது, சமர்ப்பிக்கப்பட்டர்ப்ப ஆவணங்களின் அடிப்படையில்தான் இந்த விடயங்களைக் கூறினேன். அது தவிர, இன்று ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டவர்கள் என்னைச் சந்திக்க முயன்றபோது, அந்த மாணவியின் பெற்றோரை என்னை வந்து சந்திக்கும்படி கூறினேன். அந்தப் பிள்ளையின் பெற்றோர் அந்த ஆர்ப்பாட்டத்தில் கலந்துகொள்ளவில்லை. ஆனால், அந்த மாணவி படித்த பாடசாலை மாணவர்களின் பெற்றோர்கள்தான் அதில் ஈடுபட்டிருப்பதாக எங்களுக்குத் தெரிவித்திருந்தார்கள். அதைப்பற்றி எந்தப் பிரச்சினையும் கிடையாது; மக்கள் நீதி கோர முடியும். இருந்தாலும், நீதி, நியாயத்தைச் சட்டத்துடன் தொடர்புடைய நிறுவனங்களின் ஊடாகப் பெறவேண்டுமே தவிர, சட்டத்தை யாரும் கையிலெடுக்க முடியாது. *[இடையீடு]* ஆகவே, இந்தச் சம்பவத்தை எந்தக் காரணம் கொண்டும் திசை திருப்ப முயற்சிக்க வேண்டாம். அந்த மாணவி பற்றி சமர்ப்பிக்கப்பட்ட தகவல்களை மாத்திரம்தான் நாங்கள் கூறினோம்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ විවාදයකට යා යුතු නැහැ. ගරු ඇමතිතුමිය පිළිතුරක් ලබා දෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද බම්බලපිටිය පොලීසියෙන් මේ සම්බන්ධයෙන් විමසා සිටියා. ඒ අවස්ථාවේ මාහට දැනුම් දුන්නා, දැනටමත් මේ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා, "බී" වාර්තාවක් මඟින් ගරු

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

අධිකරණයට දැනුම් දීලා තිබෙනවා, ඔහු අත්අඩංගුවට අරගෙන තිබෙනවා කියලා. ඇප ලබා දෙනවාද, නැද්ද කියන එක ගරු අධිකරණයේ වැඩක්. ඒක තීරණය කරන්න අපට - දේශපාලන අධිකාරියට - කිසිසේත්ම හැකියාවක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බම්බලපිටිය පොලීසිය මට වාර්තා කළා මේ පිළිබඳව. ඇත්ත වශයෙන් උද්ඝෝෂණයක් සිද්ධ වෙලා තිබෙනවා. ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කියන එක ඇත්ත. සිත් තැවුලක් ඇති වෙලා තිබෙනවා. ඒ දැරිය වෙනුවෙන් අපි කනගාටු වෙනවා. අපි හැමෝම කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට කිසිදු අඩුවක් නැතිව අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. පොලීසිය වැඩිදුර වාර්තාවක් මඟින් ගරු අධිකරණයට කරුණු දැනුම් දෙන බව කිව්වා, උද්ඝෝෂණත් ඇති වෙච්ච නිසා. ඒ නිසා මේ පිළිබඳ යුක්තිය ඉෂ්ට වීමේ අඩුවක් සිද්ධ වෙලා නැහැ. මේ සිද්ධිය පිළිබඳ විමර්ශන සිදු වෙනවා. අපි කනගාටුව ප්‍රකාශ කරනවා මේ දැරියට සිදු වූ දේ පිළිබඳව. රාජකාරියේදී කිසිදු අඩුවක් මේ වනවිට සිද්ධ වෙලා නැහැ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන විවාදයකට යා යුතු නැහැ. ඉක්මනින් අදහස් ඉදිරිපත් කරන්න, කාල වේලාව නොමැති නිසා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මෙතැන සිදුවීම් දෙකක් තිබෙනවා. පළමුවැනි සිදුවීම වුණේ ගිය අවුරුද්දේ අවසානයේ. ඒ, දකුණු කොළඹ පාසලේ. දෙවැනි සිදුවීම වුණේ මේ දැරිය ඒ පාසලෙන් අස් කරලා මාසයකින් පස්සේ. Stress එක නිසා ඇය counselling ගියා. ඊට පසුව තමයි ඇය මිය ගියේ. ඇය හතරවැනි තට්ටුවෙන් පැනලා මිය ගියා. ඒකට හේතු වුණේ ටියුෂන් පන්තියේ හිටපු ගුරුවරයා - අයිතිකරු - අනෙක් ළමයි ඉදිරිපිට ඇයට බැණලා තිබෙනවා; ඇය අවමානයට පත් කරලා තිබෙනවා; ඇයට insult කරලා තිබෙනවා. ඒකයි ඇය stress වුණේ. පළමුවැනි සිදුවීම වෙනයි. ඒකට අදාළව පොලීසියේ "බී" වාර්තා ඔක්කොම හරි. ඒ ගැන සොයලා බලන්න. මම මේ කාරණය සද්භාවයෙන් කියන්නේ. මම මේ දේශපාලනය කථා කරනවා නොවෙයි. දේශපාලනය කථා කරනවා නම් ඊයේ පෙරේදා කථා කරන්න තිබුණා නේ. මම කථා කළේ නැහැ නේ. මට අවස්ථාව තිබුණා නේ, දේශපාලනය කථා කරන්න. අපි මැතිවරණයකට මුහුණ දුන්නා නේ. මම එවැනි මිනිහෙක් නොවෙයි. මම සද්භාවයෙන් මේ කියන්නේ. දෙවැනි සිදුවීම කළේ ඔබලාගේ ජාතික ජන බලවේගයේ පක්ෂයේ උතුරු කොළඹ සංවිධායක. ඔහු තමයි ඒ අයිතිකරු. තේරුම් ගන්න. මම පක්ෂයට දොස් කියනවා නොවෙයි. නමුත් මේක වැරදියි. මේ ගැන පොඩ්ඩක් සොයලා බලන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බම්බලපිටිය පොලිස් ස්ථානාධිපතිවරයා මාහට වාර්තා කළා, දෙවැනි සිද්ධියට අදාළවත් දැන් නීති කෘත්‍ය ආරම්භ වෙලා තිබෙන්නේ කියලා. එච්චරයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම මේක මතු කරන්නේ ස්ථාවර නියෝග 92(2) යටතේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ සිදුවීමට අදාළවද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේ සිදුවීමට අදාළව Parliamentary Privileges breach කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ සිදුවීමට අදාළව නම් මේ අවස්ථාවේ ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ.

ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම කියන එක අහන්න. ස්ථාවර නියෝග 92(2) යටතේ කියන්නේ. මම කියන්නේ මේ සිද්ධියට අදාළ එකක් නොවෙයි.

Sir, I rise to a point of Order. මගේ point of Order එකත් අහන්න.

[අ.භා. 2.49]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රේගු ආඥා පනතේ (235 අධිකාරිය වූ) "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය පිළිබඳ තමයි අද අපි මේ සාකච්ඡා කරමින් සිටින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැසට් පත්‍රය මඟින් අපි ප්‍රධාන කරුණු කිහිපයක් ගැන සාකච්ඡා කරනවා. අපි මෙමඟින් මූලික අරමුණු කිහිපයක් ඉෂ්ට කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. අපි මේ හරහා රාජ්‍ය ආදායමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම රටේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි මේ රටට වාහන ආනයනය කිරීම නවත්වලා තිබුණේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, මිනිත්තුවක් ඇතුළත ඔබගේ අදහස ඉදිරිපත් කරන්න.

***[මේ අවස්ථාවේදී, 2025.03.19 දිනැති ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි ගරු රාමනාදන් අර්ච්චුනා මහතාගේ කථාවේ සජීවී විකාශය අත්හිටුවන ලදී.]***

*[இச்சந்தர்ப்பத்தில், 2025.03.19ஆந் திகதிய மாண்புமிகு சபாநாயகரின் கட்டளைப்படி மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரையினது நேரடி ஒளி/ஒலிபரப்பு இடைநிறுத்தப்பட்டது.]*

*[At this stage, as per the Order made by Hon. Speaker on 19.03.2025, the live telecast of the Hon. Ramanathan Archchuna's speech is suspended.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කරුණාකරලා ස්ථාවර නියෝග 92(2) කියවන්න. ඒ අනුව, MP කෙනෙකුට point of Order එකක් raise කරන්න පුළුවන් කියලා සඳහන් වෙනවා. එය raise කළාට පස්සේ ඒක වැරැදි නම්, වැරදියි කියන්න. Thank you very much. මගේ live telecasting එක නවත්වන්න.

මෙතුමිය කියලා තිබෙනවා, ඒ ළමයාට මානසික ලෙඩක් තිබුණා කියලා. මානසික ලෙඩක් තියනවා කියන්න කවුරු හෝ doctor කෙනෙක් ඒක certify කරලා දෙන්න ඕනෑ. එතකොට, මෙතැන බරපතළ බොරුවක් කියනවා. තමන්ගේ දරුවෙකුට මෙහෙම කියනවාද? තමන්ගේ දරුවෙකුට මෙහෙම කියන්න පුළුවන්ද? මේක කොච්චර මෝඩ කථාවක්ද කියන්නකෝ. එහෙම නම් doctor කෙනෙක් medical certificate එකක් දෙන්න ඕනෑ, මේ ළමයාට මානසික ලෙඩක් තිබෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මට පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, මම ඒක හිතා මතා කියපු කථාවක් නොවෙයි. කාන්තා සහ ළමා කටයුතු ඇමතිවරිය හැටියට මට ලැබුණු තොරතුරක් ගැන විමර්ශනය කරන්න අපි විස්තර වාර්තාවක් ගත්තා. ඒ පිළිබඳ අපි අමාත්‍යාංශය මට්ටමින් මාධ්‍ය නිවේදනයකුත් නිකුත් කරන්නට යෙදුණා. එතැනදී ලැබුණු වාර්තාව අනුව, ඒ දරුවා ප්‍රතිකාර ලබා ගත් වෛද්‍යවරයා කලින් වතාවේ ඉදිරිපත් කරලා තිබුණු සහතිකයත් එක්ක තමයි මම ඒ තොරතුර කිව්වේ. ඒක මම හිතලා කියපු එකක් නොවෙයි. මේ සිදුවීම පිළිබඳව තවම විමර්ශන සිදු වෙනවා. இது பற்றிய விசாரணை நடந்துகொண்டிருக்கின்றது. *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විවාදයකට යන්න බැහැ. ගරු ඇමතිතුමිය පිළිතුර ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
ඒ වාර්තාව - [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒක වැරදි දෙයක්. ඒ වාර්තාව විමර්ශනය සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ අදාළ වාර්තාවේ ප්‍රතිකාර ගන්නා බවට තොරතුරු - [බාධා කිරීමක්] නැහැ, ඒ ලබා දීපු තොරතුර විතරයි. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමන්ලා, මේ අවස්ථාවේදී ඔය කරුණ ගැන විවාදයකට යා යුතු නැහැ. *[බාධා කිරීමක්]* අර්ච්චුනා මන්ත්‍රීතුමා ඔබතුමාට අවස්ථාව දුන්නා. *[බාධා කිරීමක්]* එතැන point of Order එකක් නැහැ, පැහැදිලිවම. *[බාධා කිරීමක්]* එතැන point of Order එකක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
*ඒක තීරණය කරන්නේ අපි නොවෙයි, අධිකරණය. [බාධා කිරීමක්] ඒක අධිකරණය තීරණය කරයි. ඒක අපේ වාර්තාවක් නොවෙයි. ඒක අධිකරණයයි තීරණය කරන්නේ.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයට ඇමතිතුමිය පිළිතුරක් ලබා දුන්නා. එය ප්‍රමාණවත් වෙයි කියලා විශ්වාස කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්නේ point of Order එකක්ද?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
නැහැ, පැහැදිලි කිරීමක් කර ගන්නයි ඕනෑ. මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමිය, ඔබතුමිය කියපු කාරණය පිළිබඳවයි මම කථා කරන්නේ. ඒ කාරණය ඉතාම සංවේදී කාරණයක්. එකක් තමයි, ඇය පාසල් ශිෂ්‍යාවක්. ඒ වාගේම ඒ ශිෂ්‍යාවගේ වෛද්‍ය වාර්තා සමාජගත කිරීම පිළිබඳවත් ඔබතුමිය දෙපාරක් කල්පනා කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒ වාගේම, මෙතැනදී චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා, ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂයටත්. මම මේ කාරණය දේශපාලනීකරණය කරනවා නොවෙයි. අපි මේ ගැන මැතිවරණ වේදිකාවල කථා කළේත් නැහැ. හැබැයි, මේක පළමුවැනි වතාව නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකරලා ඉක්මනින් ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

මේ සඳහා ආණ්ඩුව මැදිහත් වෙන්න ඕනෑ. මොකද, එක පැත්තකින් නවක වදය සම්බන්ධ ගැටලුවක් තිබෙනවා. මේ දරුවා වෙනුවෙන් ආණ්ඩුව මැදිහත් වෙන්නත් ඕනෑ.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

ඇත්තටම ගත්තොත්, මේක පරණ සිදුවීමක්; 2024 දෙසැම්බර් මාසයේ ඉඳලා ඇදෙමින් ආපු සිදුවීමක්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

නැහැ, නැහැ. ඊයේ - *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමන්ලා, මේ ගැන විවාදයකට යා යුතු නැහැ. ගරු ඇමතිතුමියට පිළිතුරක් දීමට අවස්ථාව දෙන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)

ඒ, සිද්ධි දෙකක්. *[බාධා කිරීම්]* මට අවස්ථාව ලබා දෙන්න, පැහැදිලි කිරීමට. ඊට පසුව ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]* මම මෙතැනදී පැහැදිලිවම කියන්න ඕනෑ, ඒ වාර්තාව දෙන්නේ අපි කවුරුවත් නොවෙයි කියන එක. *[බාධා කිරීම්]* ඒ සිදුවීම ගැන අපි අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. *[බාධා කිරීම්]* ඊට අමතරව ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදු වෙනවා. හෙට උදේට එම දෙමව්පියන් අප හමු වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව. *[බාධා කිරීම්]* ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාව දුන්නා. දැන් ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමාගේ වෙලාව. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආනයන බදු පිළිබඳව තමයි අද අපි කථා කරන්නේ. මේ සාකච්ඡාවේදී මම කියන්න ඕනෑ, මේ ගැසට් නිවේදනය මඟින් මූලික අරමුණු කිහිපයක් ඉෂ්ට කිරීමට බලාපොරොත්තු වන බව. එකක් තමයි, රටේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි, වාහන ආනයනයට පනවා තිබුණු තහනම ඉවත් කිරීම. ඒ වාගේම මේ රාජ්‍ය ආදායමට අවශ්‍ය මුදල් සම්පාදනය කිරීමත් විශේෂයෙන්ම මෙතැනදී සාකච්ඡා වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වාහන ආනයනය කිරීම මේ රජය අදියර කිහිපයකින් සිදු කරනු ලැබුවා. අපි ප්‍රථමයෙන්ම මගී ප්‍රවාහනයට අවශ්‍ය බස් රථ ආනයනය කළා. වාණිජ ක්ෂේත්‍රයට අවශ්‍ය වාහන දෙවැනි අදියර යටතේ ගෙන්වනු ලැබුවා. අද අපි මේ සාකච්ඡා කරන පෞද්ගලික වාහන ගෙන්වීමත් මීන් අනතුරුව සිදු කරනවා. අද අපි විවාදයට භාජන කරන්නේ අන්න ඒ තුන්වැනි category එකට අදාළ යෝජනා සම්මතයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියයට 20ක් තමයි මේ සඳහා බද්ද තිබුණේ. ඒකට අමතර සියයට 10ක බද්දකුත් එකතු කරලා, සියයට 30ක් විධියට තමයි ඒ බදු අනුපාතය නිර්මාණය වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, වාහන ආනයනය තහනම් කර තිබිලා ඒ තහනම ඉවත් කරනකොට ඒක රටේ ආර්ථිකයට දැවැන්ත ලෙස බලපාන බව. අපි දන්නවා, ඒක විදේශ සංචිතවලට එක ආකාරයකින් බලපාන බවත්, ඒ වාගේම ඩොලරයේ අගයට, රුපියලේ ස්ථාවරභාවයටත් ඒකෙන් බලපෑමක් තිබෙන බවත්. මෙන්න මේ කරුණු දෙක කෙරෙහි දැඩි අවධානයක් යොමු කරලා, ඒ පිළිබඳව සාකච්ඡා කරලා, විශ්ලේෂණය කරලා තමයි අපි මේ තීන්දුව අරගෙන තිබෙන්නේ. මෙන්න මේ වාගේ තීරණ හරහා තමයි මේ රටේ මහ ජනතාවට අවශ්‍ය පෞද්ගලික වාහන ආනයනයට අවශ්‍ය වටපිටාව, ඒ වාතාවරණය නිර්මාණය වෙන්නේ, මේ රටේ ආර්ථික ස්ථාවරභාවය, ආර්ථික ස්ථායීකරණය හරහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සහ මේ උත්තරීතර සභාවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි, 2024 වර්ෂයේ සැප්තැම්බර්වලට එහා පැවති කාල පරිච්ඡේදයට. අද අපි ඉන්නේ 2025 වර්ෂයේ මැයි මාසයේ. ඔබතුමන්ලා දකිනවා, අද වෙනකොට මේ රටේ ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලනික ව්‍යුහයේ දැවැන්ත වෙනසක්, පරිවර්තනයක් වෙලා තිබෙන බව. අපි දැක්කා, ඒ කාලයේ ඒ දේවල් තිබුණේ කොහොමද කියලා. ජනතාවට වග කියන්නේ නැති, රාජ්‍ය සම්පත් හිතු හිතු පරිදි තමන්ගේ භාරයේ තබාගෙන තමන්ගේ සහචරයන්ට හිතු හිතු සේ රාජ්‍ය සම්පත් භුක්ති විඳින්න ඉඩ ලබා දුන් රාජ්‍ය පාලන ක්‍රමයක් අපි ඒ කාලයේ දැක්කා. රටේ ඉහළම කණ්ඩායම් මේ රටේ නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කළ ආකාරය අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. සමහර සහචර කල්ලි තමන්ට අවශ්‍ය ආකාරයට මේ රටේ විවිධ දූෂණ කළා. ඔවුන් මොනවාද කළේ? මේ රට තුළ අනීතික ලෙස මත්පැන් වෙළෙඳාම, මත් ද්‍රව්‍ය වෙළෙඳාම කළා. ඒවා ජාවාරම්. ඒ විතරක් නොවෙයි. මේ රටේ අපරාධ ජාලය මෙහෙයවූයේ, ඒවාට නායකත්වය දුන්නේ මේ රටේ සිටි ඒ දූෂිත දේශපාලනඥයන්. එවැනි තත්ත්වයක් තමයි මේ රට තුළ 2024 වර්ෂයට කලින් පැවතුණේ. අපි දැක්කා, මේ රටේ රාජ්‍ය ආයතන අනියමින් කඩා බිඳ දමපු ආකාරය. ඒ සියල්ලම කළේ තමන්ගේ පෞද්ගලික ව්‍යාපාර, තමන්ගේ වෙළහෙළඳාම් දියුණු කරගන්නයි. එහෙම වාතාවරණයක් තමයි මේ රටේ තිබුණේ. එහෙම තිබුණු රටක් තමයි අද වෙනකොට අපි මේ වෙනස් කරලා තිබෙන්නේ. එහෙම වෙනස් කළ රාජ්‍ය නායකයන් සහිත රාජ්‍යයකට කොහොමද බොරු කියනවා කියලා අවලාදයක් නඟන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බිඳ වැටුණු රට සහ රටේ ආර්ථිකය මාස කිහිපයක් ඇතුළත ස්ථාවර කරගන්න අපට පුළුවන් වුණා. අපි එවැනි පරිවර්තනයක් කරමින් තමයි මේ ඉන්නේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට භාර ගැනීමට සිද්ධ වුණේ බංකොලොත් රාජ්‍යයක්. අපි දන්නවා, අන්තර්ජාතික ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මේ රටට දීලා තිබුණු තත්ත්වය. "D" - Default - state එකේ අපි හිටියේ. නමුත් අද වන විට "D"වලින් පියවර දෙකක් ඉස්සරහට ඇවිල්ලා CCC+ තත්ත්වයේ අපි ඉන්නේ. එවැනි වෙනස්කම් කරමින් තමයි අපේ මේ ආණ්ඩුව මේ රට ඉස්සරහට ගෙනියන්නේ.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා දන්නවා, මේ රට brand වෙලා තිබුණේ කොහොමද කියලා. ඒ, ඉන්න හිටින්න සුදුසු රටක් විධියට නොවෙයි. මේ රටේ හිටපු වෙළෙඳ ව්‍යාපාරිකයන්, වෘත්තිකයන්, රාජ්‍ය සේවකයන් විශාල පිරිසක් මේ රට හැර ගියා. එවැනි වාතාවරණයක් තමයි මේ රට තුළ තිබුණේ. විශාල පිරිසකට රැකියා අහිමි වෙලා තිබුණා. මේ රටේ මිනිස්සු බදු බරින්, ජීවන බරින් මහත් පීඩාවකට පත් වෙලා හිටියේ. මුළු සමාජයම ආතතියට පත් වෙලා හිටියේ; stressful society එකක් තිබුණේ. හැබැයි, හිටපු පාලකයෝ සියලු සැප පහසුකම් භුක්ති වින්දා. නමුත් ඔබතුමන්ලා දන්නවා, ගත වුණු මේ කෙටි කාලය තුළ මේ රටේ ආර්ථිකයේ ස්ථායීතාවක් ඇති වෙලා තිබෙන බව. ඒ අනුව නියමිත දිශානතියකින් අපි මේ රට ඉස්සරහට ගෙනයනවා. දැරීමට බැරි තරම් වූ ආර්ථික උද්ධමනය දැන් අවම මට්ටමකට එමින් පවතිනවා. ඒ වාගේම අපි දකිනවා, ඩොලරයේ වටිනාකම රුපියල් 300 ආසන්නයේ තිබෙන බව. හැබැයි, අපට අවලාද නැඟුවේ ඩොලරයේ වටිනාකම රුපියල් 500ට යයි කියලායි.

අපි දන්නවා, මේ වන විට මේ රට සංචාරකයන්ගෙන් පිරී පවතින බව. සංචාරකයන් විශාල පිරිසක් මේ රටට එමින් පවතිනවා. ජනවාරි සිට මේ දක්වා වූ කාලය දිහා බලනකොට, මේ රටේ අපනයන ආදායම විශාල වශයෙන් වැඩිවී පවතින බවක් අපට පෙනෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කාර්මික සංවර්ධනයට අවශ්‍ය නව කාර්මික ජනපද බිහි කිරීමට අවශ්‍ය සැලසුම් මේ වන විට නිර්මාණය වෙමින් පවතිනවා.

ඔබ-අපි දන්නවා, අඩපණ වෙලා තිබුණු පරන්තන් රසායනික කම්හල, වාලච්චේනයි කඩදාසි කම්හල, අලිමංකඩ ලුණු ලේවාය වාගේ කර්මාන්තශාලා මේ වන විට සක්‍රිය කරමින් මේ රටේ නිෂ්පාදන ආර්ථිකය පණ ගන්වමින් තිබෙන බව. එහෙම නම් කොහොමද ටොම් පච කියනවා කියලා ජාතික ජන බලවේග රජයට අවලාද නඟන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට පැමිණි සෘජු විදේශ ආයෝජකයන් - direct investors - මේ රට හැර ගිය බව අපි දන්නවා. උදාහරණයක් විධියට ගත්තොත්, ජපන් ව්‍යාපෘති 12ක් මේ රටේ ක්‍රියාත්මක වුණා, චීන ව්‍යාපෘති හැත්තෑ ගණනක් තිබුණා, පසුගිය කාලයේ ඒ ආයෝජකයන් ඒ ව්‍යාපෘති අත හැර ගියා.

දැන් බලන්න, ඒ ව්‍යාපෘති නැවතත් සක්‍රිය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ රටට බාහිර පරිසරයෙන්, විදේශීය වශයෙන් එල්ල වන සියලු ආර්ථික අභියෝග මනා ලෙස කළමනාකරණය කරමින් ඉස්සරහට යන බව ඔබ දකිනවා. ඒකට හොඳම උදාහරණය තමයි, ඇමෙරිකානු ජනාධිපතිතුමා මෑතකදී පනවනු ලැබූ US tariff එක. මේ අවස්ථාව, කළමනාකරණය කරමින් ලංකාවට යහපත් ලෙස එය සකස් කිරීමට අවශ්‍ය ඒ සියලු වටපිටාව, ඒ සාකච්ඡා, ඒ දූත මෙහෙවර මේ මොහොතේ සිදු වෙනවා. ඒ විතරක් නොවෙයි. ඉතා මෑතකදී මෙරට සංචාරය කරපු ලෝක බැංකු සභාපති අජේ බංගා මහත්මයා මේ රටට ඩොලර් බිලියනයක ආධාර package එකක් ලබා දීමට එකඟ වෙලා තිබෙනවා. මෙන්න මේ හරහා මේ රටේ ක්ෂේත්‍ර විශාල සංඛ්‍යාවක දැවැන්ත සංවර්ධනයට අවශ්‍ය මුදල් ආයෝජනය වීමට සූදානම්.

ඒ වාගේම IMF එකේ හතරවෙනි වාරිකයට අදාළ වන Staff-level Agreement එක පිළිබඳ එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. මෙන්න මේ ආකාරයට අපි දකිනවා, මේ රටේ සිදු වෙමින් පවතින විශාල පරිවර්තනය. මෙවැනි පරිවර්තනයක් කරමින් මේ රටේ මහ ජනතාවගේ සුවපහසුව සඳහා අවශ්‍ය වාහන පිළිබඳව, ඒ සඳහා වන රේගු බදු පිළිබඳව තමයි අපි අද සාකච්ඡා කරන්නේ. මේ ගරු සභාවට අපි පෙර පරිදිම කියනවා, මේ රටේ මහ ජනතාවට ලබා දුන්නු පොරොන්දුව අනුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරලා තමයි අපේ මේ වැඩ පිළිවෙළ නතර වෙන්නේ කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හරි හෝ වැරදි, සත්‍ය හෝ අසත්‍ය විධියට ගරු ඇමතිතුමියගේ කටින් පිට වුණා, අර ළමයාගේ මානසික සෞඛ්‍ය සම්බන්ධ වචනයක්. ඒ වචනය හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அப்படிச் சொன்னதற்காக தமிழ் சமூகத்திடம் மன்னிப்புக் கேட்க வேண்டும். நீங்கள் மகளிர் மற்றும் சிறுவர் அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சர்! அவ்வாறு சொல்லியிருக்கக் கூடாது. அவ்வாறு சொன்னது பிழை! அது உண்மையோ, இல்லையோ அவசரப்பட்டு சொல்லியிருக்கக்கூடாது. நான் பல விடயங் களைச் சொல்லாமல் தவிர்த்துக்கொண்டேன். அந்தப் பிள்ளையின் பெயரைக்கூட சொல்லவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට ඉදිරිපත් කරනවා.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நடந்துள்ள இந்தச் சம்பவத்தை நான் வன்மையாகக் கண்டிப்பதோடு, இந்தச் சம்பவத்தால் பாதிக்கப்பட்ட வர்களுக்கு எனது ஆழ்ந்த அனுதாபங்களையும் தெரிவித்துக் கொள்கின்றேன். எங்களுக்குத் தந்திருக்கின்ற ஆவணங்களில் - B report, JMO reportஇல் - குறிப்பிடப்பட்டுள்ள விடயங் களைத் தவிர, நான் வேறு எதனையும் இங்கு மேலதிகமாகக் கூறவில்லை. அந்தப் பிள்ளை மனநிலை பாதிக்கப்பட்ட *[இடையீடு]* -

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය ]

நான் அந்த மாணவியின் மனநிலை பற்றியே சொன்னேன். இவ்வாறானதொரு சம்பவத்துக்கு முகங்கொடுத்தால் மனத்தாக்கம் ஏற்படுவது இயல்பானது. அதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். அதை நிரூபிக்க - உறுதிப்படுத்த - வேண்டியது நாங்கள் அல்லர். அது வைத்திய ஆலோசனையின்படி, சட்டத்தின்மூலம் நிரூபிக்கப்படும். அதாவது, அது வைத்தியர்களால் நிரூபிக்கப்படுமே தவிர, நாங்கள் நிரூபிப்பதில்லை. அவ்வாறானதொரு தாக்கம் ஏற்பட்டிருந்தால், அது எதிர்காலத்தில் மேற்கொள்ளப்படும் விசாரணைகளின்போது வெளிவரும் என்பதைத் தவிர, நான் வேறு எதனையும் இங்கு கூற விரும்பவில்லை. நான் குறிப்பிட்ட விடயங்களில் ஏதாவது தவறான சொற்கள் இருந்தால், அவற்றை ஹன்சாட்டிலிருந்து நீக்கிக்கொள்வதற்கு எப்பொழுதும் தயாராக இருக்கின்றேன். இந்த விடயத்தை அரசியல் ரீதியாகப் பயன்படுத்த வேண்டாமென நான் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், நாங்கள் எல்லோரும் பெற்றோர்கள்!

எங்களுடைய முக்கிய குறிக்கோள் என்னவெனில், இந்தச் சம்பவத்தால் பாதிக்கப்பட்டவர்களுக்கு நீதி கிடைக்க வேண்டும் என்பதுதான். அதைப் பெற்றுக்கொடுப்பதற்காக நாங்கள் துரிதமாக நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். நாளை காலை 10.00 மணிக்கு அந்தப் பிள்ளையின் பெற்றோர் எம்மைச் சந்திப்பதற்கு நேரம் ஒதுக்கப்பட்டு இருக்கின்றது. முன்னெடுக்கப்படுகின்ற விசாரணைகளின் அடிப்படையில், அடுத்த வாரமளவில் இது பற்றிய தகவல்களைத் தரலாமென நினைக்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමියනි, ඒ වචනයට අදාළව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට එය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් ලැබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලයෙන් විනාඩියක් එතුමාට දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, විවාදයකට තුඩු දෙන කරුණු ඉදිරිපත් නොකර අදහස ඉදිරිපත් කළා නම් ප්‍රමාණවත්.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
கௌரவ அமைச்சர் அவர்கள் கையாலும் மடியாலும் வார்த்தைகளைப் போட்டுக் கூறினார் என்று நான் சொல்லவரவில்லை. මම කොතැනකදීවත් කිව්වේ නැහැ, ඇමතිතුමිය වචන ටිකක් එකතු කරලා බොරුවක් කිව්වා කියලා. මම එහෙම කිව්වේ නැහැ. නමුත්, ඇත්ත වුණත් සදාචාරාත්මකභාවයක් තිබෙනවා. මම පැහැදිලිව සිංහලෙන් වාගේම දෙමළෙන් ඒ ගැන කිව්වා නේ. මම ඒ ළමයාගේ නම දන්නවා; ඉස්කෝලේ දන්නවා; තාත්තාගේ නම දන්නවා. නමුත්, මම කොතැනකදීවත් ඒ ගැන ප්‍රසිද්ධියේ කිව්වේ නැහැ. ඒ වාගේ සමහර දේවල් නොකියා ඉන්න පුළුවන්. ඒ නිසා තමයි හැන්සාඩ් වාර්තාවෙන් ඒ වචනය අයින් කරන්න කියලා මම කිව්වේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.07]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමනි, අපේ ගමේ මන්ත්‍රීවරයකු වන ඔබතුමා මූලාසනයේ ඉන්නකොට කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පක්ෂයක් විධියට මම හිතන හැටියට අපි හිටපු තැනට වඩා විශාල ජයග්‍රහණයකුත් ලබා තිබෙනවා. අපේ පක්ෂයේ ජයග්‍රහණය සඳහා දායක වෙච්ච සියලු අපේක්ෂක, අපේක්ෂිකාවන්ට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වනවා. ඒ වාගේම, අපෙන් ඈත්වෙලා ඔබතුමන්ලා විශ්වාස කරලා, ඔබතුමන්ලා ළඟට ආපු බොහෝ පිරිසක් අද වනකොට යථාර්ථය තේරුම් අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් බලපෑ හේතු ගොඩක් තිබෙනවා. එක හේතුවක් තමයි, ඔබතුමන්ලා ජනතාවට අසීමිත බලාපොරොත්තු ලබා දෙමින් අසීමිත විධියට බොරු කීම. ඒ යථාර්ථය ජනතාව ක්‍රමක්‍රමයෙන් තේරුම් අරගෙන තිබෙනවා. අපි කරන්න පුළුවන් දේට පුළුවන් කිව්වා වාගේම, කරන්න බැරි දේට බැහැයි කිව්වා. අපි විශාල අභියෝග මැද්දේ තමයි ඒ කටයුතු කළේ. අතිගරු ජනාධිපතිතුමා මැතිවරණ වේදිකාවේදී එක අවස්ථාවක කිව්වා මට මතකයි, ප්‍රාදේශීය සභාවේ බලය එතුමන්ලාගේ පක්ෂයට ලැබුණේ නැත්නම් මුදල් දෙන්නේ නැහැ කියලා. ඒ වාගේම අත්අඩංගුවට ගන්නා කාරණා කිව්වා. අන්තිමේදී තාත්තායි, පුතායි විතරක් නොවෙයි, අම්මාත් අත්අඩංගුවට ගන්නවාකිව්වා. ඒ සියලු අභියෝග තිබියදීත් අපේ පාක්ෂිකයෝ ඡන්ද පොළට ගිහිල්ලා ඡන්දය ප්‍රකාශ කරලා, යම් ජයග්‍රහණයක් මේ රටට ආදරය කරන වමේ දේශපාලන කඳවුරට ලබා දෙන්න කටයුතු කිරීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වාහන සම්බන්ධයෙන් බොහෝ අය ඉතා සතුටින් කථා කළා. මම හිතන විධියට, මේ ගැන අපි මේ පාර්ලිමේන්තුවේදී කථා කරනවාට වඩා, අද මේ තිබෙන තත්ත්වයත් එක්ක IMF එකත් එක්ක කථා කළා නම් ඉවරයි. මොකද, සමහර HS codes බැලුවාම ඒවා අපේ රටට ගැළපෙනවා ද, නැද්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

එක වෙලාවකට IMF එකේ කොන්දේසිවලට යටත්ව ආදායම් උත්පාදනය කිරීමේ බලාපොරොත්තුවෙන් ආනයනික වාහනවලට බදු පනවනවා. එම නිසා වාහන ගෙන්වූවාට වඩා හොඳයි කියලා හිතෙනවා නොගෙන්වා හිටියා නම්. තව පැත්තකින් බැලුවාම, ගෙන්වන ඉලෙක්ට්‍රික් වාහනවලට එක බද්දක්, හයිබ්‍රිඩ්

වාහනවලට තව බද්දක්. වාහනය ඉලෙක්ට්‍රික් ද, හයිබ්‍රිඩ් ද කියන එක පිළිබඳ Sri Lanka Customs එකේ ප්‍රශ්නයක් තිබෙනවා එක පැත්තකින්. ඒක බේරා ගන්න බැරිව වාහන yard එකේ තිබෙනවා. ඒ වෙනුවෙන් demurrage ගෙවනවා. ඒ වාහනය ගන්න ගිය මුදල වාගේ දෙගුණයක් demurrage ගෙවන්න වෙලා තිබෙනවා. අවසානයේ මොකද වෙලා තිබෙන්නේ, ලක්ෂ 12ට වාහනයක් ගන්න බලාගෙන ඔබතුමන්ලාට ඡන්දය දීපු අයට වාහනයක් ගන්න යන අවම වියදම ලක්ෂ 80යි, 90යි වෙලා තිබෙනවා. ඉතින්, එවැනි වාතාවරණයක් තිබෙන්නේ. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ පැහැදිලිව මේ පිළිබඳව කල්පනා කරන්න කියලායි. HS codes හඳුනාගෙන වාහන industry එක, ඒ ක්ෂේත්‍රය ප්‍රායෝගිකව තේරුම් ගන්න. මෙය ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පමණක් තිබෙන ගැටලුවක් නොවෙයි. අතීතයේත් මෙවැනි සිද්ධි වෙලා තිබෙන බව අපි දැක තිබෙනවා. එම නිසා තත්ත්වය තේරුම් අරගෙන, යථාර්ථය අවබෝධ කරගෙන, ඒ කාරණා ගැන ලෝකයේ තිබෙන අලුත් technology එක අනුව කටයුතු කරන්න. දැන් තිබෙන hybrid technology එක අනුව, ඉලෙක්ට්‍රික් වාහනවලට අදාළව තිබෙන්නේ technical කාරණා. සමහර වෙලාවට ඒවා පොතේ වෙනස් වෙන්නේ සුළු වචනවලින්. මේවා පිළිබඳව ඔබතුමන්ලා අවධානය යොමු නොකළහොත්, පරණ HS Codesවලටම යන්න ගියොත්, අවසානයේ මේ වාහන ගෙන්වන අයටවත්, ව්‍යාපාර කරන අයටවත් කිසිම සාධාරණයක් වෙන්නේ නැහැ. ඔබතුමන්ලා වාහන ගෙන්වන්න ඉඩ දුන්නා කියන කාරණය මතවත් ඔබතුමන්ලාට හොඳක් අහන්න වෙන්නේ නැහැ. අවසානයේ වාහන ගෙන්වන අයගෙනුත් ඔබතුමන්ලාට බැණුම් අහන්නයි වෙන්නේ. මොකද, ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ ලක්ෂ 12ට වාහනයක් ගන්න බලාගෙන. හැබැයි දැන් කිව්වා ලක්ෂ 12කට හම්බ වෙන්නේ අවුරුදු 10කින් කියලා. කමක් නැහැ. හැබැයි, මේ කාරණාව දිහා ඔබතුමන්ලා ප්‍රායෝගිකව බලන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලු කාරණා මධ්‍යයේ අද රටේ අපේ අවධානය යොමු විය යුතු ගැටලු බොහොමයක් තිබෙන බවත් අපි දන්නවා. එක ගැටලුවක් පිළිබඳව අපේ ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් සඳහන් කළා. අපේ ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් අමාත්‍යතුමියවත් ඒ පිළිබඳව අදහසක් ප්‍රකාශ කළා. අද අපේ පාසල් පද්ධතිය සහ විශ්වවිද්‍යාල පද්ධතිය ඇතුළේ අද තිබෙන මානසික පීඩනය සහ ආතතිය, ඒ සඳහා තුන්වන පාර්ශ්වයක මැදිහත් වීම සහ නවකවදය ආදී කාරණා තිබෙනවා. නවකවදය පිළිබඳව මම ඔබතුමන්ලාගේ පක්ෂයට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඒ පිළිබඳව ඔබතුමන්ලාට පුළුවන් අප බංකුවක වාඩි කරවලා lectures දෙන්න. ජාතික ආරක්ෂාව ගැන කෙසේ වෙතත්, නවකවදය ගැන. අද නවකවදය නිසා දරුවෝ විශ්වවිද්‍යාල ඇතුළේ සිය දිවි හානි කර ගන්න, ඝාතනයට ලක් වන තැනට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි පාසල ඇතුළේ වන සිදුවීම්. පාසල ඇතුළේ වුණු යම් සිද්ධියකට - ඒ දරුවාගේ විස්තර මම සඳහන් කරන්නේ නැහැ- ගරු ඇමතිතුමිය දැන් අදහසක් ප්‍රකාශ කළා. එතුමියගේ අදහසේදී එක කාරණයක් සඳහන් වුණා. ඒ තමයි, JMO වාර්තාවක් ගැන. මම නම් දන්නේ නැහැ JMO වාර්තාවේ කොහොමද මානසික තත්ත්වය පිළිබඳව සඳහනක් වෙන්නේ කියලා. මොකද, JMO වාර්තාව ලබා ගන්නේ මැරුණාට පසුව. මැරුණු කෙනෙකුගේ මානසික තත්ත්වය පිළිබඳව කොහොමද වාර්තාවක් ලබා ගන්නේ කියන කාරණය පිළිබඳව මට නම් අවබෝධයක් නැහැ. මම දන්නේ නැහැ එය කොහොමද ගත්තේ කියලා. හැබැයි, පැහැදිලිවම එම සිද්ධියේදී චෝදනාවට ලක් වෙන්නේ ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂයේ කොළඹ දිස්ත්‍රික්කයේ, මැද කොළඹ ආසනයේ සංවිධායකවරයෙක්. එම නිසා ඔබතුමන්ලා එය වහන්න යම් ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියන්න අපි දන්නේ නැහැ. ඒ චෝදනාවට ලක් වූ ගුරුවරයා ඔබතුමන්ලාගේ ආසන සංවිධායකවරයෙක්. එම නිසා ඒ ආසන සංවිධායකවරයා ආරක්ෂා කර ගැනීම පිණිස ඔබතුමන්ලා ඒ ක්‍රියාව කරනවාද, නැද්ද කියන්න අපට අවබෝධයක් නැහැ. හැබැයි, බැලූ බැල්මට ඔබතුමන්ලාගේ ආසන සංවිධායකවරයෙක් කියන කාරණය තමයි අපි දන්නේ. එහෙම නොවෙයි නම් ගරු ඇමතිතුමනි, එය නිවැරදි කරන්න. එය අපට ප්‍රශ්නයක් නොවෙයි. ඒක නිවැරදි කරන්න. හැබැයි, ඒ දරුවාට සාධාරණය ඉටු කරන්න. ඒ දරුවාට සාධාරණයක් කරන්නේ නැතුව ඒක දේශපාලන වේදිකාවේ මාතෘකාවක් බවට පත් කරන තැනට පරිවර්තනය කිරීම සාධාරණ නැහැ කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒක විශ්වවිද්‍යාල පද්ධතියටත් අදාළයි. ඔබතුමන්ලා විශේෂයෙන්ම ඒකට මැදිහත් වෙන්න. මොකද, ඔබතුමන්ලාගේ පක්ෂයේ අය තමයි විශ්වවිද්‍යාල ඇතුළේ නවකවදයේ නිර්මාතෘවරු. *[බාධා කිරීමක්]* ඒ පිළිබඳව මම බලාගෙන ඉන්නම්. මොකද, ඔබතුමන්ලා ගැන ඔබතුමන්ලාටත් වඩා හොඳට අපි අධ්‍යයනය කරලා තිබෙන්නේ. ඒ නිසා අපි ඒ ගැන බලාගෙන ඉන්නම්. ඒක තව ඉස්සරහට බලා ගන්නත් පුළුවන්, දකින්නත් පුළුවන්. හැබැයි ඉතින්, කොච්චර තීන්දු තීරණ ගත්තා කිව්වත් සිදුවීම්වල නම් අඩුවක් නැහැ. මම දැක්කා ඊයේ පෙරේදා දෙහිවල ප්‍රදේශයේ තරුණයෙක් ඝාතනය කරලා තිබුණා. ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඒ ඔබතුමාගේ ආසනය නේද? *[බාධා කිරීමක්]* මොරටුව ආසනයේ. අවුරුදු 19ක තරුණයෙක්. පොලිස් මාධ්‍ය ප්‍රකාශක ගත් කටට කිව්වේ මොකක්ද? "ඔහුගේ අම්මා කුඩු විකුණනවා" කියලා. ඒක මම දන්නේ නැහැ. අපට අදාළත් නැහැ. හැබැයි, තරුණයෙකුට මහ දවල් පාරේ වෙඩි තියලා ගිහින්. අපි ඒක මාධ්‍යයෙන් දැක්කා.

හැබැයි, ඒ තරුණයාට වෙඩි තියලා යන එක සාධාරණය කිරීමක් වාගේ හැඟෙන්නේ නැද්ද, පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ගත් කටටම "ඔහුගේ අම්මා කුඩු විකුණනවා. ඒ නිසා තමයි මේක වුණේ" කිව්වාම? කුඩු ජාවාරම්කාරයෙකුගේ පුතෙක් නම් නගර සභාවේ පාර අතු ගාන රස්සාවක් කරන්න ඕනෑ නැහැ නේ. එහෙම කරන්න ඕනෑ නැහැ නේ.

හැබැයි අනෙක් පැත්තෙන් බැලුවොත්, අද රටේ ඝාතන රැල්ලක් යනවා. එදා නම් ඔබතුමන්ලා ඒක රාජපක්ෂලාගේ පිට දැම්මා. එදා විතරක් නොවෙයි, ගිය මාසයේත් දැම්මා. අහන අහන එකට කිව්වා, සාක්ෂි හංගනවා කියලා. එහෙමනේ කිව්වේ. හැබැයි, දැන් තිබෙන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව. ඔබතුමන්ලා බලයට ආවේ අපව බංකුවක වාඩි කරවලා ජාතික ආරක්ෂාව ගැන lectures දෙන්න. හැබැයි, ඒ lectures අපට දෙන එක කෙසේ වෙතත්, මම හිතන විදියට ඔබතුමන්ලාට අද ආණ්ඩුවක් විදියට තීන්දුවක් ගන්න වෙනවා, මේකට මුහුණ දෙන ආකාරය පිළිබඳව. මේ වන විට වෙඩි තැබීම් 36ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක් වාර්තා වෙනවා. උදේට නැඟිටලා, "අද කොහේද වෙඩි තබා තිබෙන්නේ?" කියලා අහන තැනට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ කාරණා පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානය යොමු වීම විතරක් වැඩක් නැහැ. මොකද අවධානය යොමු වෙලා ඉවරයි නේ. ඒක හැමෝම දන්නවා නේ. හැබැයි, ඔබතුමන්ලා මේකට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? හිනා වෙවී ඉඳලා හරියන්නේ නැහැ. හිනා වෙලා හිටියාම,-

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මිද්දෙනියේ වෙඩි තිබ්බ එක- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මිද්දෙනියේ තියපු එක අල්ලා ගත්තා නේ. මට අල්ලන්න දෙයක් ඉතුරු වුණේ නැහැ. ඒකත් මගේ ඇඟේ නේ දැම්මේ. අන්තිමට දැක්කා නේ වෙච්ච දේ. ඒ නිසා ඔබතුමන්ලා හැම එකම

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

අපේ ඇඟේ ගහලා ඇඟ බේරා ගන්න ගියොත් ප්‍රතිඵලය දන්නවා නේ. දැන් ඒක පෙනෙනවා නේ මැතිවරණයේදී? ඒ නිසා හැම එකම අපේ ඇඟේ ගහලා අත හෝදා ගන්න ලෑස්ති වෙන්න එපා. ඔබතුමන්ලාගේ ඡන්ද ප්‍රමාණයෙන් සියයට 18ක් අඩු වෙලා තිබෙන්නේ. ඒ නිසා කරුණාකරලා හැමදේම අපේ ඇඟේ ගහලා ඇඟ බේරා ගන්නේ නැතුව ප්‍රශ්නවලට උත්තර දෙන්න, උත්තර හොයන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම එකටම අපේ පස්සෙන් එළෙව්වා කියලා හරියන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ඉදිරියේදී ඒක බලපානවා. පවු වැඩේ. ඔබතුමා අපේ හොඳ මන්ත්‍රීවරයෙක්. ඒ නිසා මම ඔබතුමන්ලාට කියන්නේ මේකයි. ඔය ඔක්කෝම කාරණා හොඳයි මේක ඇතුළේ. හැබැයි, අවසානයේ ඔබතුමන්ලාට ඡන්දය ඉල්ලන්න මිනිස්සු ගාවට යන්න වෙනවා. අඩු ගණනේ ඔබතුමන්ලා දන්නේත් නැහැ නේ, ඔබතුමන්ලාගේ නායකයෝ ඉන්දියාව එක්ක අත්සන් කරපු ආරක්ෂක ගිවිසුම මොකක්ද කියලා. ඔබතුමන්ලා පුළුවන් නම් ඔය හිනා වෙවී ඉන්න එකේ කියන්නකෝ, ඉන්දියාව හා පාකිස්තානය අතර යුද්ධයක් ඇති වෙච්ච වෙලාවක අපේ රටේ ක්‍රියාමාර්ගයක් ගන්න ඒ ගිවිසුමේ මොනවාද තිබෙන වගන්ති කියලා. ඒක ඔබතුමන්ලාට පෙන්වලා නැහැ. පෙන්වන්න විධියක් නැහැ. ඇහුවාම කියනවා නේ, ඒක ඉන්දියාවෙන් අහන්නේ නැතුව පෙන්වන්න විධියක් නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම ආණ්ඩුවට සැලැස්මක්, වැඩ පිළිවෙළක් නැති බව අද වනවිට ඔප්පු වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වාහන ගෙන්වීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඒක හොඳයි. හැබැයි, ගෙන්වන අයගේ ගැටලු කිහිපයක් තිබෙනවා. ඒ, HS codes සම්බන්ධයෙන් ආපු ගැටලු. ඒවා ප්‍රතිපත්තිමය වශයෙන් ගත යුතු තීරණ. ඒ තීරණ ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන් මේ ආණ්ඩුව දැන්වත් මේ රටේ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න මැදිහත් වෙන්න ඕනෑ. මේ ප්‍රාදේශීය සභා මැතිවරණයේ ජනතාවගේ මතය, ජනවරම කියවා ගන්න. ඒ ජනවරම 2018ත් එක්ක සම්බන්ධ කරලා ඇඟ බේරා ගත්තොත් අපට වෙච්ච දේමයි ඔබතුමන්ලාටත් වෙන්නේ. අපටත් ඒක වුණා නේ. ඒකයි මම කියන්නේ. මම සද්භාවයෙන් කියන්නේ. අපි වැටුණු රටක් ගන්න ලෑස්ති වෙන අය නොවෙයි. අපි එහෙම රටක් අරගෙන හදන්න ලෑස්ති වෙන අය නොවෙයි. ඔබතුමාට තේරෙනවා නේ. අපි දේශපාලනය කරන අය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, වෙලාව අවසන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි කැමැතියි, මේ රට හැදෙනවා නම්. ඒ නිසා අපි මේ සද්භාවයෙන් කියන්නේ. සද්භාවයෙන් කිව්වාම හිනා වෙවී ඉඳලා පස්සේ ගිහිල්ලා කෙඳිරි ගාන්න එපා. ඒ බවත් මතක් කරමින්, අපේ පක්ෂයේ අපි වෙනුවෙන් පෙනී සිටි සියලු දෙනාටත් මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද විවාදයට බඳුන් කරන්නේ 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය සම්බන්ධයෙන් වන රේගු ආඥාපනත යටතේ යෝජනා සම්මතය.

අපි හැමෝම දන්නවා යම් කාලයකදී, විශේෂයෙන් කලින් කථා කරපු මන්ත්‍රීතුමාගේ බාප්පාගේ කාලයේ, මේ රට සම්පූර්ණයෙන් ආර්ථික වශයෙන් ප්‍රපාතයට වැටුණු බව. ගෑස් පෝලිම්, ඉන්ධන පෝලිම් ඇති වුණා වාගේම, තිබුණු foreign exchange reserves සම්පූර්ණයෙන් විනාශ කරලා දාලා අන්තිමට කහ ටිකක්වත් ගෙන්වා ගන්න හැකියාවක් නැති තැනට මේ රට පත් කළා. ඉන්පසුව තමයි ඒ කාලයේ ලංකාවට කාර් ආනයනය තහනම් කරනු ලැබුවේ. ජාතික ජනබලවේගය ආණ්ඩුව විසින් ගෑස් පෝලිම් ඇති කරපු යුග පන්නලා, ඉන්ධන පෝලිම් ඇති කරපු යුග පන්නලා රට කෙමෙන් කෙමෙන් ස්ථාවරත්වය කරා රැගෙන එමින් තිබෙනවා. තවම සම්පූර්ණයෙන්ම ඒ ගැටලුවලින් රට මුදා ගෙන නැහැ. නමුත් නැවත වතාවක් කවදාවත් ඒ කාලය තුළ වූ ආර්ථික ප්‍රපාතයට මේ රට වැටෙන්නේ නැති තැනට, අපි ඉතාම සූක්ෂ්ම ලෙස ආර්ථිකය ශක්තිමත් කරගනිමින් ඇවිල්ලා තිබෙනවා.

එයින් එක කොටසක් වන්නේ වාහන ආනයනයට නැවත වාරයක් ඉඩ දීමයි. මක්නිසාද යත්, ආර්ථිකය සක්‍රිය වෙනකොට කෘෂිකාර්මික කටයුතු සඳහා, නොයෙකුත් ව්‍යාපාරික කටයුතු සඳහා, tourism සඳහා වාහන අවශ්‍ය වෙනවා. නමුත්, ඒ වාහන ගෙන්වීම හරහා කාට හෝ පර්මිට් දීම වාගේ ඒවා කරලා රටේ ඩොලර් සංචිතය විනාශ කරන්නේ නැතිව, ඉතාම සිහි බුද්ධියෙන් යුතුව, ඉතා කල්පනාවෙන් යුතුව, එළියට යන්නා වූ සංචිත ප්‍රමාණය ගැන අවබෝධයක් තබා ගෙන, කෙමෙන් කෙමෙන් එය විවෘත කරලා, ඉතා ස්ථාවර මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. එහිදී බදු පැනවීමකුත් සිද්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සිදු වන දේවල් හරිම විනෝදජනකයි. මොකද, සාමාන්‍යයෙන් ජයග්‍රහණය සමරන්න ඕනෑ, අනෙක් අයට හූ කියන්න ඕනෑ දිනපු කට්ටිය. නමුත් අපි අද

දකිනවා, පැරදුණු අය මෙතැනට ඇවිල්ලා වෙනම ආතල් එකක් ගන්නවා. කමක් නැහැ, අපි ඒ අවස්ථාව ඒ අයට ලබා දෙමු.

මොනවාද අපේ ජයග්‍රහණ? දැන් බලන්න, මෙදා පාර පළාත් පාලන මැතිවරණය අවසානයේදී ඡන්ද ගණන් කරන මොහොතේ curfew නැහැ; ප්‍රචණ්ඩ ක්‍රියා නැහැ; දරුවෝ ඉස්කෝලයට ගියා. අන්න ඒක තමයි, ජාතික ජන බලවේගය මේ රටට ගෙනාපු මූලික වෙනස. ගෙවල් ගිනි තැබුවේ නැහැ, "ප්‍රචණ්ඩ ක්‍රියා" කියන වචනය ඇහුනේත් නැහැ. එහෙම කරලා තිබියදීත් විපක්ෂයේ අය නොයෙකුත් ආකාරයේ දත්ත පාවිච්චි කරමින්, ජාතික ජන බලවේගය පසු බැහැලා තිබෙන බවක් කියන්න හදනවා. හරි, අපි ඒ ඡන්ද ප්‍රතිඵලය හොඳින් කියවා ගත්තා. ඒ ඡන්ද ප්‍රතිඵලය තුළින් ආණ්ඩුවට ලබා දීපු යම් පණිවුඩයක් තිබෙනවා, නැතුවා නොවෙයි. නමුත්, අද විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කථා කරන කොට දත්ත පාවිච්චි කළේ, not to prove a point. ඒ කියන්නේ, point එකක් prove කරන්න නොවෙයි ඒ අය දත්ත පාවිච්චි කළේ. They used data. ඔවුන් දත්ත පාවිච්චි කළේ, මත්පැන් බීපු මිනිහෙක් ලයිට් කණුවක් පාවිච්චි කරනවා වාගෙයි. ඒ කියන්නේ, හේත්තු වෙලා ඉන්න විතරයි. මොකද, ඒ දත්තවලට පදනමක් නැහැ. එහෙම දත්ත රාශියක් ගැන අද අපට මේ පාර්ලිමේන්තුවේදී දැන ගන්න ලැබුණා.

මූලිකවම ගත්තොත්, සජබය ද ඇතුළුව විපක්ෂයේ මන්ත්‍රීවරු බෙහෙවින් උදන් අනනවා ඒ අයගේ ජයග්‍රහණයක් ගැන කියමින්. ඔවුන් ජයග්‍රහණය කළේ, පළාත් පාලන ආයතන 339න් 14යි. ඒ 14ත් ඔවුන් ඉදිරියෙන් හිටියාට, ඔවුන්ට තනිවම බලය පිහිටුවන්න හැකියාවක් නැහැ. ඉතින්, ඒ කට්ටිය අපට උපදෙස් දෙනවා. මම දන්නවා, අපේ තිබුණු ශක්තිමත් තැන් ගැන. ඒ වාගේම අපේ පාක්ෂිකයන්, අපට ඡන්දය දීපු උදවිය, මධ්‍යස්ථ මතධාරීන්, අපේ දුර්වලතා පෙන්වා දීලා, සාධනීය විවේචන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වැරදුණු තැන් නිවැරදි කරගෙන ඉදිරි ගමන යන්න අපි ලෑස්තියි. නමුත්, හොම්බෙන් ගිහිල්ලා බංකොලොත් වෙච්ච, වට්ටෙම බොරු කියපු දූෂිත විපක්ෂයක උපදෙස් ගන්නවාද කියන එක තමයි අපට නැවත හිතන්න වෙලා තිබෙන්නේ.

ඔවුන් තව දෙයක් කියන්න උත්සාහ කළා. ඒ මොකක්ද? ඔවුන් දත්ත සසඳන්නේ ජනාධිපතිවරණය, මහ මැතිවරණය ආදි ජාතික මැතිවරණ සහ පළාත් පාලන මැතිවරණ සමහයි. You must compare apples to apples; you cannot compare apples to pears, although both are fruits. එහෙම බැලුවොත්, අපි මෙවර පළාත් පාලන ආයතන 267ක ජයග්‍රහණ ලබා ගෙන තිබෙනවා. 2018දී බෙහෙවින් සවිබල පොහොට්ටුව පවා ජයග්‍රහණය කර තිබුණේ, පළාත් පාලන ආයතන 226යි. අපි ජයග්‍රහණය කරපු පළාත් පාලන ආයතන 267න්, 120ක බහුතරය අපට තිබෙනවා. එම නිසා ඒවායේ කෙළින්ම සභා පිහිටුවන්න අපට පුළුවන්. තව පළාත් පාලන ආයතන 32ක බලය සම සමව ඇවිල්ලා තිබෙනවා. ඒත් අපට සභා පිහිටුවන්න පුළුවන්. එදා පොහොට්ටුව ජයග්‍රහණය කරලා තිබුණේ පළාත් පාලන ආයතන 226යි. ආයතන 28ක බලය සමානව තිබුණා. එහෙම නම් ඉතිහාසයේ විශාලම ජයග්‍රහණය ලැබුවේ, මෙදා පාර ජාතික ජන බලවේගයයි. වෙනත් කිසිම පක්ෂයක් මීට කලින් මේ තරම් පළාත් පාලන ආයතන සංඛ්‍යාවක් ජයග්‍රහණය කරලා තිබුණේ නැහැ.

මට කලින් කථා කරපු පොහොට්ටුව පක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා, හිටපු තැන හැටියට දැන් ඉන්න තැන ගැන ඔවුන්ට සන්තෝෂයි කියලා. ඔවුන්ගේ අහිංසක සන්තෝෂයට මම බාධා කරන්නේ නැහැ. නමුත්, ඔවුන් මතක තබා ගන්නට ඕනෑ, 2018දී පළාත් පාලන ආයතන 226ක් දිනාගෙන තිබුණු ඒ අයට අද එකක්වත් නැහැ කියන කාරණාව.

ඒ වාගේම එතුමන්ලා කියනවා, අපි පව කියපු හින්දා මිනිස්සු අපෙන් ඈත් වුණා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බොරු කිව්වා නම්, මිනිස්සු අපෙන් ඈත් වෙනවා නොවෙයි, විපක්ෂය දිනන්න ඕනෑ. නමුත්, පළාත් පාලන ආයතන 339න් 267ක් ජයග්‍රහණය කරමින් ජාතික ජන බලවේගය තමයි ඉදිරියෙන් ඉන්නේ. එහෙම ඉදිරියෙන් ඉන්නේ, අපේ පක්ෂය කියපු දේවල් ඉෂ්ට කරන පක්ෂයක් වන නිසායි. හැබැයි, ජනතාව පොඩි පණිවුඩයකුත් අපට දුන්නා. මොකක්ද ඒ පණිවුඩය? "ඔයගොල්ලෝ පොඩ්ඩක් slow වැඩියි, ඉක්මනින් මේ වෙනස්කම් ටික කරන්න ඕනෑ" කියන පණිවුඩය තමයි දුන්නේ. අන්න ඒ පණිවුඩයත් ජනතාව අපට දුන්නා. ඒ පණිවුඩය අපි ඒ ආකාරයෙන් තේරුම් ගත්තා.

විපක්ෂයේ කට්ටිය උද්දාමයට පත් වෙනවා, ආණ්ඩුවට දැන් බලය නැහැ, බලය වෙනස් වෙලා කියලා. හෙට ජාතික මැතිවරණයක් පවත්වලා බලන්න. මේ සෙට් එකට ඇපත් නැහැ. මෙගොල්ලෝ සංසන්දනය කරන කොට කල්පනා කරලා බලන්න ඕනෑ දෙයක් තිබෙනවා. නමුත්, අපි එහෙම සංසන්දනය කරන්න ඕනෑ නැහැ.

අවසන් වරට පැවැති ජනාධිපතිවරණයේදී සජිත් ප්‍රේමදාස මහත්මයා ගත්තු ඡන්ද සංඛ්‍යාවට වඩා කොච්චර අඩුවෙන්ද මෙදා පාර පැවැති පළාත් පාලන මැතිවරණයේදී එම පක්ෂය ඡන්ද අරගෙන තිබෙන්නේ? මේක පළාත් පාලන ආයතන මැතිවරණයක්. මොකද, පළාත් පාලන මැතිවරණයේදී ඡන්ද මෙහෙයවෙන්නේ වෙනත් ආකාරයකට පුද්ගල සම්බන්ධතා මතයි. කෙසේ වෙතත්, මේ ප්‍රතිඵලය කිසි කෙනෙකු එක්ක සංසන්දනය කරන්න අපට අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, අපි මේවා සියල්ලම ජයග්‍රහණය කරලායි තිබෙන්නේ. අපි ජයග්‍රහණය කරපු හැම පළාත් පාලන ආයතනයකම සභා පිහිටුවීමට අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු සොයා බැලුවොත් පෙනෙනවා, අප මේ සියලු පළාත් පාලන ආයතනවල ඉදිරියෙන් සිටිනවා විතරක් නොව, ඒවායේ බලය පිහිටු වන්නත් අපට හැකියාව ලැබිලා තිබෙන බව. අපි අසත්‍ය කිව්වා නම් ඉදිරියෙන් ඉන්න ඕනෑ අපි නොවෙයි, ඒ අය. නමුත්, ඒ අය යන්තම් දශම ගණන් තමයි අරගෙන තිබෙන්නේ. එවන් තත්ත්වයක් යටතේ සමහරු උදන් අනනවා, ජාතික ජන බලවේගය මැතිවරණයෙන් පසුබැහැලා කියලා. ඇල්පිටියේ ප්‍රාදේශීය සභා ඡන්දයේදීත් ඔය වාගේම කථාවක් කිව්වා. අපි දැන ගන්නට ඕනෑ, මා කලින් කිව්වා වාගේ ජාතික මැතිවරණයකදීත්, පළාත් පාලන මැතිවරණයකදීත් ඡන්දදායකයන් මෙහෙයවෙන්නේ වෙනස් විධියකට බව. ජනාධිපතිවරණයෙන් අනුර දිසානායක සහෝදරයා ජනාධිපති වෙලා මාසයකට පසුව තමයි ඇල්පිටියේ පළාත් පාලන මැතිවරණය පැවැත්වුණේ. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්දයේ ප්‍රතිඵලය අනුව අප ලබාගෙන තිබුණු ඡන්ද ප්‍රතිශතය සියයට 47යි. එතැනත් සමාන ප්‍රතිඵලයක් ලැබුණේ, 15යි 15යි වශයෙන්. ඒ කාලයේත් විපක්ෂයේ මේ කට්ටිය මේ වාගේම උදන් ඇනුවා, "ඔන්න දැන් ආණ්ඩුව ඉවරයි" කියලා. නමුත්, ඊට මාසයකට පසුව පවත්වපු මහ මැතිවරණයෙන් අපි තුනෙන් දෙකක බලයක් ගත්තා. හැබැයි, ජනතාව මේ ඡන්දයේදී අපට දීපු පණිවුඩයත් අපි තේරුම් ගත්තා. ඒ වාගේම ජනතාව විපක්ෂයේ අයටත් පණිවුඩයක් දුන්නා. ඒ මොකක්ද? එක්කෝ දේශපාලනය නවත්වන්න, නැත්නම් නායකයන් මාරු කර ගන්න, එහෙම නොකළොත් හැමදාම ඇපත් නැහැ කියන පණිවුඩයයි.

මෙවර අපේ සභිකයන් 4,000කට ආසන්න ප්‍රමාණයක් පත් වෙනවා. ඒ 4,000ට ආසන්න ප්‍රමාණය ඊළඟ අවුරුදු 4 තුළ බිම් මට්ටමේ ජනතාව සමඟ සම්බන්ධ වෙලා වැඩ කරමින් සියලු

[ගරු නිතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

පදනම හදා ගන්නවා. මතක තියා ගන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ බහුතරයක් මන්ත්‍රීවරුන් කලින් සභාවල හිටපු අය නොවෙයි කියන එක. හරියට බැලුවොත් එක්කෙනෙක්, දෙන්නෙක් ඇරෙන්න අනෙක් කිසි කෙනෙක් මේ සභාවල ඉඳලා නැහැ. අනෙක් පක්ෂවලින් තරග කරපු හැමෝම වාගේ -බහුතරය- වසර ගණනාවක් පළාත් පාලන ආයතනවල ඉඳලා, ඒවායේ පැලපදියම් වෙලා නමක් හදා ගත්තු කට්ටිය. අපට ඒ බිම තිබුණේ නැහැ. එහෙම තත්ත්වයක් තියාගෙන තමයි අපි මේ ජයග්‍රහණය ලබන්නේ. එහෙම නම් ඒක පුද්ගලයන්ගේ ජයග්‍රහණයක් නොව ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ජයග්‍රහණය කිරීමක්. අද මේ පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලවලින් පෙන්වන්නේ මොකක්ද? ජනතාව මේ පෙන්වා දී තිබෙන්නේ පසුගිය මාස 5 තුළ මේ ආණ්ඩුවේ ක්‍රියාවලියට තිබෙන කැමැත්තයි. ඒ කියන්නේ, ජනතාව මේ ආණ්ඩුවට අනුමැතිය දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නම් මේ විධියට. අපි භූමිය හදනවා; අපි වැඩ කරනවා. ඊළඟ අවුරුදු 4 අවසන් වනකොට පළාත් පාලන ආයතනවල බලය විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ බලය වේවා, ජනාධිපති ධුරය වේවා ජාතික ජන බලවේගයෙන් එළියට හොල්ලන්න හම්බ වෙන්නේ නැහැ. මක් නිසාද, අපට මේ අවුරුදු හතරහමාර තිබෙන්නේ වැඩ කරන්නයි. ජනතාව වුණත් අපට දීපු පණිවුඩය තමයි, "සහෝදරවරුනි, ඔයගොල්ලන් යන පාර හොඳයි, ගමන හොඳයි; පොරොන්දු වෙච්ච ඒවා කරනවා; හැබැයි, පොඩ්ඩක් ඉක්මනට වැඩේ කරපල්ලා" කියන එක. අපි අන්න ඒ පණිවුඩය ඇහුවා. අපි ස්වයං විවේචනයක යෙදිලා, අපේ දුර්වලතා හදාගෙන මේ ගමන සාර්ථකව ඉදිරියට යනවා කියන වචන ස්වල්පය කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතුවේ මට මිනිත්තු 10ක් තිබෙනවා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ප්‍රස්තුත විවාදයෙන් මඳක් ඔබ්බට ගොස්, ඓතිහාසික මැතිවරණ ප්‍රතිඵලයකින් පසු මෙහි ඇති වුණු සංවාදයත්, සමාජ සංවාදයත් එකට ගෙන යමක් කථා කළ යුතු යැයි මම හිතුවා. විශේෂයෙන්ම "සර්වජන බලය" හැටියට අප නිරහංකාරව ගොඩක් ආඩම්බර වන ප්‍රතිඵලයක් අපට ලැබී තිබෙනවා. අප තරග කළ පළාත් පාලන ආයතන සමූහය තුළ සියයට 4කට ආසන්න ඡන්ද ප්‍රතිශතයක් ජනතාව අපට ලබා දීලා තිබෙනවා. අවංකව ගත්තොත්, මා හිතන්නේ මේක තමයි මෙම මැතිවරණයේ වඩාත් ඓතිහාසික වැදගත්කමක් තිබෙන නිරීක්ෂණය. මෙය වඩාත් වැදගත් වන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සාකච්ඡා කරන මේ සන්දර්භය තුළ NPP එක බලයට පත් වුණේ කොහොමද කියලා බලමු. සියයට 3 ඡන්ද ප්‍රතිශතයක හිටපු ඔවුන්ට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකටත් වැඩි බලයක් ජනතාව ලබා දුන්නා.

මේ බලය ලබා දීමේදී ඇති වුණු ඒ මනෝ මූලික හා විෂය මූලික යථාර්ථය අපි සියලුදෙනාම දන්නවා, ඒ පිටුපස තිබෙන කරුණු දන්නවා. අපි ඒවා නැවත නැවතත් විග්‍රහ කරන්නට ඕනෑ නැහැ. නමුත් ජනතාව හැටියට ගත්තොත්, ඔවුන් විශාල අවදානමක් අරගෙන සියයට 3, සියයට 50ට ආසන්න ප්‍රමාණයක් දක්වා අරගෙන ගියා. එසේ අරගෙන යනකොට, ඔබම කථා කරන ලංකාවේ 76 වසරක ශාපය තුළ 57 වසරක ඔබලාගේ අයහපත් දායකත්වයත්, සිදු කරන ලද කැරලි දෙකත්, මිය ගිය දහසකට වැඩි ජනතාවත්, ඒ වාගේම දළදා මාලිගාවට බෝම්බ ගැසීමත්, පාර්ලිමේන්තුව තුළ බෝම්බ ගැසීමත්, නවකවදය ප්‍රවර්ධනය කරලා අපේ අධ්‍යාපන ක්‍රමය අපහසුතාවට පත් කිරීමත් කියන ඒ සියල්ල සම්පූර්ණයෙන්ම අමතක කරලා ජනතාව දැඩි තීරණයක හිටගත්තා, මේ ක්‍රමය වෙනස් කරන්නට ඕනෑ කියලා. මේ එන්පීපී රජයට, ගරු අගමැතිතුමිය ඇතුළු සියලුදෙනාට මම දිගින් දිගටම ආරාධනා කර සිටින්නේ, මෙන්න මේ ජනතා අභිලාශය කියවාගන්න, ජනතාව මේ දරුණු තීන්දුවට ආවේ ඇයි කියන එක කියවාගන්න කියලායි. ඒ මිස ඒකට වෙනත් අර්ථකථන දෙන්න එපා. ඒකට වෙනත් අර්ථකථන දීම තුළින් අපේ ආදරණීය මව්බිමට වන සෙතක් නැහැ, මේ රටේ දුප්පත් අහිංසක ජනතාවට සිදු වන සෙතක් නැහැ. ඒකෙන් දුප්පත් ජනතාව තව දුරටත් දුප්පත් වෙනවා. මම රට පුරා ගියා. මම දැක්කා, මේ රටේ මිනිස්සු අද කෙතරම් ජීවන බරකින් පීඩාවට පත්වෙලා තිබෙනවාද කියලා. බොරු දත්ත ගෙනැල්ලා, බොරු ගණන් ගෙනැල්ලා, හිටපු ආණ්ඩුවල අයත්, දැන් ආණ්ඩුවේ අයත් බොරු අංක ගණිත විජ්ජාවක් කරනවා නම් අපි රවටන්නේ කවුද? ලංකාවේ ජනතාවගේ දැනුවත්භාවය ඔබ අරගෙන තිබෙන්නේ බොහොම සරල ලෙස. ඔබ හිතනවා, මේ රටේ ඉන්නේ මෝඩ මිනිස්සු කියලා. ඒ පූර්ව නිගමනයෙන් තමයි මේ සියලු කථා බහ සමාජයට එන්නේ. ඔබ බය නැතුව, ඔබට ඕනෑ විධියට කරකවලා, කට උල් කරලා බොරු කියනවා. ජනතාව ඒ ඕනෑ බොරුවක් පිළිගන්න සූදානම් කියලා ඔබ හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මතක තබා ගන්නට ඕනෑ, මේ රටේ මිලියන 17ක් වන ඡන්ද දායකයන්ගෙන් මිලියන 12ක් අද වෙනකොට ඉන්නේ ඔබතුමන්ලාට ඍජුව කැමැත්ත පළ කරන්න අකමැති තත්ත්වයක් තුළ. ඒ කියන්නේ, ආසන්න වශයෙන් ශ්‍රී ලාංකික ඡන්ද දායකයන්ගෙන් සියයට 70ක්. ඉතින්, ඔබ මේ අවදානම් තත්ත්වය තේරුම් අරගෙන නිවැරදිව කළමනාකරණය කරනු ඇතැයි මම විශ්වාස කරනවා. මේ රටේ සුවහසක් අහිංසක ජනතාව, අන්තිම අසරණ ජනතාව කර කියාගන්න දෙයක් නැති නිසා මේ ඓතිහාසික මැතිවරණයේදී ඔබට මේ පණිවුඩය ලබා දීලා තිබෙනවා. ඉතින් ඒ පණිවුඩය කියවාගන්න. මේ පණිවුඩය අංක ගණිතයෙන් කොයි විධියට කරකැවුවත් මහා මැතිවරණයට සාපේක්ෂව ගත්තොත්, මේ මැතිවරණයේදී ඔබගේම ඡන්දදායකයන්ගෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් ඔබට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා.

කොහොම වුණත්, ඒක අමතක කරලා දමමු. මම පෙනී සිටින්නේ සුසමාදර්ශී දේශපාලන වෙනසක් සඳහායි. ඔබ මොන තරම් අවලාද නැඟුවත්, ඔබ කොතරම් දුරට මා පරණ දේශපාලනයට ඇදන්න උත්සාහ කළත්, සර්ව ජන බලය හැටියට මම උත්සාහ කරනවා, පරණ දේශපාලන ක්‍රමය නිවැරදි කර ගනිමින් මේ රට තුළ හොඳ වෙනසක් ඇති කරන්නට මහ පෙන්වමින් කටයුතු කරන්න. මම ප්‍රාර්ථනා කරනවා, ඔබ ලැබූ ජයග්‍රහණයත් එක්ක ඔබට මේ රට තව දුරටත් කරගෙන යන්නට අවස්ථාව ලැබේවා කියලා. එහිදී අපි නිරන්තරව උත්සාහ කරන්නේ, ඔබ සාධනීය සංවාදයක රඳවා තබා ගන්නටයි. ඉතින්, සමාජ මාධ්‍යවල fake comments ගහලා කරන ඒ අවලාද දේශපාලනය අවසන් කරන්න බලය පාවිච්චි කරන්න.

ඒ බලය පාවිච්චි කරලා ඇත්ත වශයෙන්ම මේ රට මුහුණ දී ඇති සැබෑ ආර්ථික අර්බුදය ගැන ජනතාව සමඟ සංවාදයකට යන්න. අද ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය ගැන උද්ධච්ච වෙන්න එපා, අවංකව කථා කරන්න. ඒ

වාගේම අද අපේ රටේ සභ්‍යත්වය සහ සංස්කෘතිය මුහුණ දෙන සැබෑ අභියෝග ගැන සංවාදයකට යන්න. දළදා ප්‍රදර්ශනය කිරීමෙන් හෝ වෙනත් ආගමික කටයුතුවල යෙදීමෙන් හෝ අපට සත්‍යය වසන් කරන්නට බැහැ. මේ රටේ ආදරණීය ජනතාවට ඒ අපහාසය කරන්නට එපා. මේ රටේ ජනතාව සැබෑ සංවාදයකට ගේන්න කියලා අපි ආරාධනා කරනවා. ඔවුන්ට ඇත්ත කියන්නට ඕනෑ. දැන් මේ රටට අත්‍යවශ්‍යම වෙනස, ජනතාවගේ බලාපොරොත්තුව වෙන මොකුත් නොවෙයි.

අපි ජීවන වියදමත්, මේ අමාරුකමත් ඔක්කෝම පැත්තකින් තියලා ඇත්ත කථා කරන සමාජයක් බිහි කරගන්නට ඕනෑ. මේ ව්‍යාජත්වයෙන්, මේ මිථ්‍යාවෙන්, බොරුවෙන් අපට තවදුරටත් ඉදිරියට යන්න බැහැ. 2028 වෙනකොට අපි රුපියල් බිලියන 150ක් හොයාගන්නට ඕනෑ. අපි පඩි වැඩි කරලා තිබෙනවා, ආදායම වැඩිකරගන්නේ නැතුව. අපි මේ ආර්ථික යථාර්ථයට මුහුණ දෙන්නට ඕනෑ. අපට තිබෙන්නේ ශත පහක් අලුතින් හොයන්නේ නැති ආර්ථිකයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යවසායකත්ව රාජ්‍යය කියන සංකල්පයෙන් තොරව, රාජ්‍යය ව්‍යවසායකත්ව මනසකින් මේ දෙස නොබලා සැබෑ විධියට අපේ ආදායම හා වියදම පරිපාලනය කරගන්නේ නැතුව, අපි මේ රටේ නව ධනයක් නිර්මාණය කරගන්නේ නැතුව, ලෝක බැංකුවෙන් සල්ලි හම්බ වුණා කියලා සමාජ මාධ්‍යවල සහ මාධ්‍යයේ උදන් අනනවා නම් මේ රට කොච්චර පල්ලෙහාට වැටිලා තිබෙනවාද? එහෙනම් අපි ඒ ගැන කල්පනා කරන්නට ඕනෑ. මේ සෘණාත්මක මානසිකත්වයෙන් කටයුතු කරන ඔබතුමන්ලාගේම ඔය fake comments බලකායටත් කියන්න, ඔය fake comments ගහන්න එපා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාව අවසන්.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මට තව තත්පරයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ධනාත්මක සංවාදයකට යමු, ධනාත්මක සමාජ මාධ්‍ය ප්‍රවේශයකට යමු. ඔබතුමන්ලාගේ ඔය comments ගහන අයටත් ඒක කියන්න. ඔබතුමන්ලාම ගහන fake comments වෙනස් කරලා අපි ධනාත්මක සමාජයක් නිර්මාණය කරගෙන ඉන්න තැනින් ඉස්සරහට යන්න බලමු. ඒකයි අපට කරන්නට තිබෙන්නේ.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මම මේ කාරණය කියන්න කැමැතියි. කොළඹ නගර සභාවේ බලය පිහිටුවීම සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රී මරික්කාර් මහත්මයා අද උදේ වරුවේ ඉතා බරපතළ අවලාදයක් සහ බොරුවක් කිව්වා, මාලිමාවෙන් සල්ලි දීලා මන්ත්‍රීවරු ගන්නවාය කියලා. එතුමන්ලා හිතාගෙන ඉන්නේ එතුමන්ලා කරන දේවල් අපිත් කරනවා කියලා. අපි කිසිම අවස්ථාවක කිසිම මන්ත්‍රීවරයෙක් කොළඹ නගර සභාවේ බලය පිහිටුවීම සඳහා මුදල් දීලා ලබා ගැනීමක් කරන්නේ නැහැ. එහෙම කරන පක්ෂ තිබෙනවා. නමුත් අපි එහෙම පක්ෂයක් නොවෙයි. දිගින් දිගටම දැන් කථා කරනවා, අවලාද නැඟීම ගැන. අවලාද නැඟුවේ කවුද, මඩ ගැහුවේ කවුද, pages හදාගෙන, fake comments දාගෙන මඩ ගැහුවේ කවුද කියන එක මේ විපක්ෂයේ මන්ත්‍රීවරු, මේ විපක්ෂයේ පක්ෂ හොඳටම දන්නවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා ඒක ගොඩක්ම හොඳින් දන්නවා. ඒක නිසා අපි මෙතැනදී මේ අවලාද නැඟීම්, මඩ ගැහීම් ගැන ඇත්තටම කථා කරන්න අවශ්‍යත් නැහැ. අපි දන්නවා, කවුද අවලාද නඟන්නේ, මඩ ගහන්නේ කියලා. අපි ආවේ වැඩක් කරන්න. අපි ඒ වැඩේ කරනවා. අපට වැඩක් නැහැ, මඩ ගහන ඒවා, අවලාද නඟන ඒවා. නමුත් මේ පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා අමූලික බොරු කියලා, ඊට පස්සේ කියනවා ජාතික ජන බලවේගය බොරු කියනවා කියලා. මේක තමයි පසුගිය කාලය තිස්සේම විපක්ෂයේ දේශපාලනය වුණේ. ඒ අය බොරු කියනවා, ඒ අය මඩ ගහනවා, ඒ අය ඉතා තුච්ඡ, පහත් දේශපාලන ක්‍රියාකාරිත්වයක් ගෙනියනවා. ඒවා කරන ගමන් අමූලික බොරු ව්‍යාපාරයක් ගෙනියනවා, මේ ආණ්ඩුව තමයි බොරු කියන්නේ කියලා.

අනෙක් කෙනා තමයි අර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. මම දන්නේ නැහැ, ඒ මහත්මයා උදේ ඉඳලා මොකට ඔච්චර කෑ ගහනවාද කියලා. ලංකාවේ ආර්ථිකය කඩාගෙන වැටෙන්න යනවා වාගේ බොරුවට කෑ ගහනවා මෙතැනට ඇවිල්ලා. එහෙම කෑ ගහන්න දෙයක් අපේ රටේ ආර්ථිකයට සිද්ධ වෙලා නැහැ. අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් ඉතා දක්ෂ නියෝජ්‍ය අමාත්‍යවරු දෙදෙනෙක් සහිතව මුදල් අමාත්‍යාංශය, ඉතා සූක්ෂම ලෙස, ඉතා බරපතළ ලෙස හැම දෙයක් ගැනම ළඟින්ම බලමින් කටයුතු කරන අමාත්‍යාංශයක් හැටියට වැඩ කරනවා. දැන් මෙතැනට ඇවිල්ලා ඇමෙරිකාවේ වෙළෙඳ බද්ද ගැනයි, අපේ රට ආර්ථික අවපාතයකට යනවාද කියන එක ගැනයි අමූලික බොරු කතන්දර කියනවා. උදේ කිව්වා, IMF එකෙන් අයින් වෙනවා, IMF එක පන්නනවා කියලා අපි කිව්වා කියලා. අපි එහෙම කිව්වාලු. අපි එහෙම දෙයක් කිව්වේ නැහැයි කියලා අපි කියනවා. අපි දැන් මාස 7ක් තිස්සේත්, අපේ ජනාධිපතිවරණ ව්‍යාපාරයට ඉස්සෙල්ලාත් බොහොම පැහැදිලිව ජනතාව හමුවේ කියලා තිබෙනවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් අපේ ස්ථාවරය මොකක්ද කියලා. ඒ ආයතනය ගැන අපට තිබෙන විවේචන ගත්තොත්, ඒවා ඕනෑ රටක තිබෙනවා, ඕනෑ පුද්ගලයෙකුට තිබෙනවා. IMF එක ගැන එවැනි බොහොම විශ්ලේෂණාත්මක විවේචන ඕනෑතරම් තිබෙනවා. නමුත් ඒ ආයතනය සමඟ කටයුතු කිරීමේදී අපේ ස්ථාවරය මොකක්ද කියන එක අපි දිගින් දිගටම බොහොම පැහැදිලිව කියලා තිබෙනවා. හැබැයි එහෙම පැහැදිලිව කියලා තියෙද්දීත්, ඒ බොරුවත් තමන්ගේ කථාවට රිංගවනවා. අපි කිව්වාලු, IMF එක පන්නනවා කියලා. අපි කිසිම අවස්ථාවක එහෙම කියලා නැහැ. අපි කියලා තිබෙන්නේ අපි IMF එකත් එක්ක සාකච්ඡා කරලා ජනතාවට හිතකර ආකාරයට මේ ක්‍රියාවලිය වෙනස් කරනවා කියලායි.

අපි දැනටමත් ඒ සම්බන්ධයෙන් තීරණ අරගෙන තිබෙනවා, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතාව අනුව පනවා තිබුණු සමහර බදු අපි ඉවත් කරලා තිබෙනවා, සමහර බදු අඩු කරලා තිබෙනවා. ඒ වාගේම IMF Programme එකත් එක්ක ඉන්න ලෝකයේ බොහෝ රටවල් ඉතාම අමාරුවෙන් තමයි රාජ්‍ය සේවකයන් අඩු කරන්නේ

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

නැතිව තියාගන්නේ; ඉතාම අමාරුවෙන් තමයි රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්නේ. නමුත් අපි රාජ්‍ය සේවකයන් අඩු කළේ නැහැ. ඒ විතරක් නොවෙයි. අපි අලුතින් යහපත් ලෙස රාජ්‍ය සේවයට කරන බඳවා ගැනීම් වැඩි කරලාත් තිබෙනවා. ඒ වාගේම අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ඉහළ නංවා තිබෙනවා. IMF Programme එකත් එක්ක කටයුතු කරන කිසිම රටක් මේ විධියට ක්‍රියාත්මක වෙලා නැහැ. අඩු ගණනේ ඒ වෙනස පිළිගන්න තරම්වත් නිහතමානීකමක් නැතුව තමයි මේ අය හැමදාම ඇවිල්ලා බොරු කියලා, බොරු කියලා, ඒක කොහේ හරි voice-cut එකක් කරගෙන, ඊට පස්සේ ඒක social mediaවල දාගෙන කටයුතු කරන්නේ. මේක තමයි මේ අයගේ දේශපාලනය. ඒ දේශපාලනය කරලා හිතාගෙන ඉන්නවා, එතුමන්ලා දිනලා ඉන්නවා කියලා. ඒක තමයි ලොකුම විහිළුව. කොහේද ඒ අය දිනලා තිබෙන්නේ? කොතැනද දිනලා තිබෙන්නේ? විපක්ෂයේ මේ කෑ ගහපු පක්ෂ එකක්වත් කොහේවත් දිනලා නැහැ. පළාත් පාලන මැතිවරණයක් කියන්නේ මොකක්ද? පළාත් පාලන මැතිවරණයකින් තෝරන්නේ කවුද? මේ කිසිම පළාත් පාලන ආයතනයක නාමල් රාජපක්ෂට, දිලිත් ජයවීරට, සජිත් ප්‍රේමදාසට කවුරුවත් ඡන්දය දීලා නැහැ. එහෙම ඡන්දය ඉල්ලුවේත් නැහැ. මොනවාද ඒගොල්ලන් දිනපු කොට්ඨාස? කොහේද ඒගොල්ලන් එහෙම ඡන්දයක් ඉල්ලුවේ? මේ බිම් මට්ටමේ ඉන්න කවුරුහරි බොහොම මහන්සියෙන් ඡන්ද අරගෙන ජයග්‍රහණය කරද්දී මේ අය කොට්ඨාස එකක්වත් දිනලා නැති එක ගැන හරි නම් ලජ්ජා වෙන්න ඕනෑ. මේ කෑ ගහන මහත්වරුන් කොට්ඨාස කීයක් දිනලා තිබෙනවාද?

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ඔබතුමාට කවුරු හරි ඡන්දය දීලා තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නම කිව්වාටම බැහැ, point of Order එකක් ගන්න.

ගරු මන්ත්‍රීතුමිය, කථා කරන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම පැහැදිලි කාරණයක් ඉදිරිපත් කළේ. එතුමන්ලාට කවුරු හරි ඡන්දය දීලා තිබෙනවාද කියන එකයි මම ඇහුවේ. එතුමන්ලා ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා; ඡන්දය ඉල්ලුවා; පැරදුණා. ඒක පිළිගන්න. ඒක පිළිගන්නේ නැහැ. දැන් මෙතැන තමන්ගේ කොට්ඨාසයක් ගැන කියනවා. මොන කොට්ඨාසයෙන්ද එතුමන්ලාට ඡන්දය දීලා තිබෙන්නේ? පළාත් පාලන ආයතනය කියන්නේ මොකක්ද කියන එක තේරුම් ගන්න. Ward system එකකට - කොට්ඨාස system එකකට - තමයි පළාත් පාලන ආයතනවල ඡන්දය ලබා දෙන්නේ. ඒ හැම කොට්ඨාසයකටම ඉන්නවා, අපේක්ෂකයෙක්. ඒ හැම කොට්ඨාසයකටම මේ ඉදිරිපත් වෙලා ඉන්න හැම පක්ෂයකින්ම අපේක්ෂකයෙක් ඉන්නවා. ඒ අපේක්ෂකයාට තමයි මිනිස්සු ඡන්දය දෙන්නේ. හරිද? එහෙම තමයි පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන්නේ. ඉතින් මේ ward එකක අඩුම ගානේ පක්ෂ පහක් විතර ක්‍රියාත්මක වෙනවා. ඉතින් පෞද්ගලික සම්බන්ධතා මත ඒ මිනිස්සුන්ට ඡන්ද වැටෙනවා. ඉතින් ඒකේ credit එක වෙන අය ගන්න හදනවා නම්, මොන හොරකමක්ද ඒක? ඒක නේ බොරුව. මේ පළාත් පාලන ආයතන සඳහා බිම් මට්ටමේ ඉන්න අපේක්ෂකයා යාන්තම් ඡන්ද 100ක්, 200ක් එකතු කරලා දුන්නාම, මේගොල්ලන් මේ උඩ ගිහිල්ලා! එහෙම එකක් ඇත්තේ නැහැ. පළාත් පාලන ආයතනයේ ජයග්‍රහණයේ නිර්ණායකය තිබෙන්නේ කොට්ඨාස කොපමණ ප්‍රමාණයක් දිනලා තිබෙනවාද, පළාත් පාලන ආයතන කීයක් පාලනය කිරීමේ හැකියාව ඒ ඒ පක්ෂවලට තිබෙනවාද කියන එක මතයි.

2015-2019 කාලයේදී යහ පාලන රජය සම්බන්ධයෙන් බරපතළ විවේචනයක් ජනතාව අතර තිබුණා. ජනතාවට රජයට පණිවුඩයක් ලබා දෙන්න අවශ්‍ය වුණා, රජයේ ජන වරම අවසානයි කියලා. ඒ පණිවුඩය ජනතාව ලබා දුන්නා. කොහොමද එය ලබා දුන්නේ? පොහොට්ටුවට - පොදුජන පෙරමුණට - අතිවිශාල පළාත් පාලන ආයතන ප්‍රමාණයක බලය ලබා දුන්නා, ජයග්‍රහණය ලබා දුන්නා. ඒක තමයි ජනතාව ලබා දුන් පණිවුඩය. මේගොල්ලන්ට කවුද එහෙම ජයග්‍රහණයක් අරගෙන දීලා තිබෙන්නේ? කොළඹ මහ නගර සභාවේ නගරාධිපති හැටියට ඉදිරිපත් වෙච්ච ඒ මහත්මයා අඩු ගානේ තමන්ගේ කොට්ඨාසයවත් දිනලා නැහැ. හැබැයි, මෙතැන කථා කරන්නේ කොහොමද? කථා කරන්නේ මහා ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා කියලා.

ජාතික මැතිවරණ සහ පළාත් පාලන මැතිවරණ අතර ඡන්දය දැමීමේ විධිය වෙනස්. අපේක්ෂකයන් වෙනස්. එහිදී මිනිස්සු react කරන විධිය වෙනස්. ඒ ඔක්කෝම ඉස්සෙල්ලා අපේ ඇමතිතුමා කිව්වා වාගේ apples and oranges compare කර කර තවදුරටත් තමන් අර කරගෙන ගිය කැත මඩ දේශපාලනය කරගෙන යන්න උත්සාහ කරනවා. මම හිතන්නේ අපි මේ කාරණය බොහොම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. උදේ ඉඳන් විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් කථා කළේ මොනවාද? නාමල් රාජපක්ෂ මහත්තයා සහ දිලිත් ජයවීර මහත්තයා ලොකු ජයග්‍රහණයක් කළා වාගේ මෙතැන ඇවිල්ලා කථා කරනවා. පොදු ජන පෙරමුණට 2018දී පළාත් පාලන ආයතන කීයක බලය ලබා දුන්නාද ජනතාව? නමුත් අද වෙනකොට එක ආයතනයකවත් බලය නැහැ. අද වෙනකොට එක ආයතනයකවත් බලය නැහැ විතරක් නොවෙයි, එක කොට්ඨාසයක්වත් ජයග්‍රහණය කරලා නැහැ. ඉතින් මේක තමයි බොරුව; මේක තමයි මිථ්‍යාව. තමන්ගේ media power එක පාවිච්චි කර කර, තමන්ට තිබෙන මාධ්‍ය ආයතන පාවිච්චි කර කර ජනතාවට බොරු කිව්වේ නැහැ කියනවා.

බොහෝ වාරයක් අපි මේක ප්‍රකාශ කර තිබෙනවා. ජනතාවගේ ඡන්දයට, ඡන්දය ලබා දීමට ජනතාවට තිබෙන බුද්ධිමත්කමට පක්ෂයක් හැටියට අපි ගරු කරනවා; ඒක පිළිගන්නවා. අපි කිසිම අවස්ථාවක ඒ ජනතාවට අපහාස කරන්න ඉඩ ලබා දෙන්නේ නැහැ. අපි එහෙම හිතන්නේත් නැහැ. ජනතාවට අපහාස කරන්නේ තමන්ගේ මාධ්‍ය ආයතන පාවිච්චි කරමින් මැතිවරණ ළං වෙද්දී නයි පෙන්වපු මිනිස්සු කියන එක බොාහොම පැහැදිලියි. දැන් කියනවා, අපි මිනිස්සුන්ට අපහාස කළා ලු. අපි මිනිස්සුන්ට මෝඩයෝ කියනවා ලු. අපට ජන වරමේ බර තේරෙනවා. හිටපු හොාරු ඇවිල්ලා ජන වරමේ බර මොකක්ද කියන එක අපට අමුතුවෙන් පැහැදිලි කිරීමේ අවශ්‍යතාවක් නැහැ. අපි මේ මැතිවරණ ප්‍රතිඵලය කියවාගන්නේ ජනතාව අපට ඔවුන්ගේ විශ්වාසය ප්‍රකාශ කිරීමක් හැටියට පමණයි. ඊට වඩා දෙයක් මේකේ නැහැ. අපි හැම කොට්ඨාසයක්ම

දිනලා තිබෙනවා. පළාත් පාලන ආයතන බහුතරයක පාලනය අපි අරගෙන තිබෙනවා. අපි දිනපු හැම පළාත් පාලන ආයතනයකම බලයත් අපි පිහිටුවනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ යම් මන්දගාමී ස්වභාවයක් ආණ්ඩුවේ තිබුණා කියලා මිනිස්සු කියනවා නම් අපි ඒක පිළිගන්නවා. අපි ඒ වැරැද්ද හදාගන්න ලෑස්තියි. මිනිස්සු අපට ඡන්දය නොදී හිටියා නම් ඡන්දය නොදී හිටියේ මේගොල්ලන් හිරේ නොදැම්ම එකටයි. එහෙම නැතිව, මේගොල්ලන්ට මේ ගරු සභාවට ඇවිල්ලා කෑ ගහන්න කියලා කවුරුවත් ආණ්ඩුවට ඡන්දය නොදී ඉඳලා නැහැ. ඒක බොහොම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. ජන වරම ඒගොල්ලන් තේරුම් ගන්න ඕනෑ. ඇත්තටම මේ මිනිස්සු කථා කරන දේවල් අහගෙන ඉන්නකොට කලකිරෙනවා. ඒ නිසා අපි බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනේන්, මේ ගරු සභාවට ඇවිල්ලා බොරු කියලා, කෙබර ගහලා ඒවා social mediaවල, mediaවල දමන මේ ව්‍යාපෘතිය ඉවර කරලා දමන්න, දැන්වත් හරියට ඉගෙනගෙන, අපහාස කරන, මඩ ගහන දේශපාලනය අවසන් කරලා දමන්න කියලායි. පැරදිලාවත් ඒක ඉගෙන නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිත්තු 5ට ආර්ථිකය ගැන කථා කරන්න නම් හම්බ වෙන්නේ නැහැ.

කෙසේ වෙතත්, පළාත් පාලන මැතිවරණයේදී විපක්ෂයේ සියලු පක්ෂවලට ඡන්දය දුන් ආදරණීය ජනතාවට අපේ ගෞරවනීය ස්තුතිය මේ වෙලාවේ මා පුද කරනවා. මේ මැතිවරණයේදී පුදුම විදියේ ආණ්ඩු බලයක් යෙදෙව්වා. විශේෂයෙන්ම මාස 6ක්, 7ක් ඇතුළත ලක්ෂ 23ක විතර ඡන්ද ප්‍රමාණයක් නැති කර ගත්තා. සියයට 61ක්ව තිබුණු ඡන්ද ප්‍රතිශතය 43 දක්වා අඩු කර ගත්තා. ජාතික ජන බලවේගය දිනාගත් ආයතන 264කින් ඇත්තවශයෙන්ම සභා පිහිටුවන්න පුළුවන් වන්නේ 116ක. ඒ වාගේම පළාත් පාලන ආයතන 149කට බහුතර බලයක් නැහැ. ආයතන 29ක් සම සමව තිබෙන්නේ. මේකෙන් අදහස් වෙන්නේ මොකක්ද? මට හිතාගන්න බැහැ, මේක තේරෙන්නේ නැද්ද කියලා. තේරෙන්නේ නැති එකම තමයි ප්‍රශ්නය. ඒ නිසා 116ද ලොකු, 149ද ලොකු කියලා ඉස්සෙල්ලා බලන්න ඕනෑ. ඒ කියන්නේ සභාවලින් ගත්තොත්.

දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මම මුල ඉඳලාම කිව්වා, මේ ආණ්ඩුව පව ආණ්ඩුවක් කියලා. පව කියලා තමයි දිනුවේ. පව කියලා තමයි ආණ්ඩුව පවත්වාගෙන ගියේ. ඒ වාගේම මේ මැතිවරණයේදී ජනාධිපතිතුමාම කිව්වා, ප්‍රතිපාදන දෙන්නේ නැහැ කියලා. විපක්ෂයේ ඉන්නේ හොරු කිව්වා, ඩයස්පෝරාවට එන්න කිව්වා, පවුල් ලක්ෂ 4කට අස්වැසුම දෙනවා කිව්වා, හංගාගෙන හිටපු රත්තරන් බෙදුවා, ඉඩම් බෙදනවා කිව්වා, සමහර රැස්වීම්වලට ගිහිල්ලා ළමයි හැංගුවා, හංගලා ළමයි ආයෙත් මතු කරලා ගත්තා, දළදා වන්දනාව කළා, බස් රථ 5,500ක් ගෙනැල්ලා රුපියල් කෝටි විසිහතහමාරක් වියදම් කරලා ගෝල් ෆේස් එක සෙනඟින් පිරෙව්වා. මේ සියල්ලම කරලාත් අපි දැක්කා, අතිවිශාල ජයග්‍රහණයක් නම් ගන්න ලැබුණේ නැහැ කියලා. මාස 7ක් ඇතුළත තිබුණු ජන වරමත් නැති කර ගත්ත එක තමයි සිද්ධ වුණේ. මේක සංසන්දනය කරන්න උත්සාහ කර තිබුණා, 2018දී පළාත් පාලන මැතිවරණයේදී පොහොට්ටුව ලබා ගත්තාට වඩා විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගත්තා කියලා. ඒකත් පවයක්. 2018දී පොහොට්ටුව විපක්ෂයේ හිටියේ. ඒ කාලයේ එතුමන්ලා ගත්තා, ඡන්ද 4,941,952ක්; සියයට 44.5යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කියන්න ඉඩ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ඒකත් නැති වනවා.

2025දී ජාතික ජන බලවේගයේ ජනාධිපතිවරයෙක් ඉඳලාත්, ආණ්ඩුවක් තිබිලාත්, පාර්ලිමේන්තුවක් තිබිලාත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 159ක් ඉඳලාත් ඡන්ද ලැබුණේ 4,503,930යි; සියයට 43.26යි. මම ඒකයි කියන්නේ මේ කාරණා එක්ක ගත්තාම මේ ආණ්ඩුවට ජන බලය අහිමි වෙලා තිබෙනවා කියලා. රටේ ජනතාවගේ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒක පිළිගන්න. උද්ධච්චකමට, තිබුණු මහන්තත්තකමට ජනතාව දුන් පිළිතුරක් තමයි මේ ප්‍රතිඵලය.

බලන්න, අද උදේ මෙතැන පැය භාගයක් නාස්ති වුණා. නැත්නම් ඔබතුමා මගේ වෙලාව කපන්නේ නැහැ. අද උදේ ශ්‍රීනේසන් මන්ත්‍රීතුමාට වෙලාව දීලා තිබුණා. උදේ පැය භාගයකට එතුමාට ඉඩ දීලා තිබුණා. ඒ පැය භාගය දෙන්න හදනකොට ඒකට සභානායකතුමා කෙළින්ම මැදිහත් වුණා. එක වෙලාවක කථානායකතුමා පැත්තක ඉන්නකොට සභානායකතුමා කියනවා, නැහැ, නැහැ, එහෙම කරන්න බැහැ, 5.00ට නතර කරලා නිකම් ඉන්න කියලා. පසුගිය 10වැනි දා මම විනාඩි ගණනක් කථා කළා. එතුමාට කථා කරන්න ඉතිරිව තිබුණා, විනාඩි 16ක්. හැබැයි, මොකක්ද වුණේ? 5.30 වෙනකල් තිබුණු ඒ විනාඩි 16 වෙනුවට එතුමා විනාඩි 46ක් කථා කරලා තිබෙනවා. මේ සභාව ඒගොල්ලන්ගේ සභාව විධියට භාවිත කරමින්, කාලය දීර්ඝ කරන්න ඒගොල්ලන් අත ඔසවනවා. අත ඔසවා වෙලාව අරගෙන ඒගොල්ලන්ම කථා කරනවා. ඕනෑ නම් අද මේ සභාව 5.30 වෙනකල් පවත්වන්න තිබුණා, උදේ ඒ වෙලාව නැතිවීම නිසා. මට කථා කරන්න විනාඩි 7ක් තිබුණා. දැන් ඒ විනාඩි 7ත් නැහැ. ඊට පසු නැවත තව විනාඩි 2ක් එකතු කළා, ඒ විනාඩි 2ත් දැන් නැහැ. දැන් මට ලැබුණේ විනාඩි 5යි. මේ සභාව, පැය භාගයක් ඉදිරියට පවත්වන්න තිබුණා නේ. මොකද, උදේ පැය භාගය අපි වැඩ කළේ නැහැ. හැබැයි, ඒ කාලය දුන්නේ නැහැ. සභානායකතුමන්ලාට -ආණ්ඩුවට- කැමැති විධියට, ඒ අයට කථා කරන්න ඕනෑ වෙනකොට පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කර ගන්නවා. අපට මේ සභාව ගෙනයන්න ඉඩක් නැහැ.

ඊළඟට මම මේ කාරණයත් කියන්න කැමැතියි. දැන් බලන්න, ජනාධිපතිතුමා වියට්නාම ගමන ගිහිල්ලා jet එකකින් ආවා කියලා අපේ හර්ෂණ රාජකරුණා මැතිතුමා ප්‍රශ්නයක් නැඟුවා. ආණ්ඩුවෙන් ඉස්සෙල්ලා කියලා තිබුණා, ඒ වියදම ඒ ආණ්ඩුවෙන් දැරුවා කියලා. ඊට පස්සේ කියනවා, නැහැ, නැහැ, බෞද්ධ සභාවකින් ඒ වියදම දැරුවා කියලා. මම කියන්න කැමැතියි, මේ අපේ රටේ ජනාධිපති බව. මේ රටේ ජනාධිපති අනුර දිසානායක

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මහත්මයාද, කවුද කියන එක අපට අදාළ නැහැ. නමුත්, දැන් ඔහොම private jetවල නිකම් එනකොට එතුමාගේ ජීවිතය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒකයි මම කියන්නේ. අර බීලා වැඩි වුණාම සමහරුන් කියන්නේ, අපි ගිහින් දාලා එන්නම්, වාහනයට නඟින්න කියලා. මෙතැනදී එහෙම දෙයක් කරන්න බැහැ. මේ, අපේ රටේ ජනාධිපති. මම අහන්න කැමැතියි, මේ Protocol Division එකේ අය මොකක්ද කළේ කියලා. ඔන්න, ඇමෙරිකාවේ Air Force One එකට දුන්නා නම් කමක් නැහැ. ඒකට නොවෙයි නේ මේ දීලා තිබෙන්නේ. මේ jet එකක්; private jet එකක්. Protocol Division එකේ කවුද මේකට ඉඩ දුන්නේ? Civil Aviation Authority එකේ කවුද මේකට ඉඩ දුන්නේ? කොහොමද ඒක ආවේ? ඒකයි මම කියන්නේ. ඒ නිසා අඩු මිලට යනවා වාගේම මතක තබාගන්න ඕනෑ, පරිස්සම් වෙන්නත්. මේ වාගේ private jetවල ඕනෑ එකක් set කරලා යැව්වොත් මොකක්ද වෙන්නේ? එවන්නේ දයාශාන්ත අයියාගේ ව්‍යදමින්. ඊළඟට, energy එකට මොකක් හරි එකක් තියලා එව්වොත් රටේ ජනාධිපතිට තමයි ප්‍රශ්නය ඇති වෙන්නේ. ඒ නිසා මේවා ගැන කල්පනා කරන්න කියලා අපි විශේෂයෙන් ඉල්ලනවා.

මේ අවස්ථාවේ මම මේ කාරණයත් කියන්න කැමැතියි. ජාතික ජන බලවේගය හිතනවා නම් ඒගොල්ලන් ජයග්‍රහණය කළාය කියලා, තව මාස 6ක්, 7ක් යනකොට තත්ත්වය ඊට වඩා දරුණු වුණාම ඒක තේරෙයි. අද මම කියන්න කැමැතියි, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව ගැන. අපේ ප්‍රාදේශීය සභාවේ ඉන්නවා, ස්වාධීන මන්ත්‍රීවරු දෙදෙනෙක්. දැන් තැන් තැන්වලින් ඒ අයට කථා කරනවා, මුදල් දෙන්න. ඒ අය කියලා තිබෙනවා, නැහැ, නැහැ, අපට එහෙම අවශ්‍යතාවක් නැහැ, අපි ස්වාධීනව ආපු මන්ත්‍රීවරු, අපි අපේ තීන්දුව ගන්නම් කියලා. දැන් බලන්න, මේ දේවල් මෙතැනට තල්ලු වෙලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, කොළඹ මහ නගර සභාවේ ඒ ගාන කීයද කියලා. රුපියල් ලක්ෂ 25 ඉඳලා ස්වාධීන මන්ත්‍රීවරුන්ට යෝජනා කරනවා. මෙච්චර කාලයක් ඔබතුමන්ලා කිව්වා නේ අනෙක් පක්ෂවල අය එකතු කර ගන්නේ නැහැ කියලා. දැන් එකතු කරනවා ලු. ඔය ඔක්කෝම හොරු කියලා නේ කිව්වේ. දැන් ඒ හොරුත් එකතු කර ගන්නවා. හොරු සුද්ද කරලා, සුද්ද කරලා, ලොන්ඩරියට දාලාත් සුද්ද කරලා කොහොම හරි තමන්ගේ පැත්තේ තබාගන්නයි හදන්නේ. දැනට පඩුවස්නුවර පැත්තේ ගාන රුපියල් ලක්ෂ 25යි. මෙහේ රුපියල් කෝටි දෙකයි කියලා තමයි ආරංචිය. මම දන්නේ නැහැ, කීයක් හරි දීලා ගන්නයි හදන්නේ. ඒ නිසා මම කියන්න හදන්නේ, අර පරණ පුරුදු මිලදී ගැනීමේ ක්‍රමය නැවත ක්‍රියාත්මක වන්න යන බව තමයි. ඔබතුමන්ලා කිව්වා නම්, "අනික් පක්ෂවල ඉන්නේ ඔක්කෝම හොරු, ඒ මිනිස්සු ගන්නේ නැහැ අපි තනියම කරන්නම්" කියලා, දැන් තනියම කරන්න. මේ ස්වාධීනව ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් දැන් එක්කෙනා දෙන්නා බිලී බාගන්න වැඩ පිළිවෙළ හැම තැනම සකස් කරනවා. පඩුවස්නුවර මගේ ආසනය නිසායි ඒ ගැන මම කියන්නේ. තිබුණු ආණ්ඩු කඩා වැටෙනකොට, බලය නැති වෙනකොට කොහෙන්හරි බලය හදාගැනීම සඳහා වන අර පරණ ප්‍රතිගාමී වැඩේම කරන්න තමයි මේ පටන් අරගෙන තිබෙන්නේ. කමක් නැහැ, ඔහොම යමු. ජනතාව තීන්දු කරයි, අනාගතයේ මොකක්ද කරන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, මට වෙලාව ලබා දීම ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.53]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රේගු ආඥාපනත යටතේ ගෙනෙන යෝජනා සම්මතය වාද විවාදයට ලක් කරන වෙලාවේ මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. මෙහි වාහන ආනයනයට අදාළ කාරණා කිහිපයක් තිබෙනවා. අපේ ජනාධිපතිවරයා අය වැය ඉදිරිපත් කරලා කිව්වා, මේ වතාවේ මන්ත්‍රීවරුන් සඳහා වාහන ගෙනෙන්න වෙන්නේ නැහැ කියලා. හැබැයි, එහෙම කියලා වසර 6ක් නැවතිලා තිබුණු වාහන වෙළෙඳ පොළ දැන් ජනතාවට විවෘත කර තිබෙනවා. මම එක දෙයක් කියන්නයි හදන්නේ. මෙතෙක් කල් ජනතාවගේ පටිය තද කරගන්න කියපු පාලකයන්ට උත්තරයක් විධියට අපේ ජනාධිපතිවරයා අපේ පටිය තද කරගෙන - මහජන නියෝජිතයාගේ පටිය තද කරගෙන - ජනතාවට පටිය ලිහන්න අවස්ථාව දීලා තිබෙනවා. වසර හයකට පස්සේ ජනතාවට වාහන ගෙනෙන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. දැන් විපක්ෂය පැත්තෙන් කියැවුණා, "වාහන මාර ගණන් නේ, මාර බද්දක් ගහනවා නේ කියලා, අහවල් අහවල් වාහනවලට මෙහෙම ප්‍රශ්න තිබෙනවා නේ" කියලා. මෙහෙමයි. අපි විපක්ෂයට කියනවා, දැනට සතුටු වෙන්නකෝ කියලා. අපි බංකොලොත් වෙච්ච ආණ්ඩුවකුත් අරගෙන, වසර හයක් නවත්වා තිබුණු වාහන වෙළෙඳ පොළ මාස හයෙන් විවෘත කර තිබෙනවා. ඒවා පිළිබඳ ගැටලු තිබෙනවා නම්, ඒ දවස්වල අර සාටක මහත්වරු බොම්බයි ලූනු ලාබද, පරිප්පු ලාබද, සැමන් ටින් එක කීයද කියලා ඇහුවා වාගේ මරුටි කාර් එක කීයද, ඇල්ටෝ එකේ දැන් තත්ත්වය කොහොමද කියලා අපට කියන්න බැහැ නේ.

අල, ලූනුවලට සමාන කරන්න පුළුවන්කමක් නැහැ නේ, වාහන. ඒ බදු පිළිබඳ යම් ගැටලුවක් තිබෙනවා නම් ඒ පිළිබඳව මුදල් අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡාවක් කරගන්න පුළුවන්, ඉදිරි කාලයේ රට යම් තත්ත්වයකට පත් වූ පසු. නමුත් වසර හයක් නවත්වා තිබුණු වාහන වෙළෙඳ පොළ අපි යළිත් විවෘත කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට වාහන ආනයනකරුවන්ට ගැටලු රාශියක් පැන නැඟිලා තිබෙනවා. ඔවුන් නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා එක්ක අවස්ථා කිහිපයකදී සාකච්ඡා කරලා ඒ ගැටලු නිරාකරණය කරගෙන තිබෙනවා. අදටත් තිබෙන ප්‍රශ්නයක් ලෙස ඔවුන් ඉදිරිපත් කරන්නේ වාහන clearanceවලදී ඇතිවන තත්ත්වයයි. දවසකට වාහන 50ක්, 60ක් පමණ ලු, දැනට clear වෙන්නේ. නමුත් අඩුම තරමින් වාහන 250ක් පමණ clear වෙන්න ඕනෑ. එතැන යම් අඩුපාඩුවක් තිබෙනවා නම්, රේගුව පැත්තෙන්, වරාය පැත්තෙන් ඒක නිවැරදි කරගත යුතු තත්ත්වයක් තිබෙනවා. ඒකට ආණ්ඩුව විධියට අපි මැදිහත්වීමක් කරන්නම්.

රේගු ආඥාපනත යටතේ වන ගැසට් නිවේදනය පිළිබඳ විවාදය අස්සේ ප්‍රධාන වශයෙන් කථා බහ වුණේ අපේ රටේ මැතිවරණ සම්බන්ධ කථාවයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට නම් මේවා ඇහුණාම හිනා වෙන්නේ කොහෙන්ද කියලා හිතාගන්න බැහැ. දැන් මේ මැතිවරණ ජයග්‍රහණය පිළිබඳ කථා කරනවා. මුහුණ දුන්නේ ජනාධිපතිවරණයකටද, මහ මැතිවරණයකටද, පළාත් පාලන මැතිවරණයකටද කියන එකේ වෙනස හඳුනා ගන්නේ නැතිව මෙතැනට ඇවිත් ඒ සංඛ්‍යාලේඛන උපුටා දක්වමින් කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරණයේදී දිනන්නේ එක්කෙනායි. මහ මැතිවරණයකදී මන්ත්‍රීවරුන් 225දෙනෙක් තේරී පත් වෙනවා. ඒක වෙනස් වර්ගයක මැතිවරණයක්. පළාත් පාලන මැතිවරණයක ඊට වඩා වෙනස් තත්ත්වයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැතිවරණයේ වෙනස අපට හරියටම පැහැදිලි කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ තමයි ඇල්පිටිය ප්‍රාදේශීය සභාවට අදාළ මැතිවරණය පැවැත්වුයේ. ජනාධිපතිවරණය ජයග්‍රහණය කරලා තිබෙන වටපිටාවක් ඇතුළේ අපට ඇල්පිටියෙන් ලැබෙන්නේ ඡන්ද සියයට 47.64යි. ඊට මාස එකහමාරකට, දෙකකට පස්සේ තමයි මහ මැතිවරණය එන්නේ. සියයට 47.64ක්ව තිබුණු අපේ මැතිවරණ ප්‍රතිඵලය මහ මැතිවරණයේදී සියයට 61.56ක් දක්වා ඉහළට එනවා. එනවා විතරක් නොවෙයි. ජනතාව තුනෙන් දෙකකට එහා ගිය බලයක යළිත් අපි තියනවා. ඊට පසුව පැවති පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපට ලැබෙන්නේ සියයට 43.26යි. මේ ගැන කෑගහන විපක්ෂයේ පක්ෂ නායකයන්ට අපි කියන්නේ ඒගොල්ලන්ගේ මැතිවරණ ප්‍රතිඵල කියවාගන්න කියලායි.

දැන් මෙතැන සමගි ජන බලවේගයේ මරික්කාර් මන්ත්‍රීතුමා අපේ අඩුව ගැන කථා කරනවා. හැබැයි, ඒගොල්ලන්ගේ මැතිවරණ ප්‍රතිඵලයට මොකක්ද වෙලා තිබෙන්නේ? පසුගිය ජනාධිපතිවරණයේදී ලැබුණු ප්‍රතිඵලයටත් වඩා අඩු ප්‍රතිඵලයක් තමයි සමගි ජන බලවේගය මෙවර අරගෙන තිබෙන්නේ. ඉතින්, මොනවාද මේ පුරෝකථන? දැන් මේ අය මැතිවරණ ප්‍රතිඵලවල වෙනස ගැන කථා කරනවා. දැන් මෙතැන කියවුණා නේ, අපේ මැතිවරණ ප්‍රතිඵලය කියවාගන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හොඳටම මැතිවරණ ප්‍රතිඵලය කියවාගෙන තිබෙන්නේ. අපට ගෙඩිය පිටින් සභා 267ක් තිබෙනවා. 2018දී පොහොට්ටුවෙන් තරග කළ පක්ෂය ගත්තේ සභා 226යි. අපට 267ක් තිබෙනවා. තව බලය සමාන වෙච්ච ආයතන ගණනාවක් තිබෙනවා. ඉතින්, ඉතාම පැහැදිලි ප්‍රතිඵලයක් ජාතික ජන බලවේගයට ලබා දීලා තිබෙනවා. දැන් කථා වෙන්නේ මොකක්ද? දැන් මෙතැන විශේෂයෙන් highlight වුණා, කොළඹ මහ නගර සභාවේ ප්‍රතිඵලය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන කටකින්ද මෙහෙම කියන්නේ? අපට සම්පූර්ණ ආසන 48ක් තිබෙනවා.

සමගි ජන බලවේගයට තිබෙන්නේ ආසන 29යි. අපට බලය පිහිටුවන්න තවත් අවශ්‍ය වෙන්නේ ආසන 11යි. ඒගොල්ලන්ට තවත් ආසන 30ක් ඕනෑ. එතකොට වඩාත්ම සදාචාරාත්මක, වඩාත්ම නීත්‍යානුකූල ආසන 48ක් ලබාගෙන අපි ලබා ගත්ත බලයද, එහෙම නැත්නම් ආසන 30කට ආසන්න සංඛ්‍යාවක් ලබාගෙන ඒගොල්ලන් ලබා ගත්ත බලයද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන එක එක කථා මවනවා, අපි සල්ලි දෙන්න යනවා, අපි ඒ අය සමඟ සාකච්ඡා කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම පැහැදිලියි, අපට රටේ රාජ්‍ය බලය තිබෙනවාය කියන එක. ඊට අමතරව මේ පළාත් පාලන මැතිවරණයේදී කොළඹ මහ නගර සභාවට අපට ආසන 48ක් ලැබුණා. ඉතින් එහා පැත්තේ වාඩිවෙලා ඉන්න මන්ත්‍රීවරු සාධාරණව කල්පනා කරලා අපත් එක්ක සාකච්ඡා කරනවා, "ඔබතුමන්ලාට තවත් ආසන 11 අඩු නිසා අපි ඔබතුමන්ලාට හයියක් දෙන්නම්, අපි මේ මහ නගර සභාව පවත්වාගෙන යමු" කියලා. ඒ, අපේ භාවිතාව ඇතුළේ තිබිච්ච තත්ත්වයක්. ඉතින් ඒ නිසා කාටවත් අපි ප්‍රශ්නයක් ඇති කරලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි හරියටම මේ මැතිවරණ ප්‍රතිඵලය කියවාගෙන තිබෙනවා. මේ මැතිවරණ ප්‍රතිඵලය ඇතුළේ අපි සදාචාරය රැකලා තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. විපක්ෂයෙන් කියැවුණා, අපි මේ මැතිවරණයට රාජ්‍ය බලය පාවිච්චි කළා කියලා. පසුගිය මැතිවරණවලදී සිල් රෙදි බෙදලා, වතුර බෝතල් බෙදලා, කෙහෙල් ගෙඩි බෙදලා තමයි මැතිවරණ කළේ. එතකොට අපි? සිල් රෙදි බෙදනවා වෙනුවට අපි ජනතාවට බෙදුවේ ප්‍රජාතන්ත්‍රවාදය. තේරුණාද? අපි ජනතාවට ලබා දුන්නේ සාමය; නීතියේ බලය.

ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ අපි විරුද්ධ පාක්ෂිකයන්ට අගනා ආදර්ශයක් දීපු මිනිස්සු. ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ රාජ්‍ය බලය තියාගෙන අපි පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූවා. අපි එක රාජ්‍ය ආයතනයකින් ඒ සඳහා රුපියල් පහක් අරගෙන නැහැ. එතකොට මේ පළාත් පාලන මැතිවරණය? කාටද කියන්න පුළුවන්, මේ පළාත් පාලන මැතිවරණයේදී අපි මොනම හරි පළාත් පාලන ආයතනයක බඩු භාණ්ඩ පාවිච්චි කළා, මෙන්න මේ මේ දේවල් දුන්නා කියලා? එහෙම කිසිදු තත්ත්වයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි අගනා ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. අපි රාජ්‍ය බලය පාවිච්චි කරලා නැහැ. එවැනි වාතාවරණයක් තුළත් විපක්ෂයෙන් නඟන මේ චෝදනා පදනම් විරහිතයි. බොහොම පැහැදිලියි, මේ මැතිවරණ ප්‍රතිඵලය අපි හොඳට කියවාගෙන තිබෙන බව. ඒ නිසා අපට ප්‍රජාතන්ත්‍රවාදය ගැනවත්, නීතියේ බලය ගැනවත් කියා දෙන්න ඕනෑ නැහැ. ඒවාට උරුමකම් කියපු, ඒවාට උඩ ගෙඩි දීපු දේශපාලන ව්‍යාපාර නන්නත්තාර වෙලා ඇවිල්ලා අද මෙතැන අපට පාඩම් කියා දෙන්න හදනවා. ඒක කවදාවත් හරි යන්නේ නැහැ. ඒක නිසා හරි පැහැදිලියි,- *[බාධා කිරීමක්]* උතුරේද? උතුර ගැන අහගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

මට ලැබී ඇති කාලය අවසාන නිසා ඒ ගැන කියන්න විධියක් නැහැ.

මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.03]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இச்சபையில் வாகன இறக்குமதி வரி சம்பந்தமான விவாதம் நடைபெறுகின்ற இவ்வேளையில், கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் பிரசார மேடைகளில் பேசப்பட்ட விடயங் களை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

1990ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் 28ஆம் திகதி வட மாகாணத்திலிருந்து பலவந்தமாக வெளியேற்றப்பட்ட சமூகம்தான் முஸ்லிம் சமூகம்! இவ்வாறு அகதிகளாக வெளியேற்றப்பட்டவர்களின் அவல வாழ்க்கையைப் பார்த்து அனுதாபப்படாமல், அவர்கள் shopping bag உடன் அகதிகளாக வெளியேற்றப்பட்டமை பற்றி அரசியல் மேடைகளில் அநாகரிகமாகவும் இழிவாகவும் பேசினார்கள். அந்த வகையில், மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்களை 'shopping bag உடன் வந்தவர்' என்று சொன்னார்கள். அவர் மட்டுமல்ல, அங்கிருந்து வெளியேற்றப்பட்ட 150,000 முஸ்லிம் மக்களும் shopping bag உடன்தான் வந்தார்கள். அவர்களில் நானும் ஒருவன். அப்பொழுது, மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்கள் A/L படிக்கின்ற மாணவனாக இருந்தார். அவர் அங்கிருந்து புத்தகங்களைக் கொண்டுவரவில்லை; கொப்பிகளைக் கொண்டுவரவில்லை. இவ்வாறு எதுவுமே இல்லாமல் shopping bag உடன் வந்தவர்களை நீங்கள் ஏற்றுக்கொள்கின்றீர்களா? அவ்வாறு வந்தவர்களிடம், ஏன் நீங்கள் புத்தகம் கொண்டுவரவில்லை, கொப்பி கொண்டுவரவில்லை? என்று கேட்டிருந்தால் நாங்கள் சந்தோஷப்பட்டு இருப்போம்.

கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தல் பிரசார மேடைகளில் பேசப்பட்ட இந்த விடயத்தை முஸ்லிம் மக்கள் அனைவரையும் அவமானப்படுத்தக்கூடிய ஒரு விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். அதுமட்டுமல்ல, அகதிகளாக வெளியேற்றப் பட்டவர்களுக்கு அந்தக் காலத்தில் எந்தவிதமான நிவாரணமும் வழங்கப்படவில்லை. அவர்கள் பட்ட துன்பங்களும் துயரங்களும் மட்டிலடங்காதவை. நானும் அகதியாக அநுராதபுர மாவட்டத்தில் 20 வருடங்களாக வசித்து வருகின்றேன். வட மாகாணத்திலிருந்து வெளியேற்றப்பட்ட ஒன்றரை இலட்சம் முஸ்லிம் மக்களின் வரலாற்றை மாத்திரமல்ல, மெனிக்பாமில் முட்கம்பி வேலிக்குள் அடைத்து வைக்கப்பட்டிருந்த மூன்றரை இலட்சம் தமிழ் மக்களின் வரலாற்றையும் நாங்கள் பார்க்க வேண்டும். அவர்கள் மாத்திரமல்ல, வவுனியாவின் எல்லைக் கிராமங்களிலும், அநுராதபுரத்தின் எல்லைக் கிராமங்களிலும் இருந்த சிங்கள மக்களும் யுத்தத்தால் பெரிதும் பாதிக்கப்பட்டு இருக்கின்றார்கள்.

1990ஆம் ஆண்டு வெளியேற்றப்பட்ட அந்த மக்களுக்கு இதுவரை எந்தவிதமான நிவாரணமும் வழங்கப்படாத ஒரு துர்ப்பாக்கிய நிலைமையே இருக்கின்றது. திடீரென ஒலிபெருக்கிமூலம் புலிப் பயங்கரவாதிகளால் இரண்டு மணித்தியால கால அவகாசத்தில் வெளியேற்றப்பட்ட சமூகம்தான் இந்த முஸ்லிம் சமூகம்! அவர்கள் தங்களது கைகளாலே தங்களது வீடுகளின் திறப்புகளைக் கையளித்து விட்டு வந்தவர்கள். தயவுசெய்து இனிமேலும் நீங்கள் shopping bag கதையைக் கூறி, அந்த மக்களை அவமானப்படுத்த வேண்டாம். ஏனெனில், உங்களுக்கு முஸ்லிம் மக்களும் தமிழ் மக்களும் வாக்களித்து இருக்கிறார்கள். மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்களின் பெயரைச் சொல்லி, முஸ்லிம் சமூகத்தையே அவமானப்படுத்த வேண்டாம். அன்று shopping bag உடன் அகதியாக வந்த அவர், கொழும்பு ஸாஹிரா கல்லூரியில் படித்து, பல்கலைக்கழகம் சென்று, பொறியிய லாளராக வெளியேறி, இன்று ஒரு சமூகத்துக்காகக் குரல் கொடுக்கக்கூடிய தலைவராக இருக்கின்றார். இது தவறா? என நான் கேட்கின்றேன்.

அன்று இவ்வாறான தலைவர்கள் இல்லாத காரணத்தால் தான் நாங்கள் வடக்கிலிருந்து வெளியேற்றப்பட்டு, இன்னும் அந்தத் துயரத்திலிருந்து மீள முடியாமல் இருக்கின்றோம். பொருளாதாரத்தில் பாதிப்பு, கல்வியில் பாதிப்பு எனப் பல பாதிப்புகளை நாங்கள் சந்தித்திருக்கின்றோம். எங்களுடைய மக்களில் பலர் இன்னும் வீடுகள் இல்லாமல் இருக்கின்றார்கள். இந்த நிலைமையைக் கருத்திற்கொண்டு, மக்களின் அதிக ஆதரவைப் பெற்றுள்ள இந்த அரசாங்கம், யுத்தத்தால் பாதிக்கப்பட்டுள்ள தமிழ் மக்களுக்கும் முஸ்லிம் மக்களுக்கும் நிவாரணம் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். யுத்தத்தால் பாதிக்கப்பட்ட அநேகமான அரச ஊழியர்கள் இப்போது ஓய்வுபெற்று விட்டார்கள். அவர்களுக்கு எந்த விதமான நிவாரணமும் கிடைக்கவில்லை. அவர்களுக்கு நிவாரணம் வழங்குமாறு அன்பாக வேண்டி விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.08]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් කථා කළ මන්ත්‍රීවරයා ෂොපින් බෑග් සම්බන්ධව කරුණු කාරණා වගයක් සභාවට ඉදිරිපත් කළා. මම හිතන විධියට, එම කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ජාතික ජන බලවේගයවත්, ජාතික ජන බලවේගය නියෝජනය කරන කිසිම මන්ත්‍රීවරයෙකුවත් විශේෂයෙන්ම යුද්ධය පැවැති කාලයේ අවතැන්වෙලා උතුරේ මන්නාරමේ හෝ වෙනත් පළාතකින් පැමිණි කිසිවෙකුත් කවදාවත් කිසිම අවස්ථාවක අවතක්සේරුවට ලක් කළේ නැහැ කියන කාරණාව මම කියන්න කැමැතියි. මේ කථාව දේශපාලන පිටිය තුළ මතු කරන්නේ විශේෂයෙන්ම දේශපාලනය යොදා ගනිමින් මුදල් හම්බ කිරීම සඳහා මිසක්, වෙනත් කාරණාවකට නොවන වගත් මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ඒ නිසා දේශපාලන පැවැත්ම වෙනුවෙන් ඒ දේවල් තමන්ගේ වාසියට පාවිච්චි කරන්න එපා, සාධාරණව හිතන්න පුරුදු වෙමු කියන කාරණාවත් මම කියනවා.

இங்கு shopping bag சம்பந்தமான கதையொன்று கூறப்பட்டது. யுத்தம் காரணமாக வடக்கிலிருந்தும் கிழக்கின் பல பகுதிகளிலிருந்தும் விரட்டப்பட்ட சகோதரர்கள் பட்ட துன்பங்கள், கஷ்டங்கள் தொடர்பாகவும் அவர்கள் அன்றிலிருந்து இன்றுவரை முகம்கொடுத்து வருகின்ற சவால்கள் சம்பந்தமாகவும் தேசிய மக்கள் சக்திக்கு அல்லது தேசிய மக்கள் சக்தியைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளு மன்ற உறுப்பினர்களுக்கு ஒரு தெளிவு இருக்கின்றது என்பதை நான் இங்கு மிகவும் அன்புடன் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டில் அரசியலுக்கு ஊடாகத் தவறான வழியில் பணம் சம்பாதித்தவர்களை மையப்படுத்தி - அரசியலை வியாபாரமாக்கி, அதனூடாக தனவந்தர்களாக மாறியவர்களை மையப்படுத்தி - இந்தக் கருத்து முன்வைக்கப் பட்டதே ஒழிய, ஒருசில மணித்தியாலங்களில் தங்களது வீடுகளிலிருந்து விரட்டப்பட்டு, அநியாயமாகப் பாதிக்கப்பட்ட மக்களுக்குக் கூறப்பட்டதல்ல. பாதிக்கப்பட்ட மக்கள் பற்றி எத்தகைய பிழையான உணர்வும் தேசிய மக்கள் சக்தியினரிடம் இல்லை என்பதை நான் இங்கு மிகத் தெளிவாகச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

අපි දන්නවා, පසුගිය දිනක අපේ රටේ පළාත් පාලන මැතිවරණය පැවැත්වූ බව. විශාල අභියෝග, අවලාද මැද්දේත්, ඒ වාගේම බොරු ප්‍රචාර මැද්දේත් එම මැතිවරණයේදී ආදරණීය ශ්‍රී ලාංකික ජනතාව අපට ඡන්දය ලබා දීලා අපට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන අතරම, මුස්ලිම් ජනතාවටත් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. මොකද, අපි දන්නවා, ඇතැම් අය අවලාද නඟමින්, පීඩන එල්ල කරමින් රජයෙන් මුස්ලිම් ජනතාව බැහැර කිරීම සඳහා මොන තරම් විශාල ප්‍රයත්නයක් දැරුවාද කියන වග. විශේෂයෙන් සමහර මාධ්‍යවල හැසිරීම දෙස බලනකොටම අපට ඒ බව පෙනී ගියා. එවැනි තත්ත්වයක් තිබියදීත් ජනතාව රජය පිළිබඳ විශ්වාසය තබමින් -රජයත් එම විශ්වාසය ආරක්ෂා කළා- අපට ඡන්දය ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

මැතිවරණ වේදිකාවලදී අපි දැක්කා ජාතික නායකයන් යැයි කියන සමහර පිරිස් පවා ඇතැම් අවස්ථාවලදී ඉතාම පහත් තැනකට වැටී විවේචන කළ ආකාරය. නමුත් එතැනට නොවැටී ගෞරවනීය විධියට දේශපාලනය අපට කරන්න පුළුවන් වුණා. සාමාන්‍යයෙන් අපේ රටේ ඉතිහාසය තුළ පැවැති පළාත් පාලන මැතිවරණවලදී ජනතාව ඡන්දය ලබා දීමේදී හැසිරුණු ආකාරය අපි දන්නවා. ඒවාත් එක්ක සංසන්දනාත්මකව බලනවිට, මෙවර පැවැති මැතිවරණයේදී ජනතාව අපට සුවිශේෂී ජයග්‍රහණයක් ලබා දීලා තිබෙනවා. මේ මැතිවරණ ප්‍රතිඵල හමුවේ ඇති කරුණු කාරණා විශ්ලේෂණය කරමින්, අධ්‍යයනය කරමින්, සියලු ජනතාව ඒක රාශි කර ගනිමින් ඉදිරියට යෑම සඳහා අවශ්‍ය පසුබිම ශක්තිමත්ව සකසා ගැනීම අපි රජයක් ලෙස අනිවාර්යයෙන්ම කරගෙන යන කාරණාවක්.

විශේෂයෙන්ම අපි හැම කෙනාම දන්නවා, මේ මැතිවරණ සමය තුළත්, මැතිවරණයෙන් පසුවත් අපට ආඩම්බර විය හැකි ආකාරයෙන් අපේ රටේ ජනතාව කටයුතු කළ බව. රට තුළ සාමකාමී බව රකිමින්, අපි ගොඩනඟපු සංස්කෘතිය තවදුරටත් ඉදිරියට ගෙන යමින් කටයුතු කිරීමට අපේ රටේ සමස්ත ජනතාවටම හැකිවීම පිළිබඳව මම ඉතා සතුටට පත් වෙනවා.

අතීතයේ මැතිවරණයක් අවසන් වූ විගස සමාජය හැසිරෙන විධිය අපි දැක තිබෙනවා. සමහරවිට ජයපැන් බොන විට, ජයග්‍රහණය සමරන විට අනෙකාට පීඩා ඇති කරමින්, හානි ඇති කරමින් කටයුතු කළා. එවැනි ඉතාම වැරදි පූර්වාදර්ශ තිබෙන තත්ත්වයක් තුළ අද අපට ජයග්‍රහණයකදී සාමකාමී බව රකිමින් කටයුතු කරන්න පුළුවන්වීම පිළිබඳව අපි සතුටට පත් වෙනවා.

ඔබ දන්නවා අපේ රටේ මැතිවරණ වේදිකාවලදී සමහර අය ජනතාව බිය ගැන්වීම සඳහා කියූ කාරණා. ආරම්භයේ සිටම; පළමු ජයග්‍රහණය ලැබෙන්නත් පෙර සිටම ජනතාවට කියපු දේ තමයි, ජාතික ජන බලවේගය ජයග්‍රහණය කළොත් මේ රට ලේ විලක් බවට පත් වෙයි කියන එක. එවැනි විශාල බියක් සමාජය තුළ ජනිත කරන්න උත්සාහ කළා. ඒ හරහා අපිට ඡන්දය ලබා දීමට බලාපොරොත්තුවෙන් සිටි පිරිස් අපෙන් ඈත් කර තැබීමට විශාල උත්සාහයක් දැරුවා. හැබැයි, ඔවුන් කියපු ඒ බොරුව අපේ පළමු ජයග්‍රහණයෙන් පස්සේ ඔවුන්ටම පාරා වළල්ලක් බවට පත් වුණාය කියා මා හිතනවා.

අවාසනාවකට, හැමදාමත් මේ රටේ බලය ලබා ගැනීම වෙනුවෙන් ජාතිවාදය පාවිච්චි වෙලා තිබෙනවා. බලය වෙනුවෙන් සමහරවිට සමාජයන් අතර ඇවිස්සීම් ඇති කර තිබෙනවා. සමාජයන් අතර විශ්වාසය නැති කර තිබෙනවා. නමුත් ජාතික ජන බලවේගය ලෙස අපි හැම විටම පරිස්සම් වුණා ජාතික සමඟිය, සාමය ගොඩ නඟමින්, එකිනෙකා පිළිබඳ විශ්වාසය ගොඩනඟමින් මේ මැතිවරණ ව්‍යාපාරය තුළත්, ඉන් පිටතදීත් අපේ කාර්ය භාරය සිද්ධ කරන්න. මේ පළාත් පාලන මැතිවරණය තුළත් සමහර දේශපාලන පක්ෂ තමන්ට බලය නැති වෙයි, තමන්ගෙන් බලය ගිලිහෙයි කියන පදනමේ හිඳිමින් ඉතාම පහත් විධියට නැවත නැවතත් සමාජයන් තුළ -තමන්ගේ කුඩා ඒකකය තුළ පවා- ජාතිවාදය ඇවිස්සීම සඳහා විශාල උත්සාහයක් දරමින් කටයුතු කළා. අපි ඒ ගැන ලජ්ජාවට පත් වෙන්න ඕනෑ. අපි ඒක සමාජ මාධ්‍ය තුළත්, වෙනත් වෙනත් භාවිතාවන් තුළත් දැක තිබෙනවා.

අපි දන්නවා පලස්තීනය හා ඊශ්‍රායලය අතර තිබෙන ගැටුම ගැන. ලෝකයේ කුමන රටවල් දෙකක් අතර ගැටුමක් ඇති වුණත් සෑම විටම අපේ ප්‍රාර්ථනාව වෙන්න ඕනෑ ඒ ගැටුම හැකි ඉක්මනින් අවසන් කරලා සාමය ගොඩනැඟිය යුතුයි කියන එක මිසක්, ඒ ගැටුම් මත්තෙන් ප්‍රශ්න හදා ගනිමින්, වෙනත් ප්‍රයෝජන ලබා ගනිමින් කටයුතු කිරීම නොවෙයි. ඕනෑම තරාතිරමක පුරවැසියෙකුට සාමයෙන් ජීවත්වීම සඳහා වූ පසුබිම ඇති විය යුතුයි කියන ප්‍රාර්ථනාවත් එක්ක අපි කටයුතු කළ යුතුයි. හැබැයි, පළාත් පාලන මැතිවරණය ඉලක්ක කර ගනිමින් සමහර දේශපාලන පක්ෂ තමන්ට ලැබෙන ඒ සොච්චම් අවස්ථා පවා විකෘති කරමින්, තමන්ගේ දේශපාලනය වෙනුවෙන් පාවිච්චි කරන තැනකට ඔවුන් යොමුවීම ඉතාම කනගාටුදායකයි.

අපි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළා. ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් පාලන මැතිවරණය ජයග්‍රහණය කළා. මම විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස සියලු දෙනාම එකතු වෙලා මේ රට නිවැරදි දිශානතියට යොමු කරවන කාර්යයට උර දෙන්න කියලා. අපි හැම කෙනාගේම බලාපොරොත්තුව එයයි. තව නොබෝ දිනකින් වෙසක් පොහොය උදා වෙනවා. අපි හැම කෙනාම දන්නවා ලෝකය තුළ පහළ වෙච්ච සියලු ශාස්තෘවරුන්ගේ කාර්යභාරය බවට පත් වුණේ මොකක්ද කියලා. අවුල් වෙච්ච මනසක් තිබෙන සියලු දෙනාටම සුවපත් මනසක් ගොඩනඟමින්, සාමයෙන් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හැදීම තමයි ඒ සියලු ශාස්තෘවරුන්ගේ බලාපොරොත්තුව වුණේ. විශේෂයෙන් අපි දන්නවා විවිධ හේතූන් මත, විවිධ කරුණු කාරණා නිසා ඒ අවුල් වෙච්ච සමාජය සුවපත් කරමින් අපි නිසි දිශානතියකට යා යුතුයි කියන එක.

ඒ නිසා ජාතික ජන බලවේගයේ අපිට පසුගිය මැතිවරණය තුළ මේ රටේ සමස්තයම එකට එකතු කරමින් ජාතික සමඟිය සඳහා ඉතාම ශක්තිමත් අඩිතාලමක් දමන්න පුළුවන් වුණා. අතීතයේදී සමහර මාධ්‍ය නාළිකා අපේ රට තුළත්, ජනතාව අතරත් අසමඟිය ඇති කරන්න, අවිශ්වාසය ගොඩනඟන්න, සමඟිය නැති කරන්න පුන පුනා කටයුතු කළත්, පසුගිය දළදා දැක්ම තුළ ආණ්ඩුවක් ලෙස අපට දැකගන්න පුළුවන් වුණා, මේ රටේ සාමාන්‍ය මිනිස්සු කොතරම් දුරට සාමයට ලැදියිද, ආදරය, කරුණාව සහ බැඳීම්වලට ඔවුන් කොතරම් කැමැත්තක් පළ කරනවාද කියන පණිවුඩය. ඒ සහෝදරත්වය, ඒ මිත්‍රත්වය එකතු කරමින් මේ රට නිවැරදි දිශානතියට යොමු කරන්න අපි හැම කෙනාටම ශක්තිය ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරමු.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.19]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අවස්ථාවේ රේගු ආඥාපනත යටතේ වූ යෝජනා සම්මතය සම්බන්ධයෙන් පැවැත්වෙන විවාදයේදී ඊට වචන ස්වල්පයක් එකතු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරනවා.

අපි අද කථා කරන්නේ temporary suspension එකකට පසුව නැවත කාර් ආනයනය කරන්න අවස්ථාව ඇති කරලා ඒක තුළින් රජය ආදායමක් උපයන ආකාරය සහ අපි fiscal consolidation එකක් ඇති කරගෙන ඉදිරියට ගමන් කරන්නේ කොහොමද කියන එක ගැනයි. මම හිතන විධියට ආණ්ඩුව මේ තුළින් ඉලක්ක කර තිබෙනවා, US Dollars 1.2 billion. ඒ කියන්නේ, US Dollars 1,200 million. සියයට 1.2ක වර්ධන වේගයක් එක්ක ඒක 300න් වැඩි කළාම ඒක තුළින් බිලියන 432ක් උපයන එක තමයි අපේක්ෂාව.

2025 වර්ෂයේ ආණ්ඩුවේ ආදායම් ඇස්තමේන්තුව රුපියල් බිලියන 4,950යි. ඉන් සියයට අටහමාරක් මේ කාර් ගෙනෙන එක තුළින් ලැබෙයි කියලා යම් විධියක විශ්වාසයකින්, බලාපොරොත්තුවකින් සිටිනවා. 2024 දෙසැම්බර් 18 සිට 2025 මැයි 05 වෙනකම් LCs 8,552ක් විවෘත කර තිබෙනවා. ඒකෙන් වාහන 52,411ක් ආනයනය කරලා තිබෙනවා. ඒකෙන් US Dollars 418 million ප්‍රමාණයක LCs විවෘත කරලා රටට ඇවිල්ලා තිබෙන එක ගැන තමයි මේ අවස්ථාවේදී කථා කරන්නේ.

අද වෙන තාක්කල් ශ්‍රී ලංකා රේගුවෙන් clear කරලා තිබෙන බයික් 10,800කුත්, කාර් 13,128කුත් තුළින් රුපියල් බිලියන 89ක -කෝටි 8,900ක- ආදායමක් උපයලා තිබෙනවා. මේක මාස 4කට නම්, ඒක තව මාස 8කින් වැඩි කළොත්, සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 280ක් විතර තමයි ඇස්තමේන්තු වෙන්නේ. දැන් අපේක්ෂා කර තිබෙන්නේ රුපියල් බිලියන 420යි, 430යි. ඒ නිසා මේක කොයි ආකාරයෙන්ද වර්ධනය කරන්න පුළුවන් වන්නේ කියන එක ගැන බලන්න අවශ්‍යයි. මෙහිදී රුපියල ඔරොත්තු නොදෙන මට්ටමට ගෙනියනවාට වැඩිය ඔරොත්තු දෙන මට්ටමට ගෙනියන එක රටට ඔබිනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

මේ කියන අවස්ථාවේදී වැඩියෙන්ම කාර් ආනයනය කරන්නේ ජපානයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ජපානයත් එක්ක ගනුදෙනු කරන මේ මොහොතේ අපිට පේනවා, විශේෂ බැංකු 4ක් අප රටේ Letters of Credit පාවිච්චි කරන අවස්ථාව බැහැර කරලා තිබෙනවා කියලා. ඒවා තමයි, මිට්සුයි බැංකුව, මිට්ෂුබිසි බැංකුව, මිසුහෝ බැංකුව සහ සුමිටෝමෝ බැංකුව. 2022 වර්ෂය තුළ මේ රට බංකොලොත් වුණාට පසුව අපේ මහජන බැංකුව සහ රජයේ බැංකුවල එක පාරට L/C විවෘත කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා අපේ රට ගැන විශ්වාසය අඩු වෙලා ඒ තුළින් ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක් ලෙස තමයි මේක තිබෙන්නේ. නමුත් අපි මේක පුළුවන් තරම් ඉක්මනින් නිවැරදි කරන්න අවශ්‍යයි. මොකද, මෙවැනි දේවල් තිබුණාම අපි වෙළෙඳාම් කරන රටවල් එක්ක තිබෙන විශ්වාසයට ඒ තරම් හොඳත් නැහැ. ඒ නිසා මේ ආදායම උපයන අවස්ථාවේදී අපි බලන්න කැමැතියි, ආදායම වැඩි කරන්න පුළුවන් මාර්ග මොනවාද තිබෙන්නේ කියලා. අන්තිමට මේ රටට ගෙනාපු කාර් මාස එකහමාරක් විතර හිර වෙලා තිබෙනවා, clear කරන්න බැරුව.

ඇයි එහෙම වෙලා තිබෙන්නේ? රජයේ නිලධාරින්ට එය හරියාකාරව ග්‍රහණය කර ගන්න බැරි වෙලා තිබෙන නිසායි. එම නිසා ඒ ප්‍රමාදය සිදු වී තිබෙනවා. දැන් හම්බන්තොට වරායට එන කාර් එකක් clear කරන්න සාමාන්‍යයෙන් දවස් 10ක් විතර යනවා. කොළඹ වරායට එන කාර් එකක් clear කරන්න දවස් 4ක්, 5ක් යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය නිවැරදි කරන්න අවශ්‍යයි. මොකද, එහි demurrage ගෙවන්න සිදු වන්නේ අන්තිමට පාරිභෝගිකයාටයි. ඒ වෙනුවෙන් ලක්ෂ එකහමාරක්, දෙකක් ගෙවන්න සිදු වෙනවා. සාමාන්‍යයෙන් එම වියදම ආනයනය කරන කොට ඇස්තමේන්තු කරලා තිබෙන වියදමක් නොවෙයි. අනවශ්‍ය වියදමක් නිසා පුළුවන් තරම් ඉක්මනට මෙය නිවැරදි කරන්න අවශ්‍යයි. ඒ වාගේම අපි මේ රටේ මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමවේදයත් පුළුවන් තරම් ලිහිල් කරන්න අවශ්‍යයි. තවම අප අනුගමනය කරන්නේ ගතානුගතික ක්‍රමවේදයයි. වාහනයේ valuation එක ආවාම, එහි ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් බොහොම සරල ක්‍රමවේදයක් ඇති කළොත් හොඳයි. මොකද, අවසානයේදී අපි සියලුදෙනා පාරිභෝගිකයා වෙනුවෙන් තමයි මේ නීති රීති පද්ධතිය සකස් කරන්නේ. එම නිසා අපි පුළුවන් තරම් ඉක්මනින් නිවැරදි ස්ථාවරත්වයක් ඇති කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා ආනයන වෙළෙඳාම සම්බන්ධයෙනුත් කථා කරන්න. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක යන මේ ගමන තුළ ඒ අයගේ විශේෂ කොන්දේසියක් වශයෙන් රට විවෘත කරන්න හදනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එච්චර ඉක්මනට මිනිත්තු 6ක් ගියා ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාව උපයෝගී කර ගනිමින් සංචිත ගැනත් කියන්න ඕනෑ. ඩොලර් මිලියන 6,503ක් ලෙස තිබුණු අපේ විදේශ සංචිත ගිය මාසයේ ඩොලර් මිලියන 6,300 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, සියයට 3කින් අඩු වෙලා. දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක පැත්තකින් කියනවා, අපි පුළුවන් තරම් අපනයනය කරන්න ඕනෑ කියලා. හැබැයි, එසේ කියන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලම අපේ අපනයන වර්ධනය කරන්න අපට අවස්ථාව දීලා නැහැ. සියයට 36ක් taxes පනවනවා. හැම එකකටම duty concessions නැහැ කියනවා. මේවායින් තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට උදවු කරන්න අවශ්‍ය වන්නේ.

මා උදේ ප්‍රශ්නයක් ඇහුවේ නිකරුණේ නොවෙයි. US Treasury Secretary, Scott Bessent ප්‍රසිද්ධ කරලා තිබෙනවා, තව දවස් දෙකකින් රටවල් 17ක් එක්ක ඒගොල්ලෝ වෙළෙඳ ගිවිසුම් අත්සන් කරනවා කියලා. ඒකයි මම ඇහුවේ, අපේ ලංකාව ඒ සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ කියලා. ජනාධිපතිවරයා සර්වපාක්ෂික සමුළුවක් කැඳවලා අදහස් අරගෙන සාකච්ඡා කිරීම සඳහා යවන්න පුද්ගලයන් නම් කළා. දැන් ඒ කණ්ඩායම ගිහිල්ලා කාවද හමු වෙලා තිබෙන්නේ? හමු වෙලා තිබෙන්නේ, Deputy Trade Representative. අනෙක් රටවල් කෙළින්ම ජනාධිපති සහ US Treasury Secretary වාගේ මට්ටමේ

අය හමු වනකොට අපිත් මීට වඩා වුවමනාවෙන් කටයුතු කරන්න අවශ්‍යයි. මොකද, අපිත් US Dollars 3,200 millionක අපනයනයක් කරනවා ඇමෙරිකාවට. ඒකෙන් සියයට 45ක් ඇඟලුම් කර්මාන්තයෙන්. ඒ කියන්නේ, අපනයනය සඳහා වන අපේ ඇඟලුම් කර්මාන්තයේ වක්‍රව 835,000ක් විතර නිරත වෙලා ඉන්නවා. එම නිසා අපි මේ සම්බන්ධයෙන් ඕනෑකමින් සාකච්ඡා කළ යුතුයි. ඒ ආකාරයෙන් කටයුතු කළොත් තමයි ඇමෙරිකාවට අපට බදු සහන දෙන්න පුළුවන් වන්නේ. ලංකාවේ අපනයන ඉන්දියාවට යවන්නත් කටයුතු කරන්න. මොකද, Indo-Sri Lanka Free Trade Agreement එක අනුව අපට පුළුවන් ඉන්දියාවට පහසුවෙන් අපනයනය කරන්න. මේ සම්බන්ධයෙන් අප ඉතා ඕනෑකමින් කටයුතු කරන්න අවශ්‍යයි. මම ආණ්ඩුවට මතක් කරන්නේ මේ සම්බන්ධයෙන් ලිහිල් ස්වරූපයෙන් කටයුතු කරන්න එපා, පුළුවන් තරම් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලායි. මොකද, චීනය මේ සෙනසුරාදා ස්විට්සර්ලන්තය සමඟ සාකච්ඡා කරනවා. ඇමෙරිකාවයි, ස්විට්සර්ලන්තයයි සාකච්ඡා කරනවා කිව්වාම වැඩියෙන්ම ප්‍රශ්නය තිබෙන්නේ චීනය, මෙක්සිකෝව, කැනඩාව සහ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව මිනිත්තු දෙකක් ගන්නම්.

විශේෂයෙන්ම ඇමෙරිකාව අපට පැනවූ තීරු බදු සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියලා මම ඉතා ඕනෑකමින් කියනවා.

ඊළඟට, අපේ සේවා අංශය ගන්න. අපේ Port City එක හරහා අපට පුළුවන් රටට ආයෝජන ගෙනෙන්න. ආයෝජන ගෙනෙන්න පුළුවන් මේ අවස්ථාව අපෙන් ගිලිහී ගියොත් අන්තිමට වෙන්නේ මොකක්ද? මාලදිවයිනේ දැන් පටන් අරගෙන තිබෙනවා, Maldives International Financial Centre එකක්. ඒ තුළින් ඒ අය පිට රට අයට සියයට සියයක් අයිතිවාසිකම් ලබා දෙනවා. සියයට සියයක duty-free status එකක් දෙනවා. ඊට පසුව බදු සම්පූර්ණයෙන්ම ලිහිල් කරලා තිබෙනවා. ඒ වාගේම dispute resolution methods ඇති කරලා තිබෙනවා. ආයෝජකයෙකුට ලබා ගන්න පුළුවන් හැම වරප්‍රසාදයක්ම මාලදිවයින කියන පුංචි රට තුළින් ලබා ගන්න පුළුවන්. ලංකාවටත් ඒ සඳහා හොඳම අවස්ථාවක් තිබෙනවා. ඇයි ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න බැරි? මේ අවස්ථාවේ කරුණු ඉදිරිපත් කරනවා නම් Port City එකෙන් අපි මේ සියලු පහසුකම් ලබා දෙනවා කියලා, මාලදිවයිනට ගිහිල්ලා නිකම් මුහුද දෙස බලාගෙන ඉන්න එක විතරක් වෙන්නේ නැහැ. ලංකාවටත් ඇවිත් මෙය පරිවර්තනය කරන්න පුළුවන්, entrepôt trading centre එකක් හැටියට, financial centre එකක් හැටියට. ඉන්දියාවටත් ඇවිත් ලංකාවේ ආයෝජනය කරන්න පුළුවන් අවස්ථාව ඇති කරන්න ඕනෑ කියන එක තමයි මම මේ වෙලාවේ යෝජනා කරන්නේ.

කාලය හරස් වෙලා තිබෙන නිසා මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. පුළුවන් තරම් ආදායම් ලබා ගැනීම සඳහා අපේ මේ ප්‍රතිපත්ති, යෝජනා ක්‍රියාත්මක කරන්න. මේ යෝජනා ලෝකයටම ප්‍රදර්ශනය කරලා ආයෝජන හැකියාව ලංකාවට ලබා ගන්න පුළුවන් ලෙස කටයුතු කරන්න කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.29]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வடக்கில் கரையோரத்தில் மக்களுடைய காணிகளை அபகரிக்கும் செயல் இடம்பெறுகின்றதா? அதற்காக 2025.03.28இல் வெளியிடப்பட்ட 2430ஆம் இலக்க வர்த்தமானிமூலம் யாழ்ப்பாணம் - 3,669 ஏக்கர், முல்லைத்தீவு - 1,703 ஏக்கர், கிளிநொச்சி - 515 ஏக்கர், மன்னார் - 54 ஏக்கர் என மொத்தமாக 5,941 ஏக்கர்களைக் காணி நிர்ணயக் கட்டளைச் சட்டத்தின் 5(1)ஆம் பிரிவின்கீழ் அரச காணிகளாக அபகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது. இந்தக் காணிகள் தொடர்பில் குறுகிய காலத்தில் உரிய பதிவுகள் செய்யப்பட வேண்டுமென அறிவிக்கப்பட்டுள்ளது. இல்லா விட்டால் அந்த மக்களிடம் இருந்து அந்தக் காணிகளைப் பறிக்கப் போகின்றீர்களா? இது வடக்கு மக்களுக்கு நீங்கள் செய்யும் மிகப் பெரிய துரோகமாகத் தெரியவில்லையா? அந்த மக்கள் 2009இல் இடம்பெயரும்போது எதனையும் கொண்டு செல்லவில்லை. அப்போது இனவாதத்தின் கொடூரம் நடந்தது. கோவணத்தோடு சென்ற அந்த மக்களிடம் ஆவணங்களைக் கேட்கின்றீர்களா? ஏற்கனவே கொடுமை செய்த இனவாத அரசுகளை நீங்களும் பின் தொடருகின்றீர்களா? வடக்கு, கிழக்கு மக்களுக்குத் துரோகம் செய்ய வேண்டாம்! தயவுசெய்து குறித்த வர்த்தமானியை வாபஸ் பெறுங்களென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரின் கவனத்திற்கு ஒரு விடயத்தைக் கொண்டு வருகிறேன். இன்று இலங்கைப் பொருளாதாரம் சுற்றுலாத்துறைமூலம் கிடைக்கும் வருமானத் திலும் தங்கியுள்ளது. அதிகளவான சுற்றுலாப் பயணிகள் எமது நாட்டுக்கு வருகை தருகின்றனர். குறிப்பாக, யாழ்ப்பாணம் உள்ளிட்ட வடக்கு மாகாணத்திற்கு அதிகளவான சுற்றுலாப் பயணிகள் பலாலி சர்வதேச விமான நிலையம் மற்றும் நாகப்பட்டினம் படகுச் சேவையினூடாக வருகை தருகின்றனர். சுற்றுலா சார்பான விடயங்கள் முனைப்புப் பெற்றிருக்கும் நிலையில், இவை சார்பாக அபிவிருத்திச் செயற்றிட்டங்களை நடைமுறைப்படுத்துவதற்கும் ஒழுங்குபடுத்துவதற்கும் நிர்வாக ரீதியாக மாவட்டச் செயலகங்களில் பிரத்தியேகமான சுற்றுலா அலுவலகங்கள் இல்லை.

அதேபோல, மாவட்டச் செயலகங்கள் மற்றும் பிரதேச செயலகங்களில் சுற்றுலா அபிவிருத்திக்கான உத்தியோகத் தர்கள் இல்லை. சுற்றுலாசார் அபிவிருத்திச் செயற்பாடுகள் அங்குள்ள அலுவலர்களால் மேலதிக நிர்வாகக் கடமையாகவே மேற்கொள்ளப்படுகின்றது. இதே நிலைமை மாகாண சபைகளிலும் குறிப்பாக உள்ளூராட்சிச் சபைகளிலும் காணப்படுகின்றது.

எமது மாகாணத்தின் ஒவ்வொரு மாவட்டத்திலுமுள்ள ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவும் தனித்துவமான இயற்கை மற்றும் கலாசார வளங்களைக் கொண்டுள்ளபோதும் மரபுரிமை மையங்களைப் பிரபல்யப்படுத்துவதற்கும்

[ගරු තුරෙෙරාසා රවිකරන් මහතා]

பாரம்பரிய உணவுகள், உள்ளூர் உற்பத்திப் பொருட்கள் போன்றவற்றைச் சுற்றுலாத் துறையில் சந்தைப்படுத்து வதற்கும் ஒரு பலமான நிர்வாக அலுவலகமும் ஆளணியும் தேவை. புதிய அலுவலர்களை அவர்களது திறமைகளையும் ஆற்றல்களையும் பயன்படுத்தக்கூடிய வகையில் உள்வாங்கி, எமது மாகாணத்திலுள்ள மாவட்டச் செயலகங்களில் சுற்றுலா அலகுகளை உடனடியாக நிறுவவும், பிரதேச செயலகங்களில் பொருத்தமான உத்தியோகத்தர்களை உடனடியாக நியமிக்கவும் நடவடிக்கை எடுப்பதோடு, அவர்களை வினைத் திறனான முறையில் பயன்படுத்தக்கூடிய வகையிலான பல்வேறு செயற்பாடுகளையும் உடனடியாக முன்னெடுக்கு மாறு கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.32]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මට මේ විවාදයට එන්න ලැබුණේ බදුල්ල බන්ධනාගාරයේ ඉඳන් බස් රථයකින්. කොළඹ සිට නැවත බස් රථයකින් බදුල්ල බන්ධනාගාරයට යනවා. මේ වනකොට මට බස් රථ දහයක් විතර දීලා තිබෙනවා, පාර්ලිමේන්තුවට එන්න. බදුල්ලේ ඉඳන් බස් එකක මා පාර්ලිමේන්තුවට ගෙනෙන්න රුපියල් ලක්ෂයක් විතර වියදම් වෙනවා. නමුත් මට නඩුව දැම්මේ ලක්ෂ දහයක චෙක් එකක් සම්බන්ධව. පොදු දේපළ පනත අනුව තමයි ඒ නඩුව දාලා තිබෙන්නේ. හැබැයි, දැන් ආණ්ඩුවට නඩු දාන්න ඕනෑ ලක්ෂ 20ක් විතර වියදම් කරලා මා බන්ධනාගාරයේ ඉඳන් පාර්ලිමේන්තුවට ගෙනෙන එකටයි, ගෙනියන එකටයි. ඒකත් මරු සෙල්ලමක්. කමක් නැහැ. පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා දීලා දවස් දෙකෙන් තමයි මම ඇතුළට දැම්මේ. මෙතැන ආණ්ඩුව උදන් අනන්තත් එපා, විපක්ෂය උදන් අනන්තත් එපා මේ මැතිවරණය ගැන. අපි ප්‍රාදේශීය සභා ඡන්ද හොඳට කරපු අය. ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ඉඳන් මම විස්තර කියන්නම්.

ගරු සභානායකතුමනි, එදා මේ පාර්ලිමේන්තුවට මේ මැතිවරණය තියන්න කියලා පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ මම අණ්ඩුවට කිව්වා, ඒක ගෙනෙන්න එපා කියලා. මම මෙතැන ඉඳන් ඒක කියලා පිටිපස්සට ගිහිල්ලා ඒ මන්ත්‍රීවරුන්ට ඒ කරුණු කිව්වා. ඒ මන්ත්‍රීවරු සාක්ෂියට ඉන්නවා. මම ඒ අයට කිව්වා, ඒක ගෙනාවොත් ආණ්ඩුව වරද්දා ගන්නවා කියලා. පරණ පළාත් පාලන මැතිවරණ ක්‍රමයම ගෙනෙන්න කියලා කියපු එකම මිනිහා මම. මම 1996දීයි ඇල්ල ප්‍රාදේශීය සභාවට පළමුවැනියට තේරුණේ. ඊට පස්සේ දිගටම එම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී, විපක්ෂ නායක, සභාපති විධියට මම හිටියා. ඒ තිබුණු මැතිවරණ ක්‍රමයට මගේ පුදුම කැමැත්තක් තිබෙනවා. චාමර සම්පත් දසනායක වාගේ මිනිහෙකුට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණේත් ඒ ක්‍රමය තිබුණු නිසා. මේ මැතිවරණය තියන්න එදා පනත් කෙටුම්පත ගෙනාපු වෙලාවේ මම කිව්වා, තුනෙන් දෙකක් - මන්ත්‍රීවරුන් 159දෙනෙක්- තියාගෙන මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ කියලා. ඒකට මටම හිනා ගියා. පරණ මැතිවරණ ක්‍රමය තිබුණා නම් ආණ්ඩුව හෙට අනිද්දා වෙනකොට පළාත් පාලන ආයතන 275කට වැඩි ප්‍රමාණයක බලය පිහිටුවනවා.

මම මේ පාර්ලිමේන්තුවේදී ඒක කිව්වා. ඒ හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න. මන්ත්‍රීවරුන් 159දෙනෙක් ඉඳලාත් ආණ්ඩුවට මේ පනත වෙනස් කරන්න බැරි වුණා. දැන් මෙතැන අධිකරණ ඇමතිලා, අර ඇමතිලා ඒක නිවැරැදි කරන්න යනවා. නමුත් නිවැරැදි කරන්න බැහැ. මේක නිවැරැදි කරන්න බැහැ. ඒක පිළිගන්න. ගරු සභානායකතුමනි, ඔබතුමායි, ගරු අනුර කුමාර දිසානායක මහත්මයායි 1999දී තමයි පළමුවෙන්ම පළාත් සභාවට පත් වෙලා එන්නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් පඹුවස්නුවර. ඒක දූෂිත මැතිවරණයක්. මම තමයි, ඒ වෙලාවේ පඹුවස්නුවරට ඇවිල්ලා ධර්මසිරි දසනායකට වැඩ කළේ. මතකයි නේ. අපි ඇවිල්ලා මැතිවරණය කළේ දසනායකගේ ගෙදර, රාජකරුණාගේ ගෙදර. මමයි, දයාසිරියි දැන් ඒක කථා වුණා. ඔබතුමන්ලා දෙන්නා පළමුවෙන්ම තමයි පළාත් සභාවට එන්නේ. මූනමල්දෙනිය ඡන්ද පෙට්ටිය ගැනත් මට කියන්න පුළුවන්. ගරු සභානායකතුමනි, අහගන්න. අපි ඡන්දය දමන්න කොළ ඉරන කොට, ඔබතුමාගේ එක්කෙනෙකුත් එතැනට පැනලා කොළ ඉරලා ඔබතුමාටයි, අනුර කුමාර දිසානායක මහත්මයාටයි ඡන්දය දැම්මා. මේක සත්‍ය කථාවක්. ඒක ඔබතුමන්ලාගේ කැමැත්තට, ඔබතුමන්ලාගේ වාසියට ඒ දමපු එක්කෙනා දැම්මේ. එයා ඔයගොල්ලන්ගේ කොල්ලෙක්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා දැම්මේ නැද්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැහැ, මම නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

නැහැ, එතුමා නොවෙයි. ඔබතුමන්ලාගේ කොල්ලෙක්. මූනමල්දෙනිය පන්සලේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

එදා නලින්ලා දේශපාලනයේ හිටියේත් නැහැ. මම මේ කියන්නේ පරණ දේශපාලන කථාවක්. 2001දී ලංකාවේ දිනුවේ හපුතලේ නගර සභාව විතරයි. UNP එක ඔක්කොම නගර සභා දිනුවා; ඔක්කොම ප්‍රාදේශීය සභා දිනුවා. හපුතලේ නගර සභාව විතරයි අපි දිනුවේ. හපුතලේ නගර සභාව තමයි මෙවරත් ස්වාධීන කණ්ඩායමක් දිනුවේ. කවුරුත් ලකුණු දමා ගන්න එයි. මම හිර ගෙදරට යන්න කලින් හපුතලේ නගර සභාවේ නාම යෝජනා පත්‍රය බලලා, හිටපු නගරාධිපති උපුල් දිසානායක මහතා එක්ක තමයි ගිහිල්ලා ඒක භාර දුන්නේ. ඒ මේ සැරේ දිනපු හපුතලේ නගර සභාව. ස්වාධීන කණ්ඩායමක් අපි දැම්මේ. SLFP එක නාම යෝජනා භාර දුන්නේ නැහැ. අපි පුටුව ලකුණින් නාමයෝජනා භාර දුන්නේ. මේ සැරේ අපි පුටුව අයින් කළා. බණ්ඩාරවෙල නගර සභාවෙනුත් අපි පුටුව අයින් කළා. බණ්ඩාරවෙල නගර සභාව දිනලා තිබෙන විධිය දන්නවාද? මම කියන්නම්. දේශපාලනය ඉගෙන ගන්න කියන්න ඔය ලොක්කන්ට, අපෙන්. ඔය ලොක්කෝ අපට ගහලා හිර ගෙදර දැම්මාට ඔය ලොක්කන්ට දේශපාලනය තේරෙන්නේ නැහැ. බණ්ඩාරවෙල නගර සභාවේ මන්ත්‍රී ධුර පහක් නවුෂාඩ් කියලා කොල්ලෙක් ස්වාධීන කණ්ඩායමකින් ගත්තා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට මේවා කියන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. ගරු සභානායකතුමනි, මට විනාඩි දෙකක් දෙන්න. සභානායකතුමා මට වෙලාව දෙනවා කිව්වා.

ඒ කොල්ලා මන්ත්‍රී ධුර පහක් ගන්න කොට, සජබ ගත්තේ මන්ත්‍රී ධුර තුනයි. එතකොට මන්ත්‍රී ධුර අටයි. ඔබතුමන්ලාට මන්ත්‍රී ධුර හයයි. නමුත් තනි මිනිහෙක් මන්ත්‍රී ධුර පහක් ගත්තා. බණ්ඩාරවෙල නගර සභාවේ ඒක තමයි තත්ත්වය.

මට මේ මැතිවරණයේදී එක දවසක්වත් එළියට එන්න බැරි වුණා. මම හිරේ හිටියේ. මම පුටුව ලකුණින් කට්ටිය දැම්මා. මම හිරේ හිටියේ. මම නෝනාට කිව්වා, පුළුවන් නම් ගිහිල්ලා ඔය කොල්ලන්ට රැස්වීමක් දෙකක් තියන්න කියලා. ඡන්ද 45,000ක් ලැබුණා. පුටුව ලකුණට ලංකාවේ වැඩියෙන්ම ඡන්ද ලැබිලා තිබෙන්නේ, චාමර සම්පත් දසනායක නියෝජනය කරපු ආයතනයෙන්. පොහොට්ටුව ඒ හැම තැනම තුන්වැනි තැන. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මේක අහගන්න. පොහොට්ටුව බදුල්ල දිස්ත්‍රික්කයේ හතරවැනි තැන. 45,000ක් පුටුවට ඡන්දය දීලා තිබෙනවා. මම එළියේ හිටියා නම්, ඡන්ද 70,000කින් දිනවනවා.

ඒ නිසා ගරු සභානායකතුමනි, හිර ගෙවල්වලට මිනිස්සු දාලා, ඡන්ද වෙනස් කරන්න බැහැ. ඒ නිසා පරාජය පිළිගන්න. 2015දී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එනකොට අපි මහින්ද මහත්මයලාට කිව්වා, අනිවාර්යයෙන්ම මේ රට වෙනස් වෙනවා, මෛත්‍රීපාල මහත්මයාට මේ රට යනවා කියලා. 2018දී පොහොට්ටුව ප්‍රාදේශීය සභා දිනන කොට, ඔයගොල්ලෝ අද කියන කථාවම අපි කිව්වා. ඔය ප්‍රාදේශීය සභා දිනුවාට පොහොට්ටුව ඊළඟ ආණ්ඩුව ගන්නේ කොහොමද කියලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි කිව්වා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලා ඇතුළු අපි ඒක කිව්වා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලා ඇතුළු අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට එදා වෙනම ඡන්දය ඉල්ලුවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් දෙන්න.

මම විපක්ෂයටත් කියනවා. ආණ්ඩුවටත් කියනවා. මිනිස්සු තේරුම් අරගෙන තිබෙනවා. ඒකයි ඔබතුමන්ලාගේ ලක්ෂ 20ක් ඡන්ද වැටිලා නැත්තේ, ඔබතුමන්ලාට ඡන්ද නැති වුණේ. ඒවා හදා ගන්න. තව ලක්ෂ 10ක් ඡන්දය නොදී හිටියා. "අපි ගියවර මාලිමාවට ඡන්දය දීපු මිනිස්සු. අපි අද ඡන්දය දෙන්නේ නැතුව ඉන්නවා" කියලා තව ලක්ෂ 10ක් ඔබතුමන්ලාට ඡන්දය නොදී හිටියා. ඒවාත් එකතු වුණාම, ඔබතුමන්ලාට ඡන්ද ලක්ෂ 30ක, 35ක විතර පාඩුවක් වෙලා තිබෙනවා.

ඒ නිසා මම මේ වෙලාවේදී කියන්නේ ඔබතුමන්ලා පරාජය වෙලා නැහැ කියන එකයි. හැබැයි, මේ පසුබෑම ආණ්ඩුවට ජනතාව ඔප්පු කරලා පෙන්වා තිබෙනවා. මාත් එක්ක හිරගෙදර ඉන්නවා, army එකේ කොල්ලෙක් කකුල නැති. ඔහු මට කිව්වා, "සර්, ගිය සැරේ අපි සර්ට ඡන්දය දුන්නේ නැහැ" කියලා. මම ඇහුවා, ඇයි කියලා. "කකුල නැතුව ඌව පරණගම, වැලිමඩ, බණ්ඩාරවෙල කියන ඒ ඔක්කොගේම රතු ෂර්ට් එක ඇඳගෙන මම ගියා, මම එළියේ හිටියා නම් මේ සැරේ මාලිමාවට ඡන්දය දෙන්නේ නැහැ" කියලා ඔහු මට කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා, අපිට බැණ බැණ හිටියාට වැඩක් නැහැ. දැන් බලන්න, වණ්ඩි ඉන්නවා. අපි හිරේට දැම්මාට කමක් නැහැ. මහියංගනය ප්‍රාදේශීය සභාව සමයි. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව සමයි. හදා ගන්න බැහැ. ඕක තමයි තත්ත්වය. කටින් බයිලා ගැහුවාට, කයිය ගැහුවාට වැඩක් නැහැ. ඒවා පිළිගන්න. ඒවා පිළිගන්න වෙනවා. අද මම මේ පාර්ලිමේන්තුවේදී බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට වැඳ නමස්කාර කරලා කියනවා, මම හිරේ ඉඳිද්දී 45,000ක් "පුටුව" ලකුණට ඡන්දය දුන්නු බව. "පුටුව" ලකුණ කියන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. මම තමයි ඉතුරු වෙච්ච එකම මන්ත්‍රීවරයා. අපි අද සතුටු වෙනවා, "පුටුව" ලකුණින් තරග කරලා ඡන්ද 390,000ක් ලබා ගැනීම ගැන. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, පැරණිම පක්ෂය. ඒ වාගේම මේ රටේ මිනිස්සුන්ට වැඩ කරපු පක්ෂය. මිනිස්සුන්ට වැඩ කරපු ඒ පක්ෂය අද වනකොට මිනිස්සුන්ගේ ඡන්ද 390,000ක් අරගෙන තිබෙනවා. ඒ නිසා මේ ගමන අපි යනවා. හිර ගෙවල් 50ක දැම්මත් චාමරව නවත්වන්න බැහැ. චාමරගේ ගමන චාමර යනවා. මේ ඉන්න මිනිස්සුත් හිරගෙවල්වල හිටපු මිනිස්සු. ඔබතුමන්ලාත් හිරගෙවල්වල හිටපු මිනිස්සු. ඔබතුමන්ලා දන්නවා, පටන් ගත්ත තැන.

මට කාලය ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.42]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ඔබතුමාට වේලාව වැඩිපුරත් දුන්නා, ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි. ඇත්තටම මන්ත්‍රීතුමා කථා කරනකොට දුකත් හිතෙනවා. ඔබතුමා, රුපියල් ලක්ෂ 10ක හෝ කීයක හෝ ඒ වෙක් එකක් සම්බන්ධ ගනුදෙනුව කළේ ඇයි? *[බාධා කිරීම්]* අනේ, මට වේලාව නැහැ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු සභානායකතුමනි, නඩුවක් තිබෙන නිසා ඒ ගැන එළියෙදි කථා කරමු. බැංකුවකින් මම බලෙන් ලියාගෙන නැහැ. බැංකුව ලියනවාද, රුපියල් ලක්ෂ 10ක්? නිකම් බොරුවට දන්නේ නැති දේවල් කථා කරන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබතුමා නේ කිව්වේ. *[බාධා කිරීමක්]* ඔබතුමා නේ කිව්වේ වෙක් එකක් නිසා කියලා. මමත් පිළිගන්නවා, ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වෙන්න ඕනෑ ඔබතුමා, එහෙම නැතුව සජබයෙන්, අරහෙන් මෙහෙන් ෆුට්බෝඩ් එකෙන් ආපු කට්ටිය නොවෙයි කියලා. *[බාධා කිරීමක්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී ඇත්තටම ආර්ථිකය හා සම්බන්ධ විවාදයක් ලෙස තමයි මේ සාකච්ඡාව පටන් ගත්තේ. නමුත් අතරමගදී දැන් මේ විවාදය රටේ කාලීන දේශපාලනය ගැන විවාදයක් බවට පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා රාජ්‍ය නායකයෙක් විධියට ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාට ඉතාම ඉහළ රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීම් රාශියක් මේ මාස හයක කාලය තුළ ලැබිලා තිබෙන බව. ඉන්දියාවෙන්, චීනයෙන් වාගේම රටවල් ගණනාවක රාජ්‍ය නායකයන් සහභාගි වෙච්ච ඩුබායිවල පැවති උත්සවයකදීත් එතුමාට ඉතා ඉහළ රාජ්‍ය තාන්ත්‍රික පිළිගැනීමක් ලැබුණා. ඒ වාගේම තමයි, එතුමා ඉතා මෑතකදී වියට්නාමයේ කරන ලද සංචාරය. මම හිතන විධියට, ඕනෑම රාජ්‍ය නායකයෙකුට ලබා දිය හැකි උපරිම ගරුත්වය අපේ ජනාධිපතිතුමාට මෑත භාගයේදී ලබා දුන්නා විතරක් නොවෙයි, වියට්නාම ජනාධිපතිතුමා ඒ දවස් දෙක තුනේ අපේ ජනාධිපතිතුමා එක්ක විශාල කාලයක් ගත කළා. අපට පෙනෙනවා, ඒවා protocol විතරක් නොවෙයි කියලා. ඒ අනුව වියට්නාම ජනාධිපතිතුමා අපේ ජනාධිපතිතුමා එක්ක විශාල සම්බන්ධයකින් -විශාල ගනුදෙනුවකින්- කටයුතු කරලා තිබෙනවා. අපි අලුත් ආණ්ඩුවක් හදලා ලෝකයේ පිළිගැනීමට වේගයෙන් ලක් වෙමින් තිබෙනවා. මොකද, අපි කවුරුවත් මීට මාස හයකට කලින් ජනාධිපතිතුමන්ලා එක්ක රාජ්‍ය සංචාරවල ගිය කට්ටිය නොවෙයි. ඔය හැම කෙනාම එහෙම රාජ්‍ය සංචාරවලට ගිහිල්ලා තිබෙනවා. අපේ විපක්ෂය පැත්තේ තිබෙන පක්ෂවල ගොඩක් අය එහෙම ගියපු අය. නමුත් අපි එහෙම පක්ෂයක් නොවෙයි. අපට ඉන්නේ අලුත් ජනාධිපති කෙනෙක්. එතුමාගේ තාත්තා, අම්මා, ජනාධිපතිලා, අගමැතිලා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ළඟදී -මීට දවස් දෙකකට විතර කලින්- ලෝක බැංකු සභාපතිවරයා මෙරට සංචාරයකට සහභාගි වුණා. ලෝක බැංකුව හෝ IMF එක එක්ක හෝ වැඩ කරනකොට ශ්‍රී ලංකාවේ ආණ්ඩු වශයෙන් අපි තෝරා ගන්න ක්‍රමයට තමයි වැඩ කරන්නේ. ලෝක බැංකුව ලංකා ඉතිහාසයේ කවදාවත් ඩොලර් බිලියනයක ආධාර හෝ ණය දීලා නැහැ; කවදාවත් එහෙම දීලා නැහැ. ලෝක බැංකුවේ සභාපතිතුමා ජනාධිපතිතුමා එක්ක කරපු සාකච්ඡාව අපි media campaign කරගෙන කටයුතු කරන්නේ නැහැ කියන එක ඔබතුමා දන්නවා. ලෝක බැංකු සභාපති එක්ක කටයුතු කරලා, මීට කලින් හිටපු ජනාධිපති කෙනෙකුට මිලියන 100ක් හෝ හම්බ වුණා නම් එතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මෙතැන දෙවනත් කරයි. ඔබතුමා දන්නවා, ඒ මුදල ඩොලර් බිලියනයක් බව. සරල නැහැ. ඒ මුදල් වෙන් කර තිබෙන්නේ digitalization, tourism, උතුරු නැඟෙනහිර සංවර්ධනයට කියන මේ හැම දෙයකටම. අපි අධ්‍යාපනය වෙනුවෙනුත් මුදල් ඉල්ලා තිබෙනවා. ලෝක බැංකුව සාමාන්‍යයෙන් රජයකට ණය දෙන පදනම මොකක්ද? අදූෂිත බව. ලෝක බැංකුවේ ප්‍රතිපත්තිවල ගැටලු තිබෙන්න පුළුවන්; විවිධ තත්ත්වයන් තිබෙන්න පුළුවන්. හැබැයි, ඒවා තීන්දු වෙන්නේත් ඒ රටේ පවතින ආණ්ඩුව එක්ක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රටේ පවතින ආණ්ඩුව හොරකම් කරනවා නම්, ඒකේ ඇමතිවරු රටේ දේවල් ගැන උනන්දු නැති නම් මොකක්ද වෙන්නේ? ලෝක බැංකුවේ ඉන්නේත් සාමාන්‍ය නිලධාරින් නේ. එතකොට ඒගොල්ලනුත් ඒකටම හරියන්න බැට් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් බිලියනයක්, මේ මුදල. අද මේ අය කොරවෙලා තිබෙන්නේ ඒකයි.

සමහරු හිතාගෙන ඉන්නවා නේ, ලෝක බැංකුව, IMF එක තමන්ගේ අම්මාගෙන්, තාත්තාගෙන් හම්බ වෙච්ච බුදලයක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ජනාධිපතිතුමා වියට්නාම සමාජවාදී ජනරජයේ ලොකු සංචාරයක් කළා. මම හිතන විධියට ඒ හරහාත් ඩොලර් බිලියන ගණනක ආධාරයක් අපේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනයට ලැබෙනවා. ඊට පස්සේ වියට්නාමයෙන් private jet එකක් දුන්නා, අපේ ජනාධිපතිතුමාට ලංකාවට එන්න. ඇත්තටම ඒ සම්බන්ධයෙන් වූ මුල්ම සාකච්ඡා පළමුවැනි වතාවට වියට්නාම තානාපතිතුමිය සමඟ පැවැත්වූවේ මමයි. ජනාධිපතිතුමා එක්ක කථා කළාට පස්සේ එතුමියට මම කිව්වා, අපේ ජනාධිපතිතුමා ඡන්දය දමන්න ලංකාවට එන්න ඕනෑ කියලා. ඊට පස්සේ ඔවුන් තමයි private jet එකක් ලැහැස්ති කරලා ජනාධිපතිතුමා ලංකාවට එවන්නේ. ලෝක වෙසක් උත්සවයට අපේ ජනාධිපතිතුමාට ආරාධනා කරන්නේ ඒගොල්ලන්. ඒ නිසා ජනාධිපතිතුමා ඔවුන් දීපු private jet එකේ වියට්නාම සමාජවාදී රාජ්‍යයෙන් ඇවිල්ලා, ඊළඟ දවසේ උදේ ලෝක බැංකු සභාපතිව හමු වෙනවා. අපේ මාතෘ භූමියේ යහපත වෙනුවෙන් හැමකෙනා එක්කම වැඩ කරන්න ඕනෑ විධිය අපි දන්නවා. ඒක තමයි දැන් මේ අයට තිබෙන ඊර්ෂ්‍යාව. ඒක තමයි දැන් මේ තිබෙන දරා ගන්න බැරිකම.

මෙතුමන්ලා IMF එක ගැන කිව්වා. ඔව්, අපි IMF එකත් එක්ක යන්නේ. මොකද, ඒක අපි එනකොට තිබිච්ච ගිවිසුම. ඒ ගිවිසුම වෙනස් කරන්න බැරි බව අපි මැතිවරණයට කලින්ම කිව්වා. මුලින් අපි කිව්වා, IMF ගිවිසුමක් නැත්නම් නීත්‍යානුකූල තත්ත්වයක් නැත්නම් අප වෙනස් විධියකට යනවා කියලා. නමුත්, IMF ගිවිසුම අත්සන් කරලා තිබුණා. ඒ වාගේම රනිල් වික්‍රමසිංහ IMF ගිවිසුම මේ රටේ නීතියක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක හරියි කියපු ආර්ථික ඔස්තාර්ලා තියාගෙන තමයි අද උදේ මෙතැන විපක්ෂයේ නායකයෙක් ලොකුවට කථා කළේ විදුලි බිල වැඩි කරන්න IMF එකෙන් කියලා තිබෙනවා නේද කියලා. මේ, එතුමාගේම ආර්ථිකය පිළිබඳව ඉන්න ගෝලයා. එතුමා තමයි IMF එකට වැඳගෙන ගියේ. නමුත්, මම වේලාව ගන්නේ නැහැ, මේ ගැන ගොඩක් කථා කරන්න.

ඊළඟට මම මේ කාරණයත් කියන්න කැමැතියි. දැන් මාලදිවයිනේ හදන්න යන economic zone එකක් ගැන කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාලදිවයින tourismවලින් අපට වඩා ගොඩක් ඉහළින් ඉන්නේ කියලා ඔබතුමා දන්නවා. නමුත්, මාලදිවයිනේ තිබෙන dollar crisis එක ලංකාවට වඩා බරපතළයි. මාලදිවයිනේ ආණ්ඩුව ලංකාවෙන් ණය ඉල්ලා තිබෙනවා. ඒක මේ සභාවේ ඉන්න ව්‍යාපාර කරන මැති ඇමතිවරු දන්නවා. මාලදිවයිනේ අතිවිශාල dollar crisis එකක් තිබෙනවා. ඒ රටේ වැඩ කරන අපේ මිනිසුන්ගේ වැටුප අද ලංකාවට එවාගන්න අමාරුයි. අපි මාලදිවයිනට උදවු කරනවා. ඒක අපේ සහෝදර රාජ්‍යයක් වාගේම අපේ අසල්වැසිම රාජ්‍යයක්. ඒ නිසා අපි කවදාවත් මාලදිවයින let down කරන්නේ නැහැ. නමුත්, ඇත්ත

කථාව මොකක්ද? දැන් මාලදිවයිනේ free economic zones හැදුවාටම employeesලා එන්නේ නැහැ. Employeesලා එන්න ඕනෑ; employeesලා තියා ගන්න රටකට පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා බිල්ලෝ මවන්න අවශ්‍ය නැහැ. අපි ආණ්ඩුවක් වශයෙන් ඒවාට හොඳ සූදානමකින් ඉන්නවා. අපේ ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි රාජ්‍ය තාන්ත්‍රිකව වැඩ කරන්නේ. කවුද කියනවා මම අහගෙන හිටියා, ට්‍රම්ප්ගේ Vice President ඉන්දියාවට එනවා, ඒ අස්සට ගිහිල්ලා අපේ අගමැතිතුමියට නිකම් කථාවක් ඉල්ලා ගන්න බැරිද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගෙදර යන ගමන් වාගේ ඇමෙරිකාවේ උපජනාධිපති තියා ලෝකයේ කුඩාම රාජ්‍යයකවත් කෙනෙක් හමු වෙන්න පුළුවන්ද? අනික, අපි ලංකාව නේ. අපට පෞරුෂයක් නැද්ද, අපේ අගමැතිතුමිය නිකම් කොරිඩෝවේ යවලා කථා කරන්න කියන්න? ඒ, රනිල්ලාට පුරුදු දේ. රනිල්ලා හිතන්නේ එහෙම. ඒ නිසා නේ රනිල් වික්‍රමසිංහ කිව්වේ, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් අපි වෙනම පරීක්ෂණ කරනවාට ට්‍රම්ප් තරහා වෙයි කියලා. ඒ කියන්නේ, දීන බව. අපේ එහෙම දීන බවක් නැහැ. අපි ඕනෑම නායකයෙක් එක්ක කෙළින් කථා කරනවා. අපි ඇත්ත කථා කරනවා. හැම කෙනාටම පෞද්ගලිකව ගරු කරනවා; මැතිවරණයෙන් පත්වෙලා - elected - නම් ගරු කරනවා. එච්චරයි. අපේ ලංකාව පොඩි වෙන්න පුළුවන්, ලොකු වෙන්න පුළුවන්. නමුත්, මේක අපේ රට. අපි මේ රට කාටවත් යට කරන්නේ නැහැ. අපි පුළුවන් දෙයට පුළුවන් කියනවා, බැරි දෙයට බැහැ කියනවා. අපිට ඒක ලේසියි කියන්න. මොකද, අපිට කිසිම කොන්දේසියක් නැහැ, සල්ලි පැත්තෙන්. අනෙක් පැත්තෙන් අපට ජන වරම දීලා තිබෙනවා. ඒ නිසා අපි ආර්ථික වශයෙන් මේ රට ස්ථාවර කර තිබෙනවා. අපේ රටේ ආර්ථිකය ලස්සනට ඉස්සරහට ගෙනියනවා. අපේ රටේ පසුගිය කාලය තුළ මැතිවරණ දෙක තුනක් තිබුණා. ඇත්තටම ගත්තොත් එම මැතිවරණ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍ය දේවල්. නමුත්, ඒවායින් අපේ රටේ ආර්ථික කටයුතුවලට යම් සීමා කිරීමක් වෙනවා. හැබැයි, දැන් අපි පළාත් පාලන මැතිවරණය පවත්වා අවසානයි. දැන් පළාත් පාලන ආයතන 341න්, 340ක් වැඩ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන 267ක බහුතරයක් ඉන්නේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු. අපි මේ ආයතන 267ම සභා පිහිටුවනවා. කවුරු හරි වෙන වෙන ඒවා කරන්න හීන මවනවා නම් ඒකට කියන්නේ,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
උතුරට මොකද වුණේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඒ ගැන කියන්නම්. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා ඒක දැනගන්න. මම ඒ ගැන ලියාගෙන තිබෙනවා, ඔබතුමාට කියන්න. ඒ නිසා මේ පළාත් පාලන ආයතන 267ම අපි හදනවා. ඊට අමතරව,- *[බාධා කිරීමක්]* Please! ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා කෑ ගහන්නේ නැතුව ඉන්න. මේ පළාත් පාලන ආයතන 267ම අපි හදනවා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාගේ බාධා කිරීම් නවත්වලා නිදහසේ කථා කරන්න මට අවස්ථාව සලසා දෙන්න. පළාත් පාලන ආයතන 267ක බහුතරය අපිට තිබෙනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. කවුරු හරි හිතනවා නම් මන්ත්‍රීවරු සල්ලිවලට අරගෙන වැඩ කරන්න, ඒ ඔක්කෝම අල්ලලා හිරේ දානවා. මෙතැන horse-trading කරන්න හදනවා නම්, වංචා කරන්න හදනවා නම්, ඒවා වළක්වන්න අපි කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව පරද්දපු දේශපාලන සංස්කෘතිය මොකක්ද? රාජපක්ෂලා, වික්‍රමසිංහලා සල්ලි ටොන් ගණන් බෙදලා මන්ත්‍රීවරු මිලදී ගත්ත ඉතිහාසය ගැන අපි දන්නවා. ඒක බොරුවක් නොවෙයි. හැමදාම ඇමතිකම්වලට, සභාපතිකම්වලට, සල්ලිවලට මන්ත්‍රීවරු විකිණුණා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු සභානායකතුමනි, ඒ අය ඇතුළට දාන්නකෝ. ඇයි මේ චාමර වාගේ අහිංසකයෙක්ව ඇතුළට දාලා තිබෙන්නේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමාගේ ලක්ෂ 10 අපරාදේ නේ. ඒ ගැන කථා කරන්න දැන් මට වෙලාව නැහැ. අපි ඒ ගැන වෙනම Lobby එකේදී කථා කරමුකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන 339න්, 267ක් අපි දිනලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මගේ කථාවට බාධා කරන්න දෙන්න එපා කියලා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමාගේ කථාවට බාධා කරන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කරුණාකර නිහඬ වෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ විධියට මට බාධා කළොත් මම සභාවේ අවසරය ඇතුව පැයක් හෝ කථා කරනවා. *[බාධා කිරීමක්]* කරුණාකර මට කථා කරන්න අවසර ලබා දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ගරු ඇමතිතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. බාධා කරන්න එපා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි කාටවත් බාධා කරන්නේ නැහැ නේ. මෙතැන යම් කිසි පිළිවෙළකට වැඩ කරගෙන යනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මිනිත්තුවක කාලයක් ඇතුළත ඉදිරිපත් කරන්න. දැන් සජීවී විකාශය අත්හිටුවන ලෙස මම නියෝග කරනවා.

***[මේ අවස්ථාවේදී, 2025.03.19 දිනැති ගරු කථානායකතුමාගේ නියෝගය පරිදි ගරු රාමනාදන් අර්ච්චුනා මහතාගේ කථාවේ සජීවී විකාශය අත්හිටුවන ලදී.]***

*[இச்சந்தர்ப்பத்தில், 2025.03.19ஆந் திகதிய மாண்புமிகு சபாநாயகரின் கட்டளைப்படி மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களின் உரையினது நேரடி ஒளி/ஒலிபரப்பு இடைநிறுத்தப்பட்டது.]*

*[At this stage, as per the Order made by Hon. Speaker on 19.03.2025, the live telecast of the Hon. Ramanathan Archchuna's speech is suspended.]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝගවල පැහැදිලිව තිබෙනවා, සභාවේ කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් අසත්‍යයක් කියනවා නම්, නැත්නම් මේ සභාව රවටනවා නම් ඒක බරපතළ වරදක් කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඔබතුමාට අවස්ථාව තිබෙනවා. ඔබතුමාට අදහස් දක්වන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මෙතුමා කියලා තිබෙනවා, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්. දැන් ගරු ඇමතිතුමාට අවස්ථාව ලබා දෙනවා. *[බාධා කිරීමක්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, සභාවට බාධා නොකර ඉඳගන්නවාද? දැන් ඇමතිතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අන්තිම අසාධාරණයි. එක්කෝ ඔබතුමා තීන්දුවක් ගන්න. අද පැවති ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවේදී එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්න තුනක් සම්බන්ධයෙන් කථා කරලා තිබෙනවා කියලා අදාළ කමිටු සාමාජිකයෝ අද මෙතැනදී කිව්වා. එතුමා උත්සාහ කරනවා, එතුමා දෙමළ නිසා අපි එතුමාට අසාධාරණයක් කරනවා කියලා පෙන්වන්න. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයි. ඒ නිසා කරුණාකරලා මගේ අවස්ථාව මට දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැත්නම් ඔබතුමා නීතිය ක්‍රියාත්මක කරන්න. මොකක්ද, මේ වැඩේ? *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමා මට සවන්දෙන්න. මේක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව. එම නිසා මූලාසනයට මේ සභාව පවත්වාගෙන යන්න ඉඩ දෙන්න ඕනෑ. මම ඔබතුමාට අවස්ථාව දුන්නා. දැන් ඇමතිතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම පැහැදිලිවම ඔබතුමාට කියන්න කැමැතියි, අපි -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු සභානායකතුමනි, මම මේක දවස් ගණනක්, - *[බාධා කිරීමක්]* මේ සභාව තුළ කවුරුන් හෝ වරදක් කරනවා නම්, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 77(1) බලන්න. එහි මෙසේ සඳහන් වනවා:

> "යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතාම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මඟින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී 'එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටුවනු ලැබිය යුත්තේ ය' යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබා නොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය."

මේ අනුව පළමු අවස්ථාවේ සති දෙකකට එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටුවන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා අසුන්ගන්න. සභානායකතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න. මෙය ඔබතුමාට කරන අවසන් නිවේදනය. ඔබතුමාට ඔහොම මේ සභාව මෙහෙයවන්න දෙන්න බැහැ. ගරු සභානායකතුමාට අවස්ථාව දෙන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක් ඉදිරිපත් කරන්න මට අයිතියක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Point of Order එක ඉදිරිපත් කරන්න ඔබතුමාට අවස්ථාව දුන්නා. ඔබතුමාට ඒ සඳහා අවස්ථාව දීලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඉඳගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කරුණාකරලා ඉඳගන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Sir, I rise to a point of Order.

"Point of Order" කියමින් හැම මන්ත්‍රීවරයෙක්ම මේ විධියට පාර්ලිමේන්තුවේ කාලය ගත්තොත් මොකද වෙන්නේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක් ඉදිරිපත් කරන්න මට අයිතියක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද දින සභාවේ කටයුතු අවසන් කිරීමට තව මිනිත්තු 5ක කාලයක් පමණයි තිබෙන්නේ. එම නිසා ගරු මන්ත්‍රීතුමා අසුන්ගන්න. මා දැන් සභානායකතුමාට අවස්ථාව දෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට mike එක දීලා තිබෙනවා, ඒ නිසා මම point of Order එක සඳහා අවස්ථාව ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට අවස්ථාව දුන්නා. එපමණයි. දැන් ගරු ඇමතිතුමාට අවස්ථාව ලැබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒවා වරප්‍රසාද කමිටුවට දමන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, Standing Orders අනුව ruling එකක් ක්‍රියාත්මක කරන්න කියලා. මොකක්ද මේ? *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට point of Order එකක් raise කරන්න අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, කරුණාකර අසුන්ගන්න. ඔබතුමාගේ point of Order එක සඳහා අවස්ථාවක් දුන්නා. එපමණයි. තවත් කාලය දෙන්න බැහැ. සභාවේ කටයුතු අවසන් කරන්න ඕනෑ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්කෝ මෙතුමාට කවුරු හරි මේ දේවල් ගැන කියලා දෙන්න ඕනෑ. හැම තිස්සේම මේ විධියට තමයි මෙතුමා හැසිරෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
සභානායකතුමා කරපු චෝදනාවට මට point of Order එකක් ඉදිරිපත් කරන්න පුළුවන්. අවස්ථාව දෙන්න බැරි නම් මොකක් හෝ හේතුවක් තිබෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ගරු සභානායකතුමාට අවස්ථාව දෙනවා.*[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
You always disturb the House!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
No, no.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
Why not?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තිබෙන අයිතිය රැක දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒකට බාධා කරනවා නම්, ඒ බාධාව නතර කරන එක ඔබතුමාගේ වගකීමක්. මොකද, මට නියමිත කාලයේ මම කථා කරන්නේ. මගේ කථාව කරනකොට බාධා කරන එක අසාධාරණයි. මම මගේ පක්ෂය වෙනුවෙන් පිළිතුරු කථාව මේ කරන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, මූලාසනයට සවන්දෙන්න. පාර්ලිමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යන්න ඕනෑ. ඔබතුමාට ස්ථාවර නියෝග අනුව අවස්ථාව දුන්නා, ප්‍රශ්නයක් අහන්න. සභානායකතුමා ඒකට අදාළ පිළිතුර ලබා දෙමින් තිබෙනවා. ඔබතුමාට ඊට පස්සේ නැවත සභාවට මැදිහත් වෙන්න බැහැ. ඒ කථාවට බාධා කරන්න බැහැ. *[බාධා කිරීමක්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා අසුන්ගන්න. එහෙම නැත්නම් අපට සිදු වෙනවා, අදාළ ක්‍රියාමාර්ග ගන්න. ඔබතුමා දැන් අසුන්ගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Right. මට තත්පරයක් දෙන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා, අවසාන වතාවට. *[බාධා කිරීමක්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා අසුන්ගන්න. ඔබතුමාට අවස්ථාව දීලා තිබෙනවා. මේ සභාව පවත්වාගෙන යාමට අවස්ථාව දෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order. *[බාධා කිරීමක්]* එකම දේ තමයි, එතුමාට තේරුම් කරලා දෙන්න ඕනෑ, point of Order එකක් ගන්නේ කොහොමද කියලා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභාවේ අවධානයට මෙය යොමු කරනවා. වේත්‍රධාරීතුමා, ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා සභා ගැබෙන් එළියට රැගෙන යන ලෙස නිර්දේශ කරනවා. *[බාධා කිරීම්]* ඒක තමයි සභාවේ තීන්දුව. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා එළියට රැගෙන යන ලෙස වේත්‍රධාරීතුමාට නියෝග කරනවා. *[බාධා කිරීම්]* වෙලාව ගත වෙමින් තිබෙනවා.

අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නියෝගය ක්‍රියාත්මක කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මූලාසනය ගත් තීන්දුව, - *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනයෙන් නියෝගය දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නියෝගය දුන්නා. එළියට දමන්න.

***ගරු මන්ත්‍රීවරයා සභා ගර්භයෙන් පිට නොවූයෙන් -***
*மாண்புமிகு உறுப்பினர் சபையிலிருந்து வெளியேறாதிருக்கவே-*
*The Hon. Member not leaving the Chamber -*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය පළමුවෙනි අවස්ථාව නොවෙයි. කරුණාකරලා ඔබතුමාගේ නියෝගය ක්‍රියාත්මක කරන ලෙස අපි ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* මේකේ සීමාවක් තිබෙන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම යන්නම් එළියට. - *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝග 79 (1) ප්‍රකාරව නියෝගය ක්‍රියාත්මක කරන ලෙස වේත්‍රධාරීතුමාට අවශ්‍ය මඟ පෙන්වීම කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I have the right to raise a point of Order. If I have no right to, then I will go. I only want to raise a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නියෝගය ක්‍රියාත්මක කරන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මෙහෙම බාධා කරද්දී කථා කරන්න බැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝග 79 (1)හි මෙසේ සඳහන් වනවා:

> "බරපතළ ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහා ම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය යුතු අතර, සිය නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියම කරනු ලැබිය හැකි ය. වේත්‍රධාරීවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුත්තේ ය."

***[මේ අවස්ථාවේදී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා වේත්‍රධාරී සමඟ සභා ගර්භයෙන් පිට විය.]***
*[இவ்வேளையில் மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்கள் படைக்கலச் சேவிதருடன் சபையிலிருந்து வெளியேறினார்.]*
*[Whereupon the Hon. (Dr.) Ramanathan Archchuna left the Chamber with the Serjeant-at-Arms.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමන්ලා අසුන්ගන්න. දැන් ගරු සභානායකතුමා කථා කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි, අපි විධායක ජනාධිපති බලයක්, පාර්ලිමේන්තුවේ තුනෙන දෙකක බලයක් සහ පළාත් පාලන ආයතන 341න් සියයට 79ක බලය තිබෙන පක්ෂයක් බව. එහෙම බලයක් තියාගෙන, ඒ වාගේම රටේ වෘත්තීය සමිති බලය, රටේ ගම්වල බලය ඒ ඔක්කෝම තියාගෙන තමයි මේ ගරු සභාවේ බොහොම නිහතමානීව කටයුතු කරන්නේ.

එතුමා අපිට ඇති තරම් බාධා කළා. එතුමා ඔය කියන කථාව ගත්තත්, ස්වස්තිකා අරුලිංගම් කියන්නේ අපේ පක්ෂයේ නොවෙයි, අපේ පක්ෂයට විරුද්ධවත් දේශපාලන කටයුතු කරන සමාජ ක්‍රියාකාරිනියක්, නීතිඥවරියක්. එතුමියට ඉතාම නරක විධියට මඩ ප්‍රචාර ගැසීම සම්බන්ධව ගරු අගමැතිතුමියට වාර්තා කර තිබුණා. මම ඒක තමයි මෙතැන ඉදිරිපත් කළේ. ඒක මනුස්සයෙකුට බලන්න බැහැ. ඒ සම්බන්ධව එතුමා කියපු දේවල් සහ අනික් කාරණා ගැනත් මම කියන්නම්. එතුමා හැම වෙලාවේදීම මොකක්ද කරන්නේ? ඉතාම ජරා විධියට දෙමළ ජාතිවාදී පැත්ත මතු කරමින් එතුමා මෙතැන කටයුතු කරනවා. ඔබතුමන්ලා දැක්කා, එතුමා මුස්ලිම් ජනතාවට, ඉස්ලාම් ආගමට නිග්‍රහ කළේ කොහොමද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ පළමුවන වරප්‍රසාද ප්‍රශ්නය මොකක්ද? එතුමාට විපක්ෂයෙන් වෙලාව දෙන්නේ නැහැ, විපක්ෂ නායක කාර්යාලයේදී ගැහුවා, විපක්ෂ නායක කාර්යාලයට එන්න දෙන්නේ නැහැ කියලා තමයි ලියුම දීලා තිබුණේ වේත්‍රධාරීට. අපි ඒ වෙලාවේදී එතුමා වෙනුවෙන් පෙනී හිටියා. අපි තමයි කිව්වේ එතුමාට කථා කරන්න වෙලාවක් දෙන්න කියලා. අපට කිසිම අගතිගාමී හැඟීමක් නැහැ, මේ පත්වෙලා ආපු කිසිම මන්ත්‍රීවරයෙක් ගැන. එතුමාගේ වරප්‍රසාද ප්‍රශ්න තුනක් පිළිබඳව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේදී කථා කර තිබෙනවා. මොනවාද, ඒ වරප්‍රසාද ප්‍රශ්න? පොලීසියේ මහත්වරු එක්ක රණ්ඩු වුණු ඒවා, මාර්ග නීති කඩපුවා, විපක්ෂ නායක කාර්යාලයේ රණ්ඩු වුණු ඒවා තමයි. මම මොකක්ද කරලා තිබෙන්නේ? මම එතුමාට මුකුත් කරලා නැහැ. එතුමා ගරු නීතිඥතුමියකට කැත විධියට කථා කරපු එක ගැන අගමැතිතුමියටත් ආපු, අපටත් ආපු, අපි දැකපු දෙයක් ගැනයි මම කිව්වේ. මම හිතන විධියට ඒකත් එතුමා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට දීලා තිබෙනවා නම් ඉදිරිපත් කරයි. අපේ නිහතමානීත්වය නිසා අපට තිබෙන බලය පාවිච්චි කරන්නේ නැහැ කියා ජනතාවත් අපට බණිනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ ගරුත්වය රැක අපට කථා කරන්නට ඉඩ සලසා දීම ගැන. *[බාධා කිරීමක්]*

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට සහයෝගය දෙන්න මම ඔබතුමාට වැඩිපුර වෙලාවත් ලබා දුන්නා. ඔබතුමාගේ ආසනයට ගිහින් වාඩිවෙලා ඉන්න. ඔය නරක කට්ටිය ආශ්‍රය කරන්න එපා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු සභානායකතුමනි, මම ආදරය කරපු එකම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සමන්ත විද්‍යාරත්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඕවා දිස්ත්‍රික්කයේ ප්‍රශ්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් යම් කරුණු ප්‍රමාණයක් කිව්වා. දැන් මම කැමැතියි, මැතිවරණය ගැන කියන්න. මම ඉස්සෙල්ලාම ඉතා ඉක්මනින් කියන්න කැමැතියි, පළාත් පාලන මැතිවරණය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මේ ගැන අද ගොඩක් අය කථා කරනවා, එක එක තර්ක තිබෙනවා කියලා. මේ ඉලක්කම් ගත්තාම ඉලක්කම්වලට දේශපාලනය කවන්න පුළුවන්. නමුත්, ඉලක්කම්වල දේශපාලනය නැහැ. ඒ නිසා මම ඉතාම ඉක්මනින් මේ ගැන කියන්න කැමැතියි. පසුගිය අවුරුදු 15 ඇතුළත පළාත් පාලන මැතිවරණ තිබුණේ 3යි. පළමුවැනි වතාවට 2011දීත්, දෙවැනි වතාවට 2018දීත්, තුන්වැනි වතාවට 2025දීත් එම මැතිවරණය පැවැත්වුණා. 2011දී පැවති පළාත් පාලන මැතිවරණය ගත්තොත්, පොදුජන එක්සත් පෙරමුණ යටතේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරය දරනකොට තමයි ඒ මැතිවරණය තිබුණේ. එතුමන්ලා ප්‍රාදේශීය සභා 270ක් දිනලා කෙසේ හෝ බලය පිහිටුවාගෙන තිබෙනවා. එදා එතුමන්ලාට මන්ත්‍රීවරු 2,611ක් හිටියා.

ඊට පස්සේ 2018 වෙනකල් මැතිවරණයක් තිබුණේ නැහැ. 2015, 2016 කාලයේ මැතිවරණය තිබුණේ නැහැ. කාලය දීර්ඝ කරමින් ගිහින් අවුරුදු 7ක් ගත වුණා. 2018 පෙබරවාරි විප්ලවයක් ගැන කියනවා නේද? 2018දී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඔය ලොකුවට දිනුවා කියපු වෙලාවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ප්‍රාදේශීය සභා 270ක් තිබුණේ පොදුජන පෙරමුණටයි කියන එක ජනතාව දැනගන්න ඕනෑ. පොඩ්ඩක් කැඩිලා තිබුණා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල මහත්මයා ආපු නිසා. නැත්නම් මන්ත්‍රීවරු 2,611ක් හිටියා. බින්දුවෙන් පටන් අරගෙන ඔතැනට ගියා නොවෙයි 2018දී. අද කථා කරනවා, 2018දී පැවති තත්ත්වයම තමයි මේ තිබෙන්නේ කියලා. නැහැ, 2011දී පොදුජන පෙරමුණට -මහින්ද රාජපක්ෂ මැතිතුමාට- ප්‍රාදේශීය සභා 270ක බලයක් ලැබුණා වාගේම මන්ත්‍රීවරු 2,611ක් හිටියා.

ඊළඟට එක්සත් ජාතික පක්ෂය ගනිමු. මම දැක්කා, තලතා අතුකෝරල මැතිනිය -ඇත්තටම එතුමිය ඉස්සර හිතවත් මන්ත්‍රීතුමියක්- අපට බලයෙන් යන්න කියලා තිබෙනවා. මොකක්ද, UNP ආණ්ඩුව තිබුණු වෙලාවේ වුණේ? UNP එකට ඒ වෙලාවේ තිබුණේ සභා 9යි. TNA එකට සභා 32යි.

2018දීත් පළාත් පාලන මැතිවරණය තිබුණා. 2018දී පොහොට්ටුව පක්ෂය මැතිවරණය දිනපු විධිය ගත්තොත්, ඒවාත් කෑලි-කෑලි වශයෙන් තිබුණේ. නමුත්, කෙටියෙන් කිව්වොත්, 2018දී මැතිවරණය තිබුණා, ඔය විප්ලවය කියන එක. 2018දී ඒගොල්ලන් ප්‍රාදේශීය සභා 231ක් දිනුවා. 2011දී ලැබුණු සභා 270, සභා 231 දක්වා අඩු වුණා. මන්ත්‍රීවරු 3,436ක් ආවා. 2018 පෙබරවාරි මාසයේ මැතිවරණය පැවැත්වුණේ, පාස්කු ප්‍රහාරයට පොඩ්ඩක් කලින්. මන්ත්‍රීවරු 3,436ක් සහා 231ක බලය ලබා ගත්තා; ප්‍රතිශතය 44.65යි. එතකොට තිබුණේ UNP ආණ්ඩුව. තලතා අතුකෝරල මැතිනියලා මෙතැන ඇමතිකම් දැරුවා. රනිල්ලා, සජිත්ලා ඔක්කොම එකට හිටියේ.

එතකොට කීයද තිබුණේ? UNP-SJB එකට ගත්තොත්, අගමැතිකම තියාගෙන, ජනාධිපතිකම තියාගෙන මේගොල්ලන්ට ලැබුණේ සභා 34යි; සභිකයෝ 2,433යි; ප්‍රතිශතය 32යි. මේගොල්ලන් දාලා ගියාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දැන් අපට දාලා යන්න කියනවා නේ. මේගොල්ලන් දාලා ගියේ නැහැ. 2019 අවුරුද්දේ එළවනතුරුම මේගොල්ලන් හිටියා.

[ගරු බිමල් රත්නායක මහතා]

ඊට පසුව ජනතා විමුක්ති පෙරමුණ ගනිමු. ඒ කාලයේ අපි ජාතික ජන බලවේගය හදනවා. ජවිපෙ ලෙස තමයි 2018දී පළාත් පාලන මැතිවරණයට ඉල්ලුවේ. 2018දී පැවැති පළාත් පාලන මැතිවරණයේදී අපට ජනතාව එක ප්‍රාදේශීය සභාවකවත් බලය ලබා දුන්නේ නැහැ. අපට ලැබුණේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුර 431යි; සියයට 6.27යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අවුරුද්දේ මේ පළාත් පාලන මැතිවරණය දක්වා ගත්තොත්, පොදුජන පෙරමුණේ සභාපතිවරු 231ක් හිටපු සභාපතිවරු. ඒගොල්ලන් තමයි හිටපු සභාපතිවරු. ඒගොල්ලන්ගේ මන්ත්‍රීවරු 3,436ක් හිටියා. ඒගොල්ලන් තමයි හිටපු මන්ත්‍රීවරු. අපේ මන්ත්‍රීවරු 431යි. මම හිතන විධියට ඒ මන්ත්‍රීවරු 431න්, 75ක් හෝ 100ක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. මේ පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල සන්සන්දනය කරනකොට, 2018දී පොදුජන පෙරමුණ පෙබරවාරි විප්ලවය කළේ බින්දුවෙන් පටන් අරගෙන නොවෙයි. ප්‍රාදේශීය සභා 270ක බලය තියාගෙන තමයි 231ට අඩු වුණේ. අපි දන්නවා, ඒ වෙලාවේ රටේ දේශපාලන අරාජිකත්වයක් තිබුණු බව. මෛත්‍රීපාල-රනිල් අතර රණ්ඩුවක් තිබුණා. ආර්ථිකය කඩාගෙන වැටෙමින් තිබුණා. ඒ නිසා පොදුජන පෙරමුණ වෙනස් කරන්න ජනතාවට වුවමනාවක් තිබුණා. එම නිසා ඡන්ද භාවිතය වැඩි වුණු බව අපි දන්නවා. ඒ වෙලාවේ එවැනි තත්ත්වයක් තිබුණා. නමුත් අද එවැනි තත්ත්ව මුකුත් නැහැ. අද ආණ්ඩුවේ එහෙම ප්‍රශ්නයක්වත්, අපට කිට්ටු කරන්න පුළුවන් විපක්ෂයක්වත් නැහැ. මම මේ කියන්න හදන්නේ මේකයි. 2018දී පොදුජන පෙරමුණ යම්කිසි ශක්තියක් ලබා ගත්තා නම් ඒගොල්ලන් කන්ද උඩ ඉඳලා තමයි ඊළඟ කන්ද උඩට ගියේ. සභා 270කුයි, මන්ත්‍රීවරු 2,611කුයි ඉඳලා තමයි 2018දී ඒගොල්ලන් එතැනට ගියේ. දැන් ඒගොල්ලන් ප්‍රාදේශීය සභා ගැන බලනවා නම් බලන්න ඕනෑ කොහොමද?

ඔබතුමන්ලා දන්නවා, ඇත්තටම ගමේ ජනතාවට සමීපතම පුද්ගලයා වන්නේ ප්‍රාදේශීය සභා සභාපතිතුමා, නැත්නම් මන්ත්‍රීතුමා බව. ඔබතුමා දන්නවා, මෙතැන ඉන්න අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159න්, 100කට වැඩි පිරිසක් පාර්ලිමේන්තුවට අලුත්ම මන්ත්‍රීවරු බව. එතකොට අපි බින්දුවෙන් පටන් අරගෙන පළාත් පාලන මැතිවරණයෙන් කොතැනටද ගිහින් තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025දී ප්‍රාදේශීය සභා ගැන බැලුවොත් අපි කොතැනටද ගිහින් තිබෙන්නේ? අපට සභා 267ක බහුතරය සහ මන්ත්‍රීවරු 3,927ක් හිමිවෙලා තිබෙනවා. ජාතික ජන බලවේගය මන්ත්‍රීවරු විතරක් 3,500ට වැඩියෙන් හිමි කරගෙන තිබෙනවා.

ඊට පසුව සජබයේ තත්ත්වය මොකක්ද කියලා අපි බලමු. මම කිව්වා, 2018දී එතුමන්ලාගේ ආණ්ඩුවයි තිබුණේ කියලා. හැබැයි, දිනුවේ සභා 34යි; මන්ත්‍රීවරු 2,433යි. අද කොහොමද සජබයේ තත්ත්වය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එතුමන්ලාට තිබෙන්නේ සභා 14යි. ඒවායේත් සම්පූර්ණ බලය පිහිටුවන්න පුළුවන් ඒවා අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. සභා 14ම නැහැ. මන්ත්‍රීතුමන්ලා කීයද? මන්ත්‍රීතුමන්ලා ප්‍රමාණය ගත්තොත් 1,700යි. 2025 අවුරුද්ද වෙනකම් ඔබතුමන්ලාට මන්ත්‍රීතුමන්ලා 2,433ක් හිටියා. *[බාධා කිරීමක්]* මම දන්නවා, එහෙම ගත්තොත් පොදුජන පෙරමුණටත් ඒ වචනවල හැංගෙන්න පුළුවන් බව. එහෙම නම් අපිටත් කියන්න පුළුවන් නේ, "ජවිපෙ කියලා එකක් නැහැ, ජාතික ජන බලවේගය" කියලා. එහෙම නොවෙයි. අපි ඇත්ත politics කථා කරමු. *[බාධා කිරීමක්]* බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා. නඩුවකුත් වැටිලා නේ තිබෙන්නේ. මම ඔබතුමන්ලාට කියන්නේ මේකයි. අපි ඇත්ත කථා කළොත්, real politicsවලට ආවොත් මොකක්ද තිබෙන්නේ? සජබයට මන්ත්‍රීවරු 2,433ක් හිටියා. සභා 34ක බලය තිබුණා. අද ඔබතුමන්ලාට මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමන්ලා 1,700කට අඩුවෙලා තිබෙනවා. ඕනෑ නම් රවී කරුණානායක මහත්මයාගෙන් අහලා UNP ටිකත් එකතු කරලා බලන්න. ඒත් කලින් පැවති මන්ත්‍රීවරු 2,400 නැහැ. සභා 34ක් තිබුණා. ඒක 14ට අඩුවෙලා තිබෙනවා.

පොදුජන පෙරමුණේ තත්ත්වය මොකක්ද? පොදුජන පෙරමුණ ඇත්තටම බලන්න ඕනෑ, ඒගොල්ලන්ට තිබුණු මන්ත්‍රීවරු 3,436ක සංඛ්‍යාවේ ඉඳලායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2025 අවුරුද්ද වෙනකම් පොදුජන පෙරමුණට මන්ත්‍රීවරු 3,436ක් හිටියා. සභා 231ක හිටපු සභාපතිවරු ඒගොල්ලන්ගේ. අද පොදුජන පෙරමුණට සභා කිසිවක් නැහැ. මන්ත්‍රීවරු ඉන්නේ 742යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පක්ෂයක් විධියට 1997 අවුරුද්දේ ඉඳලා දන්නවා. අපට පළමුවෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ආවේ 1997දී. අපට මන්ත්‍රීවරු 101ක් ආවා. ප්‍රාදේශීය සභාවක විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට -නිසි ගෞරවය ඇතුව කියන්නේ- ජාතික දේශපාලනයට කරන්න පුළුවන් බලපෑම බොහොම අඩුයි කියන එක අපි දන්නවා.

අපි කටයුතු කළේ කොහොමද? ඒ 101දෙනාම එකතු කරලා, fund එකක් හදලා, ඒ fund එකෙන් පාසල් පුස්තකාල වාගේ පොඩි පොඩි දේවල් හදලා, සම්පූර්ණ සමගි සම්පන්න ඒකාබද්ධ ප්‍රවේශයකින් තමයි අපි ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට යම්කිසි value එකක් හැදුවේ. ඔබතුමන්ලාගේ පක්ෂවල එහෙම සමගියක් මුළු ලංකාව පුරාම තියා සභාවකවත් හදා ගන්න බැහැ. ඔබතුමන්ලාගේ උප සභාපති හැම වෙලාවේම ඉන්නේ සභාපතිගේ බෙල්ල කපන්න නේ. එහෙම නේ. ප්‍රාදේශීය සභාවලට මන්ත්‍රී ධුර 742ක් අරගෙන තිබෙනවා, රාජපක්ෂලා. ඒ 742දෙනාට මොකක්ද කරන්න පුළුවන්? දේශපාලන වශයෙන් මොකුත් කරන්න බැහැ. දේශපාලන වශයෙන් අනාථයි. ඒ නිසා ප්‍රාදේශීය සභා මැතිවරණ ප්‍රතිඵල සන්සන්දනය කළොත් අපට කියන්න තිබෙන්නේ, ලංකා ඉතිහාසයේ වැඩිම ප්‍රාදේශීය සභා ජයග්‍රහණය තමයි ජාතික ජන බලවේගය ලබාගෙන තිබෙන්නේ කියන එක. ඒක නිහතමානීව පිළිගන්න.

අපි දන්නා තව දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? දැන් අපට කියනවා, අපි උතුරේ නැති වෙලා ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හුඟක් අය හිතාගෙන ඉන්නවා, සමහර පරණ ආචාරියොත් ඉන්නවා බයිලා කියන, අපි උතුරේ නැහැ, මහරගම විතරයි කියලා කියනවා. නැහැ. වන්නි දිස්ත්‍රික්කයේ අපේ ඡන්ද වැඩි වෙලා තිබෙනවා. වන්නි දිස්ත්‍රික්කයේ මේගොල්ලන් මේ ඡන්දය කළේ කොහොමද? කසිප්පු බෙදුවා, ඉලංගෙයි තමිළ් අරසු කච්චි. මම වගකීමෙන් කියනවා. සල්ලි බෙදුවා. මට වඩා මේ ඇමතිතුමන්ලා දන්නවා, ඒක. අමු ජාතිවාදය කළා. මම ඒ වචන කියන්නේ නැහැ, ඒවා අවුස්සන්න හොඳ නැති නිසා. අමු ජාතිවාදය පාවිච්චි කළා. නමුත්, අපි මොන වාගේ පක්ෂයක්ද? අපි සතයක්වත් බෙදුවාද? අපට කොච්චර බෙදන්න පුළුවන්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? බෙදනවා නම් අපට කොච්චර බෙදන්න පුළුවන්ද? බෙදන්න පුළුවන්. අඩු ගණනේ අපි ඡන්දයක් අරගෙන නැහැ, "මේ පාර හදනවා" කියලා. Vote on Account එකෙන් අනුමත කළ පාරවල් ටිකක් තිබුණා. ඒවා විතරයි අපි කිව්වා නම් කිව්වේ. අගමැතිතුමිය ඉස්කෝල දහස් ගණනක් හදනවා. අපි එක ඉස්කෝලයක නමක් කිව්වේ නැහැ. අපි කිසිම මන්ත්‍රීවරයෙක් සල්ලිවලට ගන්න ගියේ නැහැ. අපි ජාතිවාදය පාවිච්චි කළේත් නැහැ; වංචා කළේත් නැහැ. අපි clean politics කරලා තමයි අද මන්ත්‍රී ධුර 4,000ක් දිනලා තිබෙන්නේ, ප්‍රාදේශීය සභාවල.

මොකක්ද, උතුරේ තත්ත්වය? උතුරේ, වන්නි දිස්ත්‍රික්කයේ, මන්නාරමේ අපේ ඡන්ද වැඩි වෙලා තිබෙනවා. මන්නාරමේ අදත් ලොකුම පක්ෂය ජාතික ජන බලවේගය. ඔය ෂොපිං බෑග් එක අරගෙන මන්නාරමෙන් පුත්තලම් ගිහිල්ලා දැන් නැව් ගණනකින්වත් ගෙනෙන්න බැරි තරමට දේපළ හම්බ කර ගත්ත කට්ටිය නොවෙයි, වව්නියා දිස්ත්‍රික්කයේ ලොකුම පක්ෂය අපි. මුලතිව් දිස්ත්‍රික්කයේ ඡන්දත් වැඩිවෙලා තිබෙනවා අපේ. මන්නාරමේ ඡන්දත් වැඩි වෙලා තිබෙනවා. එහෙම නම් මතක තියා ගන්න, අනෙක් අය ඔච්චර ජාතිවාදය කරලාත්, ඔච්චර ජඩ වැඩ කරලාත් උතුරු පළාතේ, වන්නි දිස්ත්‍රික්කයේ, අද ඡන්ද වැඩි කරගෙන තිබෙන එකම පක්ෂය අපේ ජාතික ජන බලවේගය; තේසිය මක්කල් ශක්ති. අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමා මේ වෙලාවේ හිටියා නම් හොඳයි. එතුමා එළියට දමපු නිසා අහගන්න විධියක් නැහැ.

ඊළඟට, යාපනය දිස්ත්‍රික්කයේ තත්ත්වය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයටම අපට -අපේ පක්ෂයට- යාපනය දිස්ත්‍රික්කයේ එකම එක ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධුරයක්වත් තිබිලා නැහැ. ඒකයි ඇත්ත. අද මොකක්ද තත්ත්වය? අපට අද යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ධුර 81ක් තිබෙනවා. කිලිනොච්චියත් එකතු කරලා ගත්තොත්, 100ට කිට්ටු වෙන්න ඉන්නවා. යාපනය දිස්ත්‍රික්කයේ ඉලංගෙයි තමිළ් අරසු කච්චි එකට ඡන්ද 162,000ක් තිබෙනවා. ඒක ඇත්ත. ඒගොල්ලන් අවුරුදු 100ක් තිස්සේ ඒ පළාත් පාලනය කරනවා; ඇමතිවරුද, මන්ත්‍රීවරුද, සභාවල බලය ඒ ඔක්කෝම තිබෙනවා. ඉතිහාසයේ ඒ සභා ඔක්කෝම පාලනය කරලා තිබෙන්නේ ඒගොල්ලන්. අපට උතුරු පළාතේ විතරක් මන්ත්‍රී ධුර 150ක් තිබෙනවා. යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ මන්ත්‍රී ධුර 81ක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යාපනය මහ නගර සභාවේ තත්ත්වය මොකක්ද? යාපනය මහ නගර සභාවේ, ඔය ගොඩක් "ලොරි ටෝක්" දෙන පක්ෂයකට මන්ත්‍රී ධුර ලැබී තිබෙන්නේ, දැන් පත් වෙලා තිබෙන්නේ 13යි. පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ ACTC පක්ෂයට තිබෙන්නේ මන්ත්‍රී ධුර 12යි. ඒගොල්ලන් හැමදාම ඒවායේ නගරාධිපතිකම් කළ කට්ටිය. මම හිතන විධියට පොන්නම්බලම් මන්ත්‍රීතුමාගේ සීයාගේ තාත්තාත් ඒ කාලයේ යාපනය මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙක්. තේසිය මක්කල් ශක්ති වන අපට පළමුවැනි වතාවට යාපනය මහ නගර සභාවේ මන්ත්‍රී ධුර 10ක් තිබෙනවා. කාටවත් බහුතරය නැහැ. සජබයට කීයද තිබෙන්නේ? සජබයට එකයි. සජබයට එකයි තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයට එකයි තිබෙන්නේ. තේසිය මක්කල් ශක්ති වන අපට මන්ත්‍රී ධුර 10ක් තිබෙනවා, යාපනය මහ නගර සභාවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කවුද? ඒ අලුත්ම අලුත් මන්ත්‍රීවරු; අලුත්ම අලුත් මිනිස්සු. ඒගොල්ලන් මීට කලින් ප්‍රාදේශීය සභාවක පස් පාගලා නැහැ. එහෙම නම් උතුරු පළාතේ உறுப்பினர்கள் 150ක් අපට ඉන්නවා. වන්නි දිස්ත්‍රික්කයේ, මුළු උතුරු පළාතේම number one දේශපාලන පක්ෂය අපි. උතුරු පළාතේ තිබෙන ජාතික දේශපාලන පක්ෂවලින් ලොකුම පක්ෂය අපි, මතක තියා ගන්න.

මේ පළාත් පාලන මැතිවරණයේ අපි දන්නා සත්‍යය මොකක්ද? අපට යම් කිසි අවාසියක් වුණා නම් වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අපේක්ෂකයන් ඉතාම අලුත් අය නිසා. ඒ අය කවදාවත් ප්‍රාදේශීය සභාවක පස් පාගලා නැහැ; ඡන්දය ඉල්ලලා නැහැ. එතකොට ගමේ ඡන්දයේදී විශේෂයෙන්ම කොට්ඨාස ක්‍රමයට එනකොට අනිවාර්යයෙන්ම ඒවායේ වැඩ කරපු මන්ත්‍රීවරුන්ට, නමක් තිබෙන අයට බලය ලැබෙනවා. මම දැක්කා එක channel අයිතිකාරයෙක් දැන් ලොකු "ලොරි ටෝක්" දෙනවා. හොයලා බැලුවොත් එහෙම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ භාගෙට භාගයක් ඉන්නේ කවුද? පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරු. අපට ඔවාට කාලය නාස්ති කරන්න වෙලාවක් නැහැ. පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරු, එහෙම නැත්නම් වෙනත් පක්ෂවල හිටපු මන්ත්‍රීවරු ඉන්නේ. හැබැයි, ඒත් කීයද? ඊට පස්සේ මම දැක්කා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබයෙන් කියනවා -මම ඇහුවත් එක්ක, අද දිවුරුම් දෙන්නද ආවේ කියලා, සජිත් ප්‍රේමදාස මහත්මයා- බලය ගන්නවා ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන්ගේ මඩ, අවලාද, channel ප්‍රහාර ඔක්කෝම මැද්දේ මේ මැතිවරණයේදීත් අපි අරගෙන තිබෙනවා, ඡන්ද ලක්ෂ 45ක්.

දැන් මේ අපිට විරුද්ධව බලය ගන්න හදන කට්ටිය ඡන්ද කීයද ගත්තේ? ලක්ෂ 22යි; සියයට 21යි. ඔබතුමන්ලා ජනාධිපතිවරණයේදී ඡන්ද කීයක් ගත්තාද? ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලා සියයට 32ක් ගත්තා. අඩු ගණනේ ඒ ප්‍රමාණයවත් ගන්න එපා යැ. *[බාධා කිරීමක්]* මම කියන්නම්. පාර්ලිමේන්තු ඡන්දයට කලින් සංසන්දනය කරන්න ගොඩක් දේවල් තිබෙනවා. මම කියන්නේ මේකයි. දැන් කියනවා නේ අපට දමා යන්න කියලා. මම හිතන විධියට සමහරු දිවුරුම් දෙන්න ඇඳුම් මහනවා නේද? ඒ ඔක්කෝම දැන් කරනවා නේ. දෙසැම්බර්වල දිවුරුම් දෙනවා කියනවා. ඒ විධියේ එක එක ඒවා තිබෙනවා. අලවතුවල මැතිතුමනි, ඔබතුමා නම් පොළොවේ පය ගහලා ඉන්නා මන්ත්‍රී කෙනෙක් නිසා ඔබතුමා දන්නවා, ඒවා වෙන්නේ නැති බව. මෙවර මැතිවරණයෙන් සියයට 21යි අරගෙන තිබෙන්නේ, ඔබතුමන්ලා. අපිට වඩා ලක්ෂ 23ක් පසුපසින් ඉන්නේ. ඔබතුමන්ලාට ලක්ෂ 22යි, අපට ලක්ෂ 45යි. ඔබතුමන්ලා ලබා ගත් සම්පූර්ණ සංඛ්‍යාව දෙගුණ කරලා ගත්තත් අපිව අල්ලන්න ඒක මදි. මේ සංඛ්‍යා, දත්ත පාර්ලිමේන්තු ඡන්දයකට දමා බලන්න. මේක පාර්ලිමේන්තු ඡන්දයකට දැම්මත් මතක තබා ගන්න, ජාතික ජන බලවේගය සම්පූර්ණ බහුතර ආණ්ඩුවක් හදනවා. මේ සංඛ්‍යා, දත්ත දමා බලන්න. එතකොට ඔය සියයට එකේ, දෙකේ, තුනේ කෑලි යනවා. ඒවා බින්දුව වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංසන්දනය කරනවා නම්, එය කළ යුතු විධියක් තිබෙනවා. ක්‍රිකට් කියලා දහම් පාසල් match එකකුයි, test match එකකුයි සංසන්දනය කරන්න බැහැ. නමුත් ඕනෑ ක්‍රමයකට බලන්න පුළුවන්. මම ඒකයි කිව්වේ ඉලක්කම්. ඉලක්කම්වල politics නැහැ නේ. ඉලක්කම්වලට politics ගෙනෙන්න පුළුවන්. ඉලක්කම්වල politics නැහැ. ඒකයි මම කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකෙදි හැම පැත්තෙන්ම ගත්තත් මොකක්ද පෙන්වන්න පුළුවන් වන්නේ? කලින් ජවිපෙට තිබුණු මන්ත්‍රී ආසන ගණනත් එක්ක සසඳා මේ කියන්නේ. ජවිපෙට මන්ත්‍රී ආසන 431යි තිබුණේ. ඒ ප්‍රමාණය 3,927ක් දක්වා වැඩි වෙලා තිබෙනවා; ලොවෙත් නැති වෙන්න ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. 3,500ක් වැඩියි. සභා 267ක බහුතරය ලැබී තිබෙනවා. අපි ඒ සභා 267ම හදනවා. නිකම් බොරුවට කරදර වෙන්න එපා, වෙන වෙන ඒවා කරන්න ගිහිල්ලා. 267ම හදනවා. ඊට වැඩියෙන් පුළුවන් නම් ඒත් හදනවා. අපි දන්නවා, දේශපාලනය තුළ කුණු වෙන්නේ නැතුව, සවුත්තු වෙන්නේ නැතුව මේ දේශපාලනයේ උපාය උපක්‍රම තෝරන්න. අපිට ඒවා තේරෙන්නේ නැත්නම්, ජනාධිපතිකම් දිනන්න පුළුවන්ද? අගමැතිකම් ගන්න පුළුවන්ද? පාර්ලිමේන්තුවේ ආසන 159ක් ගන්න පුළුවන්ද? මම මේ ඉලක්කම් එක්ක ඔබතුමන්ලාට කිව්වේ. උතුරද, නැඟෙනහිරද නොවෙයි, ලංකාවම අපි දිනා තිබෙන්නේ.

ඊළඟට කොළඹ මහ නගර සභාව ගැන බලන්න. කොළඹ මහ නගර සභාවේ තත්ත්වය මොකක්ද? මුළු ඉතිහාසයේම ගත්තොත්, මේක තමයි පළමුවෙනි වතාව එක්සත් ජාතික පක්ෂයට හෝ සජබයට -ඔය දෙකම එකක් හෝ දෙකක් නේ- එකම එක මහ

[ගරු බිමල් රත්නායක මහතා]

නගර සභාවක හෝ බලය ලැබී නැති. දුක් වෙන්න වෙනවා. ඕවා ගැන බලන්න. නැත්නම් මළාට එන්න වෙන්නේ නැහැ. ඔහොමම ඉන්න වෙනවා, අවුරුදු 75ක් ඉවර වෙනකම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප ගැන කියන්නේ මොකක්ද? පාර්ලිමේන්තු ඡන්දයේදී අපට ලැබුණු ඡන්ද ප්‍රමාණය මෙවර ලැබුණේ නැහැ කියන එක නේ කියන්නේ. මෙවර මැතිවරණයෙන් සජබයට වැඩිවෙලා තිබෙන්නේ කීයද? ලක්ෂ 3යි. සජබයට පාර්ලිමේන්තු ඡන්දයට වඩා වැඩිවෙලා තිබෙන්නේ කීයද? ලක්ෂ 3යි. ලක්ෂ 3ට මන්ත්‍රීකම් 5ක් දමමුකෝ. 75,000 ඒවා 4යි. ජාතික ලැයිස්තුවෙන් 1යි. කීයද? දැන් 40යි තිබෙන්නේ, ඒක 45ක් වෙයි. අපි 159යි. අල්ලන්න පුළුවන්ද? අපි මේ අවුරුදු හතරහමාර තුළ පොල් ගානවාද?

ඊළඟට, පොහොට්ටුව පක්ෂය ගැන බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොහොට්ටුවට විශේෂ වාසියක් තිබුණා. අපි පිළිගන්නවා, ඒගොල්ලන්ගේ තමයි බලවත්ම සභාපතිවරු හිටියේ කියන එක. බැසිල් රාජපක්ෂ මහත්මයා ඒගොල්ලන්ගේ සභාපතිලා ඉතා බලවත්ව හැදුවා. බලය දීලා, සල්ලි දීලා, ඕනෑම ජඩ වැඩක් කරන්නත් දීලා ඉතා බලවත් සභාපතිලා හැදුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තංගල්ල ප්‍රදේශයේ නිසා ඔබතුමා දන්නවා, අර විදේශික කාන්තාවක් දූෂණය කර මරා දමපු සභාපතිවරයාව පොහොට්ටුවෙන් ආරක්ෂා කළේ කොහොමද කියලා. ඒ වාගේම ඔබතුමා දන්නවා, හම්බන්තොට මහ නගර සභාවේ සජබයේ මන්ත්‍රීවරුන්ට එරාජ් කියලා හාදයෙක් පිස්තෝලය ඔසවාගෙන ආපු බව. ඒගොල්ලන්ට පිස්තෝලය ඔසවාගෙන ආවේ. රාජපක්ෂලා ඒ කෙනාව අත්අඩංගුවට ගත්තේ නැහැ. රාජපක්ෂලා එහෙම බල කණු වාගේ සභාපතිවරුන් හැදුවා. මම හිතන විධියට ලංකා ඉතිහාසයේ ප්‍රාදේශීය සභාවල එතරම් බලගතු සභාපතිවරුන් හැදුවේ නැහැ, වෙන කවුරුවත්. අන්න ඒ සභාපතිලා තමයි මේ පාර ඡන්දය ඉල්ලුවේ. ඒ නිසා අපිට වෙච්ච අවාසිය මොකක්ද? පාර්ලිමේන්තු ඡන්දයට වඩා අපිට ඡන්ද අඩු වෙලා තිබෙනවා. ඒ ගැන සැකයක් නැහැ. ඒක පෙනෙනවා. ඉලක්කම පෙනෙනවා. හැබැයි, ඒකට හේතුව මොකක්ද? අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් ඉතාම අලුත් අය. නමුත් අරගොල්ලන්ගෙන් ඉල්ලුවේ ඉතා බලවත් අය. මම කලිනුත් කිව්වා වාගේ, ඒගොල්ලන් හිටපු තැන මතක තබා ගන්න. සභා 231ක සභාපතිවරුන් හිටියා, මන්ත්‍රීවරුන් 3,436ක් හිටියා. ඒක තමයි අපි මුහුණ දුන්, ගමේ තිබුණු යථාර්ථය.

ඒ වාගේම ඔබතුමා දන්නවා, අපි ආණ්ඩුව අරගෙන තවම මාස 6යි කියන එක. අපිට ගම්වල සංවර්ධන කටයුතු මාස 6කින් සම්පූර්ණ කරන්න බැහැ. අපිට බැහැ නේ, පාරවල් හදන්න මගේ යහළුවන්ට unsolicited විධියට ටෙන්ඩර් දීලා දමන්න.

අපට බැහැ එහෙම කරන්න. ඒ නිසා ගම්වල සමහර සංවර්ධන කටයුතු ගැන ඒ ජනතාවට deliver වෙලා නැහැ. Deliver කරන්න කාලයක් නැහැ. ඒ අතින් ගත්තොත්, ජනතාවට ඒ කිසිම දෙයක් නැතිව තිබියදී තමයි අප ඡන්දයට ඉදිරිපත් වුණේ. මෙතුමන්ලා හාල් ද, පොල් ද, බත් ද ඔක්කෝම බෙදලා නේ මේ ඡන්ද ලබා ගත්තේ. මේ සැරේත් එහෙමයි. මීට කලින් කොහොමත් එහෙමයි. අප එවැනි මොකුත් කරන්නේ නැතිව තමයි, අපේ සංවර්ධන ව්‍යාපෘති මොකවත් ගමට හරියාකාරව යන්න කලින් තමයි මේ ඡන්දය පැවැත්වුයේ. මොකද, අපට ඕනෑකම තිබුණා මේ මැතිවරණය පවත්වන්න. මොකද, අපි මේ පළාත් පාලන මැතිවරණය කල් දැමීමට විරුද්ධව නඩු ගිය පක්ෂයක්. එම මැතිවරණය කලින්ම පවත්වන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයක් තිබෙනවා. අපට ගමේ යන්ත්‍රණය හදා ගන්න ඕනෑකමත් තිබෙනවා. අපට කිසිසේත් ඕනෑකමක් තිබුණේ නැහැ, විපක්ෂය තළලා දාන්න. එහෙම නම්, අපට නීති ඕනෑ තරම් හදන්න තිබුණා. චාමර සම්පත් මන්ත්‍රීතුමා අහන්නේ ඒක නේ, "තමුන්නාන්සේලා තුනෙන් දෙකක බලයක් තියාගෙන පොල් ගැවාද" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ප්‍රජාතන්ත්‍රවාදී විධියට ආණ්ඩුව අරගෙන බලය පාවිච්චි කරලා අනෙකා තළනවා නම්, ඒක ආණ්ඩුවක්ද? ඒක නොකරනවාට නේ මෝඩකම් කරනවා කියලා අපට ඔය කියන්නේ. අපි ඒක කරන්නේ නැහැ. ඉතින් අපි මේ ක්‍රමයෙන් දිනලා තිබෙනවා සභා 267ක්. මදි ද? මම ගොඩක් කරුණු ඔබතුමාට කිව්වා. මගේ කථාවට ගොඩක් බාධා වෙච්ච නිසා මගේ flow එකත් ඇත්තටම පොඩ්ඩක් වෙනස් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රාදේශීය සභා මැතිවරණය ගත්තාම, පාර්ලිමේන්තු මැතිවරණයට වඩා අපට ඡන්ද අඩු වෙලා තිබෙනවා තමයි. ඒකට බලපෑ පැහැදිලි හේතුව මා කියපු කාරණයයි. හැබැයි, දැන් මෙතුමන්ලා මොනවාද අපට කියන්නේ? අපට කියනවා අපි උද්ධච්චයි කියලා. හොරුන් ඉස්සරහා අපි උද්ධච්චයි. තක්කඩින් ඉස්සරහා අපි හොඳටම ආඩම්බරයි. ඔය රදල මානසිකත්වය තිබෙන හිඟන්නන් වාගේ දේශපාලනඥයින් ඉන්නවා. අපි ඒගොල්ලන් ඉස්සරහා ගොඩක් ආඩම්බරයි. අපි මිනිසුන් ඉස්සරහා උපරිම නිහතමානියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා එක්ක පවත්වන සාකච්ඡාවකදී මොකද වෙන්නේ කියලා නිකම් අහලා බලන්න. ඉතිහාසයේ රජයේ සමහර ජ්‍යෙෂ්ඨ නිලධාරින් තමන්ගේ මුළු රැකියා ජීවිත කාලයේදී ඉස්සෙල්ලාම අප ඉස්සරහා තමයි තමන්ගේ අදහසක් ඉදිරිපත් කරන්නේ. මුදල් අමාත්‍යාංශයේ වෙච්චා, අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙච්චා හැම නිලධාරියෙකුටම කථා කරන්න කියලා අපි කියනවා; ඒගොල්ලන්ගේ අදහස් කියන්න කියනවා. අපි තීන්දු ගන්නේ සාමූහිකවයි. ඔබතුමාට පෙනෙනවා ඇති නේ රනිල් වික්‍රමසිංහ පක්ෂ නායක රැස්වීමේදී - ඒගොල්ලන්ගේ Group Meeting එකේදී- කටයුතු කරන්නේ කොහොමද කියලා. ඔබතුමාට පෙනෙනවා ඇති නේ, රාජපක්ෂලා Group Meeting එකේදී කථා කරන්නේ කොහොමද කියලා. අපි එහෙම නැහැ. අපි නිලධාරින්ට අවස්ථා දෙනවා, ඒ අය සමඟ කථා කරනවා, ඒගොල්ලන්ට උපරිම උදව් කරනවා. අපේ උපරිම නිහතමානිත්වය, ප්‍රජාතන්ත්‍රවාදීත්වය නිලධාරින් එක්ක තිබෙනවා.

අපි සාමාන්‍ය ජනතාව ඉස්සරහා ඉතාම නිහතමානීයි. හැබැයි, සමහරුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. අද මේ තනතුරු තමන්ගේ ප්‍රාණ බුක්තියට තිබෙනවා වාගේ තිබිලා ඒවා ජනතාව විසින් තමන්ගේ පන්තියේ සාමාන්‍ය, සාධාරණ පිරිසක් අතට ලබා දුන්නාම ඒක උහුලන්න බැරි ලෙඩ්ඩු ටිකක් ඉන්නවා මේක ඇතුළේ. ඒ ලෙඩ්ඩුන්ගේ ගෝලයෝ ටිකක් ඉන්නවා social mediaවල සහ channels කිහිපයක. ඒගොල්ලන්ට තිබෙනවා ප්‍රශ්නයක්. ඒ මොකක්ද? ඒ තමයි, අප කරන හැම දෙයක්ම වැරැදියට දකින එක. හැබැයි, මේක මතක තියා ගන්න. අපි ජනතා සතුරන් ඉස්සරහා උඩඟුයි. ජනතාවට විරුද්ධකම් කරපු හොරුන් ඉස්සරහා අපි ඉතාම උඩඟුයි. ඒ වාගේම ජනවරම පිළිගන්න බැරි, ඒ උඩඟු බව තිබෙන අය ඉස්සරහා අපි ඊට වඩා උඩඟුයි. අපි ජනතාව ඉස්සරහා නිහතමානියි; ඒ වාගේම, සාමාන්‍ය නිලධාරින් ඉස්සරහා නිහතමානියි. සමහර විට මෙහෙම වෙන්න පුළුවන්. අපට මේ ජනවරම ගෙනෙන්න උදව් කරපු අතිවිශාල පිරිසක් ඉන්නවා. අපිට ඒ හැම කෙනාම consult කරලා කටයුතු කරන්න බැහැ. COPA එකේ සභාපතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට උපදෙස් දෙන්න ගොඩාක් හොඳ මිනිස්සු කැමැත්තෙන් ඉන්නවා. නමුත්, ඔබතුමාත් මුහුණ දෙන අත්දැකීමක් ඇති. ඒ ඔක්කෝටම ඇහුම්කන් දෙන්න ඔබතුමාට

මේ මොහොතේ වෙලාවක් නැහැ. මා හිතන විධියට, ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් ලෙස අප මුහුණ දෙන එක අභියෝගයක් ඒක. අපට උදව් කරපු හැම කෙනාගෙන්ම උපදෙස් ගන්න හැකියාවක් අපට නැහැ. අර රාහුල කුමාරයා වැලි අහුරක් උඩ දාලා ඒ තරමට උපදෙස් ලැබේවා කියා ප්‍රාර්ථනා කළා වාගේ අපට දෙන හැම උපදෙසකටම ඇහුම්කන් දෙන්න අපි කැමැතියි. නමුත්, ඔබතුමා දන්නවා අපට දැනට පැවරිලා තිබෙන කාර්යභාරයන් අනුව අපට ඒ හැම දෙයකටම ඇහුම්කන් දෙන්න කාල සීමාවක් නැති බව. එහෙම නැතිව අපේ අකමැත්තක් නිසා එහෙම වෙනවා නොවෙයි. මොකද, අපි පුංචි දරුවෙකුගෙන් වුණත් ඉගෙන ගන්න කැමැතියි. ඔබතුමා දන්නවා අපි කොච්චර respect කරනවාද කියලා. ගරු අගමැතිතුමිය, මේ රටේ උගත් කාන්තාවක්. ඔබතුමා දන්නවා එතුමියට දරු පැටියෙකු හමු වුණාම ඒ දරු පැටියාට respect කරන්නේ කොහොමද කියලා. එයාගේ මට්ටමට නැමුරු වෙලා තමයි ඒ දරුවාව පිළිගන්නේ. එහෙම අගමැතිවරු දැකලා තිබෙනවා ද? එහෙම ජනාධිපතිවරු දැකලා තිබෙනවා ද? අපි උඩඟු හින්දා ඡන්ද අඩු වුණා කියන පිරිසක් ඉන්න නිසායි මම මේ කාරණය කිව්වේ.

මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මේ ජනවරම අපි ඉතාම බරපතළ ලෙස ගන්නවා. මේ ජනවරම අපට ඉතා විශාල සම්පතක්. ජාතික ජන බලවේගයේ දේශපාලන යන්ත්‍රණය, රාජ්‍ය යන්ත්‍රණය, පරිපාලන යන්ත්‍රණය අංග සම්පූර්ණ වුණේ මේ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් කියලා මම හිතනවා. ඒ නිසා අපේ මන්ත්‍රීවරුන් හැම කෙනාටම දැන් තමන් යටතේ සභාවක් තිබෙනවා. ඒ නිසා ඊළඟ සතියේ දෙකේ මෙතුමන්ලා ඇතුළු අපි ඔක්කෝම ගිහිල්ලා සභා ටික හදනවා. සභාවල plan හදලා ඉවරයි. අපි ඒවා මිනිසුන්ට බෙදුවා. අපි ඒවා ක්‍රියාත්මක කරන්න පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතා පැහැදිලිව කියන්න කැමැතියි, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් තවත් මාස හයක් ගියාට පස්සේ ජාතික ජන බලවේගයේ ඡන්ද මැෂින් බවට පත් වන බව.

මොකද, අපි ඔක්කෝටම මළ ගෙදර, මඟුල් ගෙදර, පිරිත් ගෙදර, දානේ ගෙදර යන්න වෙලාවක් නැහැ; අපට හැම කානුවම, හැම ඉස්කෝලේම, හැම ඩෙංගු මදුරුවාම බලන්න වෙලාවක් නැහැ. නමුත්, 4,000ක් වන අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඒ කටයුතු කරනවා. අපට ඩෙල්ෆ්ට් දූපතේ ඉඳලා දෙවුන්දර තුඩුව දක්වාම මන්ත්‍රීවරු ඉන්නවා. කච්චතිව්වල ඡන්දය තිබුණා නම් එත් අපි එක මන්ත්‍රී ධුරයක් හෝ දිනනවා. අපට ඩෙල්ෆ්ට් දූපතේ ඉඳලාම මන්ත්‍රීවරු ඉන්නවා. යාපනේ-යාපනේ විතරක් නොවෙයි. අපි ඒ මන්ත්‍රීවරුන් 4,000ත් එක්ක, මිනිසුන් එක්ක ලොවෙත් නැති වෙන්න වැඩ කරනවා. ඔබතුමන්ලා ස්වයං තින්දේ හරි ස්වයං වින්දනයේ හරි ඉන්න; ඉලක්කම්වලට මුළා වෙලා පණ්ඩිතයන් කියන බොරු කථා අහලා ඕනෑ හැටියේ රැවටෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබයට -විපක්ෂයේ ප්‍රධාන පක්ෂයට- තිබෙන්නේ ප්‍රාදේශීය සභා 14යි. අපට ප්‍රාදේශීය සභා 267ක් තිබෙනවා. අපි "වන් ෂොට්" පිහිටුවනවා, ප්‍රාදේශීය සභා 152ක්. අපි ඒ බව විශේෂයෙන් කියන්න කැමැතියි. ගරු අලවතුවල මන්ත්‍රීතුමනි, ගණන් හදලා බැලුවොත්, අවුරුදු 20ක් විතර ඉන්න වෙනවා මේ විධියට මන්ත්‍රී ධුර වැඩි කර ගන්න. ඒ නිසා ලණු කන්නේ නැතුව, ඉලක්කම්වලට රැවටෙන්නේ නැතුව ඉලක්කම් ඉලක්කම් ලෙස ගන්න. ඉලක්කම්වලට දේශපාලනය කවලා තේරුම් ගන්න හදන්න එපා. එතකොට ගොනාට අඳිනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියන්න ඕනෑ. ඒ, කැත දේශපාලනය ගැනයි. අපි මේ රටේ දේශපාලනය, ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන විචාරකයන්ගෙන්, උගතුන්ගෙන් විශේෂයෙන් විමසා සිටිනවා, ජන වරම මොකක්ද කියලා. ජන වරමකදී යම්කිසි පක්ෂයකට වැඩි මන්ත්‍රී ධුර ප්‍රමාණයක් දුන්නා කියන්නේ මොකක්ද? ජනතාව කැමැතියි ඔවුන් රට පාලනය කරනවාට. එය නොතකා දැන් විවිධ පක්ෂ, කල්ලි, කණ්ඩායම් එකතු වෙලා සමහර සභා පිහිටුවන්න යනවා. ඒක ඡන්දෙට කලින් කිව්වා නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම නොවෙයි නේ මේ. ඡන්දෙන් පස්සේ තනිකර සල්ලිවලට, තනතුරුවලට තමයි මේ විකිණෙන්නේ. අපි හිතනවා, ජනතාව පසුගිය සැප්තැම්බර් 21වැනි දා අවසන් කළේ ඒ ජඩ දේශපාලනයයි කියලා. ජාතික ජන බලවේගයේ අපි ඒක කරන්නේ නැති වුණාට ඒක වෙනත් කට්ටියක් කරලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ සදාචාරය විනාශ කරන්න හදනවා නම්, අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ඒ 267හිම සහ පුළුවන් නම් ඊට වැඩි ප්‍රමාණයක සභා පිහිටුවලා ලංකාව දියුණු කිරීමේ, ගමට සේවය කිරීමේ මැච් එක ගහන්න අපි හෙට උදේ ඉඳන්ම පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 මැයි 09වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2025 மே 09, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 09th May, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.